2 R

# විනය කර්ම පොත



රේරුකානේ චන්දවිමල මහාහිමි.

# විනය කර්ම පොත

(නම වන මුද්‍රණය)


මහාචාර්ය

**රේරුකානේ චන්දවිමල**

(සාහිත්‍ය චක්‍රවර්ති, පණ්ඩිත, ප්‍රවචන විශාරද,

අමරපුර මහා මහෝපාධ්‍යාය ශාසන ශෝභන, ශ්‍රී සද්ධර්ම ශිරෝමණි)

මහානායක ස්වාමිපාදයන් වහන්සේ විසින්

සම්පාදිතයි.



2552

2008



*Non-commercial distribution*

## ලේකම්ගේ සටහන්...

ශාසනයේ පැවැත්මට හේතු වන විනය පිටකය හා විශේෂයෙන් භික්ෂුත්වය හා භික්ෂු සමගිය ගොඩ නගන්නා වූ එහි ඇතුළත් 'විනය කර්ම' පිළිබඳව ඇති නොදැනුමට හේතු දක්වන පූජ්‍යපාද රේරුකානේ නාහිමියෝ මෙහි ප්‍රස්තාවනාවෙන් වැදගත් කරුණු කීපයක් අපේ අවධානයට ලක් කරති.

සමාජයීය හේතු නිසා භික්ෂු පරමාර්ථ වලින් සංඝයා වහන්සේ ඈත් වීමත්, 'විනය කර්ම ඒකාධිකාර' පිහිටුවීමත් මේ අතර වැදගත් වෙයි. සමකාලීන පඬි රුවනක් වූ පූජ්‍යපාද යක්කඩුවේ ප්‍රඥාරාම නාහිමියෝ ද තම සඟිබණ 'සමන්නේසනා, හා වනකතා යන කෘතීන් මගින් මේ පණිවුඩය දුන් බව අපි දනිමු.

භික්ෂුත්වය ආරක්ෂා කර ගනිමින් සංකීර්ණ සමාජයක කටයුතු කිරීම හා ගිහි-පැවිදි වෙනස ගැන තේරුම් ඇතිව ගිහි-පැවිදි සම්බන්ධය වර්ධනය කිරීම අද මහා සංඝ රත්නයෙන් ඉටුවිය යුතු අගනා කාර්ය භාරයකි. ගිහියන් විනය දැනුමින් පිරිහී සිටින නිසා නොබියව ප්‍රතිපදව බිඳින හෝ විනය ප්‍රඥප්තිය, තමන්ම නොදැනීම නිසා එය බිඳින හෝ භික්ෂූන් වහන්සේ, අනිකුත් සමයයන් අතර බුදුසමය සිටිනා උත්තරීතර තත්ත්වය හුවා දක්වන්නට අසමත් වෙති. වෙනත් ආගමිකයන් තම අනුගාමිකයන් රඳවා ගැනීම පිණිස ක්‍රියාත්මක කරන ලාමක පිළිවෙත් ක්‍රියාත්මක කිරීමෙන් පහත වැටෙනවාට වඩා බෞද්ධ භික්ෂූන් වහන්සේට තම දායකයන් ඇද-බැඳ තබා ගන්නා, ශ්‍රද්ධාව මුවහත් කිරීමේ මඟ, විනය ප්‍රඥප්තිය නොපිරිහෙලා ක්‍රියාත්මක කිරීම බව බොහෝ දෙනා වහන්සේට නොවැටහීම අභාග්‍යකි. බෞද්ධකම ගැන දැනුමත්, අභිමානයත් දායකයන් තුළ රඳවන්නට අසමත් උන්වහන්සේලා වෙනත් සමයයන් පිළිගන්නට තම දයකයන්ට මං පාදති.

මහා සංඝරත්නය රැකීම පිණිස යුතුකමක් වශයෙන් ගිහියා පුදන පරිෂ්කාරයන්හි ආගමික අගය ඉතිහාසය විසින් වෙනස් කර ඇති බවත්, ආනිසංසයන් පැරණි අගයෙන් දක්විය නොහැකි බවත් බෞද්ධයන්ගේ විචාරයට ලක්ව ඇති බව පෙනේ. විද්‍යාව හා තාක්ෂණය පෙරමුණ ගත් නව අධ්‍යාපන රටාවෙන් ආගම ගැන ඉහළ තක්සේරුවෙන් සිතන තරුණ පිරිස අඩු කරයි. මේ නිසා නිතැතින් ගිහි මානසිකත්වය ආකර්ෂණය කර ගන්නා බුද්ධාඥාව රැකීම සඳහා භික්ෂු අධ්‍යාපනයේ විශේෂ තැනක් හිමිවිය යුතු බව වගකිව යුතු ගිහි - පැවිදි දෙපිරිසෙහි අවධානයට යොමු විය යුතුව ඇත.

Non-commercial distribution

තමන් ඇසුරු කරන භික්ෂූන් වහන්සේ නිසා, දායකයාගේ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව තහවුරු වන අයුරු බුදුරජාණන් වහන්සේ නොයෙක් තන්හි දේශනා කර ඇත. එනිසා චිරාත් කාලයක් බුදු සසුන රැකීමෙන් ලෝකයාට සැලසෙන යහපත පවත්වා ගැනීම පිණිස වර්තමාන මහා සංඝරත්නය සැරියුත් මුගලන් පරම්පරාවට ඇති සම්බන්ධය තහවුරු කර ගැනීම පිණිස විනය පිටකය ගැන අවධානය යොමු කරත්වා.

මේ මුද්‍රණයේදීත් මීට පෙර පූජ්‍ය කිරිඔරුවේ ධම්මානන්ද හිමිපාණන් සහ කුකුල්පනේ සුදස්සී හිමිපාණන් වහන්සේලා කියවූ සෝදුපත් සටහන් ප්‍රයෝජනවත් විය. කලින් මුද්‍රණයේ තිබූ සුළු අඩුපාඩු ද විනය කර්ම අත්පොතක් වූ මෙහි තිබීම නුසුදුසු බව සැලකූ ධම්මානන්ද හිමිපාණෝ එවැනි තැන් සොයා බලා නැවත සකස් කිරීමට දැඩි අවධානයක් යෙදවූහ. සංශෝධිත පරිගණක වර්ණ සංයෝජනයෙන් දායක වූයේ හොරණ රූ-මායා ග්‍රැෆික්ස් හි සාලිය ජයකොඩි මහතාය. සිකුරු මුද්‍රණාලයාධිපති ගිහාන් අනුරංග ජයවර්ධන මහතා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයේ දායකත්වයෙන් මනා ලෙස මුද්‍රණ කටයුතු නිම විය. අප අරමුදල පවත්වන්නට උරදෙන සියලු සැදැහැවත්හු මේ පොතෙහි නොකඩවා පැවැත්මටද උපකාර වූහ. සියල්ලන්ට බුදු සසුනේ පැවැත්මට සම්බන්ධ වූහයි ලැබෙන සතුටු සිතින් සැනසීම වේවා.

තිසරණ සරණයි!

සී. තනිප්පුලි ආරච්චි
ගරු ලේකම්
ශ්‍රී චන්ද්‍රවිමල ධර්මපුස්තක
සංරක්ෂණ මණ්ඩලය

2008 ඔක්තෝබර් 20 වන දින,
පොකුණුවිටදී ය.

Non-commercial distribution

# පටුන

පිට


ප්‍රස්තාවනා xv

**පැවිදි කිරීම** 21

භණ්ඩු කර්මය 21

තචපඤ්චක කර්මස්ථානය 24

උපාධ්‍යාය ග්‍රහණය 28

පැවිදි කිරීමට නුසුදුස්සෝ 29

පැවිදි කළහොත් පැවිද්ද පිහිටන පැවිදි නො කළ යුතු පුද්ගලයෝ 33

පැවිදි කිරීමේ වයස 39

**උපසම්පදා කර්මය** 42

උපසම්පදා කර්ම වාක්‍යය 47

උපසම්පදාව අවසානයේ කරන අනුශාසනය 49

නිඃශ්‍රය සතර 49

අකරණීය සතර 51

දෙතුන් දෙනා එකවර උපසම්පදා කිරීම 53

උපසම්පදාවට අභව්‍ය පුද්ගලයෝ 54

උපසම්පදාපේක්ෂකයාගේ වයස 55

උපාධ්‍යාය වීමට සුදුසු භික්ෂූන් වහන්සේ 56

නිඃශ්‍රය සමාදානය 57

අධිෂ්ඨාන විකප්පන විධි 58

අධිෂ්ඨානය බිඳීම 59

පාත්‍ර විකප්පනය 59


*Non-commercial distribution*

පාත්‍රයේ ප්‍රමාණය 60
චීවරාධිෂ්ඨානය 61
සිවුරුවල ප්‍රමාණ 62
අධිෂ්ඨානය බිඳීම 62
පරිෂ්කාර චෝලාධිෂ්ඨානය 63
චීවර විකප්පනය 64

**ඇවැත් දෙසීම** 64

සභාගාපත්ති දෙසීම 65
ඇවැත් දෙසීමේදී භාවිත කරන වාක්‍යය 66
නිස දෙසීම 67

**පොහෝ කිරීම** 69

උපෝසථ නවය 70
සඞ්ඝ උපෝසථය ගැන දත යුතු කරුණු 71
සඞ්ඝ උපෝසථය කිරීමේ ක්‍රමය 71
විශේෂ කරුණක් 74
පාරිසුද්ධි උපෝසථය 75
අධිට්ඨාන උපෝසථය 76
වර්ජනීය පුද්ගලයෝ 76

**වස් විසීම** 78

සත්තාහ කරණීයයෙන් යෑම 79
විශේෂ කරුණක් 80
සත්තාහ කරණීයයෙන් යායුතු කරුණු 80

**පවාරණය** 82

තේවාචික සඞ්ඝපවාරණය 83
පවාරණා ඤත්තිය 86
පවාරණ වාක්‍යය 86
තේවාචික ගණ පවාරණය 87
තේවාචික පුග්ගල පවාරණය 88


*Non-commercial distribution*

| | |
|---|---|
| අධිට්ඨාන පවාරණය | 89 |
| ද්වේවාචිකාදි පවාරණා | 89 |
| **කඨිනාස්ථරණ විනය කර්මය** | 90 |
| කර්ම වාක්‍යය | 91 |
| කඨින චීවරය සමග පිරිනමන පරිෂ්කාර | 94 |
| කඨින විපත්ති | 95 |
| කලින් කළ සිවුරෙන් කඨිනය ඇතිරීම | 97 |
| නවීන පොතක අදහස් | 101 |
| කඨින විචාරණය | 106 |
| කඨින දුස්සය පැවරීමට සුදුසු පුද්ගලයා | 107 |
| පුබ්බ කරණය | 107 |
| පච්චුද්ධාරය හා අධිට්ඨානය | 108 |
| මාතෘකා අට | 109 |
| පළිබෝධ දෙක | 112 |
| කඨිනෝද්ධාර විනය කර්මය | 113 |
| කඨිනෝද්ධාර කර්ම වාක්‍යය | 113 |
| කඨිනානිසංසය | 114 |
| කඨිනත්ථාර කාලය හා ආනිසංස කාලය | 116 |
| කඨිනත්ථාරය ලබන නො ලබන භික්ෂූහු | 116 |
| **වත් මානත්** | 118 |
| අපටිච්ඡන්න මානත | 118 |
| මානත ඉල්ලීමේ වාක්‍යය | 119 |
| මානත දෙන කර්ම වාක්‍යය | 119 |
| අබ්භාන යාචන වාක්‍යය | 121 |
| අබ්භාන කර්ම වාක්‍යය | 122 |
| ආපත්ති පටිච්ඡාදනය | 123 |
| **අග්ඝසමෝධාන පරිවාසය** | 125 |
| අග්ඝසමෝධානය ඉල්ලීමේ වාක්‍යය | 126 |
| අග්ඝසමෝධාන පරිවාසදන කර්ම වාක්‍යය | 127 |


Non-commercial distribution

| | |
|---|---|
| පිරිවෙස ආරෝචනය කරන වාක්‍යය | 129 |
| අග්ඝසමෝධාන මානත ඉල්ලීමේ වාක්‍යය | 131 |
| මානත්තදන කර්ම වාක්‍යය | 131 |
| මානත ආරෝචනය කිරීමේ වාක්‍යය | 133 |
| අබ්භාන යාචන වාක්‍යය | 134 |
| අබ්භාන කර්ම වාක්‍යය | 135 |
| **සුද්ධන්ත පරිවාසය** | 137 |
| සුද්ධන්ත පරිවාස යාචන වාක්‍යය | 137 |
| පරිවාසදන කර්ම වාක්‍යය | 137 |
| ආරෝචනය කරන වාක්‍යය | 139 |
| මානත ඉල්ලීමේ වාක්‍යය | 139 |
| මානත දෙන කර්ම වාක්‍යය | 140 |
| මානත ආරෝචනය කිරීමේ වාක්‍යය | 142 |
| සුද්ධන්ත අබ්භාන යාචන වාක්‍යය | 142 |
| සුද්ධන්ත අබ්භාන කර්ම වාක්‍යය | 143 |
| වත් මානත් පිරීම ගැන දත යුතු කරුණු | 145 |
| වත් පුරන භික්ෂූන්ගේ ප්‍රතිපත්ති ක්‍රමය | 147 |
| වත් මානත් දීමේදී සැලකිය යුත්තක් | 150 |
| **තිර්ථක පරිවාසය** | 150 |
| පිරිවෙස දෙන කර්ම වාක්‍යය | 151 |
| **කුටි වස්තු දේශන කර්මය** | 151 |
| සම්මත කිරීමේ කර්ම වාක්‍යය | 152 |
| කුටිවස්තු දේශනය ඉල්ලීමේ වාක්‍යය | 153 |
| දේශනය කිරීමේ කර්ම වාක්‍යය | 153 |
| මහල්ලක විහාර වස්තු දේශනය | 154 |
| විහාරවස්තු ඕලෝකන සම්මුතිය දෙන කර්ම වාක්‍යය | 154 |
| විහාරවස්තු දේශන කර්ම වාක්‍යය | 155 |
| **සමනුභාෂණ කර්මය** | 156 |
| කර්ම වාක්‍යය | 157 |


Non-commercial distribution

සඞ්ඝ භේදකයන්ට පක්ෂවන භික්ෂූන්ට කරන සමනුභාෂණ කර්මය 158

කර්ම වාක්‍යය 158

දුර්වච භික්ෂූන්ට කරන සමනුභාෂණ කර්මය 159

කර්ම වාක්‍යය 160

**පබ්බාජනිය කර්මය** 161

පබ්බාජනීය කර්ම වාක්‍යය 161

සමනුභාෂණ කර්ම වාක්‍යය 163

පබ්බාජනීය කර්මය සංසිඳවීම 164

කර්මය සංසිඳවීමේ කර්ම වාක්‍යය 164

**අන්‍යවාදකාරෝපන කර්මය** 166

කර්මවාක්‍යය 166

**විහේසකාරෝපන කර්මය** 167

කර්මවාක්‍යය 167

පාප දෘෂ්ටිය ගෙන සිටින භික්ෂූන්ට කරන සමනුභාෂණ කර්මය 167

කර්ම වාක්‍යය 168

මිසදිටු ගත් සාමණේරයන්ට කරන නිස්සාරණ කර්මය 170

කර්මවාක්‍යය 170

**ඕසාරණය** 171

ඕසාරණ කර්මවාක්‍යය 171

**බ්‍රහ්ම දණ්ඩය** 171

කර්මවාක්‍යය 172

ඉවත් කිරීමේ කර්මවාක්‍යය 172

**මෝහාරෝපන කර්මය** 172

කර්මවාක්‍යය 173

**තජ්ජනීය කර්මය** 174

කර්ම වාක්‍යය 174


*Non-commercial distribution*

තජ්ජනීය කර්මය කරන ලද භික්ෂූන් විසින්
පිළිපැදිය යුතු අටළොස් වත 177
තජ්ජනීය කර්මය ඉවත් කිරීම 178
ඉවත් කිරීමේ කර්ම වාක්‍යය 178
**නියස්ස කර්මය** 179
නියස්ස කර්ම වාක්‍යය 180
නියස්ස කර්මය ඉවත් කිරීම 181
නියස්ස කර්මය ඉවත් කිරීමේ කර්ම වාක්‍යය 182
**පටිසාරණීය කර්මය** 183
පටිසාරණීය කර්ම වාක්‍යය 184
දූතයෙකු දීමේ කර්ම වාක්‍යය 185
පටිසාරණීය කර්මය ඉවත් කිරීම 186
පටිසාරණීය කර්මය ඉවත් කිරීමේ
කර්ම වාක්‍යය 187
**පත්තනික්කුජ්ජන කර්මය** 188
පත්තනික්කුජ්ජන කර්ම වාක්‍යය 189
පත්තනික්කුජ්ජනය ඉවත් කිරීම 189
පත්ත නික්කුජ්ජනය ඉවත් කිරීමේ
කර්ම වාක්‍යය 190
**ඇවැත් නො පිළිගත්තා භික්ෂූන්ට කරන**
**උක්ඛේපනීය කර්මය** 191
කර්ම වාක්‍යය 191
උක්ඛේපනීය කර්මය කරන ලද භික්ෂුව
විසින් පිළිපැදිය යුතු නීති 192
ඇවැත් නො පිළිගැනීමේ උක්ඛේපනීය
කර්ම ඉවත් කරීම 194
කර්ම වාක්‍යය 194
**ඇවතට පිළියම් නො කරනු කැමති භික්ෂූන්ට**
**කරන උක්ඛේපනීය කර්මය** 195
කර්ම වාක්‍යය 196

Non-commercial distribution

උක්ඛේපනීය කර්මය ඉවත් කිරීම 197
ඉවත් කිරීමේ කර්ම වාක්‍යය 197

**පාප දෘෂ්ටිය නො හරින භික්ෂූන්ට කරන උක්ඛේපනීය කර්මය** 199

කර්ම වාක්‍යය 199
භික්ෂුව විසින් පිළිපැදිය යුතු වත් අටළොස 201
උක්ඛේපනීය කර්මය ඉවත් කිරීම 202
වත් කිරීමේ කර්ම වාක්‍යය 202

**සම්මුති** 205

කප්පිය භූමි සම්මුතිය 205
කප්පිය භූමිය සම්මත කරන කර්ම වාක්‍යය 205
සේඛ සම්මුතිය 207
සේඛ සම්මුති කර්ම වාක්‍යය 207
චීවර පටිග්ගාහක සම්මුතිය 208
චීවර ප්‍රතිග්‍රාහක සම්මුති කර්මවාක්‍යය 209
චීවර නිදහක සම්මුතිය 209
චීවර නිදහක සම්මුති කර්ම වාක්‍යය 209
භාණ්ඩාගාර සම්මුතිය 210
භණ්ඩාගාර සම්මුති කර්ම වාක්‍යය 210
භාණ්ඩාගාරික සම්මුතිය 211
භාණ්ඩාගාරික සම්මුති කර්ම වාක්‍යය 211
චීවර භාජක සම්මුතිය 211
සම්මත කරන කර්ම වාක්‍යය 212
මතක චීවර දන කර්මය 213
කර්මවාක්‍යය 213
මෘත සාමණේර චීවර දන කර්මවාක්‍යය 214
තිචීවරා විප්පවාස සම්මුතිය 215
කර්මවාක්‍යය 215
නවකම්ම සම්මුතිය 216


*Non-commercial distribution*

| | |
|---|---|
| නවකම්ම සම්මුතිය දෙන කර්ම වාක්‍යය | 216 |
| සේනාසන ගාහාපක සම්මුතිය | 217 |
| කර්මවාක්‍යය | 217 |
| සේනාසන පඤ්ඤාපක සම්මුතිය | 218 |
| කර්මවාක්‍යය | 218 |
| හත්තුද්දේසක සම්මුතිය | 218 |
| කර්මවාක්‍යය | 219 |
| යාගු හාජක සම්මුතිය කරන කර්මවාක්‍යය | 219 |
| ඵල හාජක සම්මුතිය දෙන කර්මවාක්‍යය | 220 |
| ඛජ්ජ හාජක සම්මුතිය දෙන කර්මවාක්‍යය | 220 |
| අප්පමත්තක විස්සජ්ජක සම්මුතිය | 221 |
| කර්මවාක්‍යය | 221 |
| පත්තගාහාපක සම්මුතිය | 222 |
| කර්මවාක්‍යය | 222 |
| රූපියඡඩ්ඩක සම්මුති කර්මවාක්‍යය | 223 |
| සාටිය ගාහාපක සම්මුතිය | 224 |
| කර්මවාක්‍යය | 224 |
| ආරාමිකපේසක සම්මුතිය | 225 |
| කර්මවාක්‍යය | 225 |
| සාමණේරපේසක සම්මුතිය | 225 |
| දණ්ඩ සම්මුතිය | 226 |
| කම්වාක්‍යය | 226 |
| සික්කා සම්මුතිය | 227 |
| කම් වාක්‍යය | 227 |
| දණ්ඩසික්කා සම්මුතිය | 228 |
| කම්වාක්‍යය | 228 |
| උම්මත්තක සම්මුතිය | 229 |
| කම්වාක්‍යය | 229 |
| **සීමා බන්ධන විනය කම්මය** | **232** |
| සීමා විපත්ති එකොළොස | 232 |


*Non-commercial distribution*

ත්‍රිවිධ සීමා සම්පත්තිය 234
නව සීමා බන්ධනය 239
සීමා භූමි ශුද්ධිය 242

**සීමා සමූහනන සීමා සම්මුති පිළිබඳ**
**කර්ම වාක්‍යය** 247
තිචීවරෙන අවිප්පවාස සීමා සමූහනනය 247
සමාන සංවාස සීමා සමූහනනය 248
සීමා සම්මුතියේදී නිමිත්ත කීර්තනය 248
සමාන සංවාස සීමා සම්මුතිය 249
අවිප්පවාස සීමා සම්මුතිය 250
කර්ම කාරක සංඝයෝ 251
කර්ම සතර 251
කර්ම විපත්ති 251
අධර්ම කර්මය ගැන පිළිපැදිය යුතු අයුරු 256

Non-commercial distribution

**"සබ්බදානං ධම්මදානං ජිනාති"**

## දහම් පොත් මුද්‍රණයට සහාය වූ අභිනව සාමාජිකයෝ

| | | | |
|---|---|---|---|
| මාලනී ජෝතිරත්න මිය | බලංගොඩ | රු. | 12,500.00 |
| සැදැහැවතෙක් | මුල්ලේරියාව | රු. | 10,000.00 |
| කමනි නානායක්කාර මිය | කොළඹ - 02 | රු. | 10,000.00 |
| කල්‍යාණි ද සිල්වා මිය | පිළියන්දල | රු. | 1,000.00 |
| පී. එච්. ඩබ්ලිව්. ද සිල්වා මිය | පිළිමතලාව | රු. | 1,000.00 |
| මධුභානී කළුවැව මිය | මහනුවර | රු. | 1,000.00 |
| ඩී. එන්. හෙට්ටිආරච්චි මිය | හෝමාගම | රු. | 500.00 |
| මේදිනී එදිරිසිංහ මෙනවිය | බෙලිඅත්ත | රු. | 500.00 |
| චිරන්තා එදිරිසිංහ මෙනවිය | බෙලිඅත්ත | රු. | 500.00 |

අනික් පොත් හා සසඳන විට කාලීනව අඩු මිලකට මේ පොත් සැපයිය හැකිව ඇත්තේ ධර්මදානමය කුශලයේ වටිනාකම අවබෝධ කරගත් සැදැහැවතුන් නිසාය.

එක් මුද්‍රණයක් විකිණීමෙන් ලැබෙන මුදලත්, ඊළඟ මුද්‍රණයේ මුද්‍රණ වියදමත් අතර පරතරය පියවා ගැනීමට මේ ආධාර උපයෝගී වේ.

ඔබට ද මේ සඳහා සහභාගි විය හැකිය.

*Non-commercial distribution*

# ප්‍රස්තාවනා

**"විනයො නාම සාසනස්ස ආයු. විනයෙ ඨිතෙ සාසනං ඨිතං හොති"** යන සඞ්ගීතිකාරක මහරහතන් වහන්සේලාගේ වචනය පරිදි තථාගතයන් වහන්සේගේ ආඥා දේශනාව වූ විනය පිටකය, සර්වඥශාසනයේ ජීවය වන බැවින් ද, විනය පවත්නා තෙක් ම බුදු-සස්න පවත්නා බැවින් ද සකල ශාසනමාමක භික්ෂූන් විසින් ම අත්‍යාදරයෙන් විනය පිටකය පරිශීලනය කළ යුතු ය. සීමාබන්ධනඋපසම්පදදි විනයපිටකයෙහි එන කර්ම, විනය කර්ම නම් වේ. කුලපුත්‍රයන් උපසම්පද කොට බුදුසස්නට ඇතුළු කිරීම හා එසේ බුදුසස්නට ඇතුළු වූ කුලපුත්‍රයන්ගේ ශීලය නැවත නැවත සංස්කරණයත් විනයකර්ම මාර්ගයෙන් ම සිදු කළ යුතු බැවින් විනය කර්මය ද බුදු-සස්නෙහි උසස් තැනක් ගන්නකි.

විනය කර්ම කරන කල්හි විනයාගත ක්‍රම නො ඉක්මවා ඉතා පිරිසිදු ලෙස ම එය කළ යුතු ය. වරදවා කරන විනය කර්මය කෙළේ ද නො කෙළේ වේ. නො දැන වුවද විනය කර්ම වරදවා කිරීම ඉතා නපුරෙකි. එයින් බුදු-සස්න නැසෙන්නේ ය. වරදවා සීමාබන්ධනයක් කළහොත් ගල්කණු සිටවා ඇත ද එය සීමාවක් නො වේ. එහි කරන විනය කර්ම එකකුදු හරියන්නේ නොවේ. එහි උපසම්පදවක් කෙළේ ද, ඒ උපසම්පද කරනු ලැබුවෝ උපසම්පන්නයෝ නො වෙති. මතු කාලයේදී ඒ අසීමාවල උපසම්පද කරනු ලැබුවන් විසින් කරන පැවිදි උපසම්පද එකකුදු නො හරි යන්නේ ය. සීමාව හොඳ වුව ද උපසම්පද කර්මය වරදවා කරන ලද්දේ නම්, ඔවුහු ද අනුපසම්පන්නයෝ ම වෙති. මතු කාලයේදී ඔවුන් විසින් පැවිදි කරන ගෝලයෝ ද නො පැවිද්දෝ-අනුසම්පන්නයෝ ම වෙති. වරදවා විනයකර්ම කිරීමෙන් වන හානියේ බරපතල බව මේ කරුණු වලින් තේරුම් ගත යුතු ය.

Non-commercial distribution

විනයකර්ම ගැන මනා දැනුමක් ඇතිවීමට සම්පූර්ණ විනය පිටකය ම මැනවින් උගත යුතුය. නො එසේ නම්, විනය කර්ම හෝ වෙන් වශයෙන් උගත යුතුය. මැනවින් විනය කර්ම කළ හැකි වීමට පොත් පරිශීලනයමත් ප්‍රමාණ නො වේ. ඒ සඳහා විනයකර්ම කළ පුරුද්ද ද තිබිය යුතුය. අතීතයෙහි විසූ බොහෝ භික්ෂූහු විනය කම් ගැන දැනීම හා කළ පුරුද්ද ඇත්තෝ වූහ. මෙකල භික්ෂූන් අතර විනයකර්ම ගැන මනා දැනුම හා කළ පුරුද්ද ඇති භික්ෂූන් බහුල නැති බව කිය යුතුය. එයට හේතු කීපයකි.

අතීත භික්ෂුවට ධර්මවිනය පරිශීලනයට තමාගේ මුළු-කාලයම යෙදවිය හැකිව තිබිණ. වර්තමාන භික්ෂුවට ලෝකයෙහි තත්ත්වයක් ඇතිව වාසය කිරීමට ධර්ම විනය හැර තවත් බොහෝ දේ ඉගෙනගන්නට සිදුවී තිබේ. එබැවින් වර්තමාන භික්ෂුවට තමාගේ උගෙනීමේ කාලයෙන් වැඩිහරියක් ධර්මවිනයයෙන් පිටත් දේ උගෙනීම සඳහා යොදවන්නට සිදුවී තිබේ. එයද මෙකල භික්ෂූන්ට ධර්මඥානය හා විනයඥානය මඳවීමේ එක් හේතුවකි. පිරිවෙණක උගෙනීම අවසන් කොට සිය අරමට පැමිණියා වූ භික්ෂුවට ද පන්සලේ කටයුතුවලට හා දයකයන්ගේ කටයුතුවලටත්, සඞ්ඝයාගේ කටයුතුවලටත්, තමාගේ අඩුපාඩු කම් පිරිමසා ගැනීමේ වැඩවලටත් මුළු කාලයම යොදවන්නට සිදු වේ. එද මෙකල භික්ෂුවගේ ධර්මවිනය ඥානය මඳවීමේ එක් හේතුවකි.

ලාඞ්කික භික්ෂූන්ට විනයකර්ම නුපුරුදු වීමට ඇති තවත් හේතුවක් නම්, ඒ ඒ නිකායවල උපසම්පද කර්මය එක් එක් පිරිසක් විසින් අයිති කර ගෙන තිබීම ය. උපසම්පද කර්මය තථාගතයන් වහන්සේ විසින් එක් පිරිසකට පමණක් හිමිකර ඇතියක් නො වේ. එය උපසම්පදව ඇති සකල භික්ෂූන්ට ම හිමි ය. මධ්‍ය දේශයෙන් පිටත ඕනෑම ප්‍රදේශයක පිහිටි සීමාවකදී උපසම්පදව ඇති භික්ෂූන් පස් නමක් එක්ව .උපසම්පද කර්මය කළ හැකි ය.

බුද්ධකාලයෙහි ඒ ඒ පෙදෙස්වල විසූ උපසම්පදපේක්ෂකයන් උපසම්පද කර තිබෙන්නේ ඒ ඒ පෙදෙස්වල විසූ භික්ෂූන් විසින් ම ය. බුරුමයේ දැනුදු ඒ ඒ පෙදෙස්වල උපසම්පද කර්මය

Non-commercial distribution

කරන්නේ ඒ ඒ පෙදෙස්වල භික්ෂූන් විසින් ම ය. උපසම්පද කර්මයට නියමිත විශේෂ පිරිසක් හා විශේෂ තැන් එහි නැත. සෑම තැනම කෙරෙන උපසම්පද කර්ම වෙනසක් නැතිව එහි පිළිගනු ලැබේ. රටේ සියලු පෙදෙස්වල ම උපසම්පද කර්මය එහි කෙරෙන බැවින් ඒවාට සහභාගිවන්නට ලැබීමෙන් සියලුම භික්ෂූන්ට විනය කර්ම කිරීමේ පුරුද්ද ඇතිවේ. ලංකාවේ ද ඒ සිරිත පවතිත හොත්, බොහෝ භික්ෂූන්ට විනය කර්ම පිළිබඳ අභ්‍යාසයක් ඉබේම ලැබෙන්නේ ය.

එක් පිරිසකට ම උපසම්පද කර්මය හිමිවී තිබීමේ ගුණාගුණ දෙකම කිය හැකි ය. කොතෙක් ගුණ එහි ඇතත් ඉතාම නපුරු ආදීනවයක් ද එහි ඇත්තේ ය. එනම්:- උපසම්පදව හිමි කරගෙන සිටින පිරිස යම්කිසි ක්‍රමයකින් අශුද්ධ පිරිසක් වී නම්, මුළු නිකායට ම - ඒ නිකායේ සඞ්ඝපරම්පරාවට ම උපසම්පදව නැති වී යාමය. උපසම්පදාපේක්ෂකයකුට උපසම්පදව ලබා ගැනීමට ඇති ඉතාම හොඳ ක්‍රමය නම්, තමා හොඳින් දන්නා හඳුනන, නිර්මල උපසම්පදව ඇතියන් සැටියට සැකයක් නැතිව තමාට පිළිගත හැකි පිරිසකගෙන් උපසම්පදව ලබා ගැනීම ය. එසේ උපසම්පදව ලබාගත් භික්ෂුවට තමාගේ උපසම්පදව පිළිබඳ සැකයක් ඇති නො වේ. ඒ නිසැකි බව ආදරයෙන් ශීලය රැකීමටත් කරුණක් වේ. තොරතුරු නොදන්නා නාඳුනන පිරිසකගෙන් උපසම්පදව ලබාගත් තැනැත්තාට තමාගේ උපසම්පදව පිළිබඳව ස්ථිර විශ්වාසයක් ඇති නො වේ. නොයෙක් විට උපසම්පදව ගැන කුකුස් ඇති වේ. එය හොඳින් මහණදම් පුරනු කැමති කුලපුත්‍රයෙකුට මහත් බාධාවෙකි. අධෛර්‍ය්‍යයට කරුණකි.

උපසම්පද කර්මය එක් පිරිසකට පමණක් හිමිවී තිබීමේ තවත් ආදීනවයක් නම්, උපසම්පදාපේක්ෂකයන්ට හා ඔවුන්ගේ ගුරුවරුන්ට බොහෝ මුදල් සපයන්නට සිදුවීම ය. අද පවත්නා තත්ත්වයේ සැටියට නම්, මුදල් වැය නො කොට උපසම්පදව නො ලැබිය හැකි ය. පැවිද්දන්ට මුදල් පරිහරණය තහනම් කොට සිකපද පැනවූ තථාගතයන් වහන්සේ මුදල් වැය නො කොට නො ලැබිය හැකි උපසම්පදවක් නො පනවන සේක. උන් වහන්සේ විසින් උපසම්පදව පනවා ඇත්තේ පා-සිවුරු ඇති කවර දුප්පත්

Non-commercial distribution

උපසම්පදපේක්ෂකයකුට වුවද ශතයකුදු වැය නො කොට උපසම්පදව ලැබිය හැකි පරිද්දෙනි.

අද උපසම්පදව පිළිබඳව පවත්නේ ඊට ඉදුරාම වෙනස් ක්‍රමයකි. උපසම්පදව මුදල් වැය කොට ලැබිය යුත්තක් වී ඇති බැවින් ගිහියන් මඟුල් ලියුම් නෑ-මිතුරන්නට යවන්නාක් මෙන් උපසම්පද කර්මයට මුදල් ලබනු පිණිස නෑ-මිතුරන්ට දයකයනට ලියුම් යැවීම අද රටේ සිරිතක් වී තිබේ. උපසම්පද කාලවලදී සමහරුන්ට ඒ ගැන එවන ලියුම් එකක් දෙකක් නොව බොහෝ ගණනක් ද ලැබේ. එය රටට කරදරයකි. බොහෝ දෙනාගේ අප්‍රසාදයට ද කරුණකි. එක් එක් නිකායක එක් එක් පිරිසක් විසින් ම උපසම්පද කර්මය කරන කල්හි එහි යම් කිසි වරදක් ගෙන මුළු නිකායටම උපසම්පදව නැතය කියා තවත් කෙනකු විසින් චෝදනා කරන්නට ඉඩ ඇති බැවින් එක් එක් පිරිසකට ම උපසම්පද කර්මය හිමිකර ගෙන තිබීම නිකාය භේදය උග්‍රවීමට ද හේතුවකි. කරුණු මෙසේ හෙයින් එක් එක් පිරිසකටම උපසම්පද කර්මය හිමිවී තිබීමේ සුදුසු නුසුදුසු බව ගැන මහාසඞ්ඝයා වහන්සේ කල්පනා කරන සේක්වා!!

විනයකර්‍ම පිළිබඳ දත යුතු කරුණු විනය පිටකයෙහි එක් පරිච්ඡේදයකම සඳහන් නො වන බැවින් විනය පොත් කියවා විනයකර්‍ම ගැන දත යුතු සියල්ල දැන ගැනීමට ලෙහෙසි නැත. විනය පොත් භාවිතය අඩු භික්ෂූන්ට විනය පොත්වලින් ඒ ඒ විනයකර්‍ම ගැන සඳහන්වන තැන් පවා සොයා ගැනීම අපහසු ය. එබැවින් විනයකර්‍ම ගැන පලපුරුදුකම් මඳ වූ ද, විනය පොත් භාවිතය මඳ වූ ද භික්ෂූන්ට ඒ ඒ විනය කර්‍ම කරන සැටි පහසුවෙන් දත හැකි වනු පිණිස, විනය කර්‍මයන් නිවැරදි ලෙස කර ගත හැකි වනු පිණිස, සම්බුද්ධ ජයන්තිය නිමිත්ත කොට විනයකර්‍ම පොත නම් වූ මේ ග්‍රන්ථය සම්පාදනය කරන ලදී.

මෙහි පැවිදි කිරීම හා උපසම්පදකර්මය ද, උපසම්පන්න භික්ෂූන්ගේ ශීලපාරිශුද්ධිය සඳහා කරන්නට සිදු වන විනය කර්ම බොහෝ ගණනක් ද, වරද කරන භික්ෂූන්ට දඬුවම් පිණිස කරන

Non-commercial distribution

පබ්බාජනීයකර්මාදි කර්ම බොහෝ ගණනක් ද, ගිහියන්ට දඬුවම් පිණිස කරන පත්ත නික්කුජ්ජන කර්මය ද, සඞ්ඝයාගේ හා පුද්ගලයන්ගේ පහසුව පිණිස කරන විනයකර්ම බොහෝ ගණනක් ද, දුෂ්කර විනයකර්මයක් වූ සීමා බන්ධන කර්මය ද පහසුවෙන් තේරුම් ගත හැකි පරිදි දක්වා ඇත. විනයෙහි අවියත් භික්ෂු පිරිසකට වුව ද මේ පොතේ ආධාරයෙන් නිවැරදි ලෙස උපසම්පද කර්මයක් සිදු කළ හැකි වනු ඇත. දැනට භික්ෂූන් අතර කෙරෙන භික්ෂූන්ට යම් යම් අවස්ථාවලදී කරන්නට සිදුවන විනය කර්ම සියල්ල ම අඩුවක් නැතිව මෙහි ඇතුළත් වී ඇත.

කර්මවාක්‍යය කීම ඉතා සැලකිල්ලෙන් කළ යුත්තකි. කීමේ දී වරදක් වුවහොත් කර්මය සිදු නො වේ. එබැවින් විනය ගරුකයෝ පොත් බලා ගෙන ම කර්මවාක්‍යය කියති. වයෝවෘද්ධ මහාස්ථවිරයන් වහන්සේලාටත් පහසුවෙන් කියවිය හැකි වනු පිණිස මෙහි කර්මවාක්‍යයන් ලොකු අකුරෙන් මුද්‍රණය කරවා ඇත.

වර්ග කීපයක අකුරු යොදවන මෙබඳු පොතක් මුද්‍රණය කිරීම කල් ගත වන දුෂ්කර වැඩකි. එහෙත් මරදානේ අතුල මුද්‍රණාලයේ කළමනාකාර තැන්පත් **ඩබ්ලිව්. ඩී. ජේ. රත්නායක අප්පුහාමි** මහතාගේ ක්‍රියා ශූරත්වයෙන් මේ පොතේ වැඩ ඉතා කෙටි කලකින් නිමවූ බව ප්‍රීතියෙන් සඳහන් කරමු.

පොතක් මුද්‍රණය කරවීමේ දී ගත්කරුවකුට කරන්නට සිදුවන සෝද්දුපත් කියවීම් ආදි හැම වැඩක් ම මේ පොත මුද්‍රණයේදී ඉතා සැලකිල්ලෙන් කර දුන් අපගේ ශිෂ්‍ය **හේන්ගොඩ කල්‍යාණධම්ම** නමට පින්සිදු වේවා.

**බුදුසසුන බැබලේවා !**

මීට-ශාසනස්ථිතිකාමී,
**රේරුකානේ චන්දවිමල ස්ථවිර**

2499
1955 ඔක්තෝම්බර් 10 වැනි දින
පොකුණුවිට
ශ්‍රී විනයාලඞ්කාරාරාමයේදී ය.

Non-commercial distribution

## දහම් පොත් සංරක්ෂණ මණ්ඩලයෙන් ප්‍රකාශිත
## රේරුකානේ නාහිමියන්ගේ පොත් සහ වෙනත් පොත්

**විනය ග්‍රන්ථ**

ශාසනාවතරණය
විනය කර්ම පොත
උපසම්පදා ශීලය
උභය ප්‍රාතිමෝක්ෂය (අනුවාද සහිත)

**අභිධර්ම ග්‍රන්ථ**

අභිධර්ම මාර්ගය
අභිධර්මයේ මූලික කරුණු
පට්ඨාන මහා ප්‍රකරණ සන්නය
අනුවාද සහිත අභිධර්මාර්ථ සංග්‍රහය

**භාවනා ග්‍රන්ථ**

විදර්ශනා භාවනා ක්‍රමය
පෞරාණික සතිපට්ඨාන භාවනා ක්‍රමය
චත්තාලීසාකාර මහා විපස්සනා භාවනාව
සතිපට්ඨාන භාවනා විවේචනය හා වෙනත් කෘති

**ධර්ම ග්‍රන්ථ**

චතුරාර්‍ය්‍ය සත්‍යය
පාරමිතා ප්‍රකරණය
බෝධිපාක්ෂික ධර්ම විස්තරය
පටිච්ච සමුප්පාද විවරණය
ධර්ම විනිශ්චය
බෞද්ධයාගේ අත් පොත
මංගල ධර්ම විස්තරය
පුණ්‍යෝපදේශය
සූවිසි මහා ගුණය
පොහොය දිනය
කෙලෙස් එක්දහස් පන්සියය
චෛත්තසික ධර්ම හා චිත්තෝපක්ලේශ ධර්ම
බුද්ධනීති සංග්‍රහය
නිර්වාණ විනිශ්චය හා පුනරුප්පත්ති ක්‍රමය
බෝධි පූජාව
Four Noble Truths (චතුරාර්‍ය්‍ය සත්‍යය පරිවර්තනය.)

**වෙනත්**

මෙකල තිවුණු ඇත්තෝ
(නාහිමි චරිත වත හා අනුමෙවෙනි දම් දෙසුම් 15 ක්.)
සුරාධූර්තය හෙවත් මද්‍යලෝලය (වෛද්‍ය නීල් කෙසල් - පරිවර්තන)
බුදුසසුන පුබුදු කළ ශ්‍රී ලංකා ශ්වේජින් නිකාය සියවස (ශාස්ත්‍රීය සමරු කලාපය)

---

විමසීම් :- ගරු ලේකම්
ශ්‍රී චන්ද්‍රවිමල ධර්ම පුස්තක සංරක්ෂණ මණ්ඩලය,
ශ්‍රී විනයාලංකාරාරාමය, පොකුණුවිට.
දුරකථනය : 034-2263958, (2263979)

*Non-commercial distribution*

# විනය කම් පොත

**නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.**

## පැවිදි කිරීම

සියල්ල දැන වදළා වූ අප භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් දුක්-ගිනි වලින් දැවෙමින් සසර සැරිසරණ අසරණ සත්ත්වයන් දුකින් මුද, මොක් පුරයට පමුණුවනු වස් පිහිටුවා වදළ, මේ නෛර්‍යාණික ශාසන වරයට නිවන් පසක් කරනු කැමැති සැදැහැවත් කුලපුත්‍රයන් පැවිදි කිරීම් වශයෙන් ඇතුළු කිරීමේදී, භික්ෂූන් වහන්සේ විසින් කරන්නට සිදු වන පළමු වන විනය කර්මය '**භණ්ඩුකර්ම**' නම් වේ. එය ප්‍රව්‍රජ්‍යාපේක්ෂකයන්ගේ හිසකේ කැපීම පිළිබඳ විනය කර්මයෙකි.

බුදුරජාණන් වහන්සේ වැඩවෙසෙන සමයෙහි, එක් කුලදරුවෙක් මා-පියන් හා කලහ කර-ගෙන ගෙයින් පලා ගොස්, සඞ්ඝාරාමයකට පැමිණ, එහිදී එක් තෙරුන් වහන්සේ කෙනකුගෙන් පැවිද්ද ලබා ගත්තේය. එය අප්‍රසිඬ වශයෙන් සිදු වූවකි. බොහෝ භික්ෂූහු ඒ බව නො දත්හ. පැවිදි වූ දරුවාගේ මා - පියෝ ඔහු සොයා ඇවිදිනාහු ඒ ආරාමයට පැමිණ, හමුවූ භික්ෂූන් වහන්සේලා-ගෙන් "ස්වාමීනි! නුඹ වහන්සේලා මෙබඳු දරුවකු දුටු සේක් ද, මෙබඳු දරුවකු ආගිය තැනක් දන්නා සේක්දැ" යි ඇසූහ. ඒ භික්ෂූන් ඒ දරුවා නුදුටු නිසාම "අපි නුදුටුම්හ" යි ද, නො දන්නා නිසාම ඒ දරුවා ගැන "අපි නො දනුම්හ" යි ද කීහ.

දරුවාගේ මා-පිය දෙදෙනා එපමණකින් සෑහීමට පත් නොවී තැනින් තැන ඇවිද සොයන්නා හු, පැවිදිව හුන් දරුවා දැක, භික්ෂූන් කෙරෙහි කිපී "මේ භික්ෂූහු දුටු දේ නුදුටුම්හ" යි ද, "දත්

Non-commercial distribution

දෙය නො දතුම්හ" යි ද බොරු කියන්නෝ ය, බොරු කියන්නාවූ මේ භික්ෂූහු 'අලජ්ජීහුය, දුශ්ශීලයෝ ය' යනාදීන් භික්ෂූන්ට ගර්හා කළහ. භික්ෂූහු ඒ කාරණය තථාගතයන් වහන්සේට සැල කළෝ ය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මතු එවැන්නක් සිදු නො වනු පිණිස-

**"අනුජානාමි භික්ඛවෙ! සඞ්ඝං අපලොකෙතුං භණ්ඩුකම්මාය"** යි භණ්ඩුකර්මය අනුදැන වදළ-සේක.

එය කළ යුත්තේ දැහුලකට වඩා දික්වූ ඉස-කේ ඇතියකුගේ කෙස්, භික්ෂුවක් විසින් හෝ භික්ෂුවකගේ නියමයෙන් හෝ කපන කල්හි ය. එය කළ යුත්තේ මෙසේ යඃ- ආරාමය තුළ වෙසෙන සියලු භික්ෂූන් රැස්කොට පැවිද්ද ලබන තැනැත්තා සඞ්ඝයා ඉදිරියට පමුණුවා, ගුරුවරයා විසින් හෝ අනික් භික්ෂුවක් විසින් හෝ සඞ්ඝයා ඉදිරියෙහි-

**"සඞ්ඝං භන්තෙ! ඉමස්ස දරකස්ස භණ්ඩුකම්මං ආපුච්ඡාමි"** යන මේ වාක්‍යය තෙවරක් හෝ දෙවරක් හෝ එක්වරක් හෝ කීමෙනි. භණ්ඩුකර්මය සඳහා **"ඉමස්ස දරකස්ස භණ්ඩුකම්මං ආපුච්ඡාමි"** කියා හෝ **"ඉමස්ස සමණ කරණං ආපුච්ඡාමි"** කියා හෝ **"අයං සමණො හොතු කාමො"** කියා හෝ කීම ද වටනේ ය.

භික්ෂූන් වහන්සේලා එක් රැස් නො කරවා ඒ ඒ භික්ෂූන් වහන්සේ වෙසෙන තැන්වලට ගොස් භණ්ඩුකර්මය විචාරන්නට වටනේ ය. පැවිදි කරන ගුරුවරයාම භික්ෂූන් වහන්සේ වෙත නො ගොස් අනිකකු යවා භික්ෂූන් ගෙන් විචාරන්නට ද වටනේ ය. සියලු භික්ෂූන් එක් රැස් කරවීමට හෝ වෙන වෙන ම ගොස් ආරෝචනය කිරීමට හෝ අපහසු වන තරමට භික්ෂූන් බහුල අවස්ථාවක ඒ කර්මය කරන්නට සිදුවී ඇතහොත්, බඩසීමාවකට හෝ උදකෝක්ෂේප සීමාවකට හෝ ගොස්, එහි රැස්වූ භික්ෂූන් හමුවෙහි ඒ කර්මය කළ යුතු ය.

පැවිදිවන්නකුගේ හිස-කේ කැපීම සැලකිය යුතු කරුණෙකි. පැවිදිවන තැනැත්තා පින් ඇති, ගුණ නුවණ ඇති, මතු බුදුසස්නට

Non-commercial distribution

විශේෂයෙන් ප්‍රයෝජනවිය හැකි පුද්ගලයකු වේ නම්, එබඳු පුද්ගලයන් ගැන ගුරුවරුන් විසින් විශේෂයෙන් සැලකිය යුතු ය. එබඳු පුද්ගලයකු පැවිදි කිරීමේදී හිස-කේ කපවා ගෙන නා පිරිසිදු වී එන්නය කියා ප්‍රව්‍රජ්‍යාපේක්ෂකයා පිටත් කර නො යවා, භණ්ඩුකර්මයෙන් පසු ගුරුවරයාම ප්‍රව්‍රජ්‍යාපේක්ෂකයා ජලස්ථානයට කැඳවා ගෙන ගොස්, හිස-කේ කපා දීම හොඳම ක්‍රමය ය.

පැවිදි වන අවස්ථාව කුලපුත්‍රයකු ගේ සිත ඉතා ප්‍රසන්න අවස්ථාවෙකි. ඒ නිසා ඒ අවස්ථාවේදී කියා දෙන දෙය ඔහුගේ සිතට තදින් කා වැදෙන්නේ ය. හිස මුඩු කරන අවස්ථාව පැවිදි වන්නහුට 'තචපඤ්චක කමටහණ' කියාදීමට ඉතාම හොඳ අවස්ථාව ය. නුවණැති ගුරුවරුන් විසින් මේ අවස්ථාවෙහි කියාදුන් තචපඤ්චක කර්මස්ථානය මෙනෙහි කොට, එය අනුව සිත යවා, නාම-රූප ව්‍යවස්ථාව කරගෙන සංස්කාරයන්ගේ අනිත්‍යාදි ලක්ෂණත්‍රය දැක, සිවුසස් අවබෝධ කර-ගෙන උපනිශ්‍රය සම්පත්තිය ඇත්තාවූ ඇතැම් කුල පුත්‍රයෝ, හිස-කේ කපද්දීම මහඵල පිළිවෙළින් අර්හත්ත්වයට පැමිණ, සව්කෙ-ලෙසුන් නසා නිවන් දකිති. එසේ හිස-කේ කැපීමේදී රහත් වූ පුද්ගලයන් ගැන අපේ පොත-පතෙහි නොයෙක් තැන්වල සඳහන් වී ඇත්තේ ය.

එකෙණෙහිම රහත් වීමට තරම් හේතු සම්පත්තිය නැති කුල පුත්‍රයන්ට ද ඒ මොහොතේදී කියා දෙන දෙය තදින් සිතට වැදෙන බැවින් බොහෝ ප්‍රයෝජන වන්නේ ය. ප්‍රව්‍රජ්‍යාපේක්ෂකයාට මේ අවස්ථාවෙන් ප්‍රයෝජන වනු පිණිස, ගුරුවරයා විසින් තචපඤ්චක කර්මස්ථානය කියා දෙමින් පැවිදිවන්නහුගේ හිස බෑම කළ යුතු ය. ගුරුවරයාට හිස-කේ කැපිය නො හැකි වීමෙන් එය අනිකකු ලවා කරවත හොත්, ගුරුවරයා විසින් සමීපයෙහි සිට, ප්‍රව්‍රජ්‍යාපේක්ෂකයාට තචපඤ්චක කමටහණ කියා දිය යුතු ය. එසේ කරවීමට ගුරුවරයා විසින් අන්‍ය භික්ෂුවක් හෝ යෙදවිය යුතු ය. එය කිරිමේදී පළමුවෙන් කපන හිස-කේ රොද ප්‍රව්‍රජ්‍යාපේක්ෂකයාගේ අතේ තබා, එය හොඳින් බලා, එහි සැටි සිතට ගන්නා ලෙස පැවිදි වන තැනැත්තාට කියා, ඉක්බිති කමටහණ කියා දිය යුතු ය. එය කියා දිය යුත්තේ මෙසේ ය.

Non-commercial distribution

**තව පඝද්වක කර්මස්ථානය.**

ශරීරයේ කොටසක් වූ මේ කෙස්: දුගඳ නිසා ද, පිත්-සෙම්-ලේ-සැරව-මල-මූත්‍රාදි කැත කුණු නිසා හටගත් දෙයක් වන බැවින් ද, එක්තිස් කැත කුණු ගොඩේ ම හට-ගත් දෙයක් වන නිසා ද කැත දෙයකි.

ශරීරයෙහි කොටසක් වූ මේ ලොම්: දුගඳ නිසා ද, පිත්-සෙම්-ලේ-සැරව-මල මූත්‍රාදි කැත කුණු නිසා හටගත් දෙයක් වන බැවින් ද, එක්තිස් කැත කුණු ගොඩේ ම හට-ගත් දෙයක් වන නිසා ද කැත දෙයකි.

ශරීරයේ කොටසක් වූ මේ නියඃ දුගඳ නිසා ද, පිත්-සෙම්-ලේ-සැරව-මල-මූත්‍රාදි කැත කුණු නිසා හටගත් දෙයක් වන බැවින් ද, එක්තිස් කැත කුණු ගොඩේ ම හට-ගත් දෙයක් වන නිසා ද කැත දෙයකි.

ශරීරයේ කොටසක් වූ මේ දත්: දුගඳ නිසා ද, පිත්-සෙම්-ලේ-සැරව-මල-මූත්‍රාදි කැත කුණු නිසා හටගත් දෙයක් වන බැවින් ද, එක්තිස් කැත කුණු ගොඩේ ම හට-ගත් දෙයක් වන නිසා ද කැත දෙයකි.

ශරීරයේ කොටසක් වූ මේ සම: දුගඳ නිසා ද, පිත්-සෙම්-ලේ-සැරව-මල-මූත්‍රාදි කැත කුණු නිසා හටගත් දෙයක් වන බැවින් ද, එක්තිස් කැත කුණු ගොඩේ ම හට-ගත් දෙයක් වන නිසා ද කැත දෙයකි.

**ධාතු වශයෙන්:-**

ශරීරයේ කොටසක් වූ මේ කෙස්: සත්ත්වයකු නො වන, පුද්ගලයකු නො වන, ආත්මයක් නො වන, අයිති කරුවකු නැති පඨවි ධාතු කොටසකි.

ශරීරයේ කොටසක් වූ මේ ලොම්: සත්ත්වයකු නො වන, පුද්ගලයකු නො වන, ආත්මයක් නො වන, අයිති කරුවකු නැති පඨවි ධාතු කොටසකි.

Non-commercial distribution

ශරීරයේ කොටසක් වූ මේ නියඃ සත්ත්වයකු නො වන, පුද්ගලයකු නො වන, ආත්මයක් නො වන, අයිති කරුවකු නැති පඨවි ධාතු කොටසකි.

ශරීරයේ කොටසක් වූ මේ දත්ඃ සත්ත්වයකු නො වන, පුද්ගලයකු නො වන, ආත්මයක් නො වන, අයිති කරුවකු නැති පඨවි ධාතු කොටසකි.

ශරීරයේ කොටසක් වූ මේ සමඃ සත්ත්වයකු නො වන, පුද්ගලයකු නො වන, ආත්මයක් නො වන, අයිති කරුවකු නැති පඨවි ධාතු කොටසකි.

පැවිදි වන තැනැත්තා විසින් පැවිදි වීමෙන් පසු ද මේ භාවනාව නො හැර කළ යුතු ය.

හිස-කේ කැපීමෙන් පසු ගිහි ගඳ යන පරිදි සබන් ගා හොඳින් ඇඟ උලා නා පිරිසිදු විය යුතු ය. පැවිදි වන තැනැත්තා එසේ කර ගැනීමට නො සමත් තැනැත්තෙක් වේ නම් ගුරුවරයා විසින් ප්‍රව්‍රජ්‍යාපේක්ෂකයා නාවා පිරිසිදු කළ යුතු ය. එසේ කිරීමේදී පියකු ආදරනීය දරුවකු නාවන්නාක් මෙන් කැත නො සිතා, කරුණාවෙන් කළ යුතු ය. ඉක්බිති පිරිසිදු වත් හඳවා ප්‍රව්‍රජ්‍යාපේක්ෂකයා පැවිදි කරන තැනට කැඳවා ගෙන යා යුතු ය. පැවිදි වන තැනට පැමිණි පසු පැවිදි වන කුලපුත්‍රයාගේ මා-පියෝ එහි වෙත් නම්, පළමු කොට ඔවුන්ගේ පා වැඳ සමු ගෙන, උපාධ්‍යාචාර්‍යවරයා ඇතුළු රැස්ව සිටින භික්ෂූන් වහන්සේලාගේද පා වැඳ සිවුරු අතට ගෙන, උපාධ්‍යාචාර්‍යයන් වහන්සේ ඉදිරියෙහි උක්කුටිකයෙන් හිඳ, වැඳ-ගෙන පැවිද්ද අයැදිය යුතු ය. ඒ සඳහා කියන වාක්‍යය මෙසේ ය.

**ඔකාස! අහං භන්තෙ! පබ්බජ්ජං යාචාමි.**
**දුතියම්පි අහං භන්තෙ! පබ්බජ්ජං යාචාමි.**
**තතියම්පි අහං භන්තෙ! පබ්බජ්ජං යාචාමි.**

**සබ්බ දුක්ඛ නිස්සරණ නිබ්බාන සච්ඡිකරණත්ථාය ඉමං කාසාවං ගහෙත්වා පබ්බාජෙථ මං භන්තෙ! අනුකම්පං උපාදය.**

Non-commercial distribution

**දුතියම්පි සබ්බ දුක්ඛ නිස්සරණ නිබ්බාන සච්ඡිකරණත්ථාය ඉමං කාසාවං ගහෙත්වා පබ්බාජෙථ මං භන්තෙ! අනුකම්පං උපාදය.**

**තතියම්පි සබ්බ දුක්ඛ නිස්සරණ නිබ්බාන සච්ඡිකරණත්ථාය ඉමං කාසාවං ගහෙත්වා පබ්බාජෙථ මං භන්තෙ! අනුකම්පං උපාදය.**

මේ වාක්‍යය කියා උපාධ්‍යාචාර්‍යයන් වහන්සේ අතට තමාගේ සිවුරු පිළිගන්වා, නැවත ද උපාධ්‍යාචාර්‍යයන් වහන්සේ ඉදිරියෙහි උක්කුටිකව හිඳ වැඳ-ගෙන මේ වාක්‍යය කියනු.

**සබ්බ දුක්ඛ නිස්සරණ නිබ්බාන සච්ඡිකරණත්ථාය එතං කාසාවං දත්වා පබ්බාජෙථ මං භන්තෙ අනුකම්පං උපාදය. දුතියම්පි සබ්බ දුක්ඛ -පෙ- උපාදය. තතියම්පි සබ්බ දුක්ඛ -පෙ- උපාදය.**

මේ වාක්‍යය කියා ප්‍රව්‍රජ්‍යාපේක්ෂකයා සිවුරු ඉල්ලූ කල්හි, ගුරුවරයා විසින් සිවුරුපටිය ප්‍රව්‍රජ්‍යාපේක්ෂකයා ගේ කරෙහි ලා, හැඳ පොරොවා ගැනීමට තමන් අත තිබෙන සිවුරු ඔහුට දිය යුතු ය. ප්‍රව්‍රජ්‍යාපේක්ෂකයා විසින් ගුරුවරයාගෙන් ලත් ඒ සිවුරු ප්‍රත්‍යවේක්ෂා කොට හැඳ පොරොවා ගත යුතු ය. පැවිදි වන තැනැත්තා සිවුරු හැඳ පොරොවා ගැනීමට සමත් නොවේ නම්, ගුරුවරයා හෝ අනිකකු හෝ ඒවා හැඳ පොරොවා ගැනීමට උපකාර විය යුතු ය. මෙසේ ගුරුවරයකුගෙන් ලබා නොගෙන ගිහියකු විසින් සිවුරු හැඳීම නො කළ යුතු ය. පැවිද්ද ලබන තැනැත්තා කලින්ම සිවුරු හැඳ පොරවා ගෙන සිටිය හොත් ඒවා ඉවත් කර සිවුරු දී පැවිදි කළ යුතු ය. එසේ නො කොට සරණ සමාදනය කළේ ද පැවිද්ද නො පිහිටන්නේ ය. උපාධ්‍යායයන් වහන්සේගේ අණින් අනිකකු විසින් සිවුරු හැඳ වුව ද වටනේ ය. උපාධ්‍යායයන් වහන්සේ විසින් 'මේ සිවුරු මොහුට හඳවන්නය' යි කියා ගිහියකු අතට දුන හොත් උපාධ්‍යායයන්ගේ අණින් ගිහියකු විසින් සිවුරු හැඳවීම ද වටනේ ය. සිවුරු හැඳ පොරොවාගත් පසු ප්‍රව්‍රජ්‍යාපේක්ෂකයා නැවත ද උපාධ්‍යායයන් වහන්සේ වෙත ගොස්, පසඟපිහිටුවා පා වැඳ උක්කුටිකව වැඳ ගෙන හිඳ, තිසරණ සහිත පැවිදි දසසීලය මේ වාක්‍යය කියා ඉල්ලිය යුතු ය.

**ඔකාස! අහං භන්තෙ තිසරණෙන සද්ධිං පබ්බජ්ජා දසසීලං ධම්මං යාචාමි: අනුග්ගහං කත්වා සීලං දෙථ මෙ භන්තෙ. දුතියම්පි**

Non-commercial distribution

**අහං භන්තෙ -පෙ- මෙ භන්තෙ. තතියම්පි අහං භන්තෙ -පෙ- මෙ භන්තෙ අනුකම්පං උපාදය.**

මෙය කී කල්හි උපාධ්‍යායයන් වහන්සේ විසින් "**යමහං වදමි තං වදෙහි**" යි කියා නමස්කාර පාඨය කියවා ඉක්බිති-

**බුද්ධං සරණං ගච්ඡාමි.**
**ධම්මං සරණං ගච්ඡාමි.**
**සඞ්ඝං සරණං ගච්ඡාමි.**

**දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි.**
**දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි.**
**දුතියම්පි සඞ්ඝං සරණං ගච්ඡාමි.**

**තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි.**
**තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි.**
**තතියම්පි සඞ්ඝං සරණං ගච්ඡාමි.**

මෙසේ නිග්ගහිතාන්ත වශයෙන් වචන එකට සම්බන්ධ කොට හෝ "**බුද්ධම්, සරණම්, ගච්ඡාමි**" යනාදීන් මකාරාන්ත කොට වචන වෙන් කොට උච්චාරණය කිරීමෙන් හෝ සරණ සමාදනය කරවිය යුතු ය. මේ දෙයාකාරයෙන් ම සමාදන් කරවීම වඩා හොඳ ය. බොහෝ අචාර්‍ය්‍යවරු එසේ කරති. "පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි" යනාදි සිකපද නො කීයේ ද සරණ සමාදනයෙන් ම සාමණේර භාවයට පැමිණීම සිදු වේ. සිකපද කීම මෙහි ප්‍රධාන කරුණක් නො වේ.

ගිහියාගේ සරණ ගමනය චේතනාව ප්‍රධාන කරුණක් වන බැවින් කවර බසකින් කවර ආකාරයකින් සිකපද කීයේ ද සරණ ගමනය සිදු වේ. සාමණේරයන්ගේ සරණ ගමනය සිදුවන්නේ පාළිභාෂාවෙන් ම වචන නො වරදවා, අකුරු නො වරදවා, සථාන කරණ සම්පත්තිය ඇතිව, අකුරු හොඳාකාර කියැවෙන පරිදි ගුරුවරයා විසින් කියවීමෙන් හා ශෝලයා විසින් එසේ ම නො වරදවා කීමෙන් ය. ගුරු-ශෝල දෙදෙනා ගෙන් එක් අයකු වුව ද මනාකොට උච්චාරණය කිරීමට අසමත් වුවහොත් සරණ ගමනය සිදු නො වේ. දත් නැති මහල්ලන්ට ඒවා සම්පූර්ණ කොට

Non-commercial distribution

උච්චාරණය නො කළ හැකි ය. එ බැවින් දත් නැති මහලු තෙරුන් වහන්සේලා විසින් ගෝලයන් මහණ කිරීමේ දී අනිකකු ලවා සරණ සමාදනය කරවා ගත යුතු ය.

**උපාධ්‍යාය ග්‍රහණය.**

සාමණේර ශීලය සමාදන් වීමෙන් පසු පැවිද්ද ලැබූ තැනැත්තා විසින් උපාධ්‍යායයන් වහන්සේට වැඳගෙන උක්කුටිකයෙන් හිඳ, "**උපජ්ඣායො මෙ භන්තෙ හොහි**" යන වැකිය තුන් වරක් කියා උපාධ්‍යාය ග්‍රහණය කළ යුතු ය. ගෝලයා විසින් එසේ කී කල්හි උපාධ්‍යායයන් වහන්සේ විසින් "**පාසාදිකෙන සම්පාදෙහි**" යි කියා එය පිළිගත යුතු ය.

"**උපජ්ඣායො භික්ඛවෙ! සද්ධිවිහාරිකම්හි පුත්ත චිත්තං උපට්ඨපෙස්සති. සද්ධිවිහාරිකො උපජ්ඣායම්හි පිතුචිත්තං උපට්ඨපෙස්සති. එවං තෙ අඤ්ඤමඤ්ඤං සගාරවා සප්පතිස්සා සභාගවුත්තිකා විහරන්තා ඉමස්මිං ධම්මවිනයෙ වුඩ්ඪිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජන්ති**" යන බුඩ වචනය පරිදි සාමණේර නම විසින් උපාධ්‍යායයන් වහන්සේ තමාගේ පියා ලෙස සලකාගෙන, උපාධ්‍යායයන් වහන්සේ කෙරෙහි අත්‍යාදර ගෞරවයෙන් යුක්තව, උන් වහන්සේට සවිාකාරයෙන් කීකරුව වාසය කළ යුතු ය. උපාධ්‍යායයන් වහන්සේ විසින් ද තමන්ගේ සද්ධිවිහාරික සාමණේරයා පුත්‍රයකු මෙන් සලකා-ගෙන ඔහු කෙරෙහි කරුණාවත් විය යුතු ය. උපාධ්‍යායයන් වහන්සේ විසින් අභිනව සාමණේර නමට පා-සිවුරු දැරීම් ආදිය තමන් සමීපයේම වාසය කරවා ගෙන පුහුණු කර විය යුතු ය. ඒවා පුහුණුවන තුරු නිමන්ත්‍රණාදියට නො යවා ළදරුවකු රක්නාක් මෙන් අභිනව සාමණේරයා රැකිය යුතු ය. සාමණේරයකු විසින් රැකිය යුතු ශික්ෂාවන් උගන්වා දිය යුතු ය. සාමණේරයා විසින් ද-

"**අනුජානාමි භික්ඛවෙ! දසහඞ්ගෙහි සමන්නාගතං සාමණෙරං නාසෙතුං. පාණාතිපාතී හොති. අදින්නාදයී හොති. අබ්‍රහ්මචාරී හොති. මුසුවාදී හොති. මජ්ජපායී හොති. බුද්ධස්ස අවණ්ණං භාසති. ධම්මස්ස අවණ්ණං භාසති. සඞ්ඝස්ස අවණ්ණං භාසති. මිච්ඡාදිට්ඨිකො හොති. භික්ඛුනී දූසකො හොති**"

Non-commercial distribution

යනුවෙන් දැක්වෙන නාසනාඞ්ග දශය අතුරෙන් එකකුදු නො බිඳ, සුවචව වාසය කළ යුතුය. එයින් එකකුදු කඩ කළ හොත් සරණ ගමනයේ පටන් සම්පූර්ණ සාමණේර ශීලය බිඳේ. උපාධ්‍යාය ග්‍රහණය ද නැති වේ. සඞ්ඝාරාමයෙහි ඔහුට ලැබී තුබුණු සෙනසුනට ද හේ අහිමි වේ. සඞ්ඝලාභයට ද අහිමි වේ. ඔහු ආයති සංවරයෙහි පිහිටා, නැවත සරණ සමාදනය නො කරත හොත් ඒ සාමණේරයා සිවුරු හරවා සඟරමින් පහ කළ යුතු ය.

පරාජිකාවට පැමිණි සාමණේරයා තමාගේ වරද පිළිගෙන නැවත සංවරයෙහි පිහිටනු කැමති වුව හොත්, නැවත සරණ සමාදනය කරවා උපාධ්‍යායග්‍රහණය ද කරවිය යුතු ය. සාමණේරයන්ගේ සරණ ගමනය භික්ෂූන්ගේ උපසම්පද කර්මවාක්‍යය වැනිය. උපසම්පද කර්මවාක්‍යය කීමෙන් භික්ෂුවගේ චතුපාරිශුඞ් ශීල සමාදනය සිදුවන්නාක් මෙන්, සරණ සමාදනයෙන් ම සාමණේරයන්ගේ දශශීල සමාදනය ද සිදු වේ. එහෙත් ආයති සංවරයෙහි පිහිටීම පිණිස හා දළ්හිකරණය පිණිස සරණ සමාදනය කරවීමෙන් පසු සිකපද දශය ද සමාදන් කරවිය යුතු ය. නාසනාඞ්ග දශයට අයත් නොවන වරදක්, සාමණේරයා අතින් සිදු වුව හොත්, ඒ වරදට දිය-දඬුවම්, වැලි-දඬුවම් ආදි යම් කිසි දඬුවමක් කළ යුතු ය. දඬුවම් කර ආයති සංවරයෙහි පිහිටීමෙන් ශීලය පිරිසිදු වේ. නැවත සිකපද සමාදන් නුවූවාට වරදක් නැත.

## පැවිදි කිරීමට නුසුදුස්සෝ

'පැවිදි කරනු ලැබුවාහු ද පැවිද්ද නො පිහිටන, සර්වාකාරයෙන් පැවිද්දට අභව්‍ය පුද්ගලයෝ ය, පැවිදි කරනු ලැබුව හොත් පැවිද්ද පිහිටන-පැවිදි බවට නො හොබනා බැවින් පැවිද්ද තහනම් කර ඇති පුද්ගලයෝ ය' යි පැවිද්දට නුසුදුසු පුද්ගලයෝ දෙකොටසකි. නුසුදුස්සන් පැවිදි බවට පත් කිරීමෙන් ගුරුවරයාට දුකුළා ඇවැත් වේ.

**පැවිද්දට අභව්‍ය පුද්ගලයෝ එකොළොස් දෙන.**

පණ්ඩකො භික්ඛවෙ! අනුපසම්පන්නො න උපසම්පා-දෙතබ්බො, උපසම්පන්නො නාසෙතබ්බො.

Non-commercial distribution

උභතොබ්‍යඤ්ජනකො භික්ඛවෙ! අනුපසම්පන්නො න උපසම්පාදෙතබ්බො, උපසම්පන්නො නාසෙතබ්බො.

ථෙය්‍යසංවාසකො භික්ඛවෙ! අනුපසම්පන්නො න උපසම්පාදෙතබ්බො, උපසම්පන්නො නාසෙතබ්බො.

තිත්ථියපක්කන්තකො භික්ඛවෙ! අනුපසම්පන්නො න උපසම්පාදෙතබ්බො, උපසම්පන්නො නාසෙතබ්බො.

තිරච්ඡානගතො භික්ඛවෙ! අනුපසම්පන්නො න උපසම්පාදෙතබ්බො, උපසම්පන්නො නාසෙතබ්බො.

මාතුඝාතකො භික්ඛවෙ! අනුපසම්පන්නො න උපසම්පාදෙතබ්බො, උපසම්පන්නො නාසෙතබ්බො.

පිතුඝාතකො භික්ඛවෙ! අනුපසම්පන්නො න උපසම්පාදෙතබ්බො, උපසම්පන්නො නාසෙතබ්බො.

අරහන්තඝාතකො භික්ඛවෙ! අනුපසම්පන්නො න උපසම්පාදෙතබ්බො, උපසම්පන්නො නාසෙතබ්බො.

ලොහිතුප්පාදකො භික්ඛවෙ! අනුපසම්පන්නො න උපසම්පාදෙතබ්බො, උපසම්පන්නො නාසෙතබ්බො.

සඞ්ඝභෙදකො භික්ඛවෙ! අනුපසම්පන්නො න උපසම්පාදෙතබ්බො, උපසම්පන්නො නාසෙතබ්බො.

භික්ඛුනීදූසකො භික්ඛවෙ! අනුපසම්පන්නො න උපසම්පාදෙතබ්බො, උපසම්පන්නො නාසෙතබ්බො.

මේ විනය ප්‍රඥප්ති එකොළොසෙහි දැක්වෙන **පණ්ඩකය**, **උභතොබ්‍යඤ්ජනකය**, **ථෙය්‍යසංවාසකය**, **තිත්ථියපක්කන්තකය**, **තිරච්ඡානගතය**, **මාතුඝාතකය**, **පිතුඝාතකය**, **අරහන්තඝාතකය**, **ලොහිතුප්පාදකය**, **සඞ්ඝභෙදකය**, **භික්ඛුනීදූසකය** යන පුද්ගලයෝ එකොළොස් දෙන පැවිද්දටත් උපසම්පදාවටත් අභව්‍යයෝ ය. පැවිදි කරනු ලැබුවාහු ද ඔවුනට පැවිද්ද නො පිහිටන්නේ ය. උපසම්පද කරනු ලැබුවාහුද උපසම්පදාව නො පිහිටන්නේ ය.

Non-commercial distribution

**'පණ්ඩක'** යනු ලිඞ්ගවිකලත්වය ඇති පුද්ගලයෝ ය. 'ආසිත්තපණ්ඩකය, උසූයපණ්ඩකය, ඔපක්කමිකපණ්ඩකය, පක්ඛපණ්ඩකය, නපුංසකපණ්ඩකය' යි පණ්ඩකයෝ පස් දෙනෙකි. අනුන්ගේ අඞ්ගජාතය මුවින් ගෙන අසුචිය උරා ගැනීමෙන් කාම පරිළාහය සන්සිඳවා ගන්නා තැනැත්තා ආසිත්තපණ්ඩක නම්. අනුන්ගේ මෛථුන සේවනය බලා සිට එයින් කාම පරිළාහය සන්සිඳවා ගන්නා තැනැත්තා උසූයපණ්ඩක නම්. සූනබ-ගවාදීන්ට කරන්නාක් මෙන් බීජෝත්පාටනය කරන ලද තැනැත්තා ඔපක්කමික පණ්ඩක නම්. අකුශල කර්මබලයෙන් මාසයේ අවපක්ෂ-යෙහි දී පණ්ඩක බවට පැමිණෙන තැනැත්තා පක්ඛ පණ්ඩක නම්. උත්පත්තියෙන්ම ස්ත්‍රී පුරුෂ ලිඞ්ගයන් නැති තැනැත්තා නපුංසක පණ්ඩක නම්. මේ පණ්ඩකයන් පස් දෙනා අතුරෙන් ආසිත්ත උසූය පණ්ඩකයන් දෙදෙනාට ප්‍රව්‍රජ්‍යාව අනිවාරිත ය. ඉතිරි තිදෙනා පැවිද්දට නො නිස්සෝ ය. එයිනුදු පක්ෂපණ්ඩකයාට පැවිද්ද නිවාරිත වන්නේ පණ්ඩකව වෙසෙන පක්ෂයේදී ය. ඒ පක්ෂයේදී හේ කාම පරිළාහයෙන් උමතු වේ. ආසිත්ත උසූය පණ්ඩකයන් දෙදෙනාට ඇති වන කාම පරිළාහය යෝනිසෝමනස්කාරාදියෙන් සන්සිඳවා ගත හැකි ය. පක්ඛ පණ්ඩකයාගේ කාම පරිළාහය එසේ නො සන්සිඳ විය හැකි ය. ඒ කාලයේ ඔහු පැවිද්දට නුසුදුස වන්නේ එහෙයිනි.

**'උභතො බ්‍යඤ්ජනක'** යනු ස්ත්‍රී පුරුෂ නිමිති දෙකම පිහිටා ඇති පුද්ගලයා ය. 'ස්ත්‍රී උභතො බ්‍යඤ්ජනකය, පුරුෂ උභතොබ්‍යඤ්ජනකය ය' යි උභතො බ්‍යඤ්ජනකයෝ දෙදෙනෙකි. ඔවුන්ගෙන් ස්ත්‍රී උභතො බ්‍යඤ්ජනකයා ගැබ් ගැනීමට හා ස්ත්‍රීන්ට ගැබ් ගැන්වීමට ද සමත් වේ. පුරුෂ උභතො බ්‍යඤ්ජනකයා ස්ත්‍රීන්ට ගැබ් ගන්වන නමුත් තෙමේ ගැබ් නො ගනී. කාමරතියේදී ස්ත්‍රී පුරුෂ කෘත්‍ය දෙකම සිදු කිරීමට දෙදෙනා ම සමත් වෙති.

**'ලිඞ්ගථෙය්‍යනක ය, සංවාසථෙය්‍යනක ය, උභයථෙය්‍යනක ය'** යි ථෙය්‍ය සංවාසකයෝ තිදෙනෙකි. ගුරුවරයකු ගෙන් පැවිද්ද නො ලබා, තෙමේ ම සිවුරු හැඳ පොරොවා ගෙන, භික්ෂු වස් ගණනක් නොපවසන්නා වූ, වැඩිමහළු පිළිවෙළින් වන්දනාව

Non-commercial distribution

නො ඉවසන්නා වූ, අසුන් ගැනීමෙන් අන් භික්ෂුවකට බාධා නො කරන්නා වූ, විනය කර්මවලට සහභාගි නො වන්නා වූ ශ්‍රමණ වේශය පමණක් සොරෙන් ගෙන සිටින තැනැත්තා **ලිංගස්තේනක** නම් වේ. භික්ෂූන් අතින් සාමණේර පැවිද්ද පමණක් ලබා විදේශයකට ගොස්, 'මම මෙ පමණ වස් ඇතියෙක්මි' යි බොරු වස් ගණන් කියන්නා වූ ද, වැඩිමහළු පිළිවෙළින් භික්ෂූන්ගෙන් වැඳුම් පිළිගන්නා වූ ද, අසුන් ගැනීමෙන් භික්ෂූන්ට බාධා කරන්නා වූ ද,විනය කර්මවලට පෙනී සිටින්නා වූ ද තැනැත්තා සංවාසය පමණක් සොරෙන් කරන බැවින් **සංවාසස්තේනක** නමි. තමා ම සිවුරු පොරවා ගෙන විහාරයට ගොස් වස් ගණන් කියන්නා වූ ද, භික්ෂූන් ගේ වැඳුම් ඉවසන්නා වූ ද, අසුන් ගැනීමෙන් භික්ෂූන්ට බාධා කරන්නා වූ ද, විනය කර්ම වලට සහභාගි වන්නා වූ ද, තැනැත්තා **උභයස්තේනක** නමි. ථෙය්‍යසංවාසකයන් පිළිබඳ දීර්ඝ විස්තරයක් **සමන්තපාසාදිකාවෙහි** ඇත්තේ ය. එය බලාගත යුතු ය.

**'තිත්ථිය පක්කන්තක'** යනු බුදු-සස්නෙහි පැවිදිව භික්ෂුවක්ව සිට පසුව තීර්ථක ප්‍රව්‍රජ්‍යාව හා ඔවුන් ගේ ලබ්ධිය ද ගත් තැනැත්තා ය.

**'තිරච්ඡානගතය'** යන මෙයින් අදහස් කරන්නේ තිරිසනුන් පමණක් නො ව, මනුෂ්‍ය ජාතියට අයත් නො වූ නාග-සුපර්න-දේව-බ්‍රහ්මාදි සියල්ලන් ය. ප්‍රව්‍රජ්‍යාව මනුෂ්‍යයන්ට පමණක් හිමි දෙයකි.

**'මාතුඝාතකයාය'** යනු ආනන්තර්‍ය්‍ය කර්මයන්ට අයත් මාතෘඝාත කර්මය කළ තැනැත්තා ය. ඒ කර්මය සිදුවන්නේ මනුෂ්‍ය ජාතියට අයත් දරුවකු විසින් මනුෂ්‍ය ජාතියට ම අයත් වූ මවකගේ ජීවිතය ඕනෑකමින් ම නැසීමෙනි.

**'පිතුඝාතකයා'** ගැන කිය යුත්තේ ද එසේ ම ය. මරනු ලබන තැනැත්තා තමාගේ පියා බව නො දැන වුවද මැරීමෙන් ආනන්තර්‍ය්‍ය කර්මය සිදුවේ. විස්තර සමන්තපාසාදිකාවෙන් බලා ගත යුතු. **'බෞද්ධයාගේ අත්පොතෙහි'** ද ඒ කර්ම ගැන විස්තරයක් ඇත්තේ ය.

Non-commercial distribution

**'අරහන්තඝාතකයා'** ද මනුෂ්‍ය රහතුන්ගේ වශයෙන්ම කිය යුතු ය. පැවිදි වූ හෝ නො වූ හෝ මනුෂ්‍ය ජාතික රහත් කෙනකුගේ ජීවිතය මනුෂ්‍යයකු විසින්ම ඕනෑකමින් නැසුව හොත් ආනන්තර්‍ය්‍ය කර්‍මය වේ. ඔහුට ප්‍රව්‍රජ්‍යාව නො ලැබිය හැකි ය. මනුෂ්‍ය නො වන රහත් කෙනකු මැරුව හොත් බරපතල පවක් පමණක් වේ. ආනන්තර්‍ය්‍ය කර්මයක් නො වේ. තිරිසනෙක් මනුෂ්‍ය ජාතික රහතන් වහන්සේ කෙනකුගේ ජීවිතය නැසුවේ ද ආන්නතර්‍ය්‍ය කර්මය සිදු නො වේ. බරපතල පාපයක් පමණක් වේ.

**'ලොහිතුප්පාදකයාය'** යනු දේවදත්ත මෙන් නපුරු සිතින් ජීවමාන බුදුවරයකුගේ ශරීරයෙන් එක් බිංදුවක් පමණ වූ ලේ සෙලවූ තැනැත්තා ය. ඔහුට පැවිද්ද හා උපසම්පදව වාරිත ය. ආබාධයක් සුව කරනු පිණිස මෛත්‍රී සහගත සිතින් බුඩ ශරීරයෙන් ලේ බැහැර කරන්නා හට පිනක් මිස පාපයක් නො වේ.

**'සඞසභේදකයාය'** යනු දේවදත්ත මෙන් චතුර්විධ විනය කර්මයන් අතුරෙන් යම් කිසි කර්මයක් කිරීම් වශයෙන් සඞසයා බිඳින තැනැත්තා ය. එය උපසම්පන්නයකු විසින් මිස අනුපසම්පන්නයකු විසින් නො කළ හැකි කර්මයෙකි.

**'භික්ඛුනීදූසකයාය'** යනු මාර්ගත්‍රයෙන් එක්තරා මාර්ගයෙක්හි ප්‍රකෘති භික්ෂුණියක් දූෂණය කළ තැනැත්තා ය. ඔහුට ප්‍රව්‍රජ්‍යාව හා උපසම්පදව වාරිත ය. කාය සංසර්ගයෙන් භික්ෂුණියක ගේ ශීලය විනාශ කළ තැනැත්තාට ප්‍රව්‍රජ්‍යාව හා උපසම්පදව අවාරිත ය.

**පැවිදි කළහොත් පැවිද්ද පිහිටන**
**පැවිදි නො කල යුතු පුද්ගලයෝ.**

**"න භික්ඛවෙ! අනනුඤ්ඤාතො මාතා පිතූහි පුත්තො පබ්බාජෙතබ්බො. යො පබ්බාජෙය්‍ය ආපත්ති දුක්කටස්ස"** යනු විනය ප්‍රඥප්ති බැවින් මා පියන් විසින් නො අනුදත් කුල පුත්‍රයන් පැවිදි නො කළ යුතු ය. වරක් මා පියන්ගේ අනුදැනීම ලැබ පැවිදි වූ තැනැත්තා සිවුරු හැර ගොස් නැවත පැවිදි වීමට පැමිණියේ ද, නැවතත් මාපියන් ගේ අනුදැනීම නො ලබා පැවිදි නො කළ යුතු

Non-commercial distribution

ය. යම් කිසි දරුවකු "මොහු නුඹවහන්සේලාටම භාර කරමිය, නුඹ-වහන්සේලා කැමති විටෙක මොහු පැවිදි කරන්නට ය" කියා මා පියන් විසින් භාරකරන ලද්දේ වේ නම්, කොතෙක් වර සිවුරු හැර ගියේ ද ආ ආ විට මා පියන් නො විචාරා ඒ දරුවා පැවිදි කළ යුතු ය. මා පියන් හා කලහකොට විහාරයට අවුත් පැවිද්ද ඉල්ලා සිටින කෙනකුට මා පියන්ගේ අවසරය ඉල්ලා ගෙන එන්නට ය යි කී කල්හි හේ "මම මා පියන් වෙත නො යමි, මා පැවිදි නො කළහොත් ජීවිතය හෝ නසා ගන්නෙමි, නුඹ වහන්සේලාට හෝ අනර්ථයක් කරමි" යි කියා නම් ඔහුගේ ආරක්ෂාව පිණිස පැවිදි කරන්නට වටනේ ය. එසේ පැවිදි කරනු ලැබුවකු ගැන ඔහුගේ මා පියන් අවුත් විචාළ හොත් කාරණය ඔවුනට දැන්විය යුතු ය.

**"න භික්ඛවෙ! පඤ්චහි ආබාධෙහි ඵුට්ඨො පබ්බාජෙතබ්බො. යො පබ්බාජෙය්‍ය ආපත්ති දුක්කටස්ස"** යනු විනය ප්‍රඥප්ති බැවින් පඤ්චාබාධයන් අතුරෙන් යම් කිසි ආබාධයක් ඇතියෙකු පැවිදි නො කළයුතු ය. පඤ්චාබාධයෝ නම්, **කුට්ඨ, ගණ්ඩ, කිලාස, සෝස, අපමාර** යන නම්වලින් කියන ආබාධයෝ ය.

**'කුට්ඨ'** යනු රතුලප, කළුලප, දද ආදි සමෙහි හට ගන්නා රෝගයෝ ය. සුළඟිල්ලේ නිය පිට තරම් වූ ද වර්ධනය වන පක්ෂයෙහි සිටි කුෂ්ඨයක් ඇතියෙකු පැවිදි නො කළ යුතු ය. සිවුරුවලට වැසෙන තැනක ඩුව වන අතට හැරී ඇති නිය පිට පමණට කුඩා කුෂ්ඨයක් ඇති තැනැත්තා පැවිදි කිරීම සුදුසු ය. කුෂ්ඨ රෝගියකුට පිළියම් කරවා පැවිදි කිරිමෙහිදී ද සමේ ප්‍රකෘති පැහැය ඇති වූ කල්හිම පැවිදි කළ යුතු ය. ගොයෙකුගේ පිටෙහි සේ අලු මතුවන ශරීරය ඇතියේ ද පැවිදි නො කළ යුතු ය යි විනය අටුවාවෙහි කියා ඇත්තේ ය.

**'ගණ්ඩ'** යනු දෙඹගෙඩි-දෙහිගෙඩි සේ ශරීරයෙහි ඒ ඒ තැන හටගන්නා වූ නො පැසෙන්නා වූ ගෙඩි ය. ඒවාට වායු ගෙඩි යයි ද සමහරු කියති. ඩෙබර ගෙඩියක් පමණ වූ ද වැඩෙන ගෙඩියක් ඇති තැනැත්තා පැවිදි නො කළ යුතු ය. ඩෙබර ගෙඩියක් පමණ කුඩා වූ නො වැඩෙන ගෙඩියක් වැසෙන

Non-commercial distribution

තැනක ඇති තැනැත්තේ පැවිදි කරන්නට වටනේ ය. මුහුණ ආදි නො වැසෙන තැනක නො වැඩෙන ගෙඩි ඇත්තේ ද පැවිදි නො කළ යුතු ය. ගෙඩිවලට පිළියම් කොට පැවිදි කිරීමෙහිදී ද, සම ප්‍රකෘතිමත් වූවාට පසුවම පැවිදි කළ යුතු ය. වණය තිබියදී නො පැවිදි කළ යුතු ය.

**'කිලාස'** යනු රත්-පියුම්, හෙළ-පියුම් පෙති පැහැයට සමෙහි හටගන්නා වියලි කුෂ්ඨ විශේෂයකි. දැනට බොහෝ සෙයින් දක්නට ලැබෙන සුදු කබර රෝගය කිලාසය ය. මේ රෝගය ඇතියන් ගැන ද කුෂ්ඨ රෝගීන්ට කී පරිදි පිළිපැදිය යුතු යි.

**'සෝස'** යනු දිනෙන් දින මඳින් මඳ ශරීරය ගෙවා වියලවා රෝගියා මරුමුවට පමුණුවන ක්ෂය රෝගය ය.

**'අපමාර'** යනු මිනිසා සිටි සැටියේම සිහිසන් නැති වී බිම ඇද වැටී, සමහර විට මුවින් සෙම හා ලේ ද පෙරමින් දඟලන බිම සැපෙන අපස්මාර රෝගය ය. එය යක්ෂ රෝගයකැ යි කියති.

**"න භික්ඛවෙ! රාජභටො පබ්බාජෙතබ්බො. යො පබ්බාජෙය්‍ය, ආපත්ති දුක්කටස්ස"** යනු විනය ප්‍රඥප්ති බැවින් රාජභටයා පැවිදි නො කළ යුතු ය. යම් කිසි කාර්‍ය්‍යයක් කිරීම ගැන රජකෙනකු ගෙන් හෝ රජයකින් හෝ වැටුප් ලබමින් සිටින තැනැත්තා 'රාජභට' නම් වේ. ඒ අය රජසේවයෙන් අස් වූ පසු පැවිදි කිරීම වටනේ ය.

**"න භික්ඛවෙ! ධජබන්ධො චොරො පබ්බාජෙතබ්බො. යො පබ්බාජෙය්‍ය ආපත්ති දුක්කටස්ස"** යි වදාළ බැවින් බරපතල සොරකම් කරන ප්‍රසිද්ධ සොරා පැවිදි නො කළ යුතු ය. කලින් ප්‍රසිද්ධ සොරකු ව සිට පසුව එය අත්-හැර සුමගට බැස සිටින, මහ ජනයා ද ඒ බව දන්නා තැනැත්තා පැවිද්දට සුදුසු ය. සමහර විට සුළු සුළු සොරකම් කළත් සොරකු වශයෙන් ප්‍රසිද්ධියක් නැති තැනැත්තාට පැවිද්ද දිය යුතු ය.

**"න භික්ඛවෙ! කාරභෙදකො චොරො පබ්බාජෙතබ්බො. යො පබ්බාජෙය්‍ය ආපත්ති දුක්කටස්ස"** යනු විනය නීති බැවින්

Non-commercial distribution

බන්ධනයෙන් පලා-ගිය සොරා ද පැවිදි නො කළ යුතු ය. සිරගෙයකින් පලාගිය තැනැත්තාය, තැනකින් තැනකට ගෙන යාමේදී ආරක්ෂක පුරුෂයන් අතින් පළා-ගිය තැනැත්තාය, මේ පෙදෙසින් පිට නො යා යුතුය යි නියමයක් කර තිබියදී ඒ පෙදෙසින් පලා-ගිය තැනැත්තා ය යන සැම දෙනාම පැවිදි කිරීමට නුසුදුස්සෝ ය. දැහැමින් ජීවත් වෙමින් සිටියදී අනුන්ගේ කේලාම් කීම නිසා බන්ධනයට හසු වී එයින් පළා-ගිය තැනැත්තා ඒ පෙදෙසේ ම පැවිදි නො කළ යුතු ය. ඔහු අන් පෙදෙසකදී පැවිදි කළ හැකි ය.

"**න භික්ඛවෙ! ලිඛිතකො චොරො පබ්බාජෙතබ්බො. යො පබ්බාජෙය්‍ය ආපත්ති දුක්කටස්ස**" යනු විනය නීති බැවින් ඇල්ලීම සඳහා හෝ දඬුවම් කරනු සඳහා රජයෙහි ලියා ඇති සොරා පැවිදි නො කළ යුතු ය.

"**න භික්ඛවෙ! කසාහතො කතදණ්ඩකම්මො පබ්බාජෙතබ්බො. යො පබ්බාජෙය්‍ය ආපත්ති දුක්කටස්ස**" යනු විනය නීති බැවින් කසයෙන් හෝ අනිකකින් හෝ දඬුවම් පිණිස තළනු ලැබූ තැනැත්තා පැවිදි නො කළ යුතු ය. කී දේ නො කිරීම නිසා තළනු ලැබූ තැනැත්තා පැවිදි කළ හැකි ය. පැවිදි නො කළ යුත්තේ බදු නො ගෙවීම්, ණය නො ගෙවීම් ආදියට දඬුවම් වශයෙන් තළනු ලැබූ තැනැත්තා ය. ඒ තැනැත්තා වුව ද තුවාල සුව වීමෙන් පසු පැවිද්ද ලැබීමට නිසි ය.

"**න භික්ඛවෙ! ලක්ඛණාහතො කතදණ්ඩකම්මො පබ්බාජෙතබ්බො. යො පබ්බාජෙය්‍ය ආපත්ති දුක්කටස්ස**" යනු විනය නීති හෙයින් දඬුවම් වශයෙන් පිලිස්සීම් ආදියෙන් ශරීරයේ ලකුණු තබා ඇති තැනැත්තා පැවිදි නො කළ යුතු ය. ලකුණු තබා ඇති තැනැත්තා නිදහස් පුද්ගලයකු වේ නම්, තුවාල සුව වී වණ කැලැල් මැකී ගිය පසු පැවිදි කළ හැකි ය. තෙමඩුළු වසා සිවුරු පෙරවූ කල්හි නො පෙනෙන තැන්වල කැලැල් ඇති තැනැත්තා ද පැවිදි කළ හැකි ය.

"**න භික්ඛවෙ! ඉණායිකො පබ්බාජෙතබ්බො. යො පබ්බාජෙය්‍ය ආපත්ති දුක්කටස්ස**" යනු වදළ බැවින් ණය කාරයන් පැවිදි

Non-commercial distribution

නො කළ යුතු ය. පැවිදි වන තැනැත්තා ගේ ණය ගෙවීමට ඔහුගේ නෑයෙක් හෝ දයකයෙක් හෝ බාර ගනී නම් පැවිදි කළ හැකි ය. ණය ගෙවීමට ධනයක් ගුරුවරයා වෙත තිබේ නම්, ණය හිමියන්ට ඒවා දී නිදහස් කරගන්නා අටියෙන් ණයකාරයා පැවිදි කළ හැකි ය. පසුව ධනය සපයා ණය ගෙවන්නට සිතා පැවිදි නො කළ යුතු ය. ණයකාරයකු බව නො දැන පැවිදි කිරීමෙන් ගුරුවරයාට ඇවැත් නො වේ.

**"න භික්ඛවෙ! දසො පබ්බාජෙතබ්බො, යො පබ්බාජෙය්‍ය ආපත්ති දුක්කටස්ස,** යනු වදළ බැවින් දසයා ද පැවිදි නො කළ යුතු ය. මෙකල දසයන් නො මැති බැවින් මේ ගැන විස්තරයක් නො කරනු ලැබේ. අටුවාවෙහි මෙය ගැන විශාල විස්තරයක් ඇත්තේ ය.

**පැවිදි නො කළ යුත්තෝ දෙතිස් දෙනෙක්.**

**"න භික්ඛවෙ! හත්ථච්ඡින්නො පබ්බාජෙතබ්බො. න පාදච්ඡින්නො පබ්බාජෙතබ්බො. න හත්ථපාදච්ඡින්නො පබ්බාජෙතබ්බො. න කණ්ණච්ඡින්නො පබ්බාජෙතබ්බො. න නාසච්ඡින්නො පබ්බාජෙතබ්බො. නකණ්ණනාසච්ඡින්නො පබ්බාජෙතබ්බො. න අඞ්ගුලිච්ඡින්නො පබ්බාජෙතබ්බො. න අළච්ඡින්නො පබ්බාජෙතබ්බො. න කණ්ඩරච්ඡින්නො පබ්බාජෙතබ්බො. න ඵණහත්ථො පබ්බාජෙතබ්බො. න ඛුජ්ජො පබ්බාජෙතබ්බො. න වාමනො පබ්බාජෙතබ්බො. න ගලගණ්ඩී පබ්බාජෙතබ්බො. න ලක්ඛණාහතො පබ්බාජෙතබ්බො. න කසාහතො පබ්බාජෙතබ්බො. න ලිඛිතකො පබ්බාජෙතබ්බො. න සීපදී පබ්බාජෙතබ්බො. න පාපරොගී පබ්බාජෙතබ්බො. න පරිසදූසකො පබ්බාජෙතබ්බො. න කාණො පබ්බාජෙතබ්බො. න කුණී පබ්බාජෙතබ්බො. න ඛඤ්ජො පබ්බාජෙතබ්බො. න පක්ඛහතො පබ්බාජෙතබ්බො. න ඡින්නිරියාපථො පබ්බාජෙතබ්බො. න ජරාදුබ්බලො පබ්බාජෙතබ්බො. න අන්ධො පබ්බාජෙතබ්බො. න මූගො පබ්බාජෙතබ්බො. න බධිරො පබ්බාජෙතබ්බො. න අන්ධමූගො පබ්බාජෙතබ්බො. න අන්ධබධිරො පබ්බාජෙතබ්බො. න මූගබධිරො පබ්බාජෙතබ්බො. න අන්ධමූගබධිරො පබ්බාජෙතබ්බො. යො පබ්බාජෙය්‍ය ආපත්ති දුක්කටස්ස.**

Non-commercial distribution

තථාගතයන් වහන්සේ විසින් විනයෙහි මෙසේ වදරා ඇති බැවින් අත් සුන් තැනැත්තාය, පා සුන් තැනැත්තාය, අත්-පා සුන් තැනැත්තාය, කන් සුන් තැනැත්තාය, නාස් සුන් තැනැත්තාය, කන් නාස් සුන් තැනැත්තාය, මහ ඇඟිලි සුන් තැනැත්තාය, සුළඟිලි සුන් තැනැත්තාය, මහ නහර සුන් තැනැත්තාය, පෙණ අත් ඇතියාය, කුදය, අඟුටුමිට්ටාය, ගෙළෙහි ගෙඩි ඇති තැනැත්තාය, දඬුවම් පිණිස කළ ලකුණු ශරීරයෙහි ඇති තැනැත්තාය, කසයෙන් තැළූ ලකුණු ඇති තැනැත්තාය, අපරාධ කාරයකු වශයෙන් රජයේ ලියා ඇති තැනැත්තාය, බරවා රෝගය ඇති තැනැත්තාය, පාපරෝග ඇති තැනැත්තාය, පරිසදූසකයාය, කණාය, කුදය, කොරාය, ශරීරයෙන් පක්ෂයක් පණ නැති තැනැත්තාය, පිළාය, ජරා දුර්වලයාය, අන්ධයාය, ගොලුවාය, බිහිරාය, අන්ධ ගොලුවාය, අන්ධ බිහිරාය, ගොලු බිහිරාය, අන්ධ ගොලු බිහිරාය යන මොවුහු පැවිදි නො කළ යුත්තාහුය. පැවිදි කළ හොත් ගුරුවරයාට දුකුළා ඇවැත් වේ.

නියෙන් මදක්වත් ඉතිරි වන ලෙස ඇඟිලි අග පමණක් සුන් තැනැත්තා පැවිදි කළ හැකි ය. නිය ඉතිරි නො වන පරිදි එක ඇඟිල්ලක් වුවද සුන් තැනැත්තා පැවිදි නො කළ යුතු ය.

මහ නහර සුන් තැනැත්තාය යනු නහර සිඳී යාම නිසා පතුල සම්පූර්ණයෙන් බිම තැබිය නො හී, ඇඟිලි අග පමණක් හෝ විළුඹ පමණක් හෝ බිම තබමින් ගමන් කරන තැනැත්තා ය.

පෙණ අත් ඇතියාය යි කියනුයේ ඒකාබද්ධ ඇඟිලි ඇති තැනැත්තා ය.

පාප රෝගියා යනු ඇදුම-අර්ශස්-භගන්දරා-කාස ආදි යම් කිසි රෝගයකින් පෙළෙන, ජනයා විසින් පිළිකුල් කරන තැනැත්තා ය.

පරිසදූසකයාය කියනුයේ විරූපත්වයෙන් පිරිස කැත කරන තැනැත්තා ය. අන්‍යයන්ගේ හිස් තමන් ගේ තුනටිය තරමට සිටින ඉතා උස් පුද්ගලයෝ ය, භෛරව රූප බඳු ඉතා මිටි පුද්ගලයෝය,

Non-commercial distribution

දැවුණු කොටයක් බඳු ඉතා කළු පුද්ගලයෝය, හුණු බිත්තියක් බඳු ඉතා සුදු පුද්ගලයෝ ය, ඇට සම පමණක් ඇති සේ පෙනෙන ලේ මස් ඉතා මඳ ප්‍රේතයන් බඳු ඉතා කෘශ ශරීර ඇත්තෝය, පරිහරණය කිරීමට දුෂ්කර වන තරමට ඉතා ස්ථූල ශරීර ඇත්තෝය, පිශාචයන්ට බඳු මහෝදර ඇත්තෝය, ඔසවා සිටිය නො හෙන පමණට මහත් හිස් ඇත්තෝය යනාදීහු පරිසදූසකයෝ ය. පරිසදූසකයන් ගැන දීඝී විස්තරයක් **විනය අටුවාවෙහි** ඇත්තේ ය. පරිසදූසකයන් බොහෝ දෙනෙකුන් එහි දක්වා ඇත්තේ ය.

### පැවිදි කිරීමේ වයස

"**න භික්ඛවෙ! ඌනපණ්ණරසවස්සො දරකො පබ්බා-ජෙතබ්බො. යො පබ්බාජෙය්‍ය ආපත්ති දුක්කටස්ස.**" යනුවෙන් බුදුරජාණන් වහන්සේ වරක් පසළොස් අවුරුද්දකට අඩු වයස් ඇති කුලදරුවන් පැවිදි නො කළ යුතු බව වදාළ සේක.

පසු කාලයේදී ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේගේ උපස්ථායක වූ ඉතා සැදැහැවත් පවුලක් අහිවාතක රෝගයෙන් කාලක්‍රියා කළෝ ය. ඒ පවුලේ ළදරුවෝ දෙදෙනෙක් ඉතිරි වූහ. භික්ෂූන් දක්නා කල්හි පළමු පුරුද්ද නිසා ඔවුහු උන්වහන්සේලා වෙත දුව එති. භික්ෂූහු ඔවුන් එළවා ගනිති. භික්ෂූන්ගෙන් අනුකම්පාවක් නො ලබන්නා වූ ඒ දරුවෝ හඬති. ඔවුන්ගේ දුක ගැන ආනන්ද ස්ථවිරයන් වහන්සේගේ සිත උණු වී, "බුදුන් වහන්සේ විසින් පහළොස් අවුරුද්දට ආයු අඩු දරුවන් පැවිදි නො කරන සේ සිකපද පනවා ඇත්තේ ය. මේ දරුවන් විනාශ නොවීමට කළ යුත්තේ කුමක් දැ" යි සිතා, ඒ කාරණය බුදුන් වහන්සේට සැල කළහ.

එකල්හි තථාගතයන් වහන්සේ 'ආනන්දය! ඒ දරුවෝ කවුඩන් එළවීමටවත් සමත් වන්නාහුදැ' යි විචාරා "එසේ ය" යි පිළිවදන් දුන් කල්හි භික්ෂූන් අමතා, "**අනුජානාමි භික්ඛවෙ! ඌනපණ්ණරසවස්සං කාකුඩ්ඩෙපකං පබ්බාජෙතුං**" යනුවෙන් කවුඩන් පළවා හැරීමට සමත් පහළොස් අවුරුදු වයසට නො පැමිණි දරුවන් ද පැවිදි කිරීමට අනුදැන වදාළ සේක. හදිසි

Non-commercial distribution

අවස්ථාවේදී ඒ කුලදරුවන් දෙදෙනා විනාශ නො වනු පිණිස කවුඩන් එළවීමට සමත් දරුවන් පැවිදි කිරීමට අනුදැන වදළේ වී නමුත් බුදුන් වහන්සේගේ අදහස සැටියට සැලකිය යුත්තේ වයසින් පසළොස් වස නො පිරුණු කුලදරුවන් පැවිද්දට නුසුදුසු බව ය. එබැවින් විශේෂ කරුණක් සඳහා මිස, පසළොස් අවුරුදු වයස නො පිරුණු කුලදරුවන් පැවිදි නො කළ යුතු ය. වයස අවුරුදු පසළොසටත් විස්සටත් අතර කාලය කුලදරුවන් පැවිදි කිරීමට ඉතා සුදුසු කාලය සැටියට සැලකිය යුතු ය. වයස් ගත වී පැවිදි වන්නවුන්ට පැවිද්දට සුදුසු වන සැටියට සිත-කය සකස් කර ගැනීම අපහසු ය. එබැවින් බුදුන් වහන්සේ විසින්-

**"පඤ්චහි ධම්මෙහි සමන්නාගතො දුල්ලභො බුඩ්ඪපබ්බජිතො. කතමෙහි පඤ්චහි? දුල්ලභො නික්ඛවෙ! බුඩ්ඪපබ්බජිතො සුවචො. දුල්ලභො සුග්ගහිතගාහී. දුල්ලභො පදක්ඛිණග්ගාහී. දුල්ලභො ධම්මකථිකො. දුල්ලභො විනයධරො."**

යනුවෙන් ධර්මපසකින් යුක්ත බුඩ්ඪපබ්බජිතයන් දුර්ලභ බව වදරා තිබේ. "මහණෙනි! මේ කරුණු පසින් යුක්ත බුඩ්ඪපබ්බජිතයෙක් දුර්ලභය. කවර කරුණු පසකින් ද යත්? මහණෙනි! සුවච බුඩ්ඪපබ්බජිතයෙක් දුර්ලභය, ගුරුන් වෙතින් මැනවින් උගන්නාවූ බුඩ්ඪපබ්බජිතයෙක් දුර්ලභය, ගුරුන්ගේ අනුශාසනය දකුණට ගන්නා බුඩ්ඪපබ්බජිතයෙක් දුර්ලභය, ධර්මකථික බුඩ්ඪපබ්බජිතයෙක් දුර්ලභය, විනයධර බුඩ්ඪපබ්බජිතයෙක් දුර්ලභය" යනු එහි තේරුම යි. බුදුන් වහන්සේ විසින් තවත් සූත්‍රයකදී ද **"දුල්ලභො ආකප්පසම්පන්නො"** යි ආකල්ප- සම්පත්තිය ඇති බුඩ්ඪපබ්බජිතයන් දුර්ලභ බව ද වදරා ඇත්තේ ය.

ධනවත් බව උගත් බව, කුලවත් බව යන මේවා පැවිද්දට සුදුසුකම් නුසුදුසුකම් බැලීමේ දී සැලකිය යුතු බවක් බුධදේශනයෙන් නො පෙනේ. ඉහත දැක්වුණු ප්‍රව්‍රජ්‍යා දෝෂන්ගෙන් මුක්ත වේ නම්, දුප්පත්-පොහොසත් උගත්-නූගත් කවුරුත් පැවිද්දට සුදුස්සෝ ය.

**"යෙභුය්‍යෙන හි ඛත්තියකුලතො පබ්බජිතා ජාතිං නිස්සාය මානං කරොන්ති. බ්‍රාහ්මණකුලා පබ්බජිතා මන්තෙ නිස්සාය**

Non-commercial distribution

**මාතං කරොන්ති. හීනජච්චකුලා පබ්බජිතා අත්තනො විජාතිතාය පතිට්ඨාතුං න සක්කොන්ති. ගහපතිදාරකා පන කච්ජෙහි සෙදං මුඤ්චන්තෙහි පිට්ඨියා ලොණං පුප්ඵමානාය භූමිං කසිත්වා නිහතමානදප්පා හොන්ති. තෙ පබ්බජිත්වා මානං වා දප්පං වා අකත්වා බුද්ධවචනං උග්ගහෙත්වා විපස්සනාය කම්මං කරොන්තා සක්කොන්ති අරහත්තෙ පතිට්ඨාතුං."**

යන චූලහත්ථිපදෝපම සූත්‍ර අටුවා පාඨය ද මෙහි ලා සැලකිය යුතු ය.

Non-commercial distribution

# උපසම්පද කර්මය.

උපසම්පද කර්මය බුදු-සස්නෙහි ගරු විනය කර්මයෙකි. එය පැවිදි කිරීම සේ සැම තන්හිම කළ හැකි කර්මයක් නොව සීමාවකදී පමණක් කළ හැකි කර්මයකි. එය මධ්‍යදේශයේ සිදු කරත හොත් **"අනුජානාමි භික්ඛවෙ! දසවග්ගෙන වා අතිරෙක දස වග්ගෙන වා ගණෙන උපසම්පාදෙතුං"** යි වදළ පරිදි දස නමක් වූ හෝ දස නමකට අධික වූ හෝ සඞ්ඝයා විසින් සිදු කළ යුතු ය. ප්‍රත්‍යන්ත දේශයෙහි සිදු කරනවා නම් **"අනුජානාමි භික්ඛවෙ! සබ්බපච්චන්තිමෙසු ජනපදෙසු විනයධරපඤ්චමෙන ගණෙන උපසම්පාදෙතුං"** යි වදළ පරිදි විනයධරයා පස්වෙනි කොට ඇති ගණයා විසින් හෙවත් පස් නමක්වූ භික්ෂු සඞ්ඝයා විසින් සිදු කළ හැකි ය. ප්‍රත්‍යන්ත ජනපද බුදුන් වහන්සේ විසින් ම නියම කර වදරා තිබේ.

ඒ මෙසේ ය.:-

"පුරත්ථිමාය දිසාය කජඞ්ගලං නාම නිගමො, තස්සා පරෙන මහාසාලා, තතො'පරා පච්චන්තිමා ජනපද, ඔරතො මජ්ඣෙ. පුරත්ථිමදක්ඛිණාය දිසාය සලලවතී නාම නදී, තතො 'පරා පච්චන්තිමා ජනපද, ඔරතො මජ්ඣෙ. දක්ඛිණාය දිසාය සෙතකණ්ණිකං නාම නිගමො, තතො' පරා පච්චන්තිමා ජනපදා ඔරතො මජ්ඣෙ. පච්ඡිමාය දිසාය ථූනං නාම බ්‍රහ්මණ ගාමො, තතො' පරා පච්චන්තිමා ජනපදා ඔරතො මජ්ඣෙ. උත්තරාය දිසාය උසීරධජො නාම පබ්බතො, තතො'පරා පච්චන්තිමා ජනපදා ඔරතො මජ්ඣෙ.

Non-commercial distribution

මධ්‍ය දේශයේ සිට කථාකරන කල්හි නැගෙන හිරින් කජඞ්ගල නම් නියම් ගමෙන් ඔබ ද, ගිනි කොණින් සලලවතී නම් ගඞ්ගාවෙන් ඔබද, දකුණෙන් සේතකණ්ණික නම් නියම් ගමෙන් ඔබ ද, බස්නාහිරින් ථූන නම් බ්‍රාහ්මණ ගමින් ඔබද, උතුරෙන් උසීරද්ධජ නම් පර්වතයෙන් ඔබ ද, ප්‍රත්‍යන්ත ජනපදයෝ ය. අප රට ද ප්‍රත්‍යන්ත ජනපදයන්ට අයත් බැවින් මෙහි පස්නමකට ද උපසම්පද කර්මය කළ හැකි ය. උපසම්පදවක් කිරීමේදී බොහෝ වැඩ කරන්නට ඇත්තේ කර්මාචාර්යවරයාට ය. උපසම්පදපේක්ෂකයා සීමාවට පැමිණි කල්හි පළමුවෙන් කළ යුත්තේ උපසම්පදපේක්ෂකයාගේ හා උපාධ්‍යාචාර්යයන් වහන්සේගේ නම් යොදා කර්මවාක්‍යය කීමට අපහසු නම්, උපසම්පදපේක්ෂකයාට **නාග** කියා ද උපාධ්‍යාචාර්යයන් වහන්සේට **තිස්ස** කියා ද නම් සම්මත කිරීම ය. එය කර්මාචාර්යවරයා විසින් මෙසේ කළ යුතු ය.

මේ උපසම්පදපේක්ෂකයාගේ පුරාණ නාමය අස්කොට ඔහුට **නාග** යන නාමය ද, උපසම්පදපේක්ෂකයාගේ උපාධ්‍යාචාර්යයන් වහන්සේගේ පුරාණ නාමය අස් කොට උන් වහන්සේට **තිස්ස** යන නාමය ද කර්මවාක්‍යය කීමේ පහසුව සඳහා සම්මත කරමි. ඒ බව උපසම්පදාපේක්ෂකයා විසින් හා උපාධ්‍යාචාර්යයන් වහන්සේ විසින් ද, මහා සඞ්ඝයා වහන්සේ විසින් ද දත යුත්තේ ය.

නාම සම්මුතියෙන් පසු කර්මාචාර්යයන් වහන්සේ විසින් උපසම්පදපේක්ෂකයාට මෙසේ කිය යුතු ය.

"**පඨමං උපජ්ඣං ගාහාපෙතබ්බො**" යි ලෝකනාථයන් වහන්සේ විසින් වදරා ඇති බැවින් 'සංසාර සාගරයෙන් එතර වී නිවන් පුර පැමිණෙනු රිසියෙන් උපසම්පදව ලැබීමට පැමිණ සිටින සාමණේරය! යුෂ්මතා විසින් පළමු කොට උපාධ්‍යාය ග්‍රහණය කළ යුතු ය..

මෙසේ කී කල්හි උපසම්පදපේක්ෂකයා විසින් උපාධ්‍යායන් වහන්සේ ඉදිරියෙහි උක්කුටිකව හිඳ "**උපජ්ඣායො මෙ භන්තෙ හොහි**" යන වැකිය තෙවරක් කිය යුතු ය. උපාධ්‍යායයන් වහන්සේ විසින් "**පාසාදිකෙන සම්පාදෙහි**" යි කියා එය පිළිගත යුතු ය.

Non-commercial distribution

ඉක්බිති කම්මාචාර්‍යයීවරයා විසින් මෙසේ කිය යුතු ය. "පින්වත් සාමණේරය! "**උපජ්ඣං ගාහාපෙත්වා පත්තචීවරං ආචික්ඛිතබ්බං**" යි ලෝකස්වාමීවූ භාග්‍යවතුන් වහන්සේ වදරා ඇති බැවින් දැන් යුෂ්මතාට පා-සිවුරු පිළිබඳ ශාසනික ව්‍යාවහාරය දැනගනු පිණිස එය කියන්නෙමි. "**අයං තෙ පත්තො**" පින්වත් සාමණේරය! කාලවර්ණ වූ මේ මණ්ඩලාකාර භාජනය යුෂ්මතාගේ පාත්‍රය නම් වන්නේ ය. 'අයං සංඝාටි' කඩ කපා දෙපොට කොට මසා පඬු පොවන ලද යුෂ්මතාගේ කරෙහි ඇති මේ සිවුර ශාසන ව්‍යවහාරයෙන් සංඝාටි නම් වන්නේ ය. "**අයං උත්තරාසංගො**" කඩ කපා එක් පටින් මසා පඬු පොවා ඇති යුෂ්මතාගේ කයෙහි ඇති මේ චීවරය ශාසනව්‍යවහාරයෙන් උත්තරාසංග නම් වන්නේ ය. "**අයං අන්තරවාසකො**" යුෂ්මතා හැඳ සිටින්නාවූ මේ චීවරය ශාසන ව්‍යවහාරයෙන් අන්තරවාසක නම් වන්නේ ය.

'**ගච්ඡ: අමුම්හි ඔකාසෙ තිට්ඨාහි**. පින්වත් සාමණේරය! "**අනුජානාමි භික්ඛවෙ! එකමන්තං අනුසාසිත්වා සඞ්ඝ මජ්ඣෙ අන්තරායිකෙ ධම්මෙ පුච්ඡිතුං**" යනුවෙන් සඞ්ඝයා ගෙන් බැහැර කොට යම් කිසි තැනකදී උපසම්පදාපේක්ෂකයාට අනුශාසනා කළ යුතුය යි තථාගතයන් වහන්සේ විසින් වදරා ඇති බැවින් ද, මේ සඞ්ඝමධ්‍යයෙහි යුෂ්මතාට අනුශාසනය කිරීම නුසුදුසු බැවින් ද මෙහින් බැහැරට ගොස් අර පෙනෙන තැන සිටිනු මැනවි.'

මෙසේ කී කල්හි උපසම්පදාපේක්ෂකයා නැඟිට මහා සඞ්ඝයා වහන්සේට පිටි නො පා, ඇඳිලි බැඳ ගෙනම මදක් දුර ගොස් සිටිය යුතු ය. කම්මාචාර්‍යයීවරයා විසින් එහි ගොස් උපසම්පදා-පේක්ෂකයාට අනුශාසනය කළ යුතු ය. "**න භික්ඛවෙ! අසම්මතෙන අනුසාසිතබ්බො. යො අනුසාසෙය්‍ය ආපත්ති දුක්කටස්ස**" යනු වදළ බැවින් සම්මුතිය නො ලබා අනුශාසනයට නො යා යුතු ය. දැන් කම්මාචාර්‍යයීවරයා විසින් මතු දැක්වෙන වැකිය කියා තමා විසින්ම තමා සම්මත කර ගත යුතු ය.

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. නාගො ආයස්මතො තිස්සස්ස උපසම්පදාපෙක්ඛො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං අහං නාගං අනුසාසෙය්‍යං.**

Non-commercial distribution

ඉක්බිති සඞ්ඝ සමධ්‍යයෙන් නැගිට උපසම්පදපේක්ෂකයා සමීපයට ගොස්, සිටගෙන ම මෙසේ අනුශාසනය කළ යුතු ය.

**සුණසි නාග! අයං තෙ සච්චකාලො, භූතකාලො, යං ජාතං තං සඞ්ඝමජ්ඣෙ පුච්ඡන්තෙ සන්තං අත්ථීති වත්තබ්බං. අසන්තං නත්ථීති වත්තබ්බං. මා ඛො විත්‍ථාසි, මා ඛො මඞ්කු අහොසි.**

'සංසාරසාගරය තරණය කරනු වස් බුදු සස්නට දිවි පුද සිටින නාග නම් වූ සාමණේරය! අතිදුර්ලභ වූ මේ සර්වඥ සාසනයෙහි අධිශීලසඞ්ඛ්‍යාත අත්‍යුත්තම උපසම්පද ශීලය ලබන්නට යන මේ කාලය, අසන දෙය සැඟවීමක් නො කොට, අවඞ්කව සත්‍යය ම ප්‍රකාශ කිරීමට කාලය ය, කාරණය සඟවන්නට තැත් නො කොට, ඇති සැටියට ම ප්‍රකාශ කිරීමේ කාලයය, තොපගේ ශරීරයෙහි යම් කුෂ්ඨ ගණ්ඩාදි රෝගයක් ඇත්තේ නම්, එය සඟමැද විචාරන කල්හි ඇති දෙය එසේ ම ඇතය යි කිය යුතු ය. නැති දෙය නැතය යි කිය යුතු ය. සඟමැද ප්‍රශ්න කරන කල්හි මාහට තපුරක් කිරීමට විචාරතැ යි බියෙන් නො තැති ගනුව. නින්ද කරනු පිණිස නැති දේවල් ඇති දැයි විචාරති යි සිතා නො සතුටුව මුහුණ නො හකුළුවා ගත යුතු ය.'

**"එවං තං පුච්ඡිස්සන්ති, සන්ති තෙ එවරූපා ආබාධා, කුට්ඨං, ගණ්ඩො, කිලාසො, සොසො, අපමාරො, මනුස්සොසි, පුරිසොසි, භුජිස්සොසි, අනණොසි, නසි රාජභටො, අනුඤ්ඤාතොසි මාතා පිතූහි, පරිපුණ්ණවීසතිවස්සොසි, පරිපුණ්ණං තෙ පත්තචීවරං, කිං නාමොසි, කො නාමො තෙ උපජ්ඣායොති."**

'පුපින්වත් සාමණේරය! "**අනුජානාමි භික්ඛවෙ! උපසම්පාදෙන්තෙන තෙරස අන්තරායිකෙ ධම්මෙ පුච්ඡිතුං**" යනුවෙන් තථාගතයන් වහන්සේ විසින් උපසම්පදපේක්ෂකයා ගෙන් තෙළෙස් අන්තරායික ධර්මයන් විචාරන්නට අනුදැන වදරා ඇති බැවින්, උපසම්පද කිරීමට පූර්වභාගය වූ මේ කාලයෙහි සඟ මැදදී තොප අතින් මෙසේ විචාරන්නාහු ය. ශ්‍රීමතා ගේ ශරීරයෙහි ලාදුරු-පරංගි-කඩුවේගං ආදි නම් වලින් කියැවෙන කුෂ්ඨරෝගයන් අතුරෙන් යම් කිසි රෝගයක් ඇත්තේ දඃ දෙඹ ගෙඩි-දෙහි ගෙඩි මෙන් ශරීරයෙහි තැන්

Non-commercial distribution

තැන්වල හටගන්නා වූ ගණ්ඩ රෝගය ඇත්තේ ද: සමෙහි පැතිර ශරීරය විරූප කරන්නාවූ සුදු කබර රෝගය ඇත්තේ ද: ක්‍රමයෙන් ශාරීරික සප්තධාතූන් ක්ෂය කර දිවි නසන්නා වූ ක්ෂය රෝගය ඇත්තේ ද, සිටි සැටියේ සිහිසන් නැති වී බිම ඇද වැටෙන අපස්මාර රෝගය ඇත්තේ ද, ඔබ මනුෂ්‍යයෙක් ද, පුරුෂයෙක් ද, නිදහස් කෙනෙක් ද, ණය නැතියෙක් ද, රාජ භටයෙක් නොවන්නෙහිද, මා පියන් විසින් අනුදක්නා ලද්දෙහි ද, පිරුණු විසිවස් වයස ඇත්තෙහි ද, ඔබට පා-සිවුරු සම්පූර්ණ ද, ඔබගේ නම කුමක් ද, ඔබ උපාධ්‍යායයන් වහන්සේගේ නම කුමක් ද? මෙසේ සඟ මැද දී විචාරන්නාහ.

මෙසේ අනුශාසනය කොට උපසම්පදපේක්ෂකයාට එහි ම සිටින්නට හැර කර්මාචාර්‍ය්‍යවරයා සඟමැදට ගොස්-

**"සුණාතු මෙ භන්තෙ සංඝො, නාගො ආයස්මතො තිස්සස්ස උපසම්පදපෙක්ඛො අනුසිට්ඨො සො මයා යදි සංඝස්ස පත්තකල්ලං නාගො ආගච්ඡෙය්‍ය"**

යන වාක්‍යය කියා සංඝයාගෙන් අවසරය ගෙන උපසම්පදපේක්ෂකයා සඟමැදට ගෙන්වා ගත යුතු ය. ඉක්බිති "**න භික්ඛවෙ! අයාචිතෙන උපසම්පාදෙතබ්බො. යො උපසම්පාදෙය්‍ය ආපත්ති දුක්කටස්ස**" යි වදරා ඇති බැවින් උපසම්පදපේක්ෂකයා ලවා උපසම්පදාව ඉල්ල විය යුතුය. මේ අවස්ථාවේදී උපසම්පද-පේක්ෂකයා විසින් සිවුරු ඒකාංස කොට පොරවා භික්ෂූන් වහන්සේගේ පා වැඳ උක්කුටිකව හිඳ ඇඳිලි බැඳ-

**"සංඝං භන්තෙ උපසම්පදං යාචාමි, උල්ලුම්පතු මං භන්තෙ සඞ්ඝො අනුකම්පං උපාදය. දුතියම්පි භන්තෙ සඞ්ඝං උපසම්පදං යාචාමි, උල්ලුම්පතු මං භන්තෙ සඞ්ඝො අනුකම්පං උපාදය. තතියම්පි භන්තෙ සඞ්ඝං උපසම්පදං යාචාමි, උල්ලුම්පතු මං භන්තෙ සඞ්ඝො අනුකම්පං උපාදය."** යන වාක්‍යය කියා උපසම්පදාව ඉල්ලිය යුතු ය.

ඉක්බිති කර්මාචාර්‍ය්‍යයන් වහන්සේ විසින් "**සුණාතු මෙ භන්තෙ සඞ්ඝො, අයං නාගො ආයස්මතො තිස්සස්ස උපසම්පදපෙක්ඛො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං අහං නාගං අන්තරායිකෙ ධම්මෙ පුච්ඡෙය්‍යං**"

Non-commercial distribution

යන කර්මවාක්‍යයෙන් අන්තරායික ධර්ම විචාරීමේ සම්මුතිය ලබා ගෙන මතු දැක්වෙන පරිදි අන්තරායික ධර්ම විචාළ යුතු ය.

**සුණසි නාග! අයං තෙ සච්චකාලො, භූතකාලො, යං ජාතං තං පුච්ඡාමි. සන්තං අත්ථීති වත්තබ්බං. අසන්තං නත්ථීති වත්තබ්බං. සන්ති තෙ එවරූපා ආබාධා, කුට්ඨං?** (නත්ථි භන්තෙ) **ගණ්ඩො?** (නත්ථි භන්තෙ) **කිලාසො?** (නත්ථි භන්තෙ) **සොසො?** (නත්ථි භන්තෙ) **අපමාරො?** (නත්ථි භන්තෙ) **මනුස්සොසි?** (ආම භන්තෙ) **පුරිසොසි?** (ආම භන්තෙ) **භුජිස්සොසි?** (ආම භන්තෙ) **අනණොසි?** (ආම භන්තෙ) **නසි රාජභටො?** (ආම භන්තෙ) **අනුඤ්ඤාතොසි මාතාපිතූහි?** (ආම භන්තෙ) **පරිපුණ්ණවීසති වස්සොසි?** (ආම භන්තෙ) **පරිපුණ්ණං තෙ පත්තචීවරං?** (ආම භන්තෙ) **කිං නාමොසි?** (අහං භන්තෙ නාගො නාම) **කො නාමො තෙ උපජ්ඣායො?** (උපජ්ඣායො මෙ භන්තෙ ආයස්මා තිස්සත්ථෙරො නාම) අන්තරායික ධර්ම විචාරීමෙන් පසු **ඥප්ති චතුර්ථ කර්ම වාක්‍යයෙන්** උපසම්පද කළ යුතු ය.

උපසම්පද කර්ම වාක්‍යය

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො, අයං නාගො ආයස්මතො තිස්සස්ස උපසම්පදාපෙක්ඛො පරිසුද්ධො අන්තරායිකෙහි ධම්මෙහි, පරිපුණ්ණස්ස පත්තචීවරං, නාගො සඞ්ඝං උපසම්පදං යාචති, ආයස්මතා තිස්සෙන උපජ්ඣායෙන, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො නාගං උපසම්පාදෙය්‍ය, ආයස්මතා තිස්සෙන උපජ්ඣායෙන. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො, අයං නාගො ආයස්මතො තිස්සස්ස උපසම්පදාපෙක්ඛො, පරිසුද්ධො අන්තරායිකෙහි ධම්මෙහි, පරිපුණ්ණස්ස පත්තචීවරං, නාගො සඞ්ඝං උපසම්පදං යාචති, ආයස්මතා තිස්සෙන උපජ්ඣායෙන. සඞ්ඝො නාගං උපසම්පාදෙති, ආයස්මතා තිස්සෙන උපජ්ඣායෙන.

Non-commercial distribution

යස්සායස්මතො ඛමති නාගස්ස උපසම්පදා ආයස්මතා තිස්සෙන උපජ්ඣායෙන. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

දුතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො, අයං නාගො ආයස්මතො තිස්සස්ස උප-සම්පදාපෙක්ඛො, පරිසුද්ධො අන්තරායිකෙහි ධම්මෙහි. පරිපුණ්ණස්ස පත්තචීවරං. නාගො සඞ්ඝං උපසම්ප-දං යාචති, ආයස්මතා තිස්සෙන උපජ්ඣායෙන. සඞ්ඝො නාගං උපසම්පාදෙති, ආයස්මතා තිස්සෙන උපජ්ඣායෙන. යස්සායස්මතො ඛමති නාගස්ස උපසම්පදා, ආයස්මතා තිස්සෙන උපජ්ඣායෙන, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

තතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො, අයං නාගො ආයස්මතො තිස්සස්ස උපසම්පදාපෙක්ඛො, පරිසුද්ධො අන්තරායිකෙහි ධම්මෙහි. පරිපුණ්ණස්ස පත්ත චීවරං. නාගො සඞ්ඝං උපසම්පදං යාචති, ආයස්මතා තිස්සෙන උපජ්ඣායෙන. සඞ්ඝො නාගං උපසම්පාදෙති, ආයස්මතා තිස්සෙන උපජ්ඣායෙන. යස්සායස්මතො ඛමති නාගස්ස උපසම්පදා, ආයස්මතා තිස්සෙන උපජ්ඣායෙන, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

උපසම්පන්නො සඞ්ඝෙන නාගො ආයස්මතා තිස්සෙන උපජ්ඣායෙන. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමි..

Non-commercial distribution

## උපසම්පදව අවසානයේ කරන අනුශාසනය

**තාවදෙව ඡායාමෙතබ්බා. උතුප්පමාණං ආචික්ඛිතබ්බං දිවසභාගො ආචික්ඛිතබ්බො. සඞ්ගීති ආචික්ඛිතබ්බා. චත්තාරො නිස්සයා ආචික්ඛිතබ්බා. චත්තාරි අකරණීයානි ආචික්ඛිතබ්බානි.**

'සකලඥෙය පාරගත මහා කාරුණික වූ අප භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුධයන් වහන්සේ විසින් මෙසේ වදරා ඇති බැවින් සුප්‍රතිපන්නතාදි ගුණගණෝපේත මහා සඞ්ඝයා වහන්සේ විසින් පරම නිර්මල උපසම්පදවෙන් අභිෂේක කරන ලද ආයුෂ්මතා හට මේ සීමාමාලකයෙහිදී ම උපසම්පදව ලැබූ වේලාවේ ඡායා ප්‍රමාණයය, ඍතු ප්‍රමාණයය, දිවසභාගයය, ඒ සියල්ලය, නිඃශ්‍රය සතරය, අකරණීය සතරය යන මේවා කියා දීමට අනුදැන වදරා ඇති බැවින් අපගේ කීමට ආදරයෙන් ඇහුම් කන් දුන මැනවි.

පරම පරිශුධෝපසම්පද ශීලයෙන් අභිෂේක ලත් ආයුෂ්ම තාණෙනි! ඔබ ශ්‍රී බුඩ වර්ෂයෙන්..........වැන්නෙහි................ මස..................තිථිය ලත්......................දිනක්‍රිස්තු වර්ෂ...................... වැන්නෙහි.....................මස ......................වෙනි.......................දින ......................ට...................සීමා මාලකයේදී..................ප්‍රමුඛ මහා සඞ්ඝයා වහන්සේ විසින් සාමණේර භූමියෙන් නඟා උපසම්පද භික්ෂුභාවයට පමුණුවන ලද්දෙහි ය. ඒ බව දිවිහිමියෙන් මතක තබාගෙන ඉතා කුඩා සිකපදයකුදු නො කඩකොට ජීවිතය සේ දැන් ලත් උපසම්පද ශීලය රක්නෙහි ය.

සසර බිය දැක නිවන් පසක් කරනු රිසියෙන් බුදුසසුන් වන් ආයුෂ්මතාණෙනි! පැවිදි ජීවිතය පවත්වාගනු සඳහා මහා කාරුණික-යන් වහන්සේ අනුදැන වදරා ඇති නිඃශ්‍රය සතර අසනු මැනවි.

(1) "**පිණ්ඩියාලොප භොජනං නිස්සාය පබ්බජ්ජා. තත්ථ තෙ යාවජීවං උස්සාහො කරණීයො. අතිරෙක ලාභො සඞ්ඝභත්තං, උද්දෙසභත්තං, නිමන්තණං, සලාකභත්තං, පක්ඛිකං, උපොසථිකං, පාටිපදිකං.**"

ඇවැත්නි! මේ පැවිද්ද පාත්‍රය ගෙන ගෙදෙරක් පාසා ඇවිද පිඩ පිඩ බැගින් ලබාගන්නා භෝජනය නිසා පවත්නේ ය. තොප

Non-commercial distribution

විසින් පිණ්ඩියාලෝප භෝජනයෙන් දිවිපැවැත්වීමෙහි දිවිහිමියෙන් උත්සාහ කළ යුතු ය. සකල සඞ්ඝයා හට දෙන දානයය, දෙතුන් නම බැගින් සහිත් නිමන්ත්‍රණය කොට දෙන දානයය, පෞද්ගලික වශයෙන් නිමන්ත්‍රණය කොට දෙන දානයය, සලාක දානයය, පක්ෂයකට වර බැගින් දෙන දානය ය, පොහෝදිනයෙහි දෙන දානයය, පැළවිය දිනයෙහි දෙන දානයය යන මේවා අතිරේක ලාභ වශයෙන් පිළිගත යුතු ය.

(2) **"පංසුකූල චීවරං නිස්සාය පබ්බජ්ජා. තත්‍ථ තෙ යාවජීවං උස්සාහො කරණීයො. අතිරෙක ලාභො ඛොමං. කප්පාසිකං. කොසෙය්‍යං. කම්බලං. සාණං. භඞ්ගං."**

පැවිද්ද පාංසුකූල චීවරය නිසා පවත්නේ ය. ඔබ විසින් පාංසුකූල චීවරයෙන් දිවි පැවැත්මෙහි දිවි හිමියෙන් උත්සාහ කළ යුතු ය. පූර්වකෘත කුශලානුභාවයෙන් ඔබට කොමු පිළිය, කපු පිළිය, පට පිළිය, කම්බිලිය, සණ පිළිය, මුසු පිළිය යන මේවා ලැබෙත හොත් අතිරේක ලාභ වශයෙන් පරිභෝග කළ යුතු ය.

(3) **"රුක්ඛමූලසෙනාසනං නිස්සාය පබ්බජ්ජා. තත්‍ථ තෙ යාවජීවං උස්සාහො කරණීයො. අතිරෙක ලාභො විහාරො. අඩ්ඪයොගො. පාසාදෙ. හම්මියං. ගුහා"**

පැවිද්ද වෘක්ෂමූල සේනාසනය නිසා පවත්නේ ය. ඔබ විසින් වෘක්ෂමූල සේනාසනය ඇසුරු කරමින් දිවිපැවැත්වීමෙහි දිවි හිමියෙන් උත්සාහ කළ යුතු ය. ඉදින් පූර්ව කෘත කුශලානුභා-වයෙන් ලැබෙතොත් දෙ-පල ඇති ගෙවල් ය, එක් පල ඇති ගෙවල්ය, සතර පල ඇති ගෙවල්ය, සොල්දර ගෙවල්ය, ගුහාය යන මේවා ද පරිභෝග කළ යුතු ය.

(4) **"පූතිමුත්තභෙසජ්ජං නිස්සාය පබ්බජ්ජා. තත්‍ථ තෙ යාවජීවං උස්සාහො කරණීයො. අතිරෙක ලාභො සප්පි. නවනීතං. තෙලං. මධු. ඵානිතං"**

පැවිද්ද අරළු ගෝමූත්‍රයෙහි ලා සම්පාදනය කරන පූතිමුත්‍ර භෛෂජ්‍යය නිසා පවත්නේ ය. පූතිමුත්‍ර භෛෂජ්‍යයෙන් දිවි

Non-commercial distribution

පැවැත්වීමෙහි ඔබ විසින් දිවි හිමියෙන් උත්සාහ කළ යුතු ය. ඉදින් ඔබට පූර්ව කෘත කුශලානුභාවයෙන් ලැබෙතොත් ගිතෙල්ය, වෙඬරුය, තලතෙල්ය, මී පැණිය, උක් සකුරුය යන මේවා අතිරේක ලාභ වශයෙන් පරිභෝග කළ යුතු ය.

දැන් අකරණීය සතර අසනු මැනවි.

(1) "උපසම්පන්නෙන භික්ඛුනා මෙථුනො ධම්මො න පතිසෙවිතබ්බො, අන්තමසො තිරච්ඡාන ගතායපි. යො භික්ඛු මෙථුනං ධම්මං පතිසෙවති, අස්සමණො හොති අසක්‍යපුත්තියො. සෙය්‍යථාපි නාම පුරිසො සීසච්ඡින්නො අභබ්බො තෙන සරීර බන්ධනෙන ජීවිතුං. එවමෙව භික්ඛු මෙථුනං ධම්මං පතිසෙවිත්වා අස්සමණො හොති අසක්‍යපුත්තියො. තං තෙ යාවජීවං අකරණීයං"

උපසම්පද භික්ෂුව විසින් යටත් පිරිසෙයින් තිරිසන් සත්ත්වයකු සමග ද මෛථුන සේවනය නොකළ යුත්තේය. යම් භික්ෂුවක් මෛථුන සේවනය කෙරේ නම්, එයින් ඒ භික්ෂු තෙමේ අශ්‍රමණයෙක් වේ. අබුඩපුත්‍රයෙක් වේ. යම් සේ හිසසුන් පුරුෂයෙක් ඒ හිස කය හා සම්බන්ධ කොට නැවත ජීවත්වීමට අභව්‍ය වේද, එමෙන්ම මහණ තෙමේ මෛථුන සේවනය කොට අශ්‍රමණයෙක් වේ. අබුද්ධපුත්‍රයෙක් වේ. එබැවින් තොප විසින් ඒ මෛථුන සේවනය දිවිහිමියෙන් නො කළ යුතුය.

(2) "උපසම්පන්නෙන භික්ඛුනා අදින්නං ථෙය්‍ය සඞ්ඛාතං න ආදාතබ්බං අන්තමසො තිණසලාකං උපාදාය. යො භික්ඛු පාදං වා පාදාරහං වා අතිරෙකපාදං වා අදින්නං ථෙය්‍යසංඛාතං ආදියති අස්සමණො හොති අසක්‍යපුත්තියො. සෙය්‍යථාපි නාම පණ්ඩුපලාසො බන්ධනා පමුත්තො අභබ්බො හරිතත්ථාය. එවමෙව භික්ඛු පාදං වා පාදාරහං වා අතිරෙකපාදං වා අදින්නං ථෙය්‍යසංඛාතං ආදියිත්වා අස්සමණො හොති අසක්‍යපුත්තියො. තං තෙ යාවජීවං අකරණීයං "

උපසම්පන්න භික්ෂුව විසින් අන්තිම වශයෙන් තණපතෙහි පටන් හිමියන් විසින් නුදුන් දෙය සොර සිතින් නොගත යුතු ය. යම් භික්ෂුවක් පාදයක් වූ ධනය හෝ පාදයක් අගනා වස්තුවක් හෝ පාදයකට අධික වස්තුව හෝ සොරසිතින් ගනී ද, හෙතෙමේ අශ්‍රමණයෙක් වේ. අබුඩ පුත්‍රයෙක් වේ. යම් සේ නටුවෙන් ගැලවුණු

Non-commercial distribution

පඬුවන් පත නැවත තිල්පතක් වීමට අභව්‍ය වේ ද, එමෙන් භික්ෂු තෙමේ පාදයක් වූ ධනය හෝ පාදයක් අගනා දෙයක් හෝ පාදයකට අධික ධනය හෝ සොර සිතින් ගැනීමෙන් අශ්‍රමණයෙක් වේ. අබුඩ පුත්‍රයෙක් වේ. එය තොප විසින් දිවිහිමියෙන් නො කළ යුතු ය.

**(3) "උපසම්පන්නෙන භික්ඛුනා සංචිච්ච පාණො ජීවිතා න වොරොපෙතබ්බො අන්තමසො කුන්ථ කිපිල්ලිකං උපාදාය. යො භික්ඛු සංචිච්ච මනුස්සවිග්ගහං ජීවිතා වොරොපෙති, අන්තමසො ගබ්භ පාතනං උපාදාය. අස්සමණො හොති අසක්‍යපුත්තියො. සෙය්‍යථාපි නාම පුථුසිලා ද්වීධා භින්නා අප්පටිසන්ධිකා හොති, එවමෙව භික්ඛු සංචිච්ච මනුස්ස විග්ගහං ජීවිතා වොරොපෙත්වා අස්සමණො හොති අසක්‍යපුත්තියො. තං තෙ යාවජීවං අකරණීයං"**

උපසම්පන්න භික්ෂුව විසින් යටත් පිරිසෙයින් සිතා මතා කුහුඹුවෙකුදු නො මැරිය යුතුය. යම් භික්ෂුවක් ගැබ් හෙළීමෙන් වුව ද මිනිසකු මරා නම්, ඒ භික්ෂුව අශ්‍රමණයෙක් අබුඩපුත්‍රයෙක් වේ. දෙකට පැලුණා වූ ගල යම් සේ නැවත සන්ධි කළ නොහේද, එමෙන් භික්ෂු තෙමේ සිතා මතා මිනිසකු මැරීමෙන් අශ්‍රමණයෙක් වේ. අබුද්ධ පුත්‍රයෙක් වේ. එය තොප විසින් දිවි හිමියෙන් නො කළ යුතු ය.

**(4) "උපසම්පන්නෙන භික්ඛුනා උත්තරිමනුස්ස ධම්මො න උල්ලපිතබ්බො අන්තමසො සුඤ්ඤාගාරෙ අභිරමාමීති. යො භික්ඛු පාපිච්ඡො ඉච්ඡාපකතො අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං උල්ලපති ඣානං වා විමොක්ඛං වා සමාධිං වා සමාපත්තිං වා මග්ගං වා ඵලං වා, අස්සමණො හොති, අසක්‍ය පුත්තියො, සෙය්‍යථාපි නාම තාලො මත්ථකච්ඡින්නො අභබ්බො පුන විරූළ්හියා, එවමෙව භික්ඛු පාපිච්ඡො ඉච්ඡාපකතො අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං උල්ලපිත්වා අස්සමණො හොති, අසක්‍යපුත්තියො. තං තෙ යාවජීවං අකරණීයං"**

උපසම්පන්න භික්ෂුව විසින් යටත් පිරිසෙයින් "මම ශූන්‍යාගාරයෙහි සිත් අලවා වෙසෙමි" යි කියා ද උත්තරී මනුෂ්‍යධර්මය ප්‍රකාශ නො කළ යුතු ය. යම් භික්ෂුවක් ලාමක වූ ආශා ඇත්තේ, ලාමක ආශාවෙන් මඩනා ලද්දේ, මට ධ්‍යානයක්

*Non-commercial distribution*

හෝ විමෝක්ෂයක් හෝ සමාධියක් හෝ සමාපත්තියක් හෝ මාර්ගයක් හෝ ඵලයක් හෝ ඇතය යි තමා කෙරෙහි නැති උත්තරී මනුෂ්‍යධර්මය ප්‍රකාශ කෙරේ ද, එයින් හෙතෙමේ අශ්‍රමණයෙක් වේ, අබුධපුත්‍රයෙක් වේ. යම් සේ මුදුන සුන් තල්ගස නැවත වැඩීමට අභව්‍ය වේද, එමෙන් මහණ ලාමක ආශා ඇතිව ලාමකාශාවෙන් මඩනා ලදුව තමා කෙරෙහි නැත්තා වූ උත්තරීමනුෂ්‍ය ධර්මය ප්‍රකාශ කොට අශ්‍රමණයෙක් වේ. අබුද්ධ පුත්‍රයෙක් වේ. එය තොප විසින් දිවි හිමියෙන් නො කළ යුතු ය.

## දෙතුන් දෙනා එකවර උපසම්පද කිරීම

එසමයෙහි උපසම්පදපේක්ෂකයන් අතර පළමු වෙන් උපසම්පද වීම ගැන විවාද ඇති විය. ඒ බව බුදුරජාණන් වහන්සේට සැලකළ කල්හි **"අනුජානාමි භික්ඛවෙ ද්වෙ තයො එකානුසාවනෙ කාතුං, තඤ්ච ඛො එකෙන උපජ්ඣායෙන, නත්වෙව නානුපජ්ඣායෙන"** යනුවෙන් සමාන උපාධ්‍යායයන් ඇති දෙතුන් දෙනා එක් අනුශ්‍රාවණයෙන් උපසම්පද කිරීමට අනුදැන වදළ-සේක. එහෙත් එය කරන කර්මවාක්‍යය විනය පාළියෙහි නැත්තේය. බුරුම රට කර්මවාක්‍ය පොත්වල එය මෙසේ දක්වා තිබේ.

**"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො, අයං ච නාගො අයං ච දත්තො ආයස්මතො තිස්සස්ස උපසම්පදාපෙක්ඛා, පරිසුද්ධා අන්තරායිකෙහි ධම්මෙහි, පරිපුණ්ණ'ස්සිමෙසං පත්තචීවරං. නාගො ච දත්තො ච සඞ්ඝං උපසම්පදං යාචන්ති, ආයස්මතා තිස්සෙන උපජ්ඣායෙන. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො නාගං ච දත්තං ච උපසම්පාදෙය්‍ය ආයස්මතා තිස්සෙන උපජ්ඣායෙන. එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ සඞ්ඝො, අයං ච නාගො අයං ච දත්තො ආයස්මතො තිස්සස්ස උපසම්පද**

Non-commercial distribution

පෙකඛා, පරිසුද්ධා අන්තරායිකෙහි ධම්මෙහි, පරිපුණ්ණමෙසං පත්තචීවරං, නාගො ච දත්තො ච සඞ්ඝං උපසම්පදං යාචන්ති, ආයස්මතා තිස්සෙන උපජ්ඣායෙන. සඞ්ඝො නාගං ච දත්තං ච උපසම්පාදෙති, ආයස්මතා තිස්සෙන උපජ්ඣායෙන. යස්සායස්මතො ඛමති නාගස්ස ච දත්තස්ස ච උපසම්පදා, ආයස්මතා, තිස්සෙන උපජ්ඣායෙන. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

දුතියම්පි එතමත්ථං වදාමි. -පෙ-
තතියම්පි එතමත්ථං වදාමි. -පෙ- සො භාසෙය්‍ය.

උපසම්පන්නා සඞ්ඝෙන නාගො ච දත්තො ච ආයස්මතා තිස්සෙන උපජ්ඣායෙන. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි..

**උපසම්පදාවට අභව්‍ය පුද්ගලයෝ**

ඉහත දැක්වූ පණ්ඩකාදි පුද්ගලයෝ එකොළොස් දෙනාය, පාරාජිකාවට පත් තැනැත්තාය, විසිවයස නො පිරුණු තැනැත්තාය යන තෙළෙස් දෙනා උපසම්පදාවට අභව්‍යයෝ ය. උපසම්පදා කර්මය කරන ලදුයේ ද ඔවුනට උපසම්පදාව නො පිහිටන්නේ ය. සෙසු දෙස් ඇතියන් උපසම්පදා කළහොත් කාරක සඞ්ඝයාට දුකුළා ඇවැත් වේ. උපසම්පදාව ඔවුන්ට පිහිටයි. පැවිද්දට නුසුදුස්සන් වශයෙන් දක්වා ඇති සැම දෙනාම උපසම්පදාවට ද නුසුදුස්සෝ ය. එහෙත් හත්ථච්ඡින්නාදීන් උපසම්පදා කළහොත් ඔවුනට උපසම්දාව පිහිටන්නේ ය. එයින් කාරක සඞ්ඝයාට හා ආචාර්යෝපාධ්‍යායයන්ට ඇවැත් වේ. එහෙයින් **සමන්තපාසාදිකා** නම් වූ විනය අටුවාවෙහි **"යෙසං ච පබ්බජ්ජා පටික්ඛිත්තා උපසම්පදාපි තෙසං පටික්ඛිත්තා ච. සචෙ පන සඞ්ඝො උපසම්පාදෙති සබ්බෙපි හත්ථච්ඡින්නාදයො සූපසම්පන්නා, කාරකසඞ්ඝො පන ආචාරියුපජ්ඣායා ච ආපත්තිතො න මුච්චන්ති"** යි කීහ.

Non-commercial distribution

### උපසම්පදපේක්ෂකයාගේ වයස

උපසම්පදපේක්ෂකයාගේ වයස විශේෂයෙන් සැලකිය යුත්තකි. **"යො පන භික්ඛු ජානං ඌනවීසති වස්සං පුග්ගලං උපසම්පාදෙය්‍ය සො ච පුග්ගලො අනුපසම්පන්නො, තෙච භික්ඛු ගාරය්හා ඉදං තස්මිං පාචිත්තියං"** යනුවෙන් තථාගතයන් වහන්සේ විසින් විසි වසක් නො පිරුණු පුද්ගලයකු උපසම්පද කරන උපාධ්‍යාචාර්‍ය්‍යවරයාට පචිති ඇවැතක් පනවා තිබේ. අනිකුත් නුසුදුස්සන් උපසම්පද කිරීමේ වරදට දුකුළා ඇවත මිස පචිති ඇවතක් පනවා නැත. එයින් උපසම්පදපේක්ෂකයාගේ වයස විශේෂයෙන්ම සැලකිය යුතු බව කීමු. උපසම්පදපේක්ෂකයාගේ වයස ගණින් ගත යුත්තේ ප්‍රසූතියේ පටන් නොව ප්‍රතිසන්ධියේ පටන් ය. ඒ බවː-

**"යං භික්ඛවෙ! මාතුකුච්ඡිස්මිං පඨමං චිත්තං උප්පන්නං, පඨමං විඤ්ඤාණං පාතුභූතං, තදුපාදය සාවස්ස ජාති. අනුජානාමි භික්ඛවෙ ගබ්භවීසං උපසම්පාදෙතුං"**

යන විනය දේශනයෙන් දත යුතු ය. මවුකුස දස මසක් විසූ කෙනකු උත්පත්තියෙන් එකුන්විසි වසකුත් දෙමසක් ගත වූ කල්හි උපසම්පද කළ හැකි ය. නව මසක් මවුකුස විසූ තැනැත්තා උත්පත්තියෙන් එකුන් විසි වසකුත් තෙමසක් ගතවූ පසු උපසම්පද කළ හැකි ය. විසිවස් වයස නො පිරුණු කෙනකු පිරුණු කෙනකැයි සිතා වැරදීමකින් උපසම්පද කිරීමෙන් ඇවැත් නො වේ. එහෙත් වයස වරදවා තේරුම් ගෙන සිටි උපසම්පදපේක්ෂකයාට උපසම්පදව නොපිහිටයි. ඔහු දසවස් පිරුණු පසු උපාධ්‍යාය වී ගෝලයකු උපසම්පද කළ හොත්, ඔහු හැර කර්මයට සෑහෙන පමණට භික්ෂූහු එහි වූවාහු නම් ගෝලයාට උපසම්පදව පිහිටයි. විසිවස් වයස නො පිරී උපසම්පද වූ බව නො දැන, මහණකම් කරන්නා වූ ඒ තැනැත්තාට එසේ විසීම ස්වර්ග- මෝක්ෂ දෙකට අන්තරායකර නො වේ. මහළු වයසට පැමිණි පසු වුව ද තමා අඩුවයසින් උපසම්පද වූ බව නිසැකව දැනගත හොත් නැවත උපසම්පද විය යුතු ය. දැන ගැනීමෙන් පසු උපසම්පන්නයකු සැටියට පෙනී සිටීම වඤ්චාවක් බැවින් ඔහුට එය අන්තරායකර වේ.

*Non-commercial distribution*

**"අනාපත්ති ඌනවීසතිවස්සං. පරිපුණ්ණවීසති සඤ්ඤිති එත්ථ කිඤ්චාපි උපසම්පාදෙන්තස්ස අනාපත්ති, පුග්ගලො පන අනුපසම්පන්නොව හොති. සචෙ පන සො දසවස්සච්චයෙන අඤ්ඤං උපසම්පාදෙති, තං චෙ මුඤ්චිත්වා ගණො පූරති, සූපසම්පන්නො. සො පි ච යාව න ජානාති, තාවස්ස නෙව සග්ගන්තරායො න මොක්ඛන්තරායො, ඤත්වා පන පුන උපසම්පජ්ජිතබ්බං"** යනු විනය අටුවායි.

**උපාධ්‍යාය වීමට සුදුසු භික්ෂූන් වහන්සේ**

උපාධ්‍යාය වී ගෝලයන් මහණ කිරීමට හා උපසම්පද කිරීමට සියල්ලෝ සුදුස්සෝ නො වෙති. සුදුසුකම් නැතිව උපාධ්‍යාය වී ගෝලයන් මහණ කරන උපසම්පද කරන නිස දෙන භික්ෂුවට දුකුළා ඇවැත් වේ.

**"න භික්ඛවෙ! බාලෙන අබ්‍යත්තෙන උපසම්පාදෙතබ්බො. අනුජානාමි භික්ඛවෙ! බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන දසවස්සෙන වා අතිරෙක දසවස්සෙන වා උපසම්පාදෙතුං"** යනු බුධ වචනයි.

"මහණෙනි! බාලවූ අව්‍යක්තවූ භික්ෂුව විසින් උපසම්පද නො කළ යුතු ය. මහණෙනි! දසවස් ඇත්තාවූ ද, දසයකට අධික වස් ඇත්තා වූ ද, ව්‍යක්ත වූ ද, ප්‍රතිබල වූ ද භික්ෂුව විසින් උපසම්පද කිරීම අනු දනිමිය, යනු එහි තේරුම ය.

උපාධ්‍යාය වීමට සුදුසු භික්ෂූන් වහන්සේ **'පරිසුපට්ඨායක බහුශ්‍රැත'** නම් වෙති, පරිසුපට්ඨායක බහුශ්‍රැතයාගේ අඞ්ග මෙසේ යː-

විනයෙන් භික්ෂු භික්ෂුණී විභඞ්ග දෙක ප්‍රගුණ වීමය, කර්‍මාකර්‍ම විනිශ්චය දැන ගැනීමය, වත්තක්ඛන්ධකය දැන ගැනීමය, මජ්ඣිම නිකායයෙන් මූලපණ්ණාසකය හෝ දීඝනිකායයෙන් මහාවර්ගය හෝ සංයුත්ත නිකායයෙන් හෙට්ඨිම වර්ග තුන හෝ මහාවර්ගය හෝ අඞ්ගුත්තර නිකායයෙන් අඩක් හෝ ඛුද්දක නිකායයෙන් අටුවාව සහිත ධම්මපදය හෝ ජාතක පොත හෝ ප්‍රගුණ කරගෙන තිබීමය, උපසම්පදවෙන් දසවස් ඇත්තකු වීම ය යන මේවා පරිසුපට්ඨායක බහුශ්‍රැතයාගේ අඞ්ගයෝ ය.

Non-commercial distribution

**උපසම්පදවෙන් පසු:**

අළුත උපසම්පද වූ භික්ෂුව පස් වසක් ගත වන තුරු උපාධ්‍යායයන් වහන්සේ ඇසුරු කෙරෙමින් උන් වහන්සේ වෙසෙන තැනක ම විසිය යුතු ය. උපාධ්‍යායයන් වහන්සේගෙන් වෙන්ව වාසය කරන, නවක භික්ෂුවට එයින් අරුණක් පාසාම දුකුළා ඇවැත් වේ. තමා උපාධ්‍යාය වී අන්‍යයන් උපසම්පද කොට ඔවුන් හැර දමන්නා වූ උපාධ්‍යායයාට ද වත්තභේදයෙන් දුකුළා ඇවැත් වේ. '**නිඃශ්‍රය මුක්තක බහුශ්‍රැතයකු**' නුවුවහොත්, භික්ෂුව දිවිහිමියෙන් උපාධ්‍යායයන් වහන්සේ වෙත හෝ ආචාර්‍ය්‍යවරයකු වෙත හෝ විසිය යුතුය.

ප්‍රාතිමෝක්ෂ දෙක පාඩම් තිබීමය, සූත්‍ර පිටකයෙන් බණවර සතරක් ප්‍රගුණ වීමය, තමා වෙත පැමිණෙනවුන්ට කියා දීමට යම්කිසි කථාමාර්ගයක් පුහුණු කර ගෙන තිබීමය, මඞ්ගලා-මඞ්ගලයන්හි අනුමෝදනාව පිණිස බණ තුනක් පුහුණු කරගෙන තිබීමය, උපෝසථපවාරණාදි විනය කර්ම ගැන දැනගෙන තිබීමය, යම් කිසි භාවනා මාර්ගයක් පුහුණු කරගෙන තිබීමය, උපසම්පදවෙන් පස්වසක් පිරීමය යන මේවා නිඃශ්‍රය මුක්තක බහුශ්‍රැතයාගේ අඞ්ගයෝ ය.

**නිඃශ්‍රය සමාදානය.**

උපාධ්‍යායයන් වහන්සේ අපවත් වීම් ආදී යම්කිසි කරුණකින් නිඃශ්‍රය මුක්තක නො වූ භික්ෂුවට, උපාධ්‍යායයාගේ නිඃශ්‍රය නැතිවුව හොත්, ඒ භික්ෂුව පරිසුපසථායක බහුශ්‍රැත සථවිර නමකගෙන් නිඃශ්‍රය ග්‍රහණය කොට විසිය යුතු ය. නිඃශ්‍රය ගන්නා වූ භික්ෂුව විසින් නිඃශ්‍රයාචාර්‍ය්‍යවරයා වෙත එළඹ, සිවුරු ඒකාංසකොට පෙරවා, උක්කුටියෙන් හිඳ වැඳගෙන "**ආචාරියො මෙ භන්තෙ හොහි. ආයස්මතො නිස්සාය වච්ඡාමි**" යන වැකිය තුන්වරක් කීමෙන් නිස ගත යුතු ය. නිඃශ්‍රයාචාර්‍ය්‍යයා විසින් "**පාසාදිකෙන සම්පාදෙථ**" යි කියා එය පිළිගත යුතු ය. සාහු, ලහු, ඔපායිකං, පතිරූපං යන වචන ද ඒ සඳහා සුදුසු ය.

වස් බොහෝ ගණනක් වී නිස මිදීමට තරම් උගත් කමක් නැත්තා වූ භික්ෂුව, නිස ගැනීමට වැඩිමහල්ලකු සොයා ගත

Non-commercial distribution

හැකි නො වේ නම්, තමාට බාලවූ පරිසුපස්ථායක බහුශ්‍රැතයකුගෙන් නිස ගත යුතු ය. තමාට බාල වුව ද ගුරුවරයාට වැදිය යුතු ය. එහෙත් බාලයකුට "**භන්තෙ**" යන වචනය ව්‍යවහාර නො කළ යුතු ය. වැඩිමහලු භික්ෂුවක් විසින් බාල භික්ෂුවකගෙන් නිස ගැනීමේදී නිඃශ්‍රයාචාර්‍යවරයා ඉදිරියේ සිවුරු ඒකාංසකොට පෙරවා උක්කුටිකයෙන් හිඳ වැඳ-ගෙන "**ආචාරියො මෙ ආවුසො හොහි. ආයස්මතො නිස්සාය වච්ජාමි**" යි තෙවරක් කිය යුතු ය. ගම් වැදීමට විචාරන කල්හි ද උක්කුටිකයෙන් හිඳ වැඳගෙන "**ගාමප්පවෙසනං ආපුච්ජාමි ආචරිය**" යි කිය යුතු ය. පැන විචාරීමේදී ද එසේ පිළිපැදිය යුතු ය.

උපාධ්‍යාචාර්‍ය, නිඃශ්‍රයාචාර්‍ය දෙදෙනාගෙන් උපාධ්‍යාචාර්‍යවරයා ප්‍රධාන වේ. නිස ගත යුත්තේ උපාධ්‍යාචාර්‍යවරයාගෙන් වෙන් වූ අවස්ථාවලදී ය. උපාධ්‍යාචාර්‍යවරයා අන් පෙදෙසක වෙසෙන අවස්ථාවක අන් තෙර කෙනකුන්ගෙන් නිස ගෙන වෙසෙන කල්හි, නැවත උපාධ්‍යාචාර්‍යවරයා එහි පැමිණියහොත් අන්තේවාසිකයා විසින් උපාධ්‍යායයා දුටු කෙණෙහි ගන්නා ලද නිස සන්සිඳෙයි. (අහෝසි වෙයි) උපාධ්‍යාචාර්‍යවරයා නැවත ගිය හොත්, පළමු ගත් නිස අභාවයට ගිය බැවින් නැවතත් නිස ගත යුතු ය. උපසම්පද වීමේදී උපාධ්‍යාය ග්‍රහණය කළ තැනැත්තාට එය සැම කල්හි ම පවත්නේ ය. නැවත ගැනීමක් නුවුවමනාය. නිස වනාහි බිඳුණු බිඳුණු අවස්ථාවලදී නැවත නැවත ගත යුතු ය.

## අධිෂ්ඨාන විකප්පන විධි

"**දසාහපරමං අතිරෙක පත්තො ධාරෙතබ්බො. තං අතික්කාමයතො නිස්සග්ගියං පාචිත්තියං**" යි වදාරා ඇති බැවින් අතිරේක පාත්‍රය දසදිනකට වඩා කල් තබා ගන්නා භික්ෂුවට නිසගි පචිති වේ. එබැවින් පාත්‍රය අධිෂ්ඨාන හෝ කළ යුතු ය. විකප්පනය හෝ කළ යුතු ය. අතිරේක පාත්‍රය යයි කියනුයේ එසේ නො කළ පාත්‍රය ය. පාත්‍රයක් වශයෙන් අධිෂ්ඨාන කළ යුත්තේ ද ඉතා කුඩා ද නො වූ, ඉතා මහත් ද නො වූ පරිභෝගයට සුදුසු වන සැටියට මට්ටම් කොට වර්ණවත් කළ පාත්‍රය යි. එසේ නො වන පාත්‍රය භාජනයක් හැටියට පාවිච්චි කිරීමෙන් වරදක් නො වේ.

Non-commercial distribution

උපසම්පදවට ගත් පාත්‍රය දස දිනක් ඇතුළත අධිෂ්ඨාන කරගත යුතු ය. එක් පාත්‍රයක් අධිෂ්ඨාන කර ගෙන ඉන්නා අතර අලුත් පාත්‍රයක් අධිෂ්ඨාන කර ගන්නට ඕනෑකරන හොත්, එක් භික්ෂුවකට පාත්‍ර දෙකක් නො ඉටිය හැකි බැවින් පරණ පාත්‍රය අනිකකුට හෝ දිය යුතු ය, පච්චුද්ධරණය හෝ කළ යුතු ය. පච්චුද්ධරණය කිරීමේදී පාත්‍රය ළඟ තිබේ නම්, එය අතට ගෙන හෝ අතින් ස්පර්ශ කර ගෙන හෝ "**ඉමං පත්තං පච්චුද්ධරාමි**" යි තෙවරක් කිය යුතු ය. පාත්‍රය දුර තිබේ නම්, ඇති තැන සලකා ගෙන "**එතං පත්තං පච්චුද්ධරාමි**" යි තෙවරක් කිය යුතු ය. අධිෂ්ඨාන කිරීමේදී පාත්‍රය ළඟ තිබේ නම්, "**ඉමං පත්තං අධිට්ඨාමි**" යි ද, දුර තිබේ නම් ඇති තැන සලකා ගෙන, එතං පත්තං අධිට්ඨාමි, යි ද තෙවරක් කිය යුතු ය.

**අධිෂ්ඨානය බිඳීම**.

**"අච්ඡේද දාන ගාහෙහි-විබ්භමා මරණූද්ධටා**
**ලිඞ්ග සික්ඛාහි ජිද්දෙසු-පත්තොධිට්ඨාන මුජ්ඣති**."

යනුවෙන් දැක්වෙන පරිදි සොරුන් විසින් පැහැර ගැනීමය, අනුන්ට දීමය, විශ්වාසිකයන් විසින් ගැනීමය, සිවුරු හැරීමය, මරණයට පැමිණීමය, පච්චුධරණය කිරීමය, ලිඞ්ග පරිවර්තනය වීමය, උපසම්පදව ප්‍රතික්ෂේප කිරීමය, බත්හුළු පිට වෙන තරමට සිදුරුවීමය යන කරුණු නවයෙන් පාත්‍රාධිෂ්ඨානය අභාවයට යේ. සිදුරු වීමෙන් අධිෂ්ඨානය බිඳුණු කල්හි පිළියම් කර නැවත අදිටන් කළ යුතු ය. එසේ නො කළ හොත් දසදින ඉක්මීමෙන් නිසගි පචිති වේ.

**පාත්‍රවිකප්පනය**

එක් පාත්‍රයක් අධිෂ්ඨාන කර-ගෙන වෙසෙන භික්ෂුව තවත් පාත්‍ර ලැබී ඒවාත් තමාගේ අයිතියෙහි තබා ගනු කැමති නම්, විකප්පනය කොට තබා ගත යුතු·ය. නිකම්ම තබා ගත හොත් දස දින ඉක්මීමෙන් නිසගි පචිති වේ. විකප්පනය කළ යුත්තේ මෙසේය. පාත්‍රය ව්‍යක්ත භික්ෂුවක් වෙත ගෙන ගොස්, උක්කුටිකයෙන් හිඳ, "**ඉමං පත්තං තුය්හං විකප්පෙමි**" යන වැකිය තෙවරක් කියා

Non-commercial distribution

ඒ භික්ෂුවට දිය යුතු ය. විකප්පනය යනු දීමක් හෝ පූජාවක් නොව, විනය කර්‍මයකි. එබැවින් ඒ භික්ෂුව විසින් **"මය්හං සන්තකං පරිභුඤ්ජ වා විස්සජ්ජෙහි වා යථාපච්චයං කරොහි"** යන වැකිය තුන්වරක් කියා ආපසු දිය යුතු ය. එසේ කිරීමට **පච්චුද්ධාරය** යි කියනු ලැබේ.

පච්චුද්ධාරයෙන් පසු ඒ පාත්‍රය කැමති කලක් තබා ගැනීමෙන් හා පරිභෝග කිරීමෙන් ද ඇවැත් නො වේ. වැඩි ගණනක් පාත්‍ර විකප්පනය කිරීමේදී **"ඉමෙ පත්තෙ තුය්හං විකප්පෙමි"** යි ද පච්චුද්ධාරයේ දී **"මය්හං සන්තකෙ පරිභුඤ්ජ වා විස්සජ්ජෙහි වා යථා පච්චයං කරොහි"** යි ද කිය යුතු ය. විකප්පනය කිරීමට පාත්‍රය සමීපයෙහි නැති නම්, මාගේ පාත්‍රය අසවල් තැන ඇත ය යි අනික් භික්ෂුවට කියා, තිබෙන තැන සලකාගෙන **"එතං පත්තං තුය්හං විකප්පෙමි"** යි ද, පාත්‍ර බොහෝ නම් **"එතෙ පත්තෙ තුය්හං විකප්පෙමි"** යි ද කියනු.

**පාත්‍රයේ ප්‍රමාණය.**

**"තයො පත්තස්ස වණ්ණා උක්කට්ඨො පත්තො මජ්ඣිමො පත්තො ඔමකො පත්තො. උක්කට්ඨො නාම පත්තො අඩ්ඪාළ්හකොදනං ගණ්හාති. චතුභාගං ඛාදනං තදුපියං ච ව්‍යඤ්ජනං. මජ්ඣිමො නාම පත්තො නාළිකොදනං ගණ්හාති. චතුභාගං ඛාදනං තදුපියං ච ව්‍යඤ්ජනං. ඔමකො නාම පත්තො පත්ථොදනං ගණ්හාති. චතුභාගං ඛාදනං තදුපියං ච ව්‍යඤ්ජනං"** මෙය පාරාජිකාපාළියෙහි පාත්‍රයේ ප්‍රමාණය දැක්වුණු පාඨයෙකි.

මේ විනය දේශනයෙන් උත්කෘෂ්ට පාත්‍රයය, මධ්‍යම පාත්‍රයය, ඕමක පාත්‍රය යයි පාත්‍ර තුනක් දැක් වේ. උත්කෘෂ්ට පාත්‍රය නම්:- එකල මගධ-රට භාවිත කළ නැළියෙන් සහල් දෙ නැළියකින් මැනවින් පිසූ බත හා ඒ බතින් සතරෙන් කොටසක් පමණ වූ අතට ගත හැකි පදමට පිසූ මුංඇට මාළුව ද, ඒ බතට ප්‍රමාණ වන අනිකුත් ව්‍යඤ්ජන ද යන සියල්ල බහා-ලිය හැකි පාත්‍රය ය. මධ්‍යම පාත්‍රය නම්:- මගධ නැළියෙන් එක් නැළියක සහලින් පිසූ බත හා එයින් සතරෙන් කොටසක් මුංඇට මාළුව ද, ඒ බතට සෑහෙන අනිකුත් ව්‍යඤ්ජන ද බහා-ලිය හැකි පාත්‍රය ය. ඕමක පාත්‍රය නම්:- මගධ

Non-commercial distribution

නැළියෙන් අඩක් සහලින් පිසූ බත හා එයින් සතරෙන් කොටසක් මුංඇට මාළුවත් අනිකුත් ව්‍යඤ්ජනත් බහා-ලිය හැකි පාත්‍රය ය.

මගධ නැළියෙන් දෙ නැළියක බත හා එයින් සතරෙන් කොටසක් මුංඇට මාළුවත් අනිත් ව්‍යඤ්ජනත් බහා-ලූ කල්හි පාත්‍ර ගැටියේ යටි මට්ටමෙනුත් පහළින් සිටී නම්, ඒ පාත්‍රය උත්කෘෂ්ට පාත්‍රයට මහත් බැවින් අපාත්‍රයෙකි. ඕමක පාත්‍රයට නියමිත ආහාර රාසිය බහා-ලූ කල්හි ගැටියෙන් උඩටත් ආහාර මතු වී සිටින පාත්‍රය, ඉතා කුඩා බැවින් අධිෂ්ඨානයට අයෝග්‍යය ය, එය ද අපාත්‍රයෙකි. විනය අටුවාවෙහි උත්කෘෂ්ටෝත්කෘෂ්ටය, උත්කෘෂ්ට ය, උත්කෘෂ්ටෞමක ය, මධ්‍යමෝත්කෘෂ්ටය, මධ්‍යමය, මධ්‍යමෞමකය, ඕමකෝත්කෘෂ්ටය, ඕමකය, ඕමකෞමකය යි පාත්‍ර නවයක් දක්වා උත්කෘෂ්ටෝත්කෘෂ්ට පාත්‍රය හා ඕමකෞමක පාත්‍රය අපාත්‍රය යි ද, ඉතිරි සත අධිෂ්ඨානයට යෝග්‍ය පාත්‍රයයි ද කියා තිබේ.

මගධ නැළිය ගැන නොයෙක් මත තිබේ. එය සාමාන්‍යයෙන් දැනට මෙහි භාවිත කරන සේරුව තරමේ එකකැයි සිතිය හැකි ය.

**"අනුජානාමි භික්ඛවෙ! ද්වෙ පත්තෙ අයොපත්තං මත්තිකා-පත්තං"** යි වදරන ලද යකඩ පාත්‍රය හා මැටි පාත්‍රයක් හැර, අනික් පාත්‍රයක් අධිෂ්ඨානයට නුසුදුසු බව ද සැලකිය යුතු ය.

**චීවරාධිෂ්ඨානය.**

**"නිට්ඨිතචීවරස්මිං පන භික්ඛුනා උබ්භතස්මිං කඨිනෙ දසාහපරමං අතිරෙක චීවරං ධාරෙතබ්බං, තං අතික්කාමයතො නිස්සග්ගියං පාචිත්තියං"** යනු විනය නීති බැවින් අධිෂ්ඨානය හෝ විකප්පනය හෝ නො කොට සිවුරු තබා ගැනීමට නිදහස ඇති විශේෂ කාල හැර, අන් දිනකදී අතිරේක චීවරයක් දසදිනකට වඩා තබා ගත හොත් නිසගි පචිති වේ. 'අතිරේක චීවරය ය' යි කියනුයේ අධිෂ්ඨානය හෝ විකප්පනය නො කළ සිවුරුවලට ය. සංඝාටිය, උත්තරා සඞ්ගය, අන්තර වාසකය, වස්සිකසාටිකය, නිසීදනය, පච්චත්ථරණය, කණ්ඩුපටිච්ඡාදිකය, මුඛපුඤ්ඡන චෝළකය, පරික්ඛාර චෝළය යි සිවුරු නවයෙකි, එයින් සඞ්ඝාටි-උත්තරාසඞ්ග-අන්තරවාසක යන තුන ප්‍රධාන ය.

Non-commercial distribution

සඞ්ඝාටි යනු දෙපට සිවුරය, උත්තරාසඞ්ග යනු තනිපට සිවුරය, අන්තරවාසක යනු අඳනය ය. ඒවා අධිෂ්ඨාන කරන්නට කලින් පඬු පොවා **කප්බින්දු** තැබිය යුතු ය. කප්බින්දුව සිවුරේ කොන් සතරෙහි ම හෝ තුනක හෝ දෙකක හෝ එක්කොණක හෝ මොනරකුගේ ඇස පමණ මහතට නිල් පැහැයෙන් තැබිය යුතු ය. සංඝාටිය **"ඉමං සඞ්ඝාටිං අධිට්ඨාමි"** කියා ද, උත්තරාසඞ්ගය **"ඉමං උත්තරාසඞ්ගං අධිට්ඨාමි"** කියා ද, අන්තරවාසකය **"ඉමං අන්තරවාසකං අධිට්ඨාමි"** කියා ද ඉටාගත යුතු ය. ඒවා අත්පසින් බැහැර තිබියදී අදිටන් කරත හොත් ඇති තැන සලකාගෙන, එතං සඞ්ඝාටිං අධිට්ඨාමි, එතං උත්තරාසඞ්ගං අධිට්ඨාමි, එතං අන්තරවාසකං අධිට්ඨාමි, යි අදිටන් කළ යුතු ය.

**සිවුරුවල ප්‍රමාණ.**

ප්‍රමාණයට වඩා කුඩා වූ හෝ මහත් වූ හෝ සිවුරු සඞ්ඝාටි උත්තරාසඞ්ග අන්තරවාසක යන නම් වලින් නො ඉටිය හැකි ය. අන්තිම පරිච්ඡේදයෙන් සඞ්ඝාටිය හා උත්තරාසඞ්ගය, අදිටන් කරන භික්ෂුවගේ අතින්, දිගින් සතර රියනක් හා මිටි-රියනක් ද, පුළුලින් දෙරියනක් හා මිටි-රියනක් ද තිබිය යුතු ය. අන්තරවාසකය දිගින් සතර රියනක් හා මිටි-රියනක් ද පුළුලින් දෙරියනක් ද තිබිය යුතු ය. ඒ ප්‍රමාණවලට කුඩා නම් තිචීවරාධිෂ්ඨානයට නො ගත හැකි ය. මහත් වූවාට වරදක් නැත. එහෙත් හැම සිවුරක් ම සුගතචීවරයට වඩා කුඩා විය යුතු ය.

**අධිෂ්ඨානය බිඳීම.**

පාත්‍රාධිෂ්ඨානය බිඳීමට කී කරුණු නවයෙන් තිචීවරාධිෂ්ඨානය ද බිඳේ. සිදුරු වීමෙන් අධිෂ්ඨානය බිඳෙන්නේ සඞ්ඝාටි උත්තරාසඞ්ග දෙක්හි දිග අතේ දෙ-කෙළවරින් වියතින් මොබ ද, පලල් අතේ දෙ-කෙළවරින් අහල් අටකින් මොබ ද, සුළඟිලි නිය පිට පමණ වූ ද සිදුරක් වීමෙනි. අන්තරවාසකයෙහි දික් අතේ දෙ-කෙළවරින් වියතකට මොබ ද, පලල් අතේ දෙ-කෙළවරින් සතර අඟුලකින් මොබ ද කියන ලද ප්‍රමාණ සිදුරක් වීමෙනි. සිදුරු මැද එක් නූල්-පටකුදු ඉතිරිවී නැති නම් අධිෂ්ඨානය නො බිඳේ.

Non-commercial distribution

එසේ අධිෂ්ඨාන බිඳුණු චීවරය මසා ප්‍රතිසංස්කරණය කොට දස දිනකින් මොබ නැවත ඉටාගත යුතු ය.

**පරික්කාරචෝළාධිෂ්ඨානය.**

සඞ්ඝාටි, උත්තරාසඞ්ග, අන්තරවාසක යන නම් වලින් එක් භික්ෂුවකට එක් චීවරය බැගින් මිස, එක ජාතියකින් දෙක තුන අධිෂ්ඨාන නො කළ හැකි ය. එබැවින් වැඩි සිවුරු පරිභෝග කරනු කැමතියන් විසින් ඒවා පරිෂ්කාරචෝළ වශයෙන් ඉටිය යුතු ය. එක් සිවුරක් අදිටන් කිරීමේදී " **ඉමං චීවරං පරික්ඛාර චොළං අධිට්ඨාමි**" යි තුන් වරක් කියා අදිටන් කළ යුතු ය. සිවුරු එකකට වැඩි ගණනක් වේ නම්, සියල්ල එක්කොට තබා " **ඉමානි චීවරානි පරික්ඛාර චොළානි අධිට්ඨාමි** " යි කිය යුතු ය. අත්පසින් බැහැර ඇති සිවුරු අදිටන් කිරීමේදී " **එතං චීවරං පරික්ඛාර චොළං අධිට්ඨාමි**" යි ද, " **එතානි චීවරානි පරික්ඛාර චොළානි අධිට්ඨාමි** " යි ද කිය යුතු ය.

**"තිච්චීතචීවරස්මිං පන භික්ඛුනා උබ්භතස්මිං කඨිනෙ, එකරත්තං පි චෙ භික්ඛු තිචීවරෙන විප්පවසෙය්‍ය අඤ්ඤත්‍ර භික්ඛු සම්මුතියා, නිස්සග්ගියං පාචිත්තියං"**

යන සිකපදයෙන් ඇවැත් නො වන සැටියට තුන් සිවුර යන යන තැනට ගෙන යමින් පරිහරණය කිරීම අපහසු භික්ෂූන් විසින්, සඞ්ඝාටි-උත්තරාසඞ්ග-අන්තරවාසක යන නම්වලින් එකකුදු අදිටන් නො කොට, සියල්ල ම පරික්ඛාර චෝළ නාමයෙන් ම ඉටා ගැනීමෙන් ද වරදක් නොවේ. දැනට බොහෝ භික්ෂූන් සිවුරු පරිහරණය කරන්නේ ඒ ක්‍රමයෙනි.

කොට්ටඋර-ඇතිරිලි ආදි සේනාසන පරිෂ්කාර වන වස්ත්‍ර හැර, දිගින් රියනටත් පුළුලින් වියතටත් කුඩා නො වන, වස්ත්‍ර ජාති වලින් කවරක් වුවත් අධිෂ්ඨානය හෝ විකප්පනය නො කොට, අකාලයේදී දස දිනකට වඩා තබා ගත හොත් නිසගි පචිති වන බැවින්, ඨවික-ලේන්සු අංසකඩ හා තවත් ලැබෙන රෙදි කැලි සියල්ල 'පරිෂ්කාර චෝළ' වශයෙන් ඉටා ගන්නට හෝ විකප්පනය කරගන්නට හෝ පුරුදු කර ගත යුතු ය.

Non-commercial distribution

**චීවර විකප්පනය.**

විකප්පනය කරන සිවුර ගෙන භික්ෂුවක් සමීපයේ උක්කුටිකව හිඳ, "**ඉමං චීවරං තුය්හං විකප්පෙමි**" යි තුන්වරක් කියා අනික් භික්ෂුවට සිවුර දිය යුතු ය. එසේ කිරීම විකප්පනය ය. පිළිගත් භික්ෂුව විසින් "**මය්හං සන්තකං පරිභුඤ්ජ වා විස්සජ්ජෙහි වා යථාපච්චයං කරොහි**"යි තුන් වරක් කියා එය ආපසු දිය යුතු ය. එය පච්චුද්ධාරය යි. සිවුරු එකකට වැඩි කල්හි "**ඉමානි චීවරානි තුය්හං විකප්පෙමි**" යි කිය යුතු ය. පච්චුද්ධාරයේ දී "**මය්හං සන්තකානි පරිභුඤ්ජ වා විස්සජ්ජෙහි වා යථාපච්චයං කරොහි**" යි කිය යුතු ය. අත්පසින් බැහැර ඇති සිවුරු විකප්පනය කිරීමේදී ඇති තැන කියා "**එතං චීවරං තුය්හං විකප්පෙමි**" යි ද, සිවුරු බොහෝ නම් "**එතානි චීවරානි තුය්හං විකප්පෙමි**" යි ද කිය යුතු ය. පච්චුද්ධාරය පෙර සේ ම ය.

කොට්ට-උර, ඇතිරිලි ආදිය නො ඉටීමෙන් ඇවැත් නො වේ. පරික්ඛාර චෝළ සැටියට ඉටීමේදී එකක් නම්, "**ඉමං චීවරං පරික්ඛාරචොළං අධිට්ඨාමි**" කියා ද, වැඩි ගණනක් නම්, "**ඉමානි චීවරානි පරික්ඛාරචොළානි අධිට්ඨාමි**" කියා ද අදිටන් කළ යුතු ය. අත්පසින් බැහැර ඇති සිවුරු ඉටීමේදි "**එතං චීවරං පරික්ඛාර-චොළං අධිට්ඨාමි**" කියා ද "**එතානි චීවරානි පරික්ඛාරචොළානි අධිට්ඨාමි**" කියා ද අදිටන් කළ යුතු ය.

## ඇවැත් දෙසීම.

'ඇවැත් දෙසීමය' යනු ඇවැත් වලින් පිරිසිදු වනු පිණිස ආරෝචනය කිරීම ය. භික්ෂුවක් සැටියට පෙනී නො සිටීම, භික්ෂුභාවය අත හැර සාමණේර බවට හෝ ගිහිබවට පැමිණීම පාරාජිකාපත්ති දේසනාව ය. වත් මානත් පුරා අබ්භාන කර්මය කර ගැනීම සඞ්ඝාදිසේසාපත්ති දේසනාව ය. එක් භික්ෂුවක් වෙත දෙසීමෙන් ථුල්ලච්චය පාචිත්ති ආදි ඇවැත් වලින් පිරිසිදු විය හැකි ය. මෙහි ඇවැත් දෙසීම යනුවෙන් අදහස් කරන්නේ ථුල්ලච්චයාදි ඇවැත් දෙසීම ය. භික්ෂූන්ට සිකපද ඉතා බොහෝ බැවින් ද, අචිත්තක සිකපදත් ඇති බැවින් ද, භික්ෂූහු නොයෙක්

Non-commercial distribution

විට ඇවැත්වලට පැමිණෙති. සමහර විට තමන් දන්නේ ම නැතිව ද ඇවැත්වලට පැමිණෙති.

සුක්කවිස්සට්ඨි-කායසංසග්ග යන ගරුකාපත්ති දෙකට ද පහසුවෙන් පැමිණිය හැකි ය. ගරුකාපත්තියෙන් පිරිසිදු වීමට විනය කම් කිරීමේදී, පැමිණි ඇවත භික්ෂුවකට ආරෝචනය නො කර, ගත කළ දිනගණනට පිරිවෙස් පිරිය යුතු වේ. ඇවතට පැමිණි දිනයේ ම එය අන් භික්ෂුවකට ආරෝචනය කළ භික්ෂුවට, සදිනක් මානත පුරා අබ්භාන කර්‍මය කර ගැනීමෙන් පිරිසිදු විය හැකි ය. ගරුකාපත්ති සඳහා වත් පුරන්නට නො වීමටත්, වත් පිරීමේ දින ගණන අඩුකර ගත හැකි වීමටත් ඇවැත් දෙසන සියලු ම අවස්ථාවලදී ගරුකාපත්ති ආරෝචනය කිරීම හොඳ ය. එසේ කිරීමේදී තමා පැමිණි ගරුකාපත්තිය නිශ්චය වශයෙන් ම දන්නේ නම්, ඒ ඇවතේ නම ම ගෙන ආරෝචනය කිරීම හොඳ ය. තමා කොතෙක් ගරුකාපත්තීන්ට පැමුණුනේ ද යන බව නිශ්චය වශයෙන් නො දන්නා තැනැත්තා විසින්, 'තමා පැමිණි සියලුම ඇවැත් ආරෝචනය කරමි' ය යන අදහසින්-

"**සබ්බාපත්තියො ආවිකරොමි**" කියා හෝ "**සබ්බාපත්තියො ආරොචයාමි**" කියා හෝ පළමුවෙන් ආපත්ති ආරෝචනය කොට, පසුව අනික් ඇවැත් දෙසීම කළ යුතු ය.

**සභාගාපත්ති දෙසීම**

"**න භික්ඛවෙ! සභාගාපත්ති දෙසෙතබ්බා. යො දෙසෙය්‍ය ආපත්ති දුක්කටස්ස. න භික්ඛවෙ! සභාගාපත්ති පටිග්ගහෙතබ්බා. යො පටිග්ගණ්හෙය්‍ය ආපත්ති දුක්කටස්ස.**"

යන බුඩ ප්‍රඥප්තිවල සැටියට සභාගාපත්ති දෙසීමෙන් හා පිළිගැනීමෙන් දුකුළා ඇවැත් වේ. "සභාගාපත්තිය" ය යනු දේශක ප්‍රතිග්‍රාහක දෙදෙනා ම පැමිණ සිටින ඇවත ය. විකාල භෝජනාදි යම් කිසි ආපත්තියකට පැමිණි භික්ෂුවක්, ඒ ඇවතට ම පැමිණ සිටින භික්ෂුවක් සමීපයෙහි, ඒ ඇවැත දෙසීම සභාගාපත්ති දේශනය ය. විකාල භෝජනාපත්තියට පැමිණි භික්ෂුවක් ඒ ඇවැත හා අනිකුත් ඇවැත් ද ගෙන, විකාල භෝජනාපත්තියට පැමිණ

Non-commercial distribution

සිටින භික්ෂුවක් සමීපයෙහි "**අහං භන්තෙ! සම්බහුලා ආපත්තියො ආපජ්ජිං. තා තුම්හ මූලෙ පටිදෙසෙමි**" යි ඇවැත් දෙසුව හොත් දෙසූ සියලු ඇවැත්වලින් ඒ භික්ෂුව පිරිසිදු වේ.

සභාගාපත්තිය නො දෙසිය යුතුය යන නීතිය ඇති නිසා, ඒ ඇවැත්වලින් පිරිසිදු නො වන්නේ නො වේ. එයින් වන්නේ කලින් පැමිණ සිටි ඇවැත් වලින් පිරිසිදු වී අලුත් දුකුළා ඇවතකට පැමිණීම ය. ඒ භික්ෂුවගේ ඇවැත් පිළිගත් භික්ෂුව විසින්, පසුව ඒ භික්ෂුව කෙරෙහි ම විකාලභෝජනාපත්තියත්, සභාගාපත්ති පිළිගැනුමෙන් වූ ආපත්තියත්, තවත් ආපත්තිත් එක්කොට "**සම්බහුලා ආපත්තියො ආපජ්ජිං. තා තුම්හමූලෙ පටිදෙසෙමි**" යි ඇවැත් දෙසුව හොත්, පළමු ඇවැත් දෙසූ භික්ෂුව විකාලභෝජනාපත්තියෙන් පිරිසිදු වී සිටින බැවින් සභාගාපත්ති දෙසීමේ වරදට අසු නො වේ. එසේ දෙසීමෙන් ඒ භික්ෂුව සියලු ම දේසනා ගාමිනී ඇවැත් වලින් පිරිසිදු වේ. පළමු ඇවැත් දෙසූ භික්ෂුවට ඊට පසු දෙවනුව ඇවැත් දෙසූ භික්ෂුව කෙරෙහි ම සභාගාපත්ති දෙසීමෙන් වූ ඇවත, දෙසා පිරිසිදු විය හැකි ය. එබැවින් ඔවුනොවුන් ඇවැත් දෙසා ගන්නා කල්හි සභාගාපත්ති ඇති නම්, පළමු ඇවැත් දෙසූ භික්ෂුව විසින් නැවත වරක් ද ඇවැත් දෙසිය යුතු ය.

**ඇවැත් දෙසීමේදී භාවිත කරන වාක්‍යය.**

පළමුවෙන් නවකයා විසින් ඇවැත් දෙසිය යුතු ය.

නවකයා - **අහං භන්තෙ! සබ්බාපත්තියො ආවිකරොමි.**
(මේ ගරුකාපත්ති ආරෝචනය යි)

වැඩිමහල්ලා - **සාධු. සාධු!**

නවකයා - **අහං භන්තෙ! සම්බහුලා ආපත්තියො ආපජ්ජිං. තා තුම්හමූලෙ පටිදෙසෙමි.**

වැඩිමහල්ලා - **පස්සසි ආවුසො! තා ආපත්තියො?**

නවකයා - **ආම භන්තෙ! පස්සාමි.**

වැඩිමහල්ලා - **ආයතිං ආවුසො! සංවරෙය්‍යාසි.**

නවකයා - **සාධු සුට්ඨු භන්තෙ! සංවරිස්සාමි**
(මහළු භික්ෂුවගේ ඇවැත් දෙසීම)

Non-commercial distribution

මහළු - අහං ආවුසො! සබ්බාපත්තියො ආවිකරොමි.

නවක - සාධු භන්තෙ! සාධු.

මහළු - අහං ආවුසො! සම්බහුලා ආපත්තියො ආපජ්ජිං. තා තුය්හමූලෙ පටිදෙසෙමි.

නවක - පස්සථ භන්තෙ! තා ආපත්තියො?

මහළු - ආම ආවුසො! පස්සාමි.

නවක - ආයතිං භන්තෙ! සංවරෙය්‍යාථ.

මහළු - සාධු සුට්ඨු අහං ආවුසො! සංවරිස්සාමි.

නවක - සාධු භන්තෙ! සාධු.

මෙසේ ඔවුනොවුන්ට ඇවැත් දෙසූ කල්හි, පළමු ඇවැත් දෙසූ භික්ෂුව කෙරෙහි සභාගාපත්ති දෙසීමෙන් වන දුකුළා ඇවත ඉතිරි වේ. සභාගාපත්ති බොහෝ වී නම්, ඒ ආපත්ති ගණනට ම දුකුළා ඇවැත් ඇති විය හැකි බැවින් මෙසේ දෙවෙනි වරටත් ඇවැත් දෙසිය යුතු ය.

නවක - අහං භන්තෙ! සම්බහුලා ආපත්තියො ආපජ්ජිං. තා තුම්හමූලෙ පටිදෙසෙමි.

මහළු - පස්සසි ආවුසො! තා ආපත්තියො?

නවක - ආම භන්තෙ! පස්සාමි.

මහළු - ආයතිං ආවුසො! සංවරෙය්‍යාසි.

නවක - සාධු සුට්ඨු භන්තෙ! සංවරිස්සාමි.

මහළු - සාධු සාධු.

ගරුකාපත්ති ආරෝචනය පළමුවර ඇවැත් දෙසීමේදී කළ බැවින් දෙවෙනි වර ඇවැත් දෙසීමේදී එය නැවත කිරීමෙන් ප්‍රයෝජනයක් නැත.

## තිස දෙසීම.

අධිෂ්ඨානාදිය නො කිරීමෙන් නිසගි වූ පාත්‍රචීවරාදිය ඇතිනම්, ඒවා නිස්සර්ජනය නො කොට ඇවැත් දෙසුව ද පාරිසුඩිය

Non-commercial distribution

නො ලැබේ. එබැවින් ඒ ඇවැත් වලින් පිරිසිදු වනු පිණිස, නිසගි වූ දෙය නිස්සජ්ජනය කොට ඇවැත් දෙසා ගත යුතු ය. නිගයි වූ චීවරාදිය නිස්සජ්ජනය නො කොට පරිභෝග කරන්නා වූ භික්ෂුවට පරිභෝග කරන වාරයක් පාසාම දුකුළා ඇවැත් වේ. නිස්සජ්ජනය දීමක් හෝ පූජාවක් නොව, විනය කර්‍මයක් බව සැලකිය යුතුය. නිස්සග්ගිය වස්තුව සඞ්ඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයකුට හෝ නිස්සජ්ජනය කොට ඇවැත් දෙසා ගත හැකි ය. පුද්ගලයකුට නිස්සජ්ජනය කිරීම පහසු බැවින් මෙහි පුද්ගලයකුට නිස්සජ්ජනය කරන ක්‍රමය පමණක් දක්වනු ලැබේ.

නො ඉටා, නො විකපා දසදින ඉක්මීමෙන් නිසගි වූ සිවුර එක් භික්ෂුවක් වෙත ගෙන ගොස්, උක්කුටිකව හිඳ, සිවුර අතින් ගෙන **"ඉදං මෙ භන්තෙ! චීවරං දසාහාතික්කන්තං නිස්සග්ගියං, ඉමාහං ආයස්මතො නිස්සජාමි"** යන වාක්‍යය කියා සිවුරු දී ඇවැත දෙසිය යුතු ය. ඇවැත් දෙසූ පසු පිළිගත් භික්ෂුව විසින් **"ඉමං චීවරං ආයස්මතො දම්මි"** යි කියා පෙරළා දිය යුතු ය. සිවුරු බොහෝ නම් **"ඉමානි මෙ භන්තෙ චීවරානි දසාහාතික්කන්තානි, නිස්සග්ගියානි ඉමානාහං ආයස්මතො නිස්සජාමි"** යි කිය යුතු ය. දීමෙහිදී **"ඉමානි චීවරානි ආයස්මතො දම්මි"** යි කිය යුතු ය

අත්පසින් බැහැර ඇති සිවුරු නිස්සජ්ජනයේදී **"එතං මෙ ආවුසො! චීවරං දසාහාතික්කන්තං නිස්සග්ගියං, එතාහං ආයස්මතො නිස්සජාමි"** යි කිය යුතු ය. දෙන කල්හි **"එතං චීවරං ආයස්මතො දම්මි"** යි කිය යුතු ය. සිවුරු එකකට වැඩිකල්හි **"එතානි මෙ භන්තෙ! චීවරානි දසාහාතික්කන්තානි නිස්සග්ගියානි" එතානාහං ආයස්මතො නිස්සජාමි"** යි ද **"එතානි චීවරානි ආයස්මතො දම්මි"** යි ද කිය යුතු.

රත්තිවිප්පවුත්ථ වීමෙන් නිසගි වූ සිවුර **"ඉදම්මෙ භන්තෙ! චීවරං රත්ති විප්පවුත්ථං අඤ්ඤත්‍ර භික්ඛු සම්මුතියා නිස්සග්ගියං, ඉමාහං ආයස්මතො නිස්සජාමි"** යි නිස්සජ්ජනය කළ යුතු ය.

දස දිනකට වඩා තබාගත් අතිරේක පාත්‍රය, **"අයම්මෙ පත්තො දසාහාතික්කන්තො නිස්සග්ගියො, ඉමාහං ආයස්මතො නිස්සජාමි"** යි නිස්සජ්ජනය කළ යුතු ය. අනිකුත් නිස්සග්ගිය වස්තූන් නිස්සජ්

Non-commercial distribution

ජනය කරන සැටි විනය පොත්වලින් බලාගත යුතු ය. ඒවා **කුඩුසිකෙන්** පහසුවෙන් බලාගත හැකි ය.

## පොහෝ කිරීම.

හේමන්තය, ගිම්හානය, වස්සානය' යි එක් වර්‍ෂයක ඍතු තුනක් ඇත්තේ ය. එක් එක් ඍතුවකට මාස සතර බැගින් ඇත්තේ ය. එක් මාසයකට දින තිසක් ඇත්තේ ය. ඇතැම් මාසයකට ඇත්තේ දින විසි නවයෙකි. පුරය අවය කියා මසකට පක්‍ෂ දෙක බැගින් ඇත්තේ ය. එක් එක් පක්‍ෂයකට දින පසළොස බැගින් ඇත්තේ ය. දින තුදුස ඇති පක්‍ෂ ද ඇත්තේ ය. ඉල්මස ය, උඳුවප් මසය, දුරුතු මසය, නවම් මසය, මැදින් මසය, බක් මසය, වෙසක් මසය, පොසොන් මසය, ඇසළ මසය, නිකිණි මසය, බිනර මසය, වප් මසය යි වර්‍ෂයකට මාස දෙළසක් ඇත්තේ ය. එක් එක් මසකට පෝය දෙක බැගින් ඇත්තේ ය. 'පෝය' යයි කියනුයේ පක්‍ෂයේ අවසාන දිනයට ය. මාස දෙළොස ඍතුවලට බෙදෙන සැටි මෙසේ ය.

**"කත්තිකස්ස ච කාළම්හා**
**යාව ඵග්ගුණපුණ්ණමා**
**හෙමන්තකාලො විඤ්ඤෙය්‍යො**
**අට්ඨ හොන්ති උපොසථා."**

ඉල්මස අව පැළවිය පටන් මැදින්මස පුර පසළොස්වක දක්වා ඇති සාරමස හේමන්ත ඍතුව ය. එහි පොහෝ දින අටෙකි.

**"ඵග්ගුණස්ස ච කාළම්හා**
**යාව ආසළ්හපුණ්ණමා**
**ගිම්හකාලොති විඤ්ඤෙය්‍යො**
**අට්ඨ හොන්ති උපොසථා"**

මැදින් මස අව පැළවියෙහි පටන් ඇසළමස පසළොස්වක දක්වා ඇති කාලය ගිම්හාන ඍතුව ය, එහි පොහෝ දින අටෙකි.

**"ආසළ්හස්ස ච කාළම්හා**
**යාව කත්තිකපුණ්ණමා**
**වස්සකාලොති විඤ්ඤෙය්‍යො**
**අට්ඨ හොන්ති උපොසථා."**

Non-commercial distribution

ඇසළ මස අව පෑළවියෙහි පටන් ඉල්මස පුර පසළොස්වක දක්වා ඇති සිවු මස වස්සාන ඍතුව ය. එහි පොහෝ දින අටෙකි.

"උතුනං පත තිණ්ණං
පක්ඛෙ තතිය සත්තමෙ
චාතුද්දසොති පාතිමොක්ඛං
උද්දිසන්ති නයඤ්ඤුනො."

තුන් ඍතුවෙහි ම තුන්වන සත්වන පෝයවල් චාතුද්දසීහුය. වර්ෂයකට ඇති පොහෝදින සූවිස්සෙන් සයක් චාතුද්දසීහු ය. අටළොසක් පණ්ණරසීහු ය.

'පොහෝ කිරීමය' යනු පොහෝ දිනයෙහි භික්ෂූන් විසින් කළ යුත්ත කිරීම ය. එනම්:- සතර නමක් හෝ සතරනමකට වැඩි ගණ-නක් හෝ භික්ෂූන් රැස්වූව හොත් පාමොක් උදෙසීමත්, තුන්නමක් හෝ දෙනමක් වූව හොත් පාරිශුධ්ය ආරෝචනය කිරීමත්, එක් නමක් වූව හොත් "අද පොහෝ දිනය ය" යි ඉටා ගැනීමත් ය.

උපෝසථ නවය.

චාතුද්දසී උපෝසථයය, පණ්ණරසී උපෝසථයය, සාමග්ගි උපෝසථය යයි දිනයන්ගේ වශයෙන් උපෝසථ තුනෙකි.

සඞ්ඝ උපෝසථයය, ගණඋපෝසථයය, පුග්ගල උපෝසථය ය යි කාරක පුද්ගලයන් ගේ වශයෙන් උපෝසථ තුනෙකි.

සුත්තුද්දේස උපෝසථය ය, පාරිසුඩි උපෝසථයය, අධිට්ඨාන උපෝසථය යයි කර්තව්‍යාකාරයෙන් උපෝසථ තුනෙකි. මෙසේ උපෝසථ නවයක් වේ.

නව වැදෑරුම් උපෝසථයන් අතුරෙන් "චාතුද්දසී උපෝසථය" යනු පක්ෂයේ තුදුස් වන දිනයේ කරන උපෝසථය ය. එය කරනුයේ (පසළොස් දිනයක් නැති) ඍතුවල තුන්වන, සත්වන, පක්ෂවල ය. 'පණ්ණරසී උපෝසථය' යනු පක්ෂයේ පසළොස් වන දිනයෙහි කරන උපෝසථය ය. 'සාමග්ගි උපෝසථය' යනු භේද වී සිටි සඞ්ඝයා සමගි කළ දිනයෙහි ඒ සමගිය නිමිත්තෙන් කරන පොහොය ය. 'සඞ්ඝඋපෝසථය' යනු සතරනමක් හෝ සතර

Non-commercial distribution

නමකට වැඩි ගණනක් වූ හෝ භික්ෂූන් විසින් කරන පොහොය ය. 'ගණ උපෝසථය' යනු තුන්නමක් විසින් කරන පෝය ය. 'පුග්ගල උපෝසථය' යනු දෙනමක් හෝ එක් නමක් විසින් කරන පෝය ය. 'සුත්තුද්දේස උපෝසථය' යනු පාමොක් උදෙසීම් වශයෙන් කරන පෝය ය. 'පාරිසුද්ධි උපෝසථය' යනු පාරිශුද්ධිය ආරෝචනය කිරීම් වශයෙන් කරන පෝය ය.

**සඞ්ඝ උපෝසථය ගැන**
**දතයුතු කරුණු**

"**න භික්ඛවෙ! සඞ්ඝමජ්ඣෙ අනජ්ඣිට්ඨෙන පාතිමොක්ඛං උද්දිසිතබ්බං. යො උද්දිසෙය්‍ය, ආපත්ති දුක්කටස්ස**" යි වදරා ඇති බැවින් සීමාවට සඞ්ඝයා රැස්වූ පසු පාමොක් උදෙසීම සඳහා, සම්මුතිය ලත් භික්ෂුවක් විසින් සඞ්ඝස්ථවිරයන් වහන්සේට හෝ අන්‍ය විනයධර තෙරනමකට හෝ ආරාධනය කළ යුතු ය. ආරාධනය ලැබූ තෙරුන් වහන්සේ විසින් පාමොක් උදෙසීමට කලින්, ආරාධනය කළ භික්ෂුවගෙන් විනය විචාළ යුතු ය. එසේ කළ යුත්තේ ද සම්මුතිය ලබා ගෙන ය. ආරාධනා කළ භික්ෂූන් වහන්සේ විසින් විනය ප්‍රශ්න විසඳිය යුත්තේ ද සම්මුතිය ලබා ගෙන ය. 'විනය පුච්ඡක සම්මුතිය හා විස්සජ්ජක සම්මුතිය' තම තමා විසින් ම ද කර ගත හැකි ය. තමන් විසින් ම කර ගැනීම දැනට පවත්නා චාරිත්‍රය ය. ආරාධනාදිය කරන සැටි මතු දක්වනු ලැබේ. එහිදී **තිස්ස**, **දත්ත** යන නම් යොදා වාක්‍යවල් දක්වනු ලැබේ. පෝය කිරීමේදී ඒ තැන්වලට ඒ ඒ අයගේ නම් යොදා ගත යුතු ය.

## සඞ්ඝ උපෝසථය කිරීමේ ක්‍රමය

**ආරාධනය කිරීම.**

"**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං අහං ආයස්මන්තං (තිස්සං) පාතිමොක්ඛුද්දෙසං අජ්ඣෙසෙය්‍යං.**" මෙසේ සම්මුතිය ලබා ගෙන මතු දැක්වෙන වාක්‍යය තුන් වරක් කියා ආරාධනය කළ යුතු.

**සඞ්ඝො භන්තෙ! ආයස්මන්තං (තිස්සං) පාතිමොක්ඛුද්දෙසං අජ්ඣෙසති. උද්දිසතු ආයස්මා (තිස්සො) පාතිමොක්ඛං.**

Non-commercial distribution

**පිළිවදන් දීම**

**ආම උද්දිසිස්සාමහං ආවුසො.**

**විනය පුච්ඡක සම්මුතිය.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං. අහං ආයස්මන්තං (දත්තං) විනයං පුච්ඡෙය්‍යං.**

**විස්සජ්ජක සම්මුතිය.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං. අහං ආයස්මතා (තිස්සෙන) විනයං පුට්ඨො විස්සජ්ජෙය්‍යං.**

**විනය විචාරීම**

**"සම්මජ්ජනී පදීපො ච**
**උදකං ආසනෙන ච**
**උපොසථස්ස එතානි**
**පුබ්බකරණන්ති වුච්චති"**

යනුවෙන් දක්වෙන උපෝසථාගාරයට සඞ්ඝයා රැස්වීමට කලින් කළ යුතු වන උපෝසථාගාරය හැමදීමය, පහන් දැල්වීමය, පැන් තැබීමය, අසුන් පැනවීමය යන සතර කිස කොට නිමවීද?

**පිළිතුරඃ-** දනට සූර්‍ය්‍යාලෝකය ඇති බැවින් පහන් දැල්වීමෙන් ප්‍රයෝජන නැත. සෙසු වත් තුන කොට නිමවී ය.

**"ඡන්දපාරිසුද්ධි උතුක්ඛානං**
**භික්ඛු ගණනා ච ඔවාදෙ**
**උපොසථස්ස එතානි**
**පුබ්බකිච්චන්ති වුච්චති"**

යනුවෙන් දැක්වෙන පූර්වකෘත්‍යයන් සම්පූර්ණ වනු පිණිස ගෙනෙන ලද ඡන්දපාරිසුද්ධීන් සඞ්ඝයාහට ආරෝචනය කොට නිමවී ද?

**පිළිතුරඃ-**සීමස්ථක සියලු භික්ෂූන් වහන්සේ ම මෙහි රැස්වී ඇති බැවින් ගෙනෙන ලද ඡන්දපාරිසුද්ධියක් නැත්තේ ය.

**ප්‍රශ්නයඃ-**ඍතුව වනාහි හේමන්තය, ගිම්හානය, වස්සානය යි තුන් වැදෑරුම් වේ. එයින් දැනට පැමිණ ඇති ඍතුව කවරේ ද?

Non-commercial distribution

පිළිතුරු දෙනු.

**ප්‍රශ්නය:-** එක් එක් ඍතුවක පක්ෂ අට බැගින් ඇත්තේ ය. පැමිණ ඇත්තා වූ මේ ඍතුවෙහි ඉක්ම ගිය පක්ෂ කෙතෙක් ද? ඉදිරියට ඇති පක්ෂ කෙතෙක් ද? මේ පැමිණ තිබෙන පක්ෂය කීවෙනි පක්ෂය ද?

පිළිතුරු දෙනු.

**ප්‍රශ්නය:-** දැනට මේ සීමාවෙහි රැස්ව ඉන්නා භික්ෂූන් වහන්සේලා කොතෙක් වන්නාහු ද?

ගණන කියනු.

**ප්‍රශ්නය:-** අවවාද ලබා ගැනීම සඳහා භික්ෂුණීන් විසින් කර ඇති ආයාචනය සඞ්ඝයාහට සැල කොට නිමවී ද?

**පිළිතුරු:-** මෙකල භික්ෂුණීන් නැති බැවින් එබඳු ආයාචනයක් නැත්තේ ය.

**ප්‍රශ්නය:-** මේ සතර, සඞ්ඝයා සීමාවට රැස් වූ පසු පාමොක් උදෙසීමට පළමුවෙන් කළ යුතු බැවින් පූර්ව කෘත්‍යය ය යි කියනු ලැබේ.

**"උපොසථො යාවතිකා ච භික්ඛූ**
**කම්මප්පත්තා සභාගාපත්තියො ච**
**න විජ්ජන්ති වජ්ජනීයා ච පුග්ගලා**
**තස්මිං න හොන්ති පත්තකල්ලන්ති වුච්චති"** යි

අර්ථකථාචාර්‍ය්‍යයන් වහන්සේලා විසින් ප්‍රකාශිත පරිදි, උපෝසථකර්මයට සුදුසු කාලය චතුරඞ්ගයකින් යුක්ත විය යුතු ය. උපෝසථය සාමාන්‍ය ලක්ෂණයෙන් එකක් වුවද චාතුද්දසී-පණ්ණරසී-සාමග්ගීය' යි දින වශයෙන් තුනක් ද, සඞ්ඝ-ගණ-පුග්ගලය' යි කාරක පුද්ගලයන් ගේ වශයෙන් තුනක් ද, සුත්තුද්දේස පාරිසුද්ධි අධිට්ඨානය' යි කර්තව්‍යාකාර වශයෙන් තුනක් ද වේ, එයින් මේ කරනු ලබන උපෝසථය දින වශයෙන් කිනම් උපෝසථයක් ද?

Non-commercial distribution

පිළිතුරු දෙනු.

**ප්‍රශ්නයः-** කාරකපුද්ගලයන්ගේ වශයෙන් කිනම් උපෝසථයක් ද?

පිළිතුරු දෙනු.

**ප්‍රශ්නයः-** කර්තව්‍යාකාර වශයෙන් කිනම් උපෝසථයක් ද?

පිළිතුරු දෙනු.

**ප්‍රශ්නයः-** සුත්තුද්දේස උපෝසථය යි කීයෙහි, එයට සතර නමකට නො අඩු භික්ෂු පිරිසක් එක් සීමාවෙක්හි අත්පස නොපිරිහෙළා වැඩසිටිය යුතු ය. එපමණ භික්ෂූහු මෙහි වැඩසිටින්නාහු ද?

"එසේය" යි පිළිතුරු දෙනු.

**ප්‍රශ්නයः-** පැමිණ සිටින භික්ෂූහු වස්තුසභාගාපත්ති වලින් මිදුණාහු ද?

පිළිතුරු දෙනු.

**ප්‍රශ්නයः-** ගෘහස්ථාදි එක්විසි වර්ජනීය පුද්ගලයන් සඞ්ඝයාගේ අත්පසින් බැහැර කොට නිමවී ද?

"එසේය" යි පිළිතුරු දෙනු.

ඉක්බිති පාමොක් උදෙසන ස්ථවිරයන් විසින් මෙසේ කිය යුතු ය.

මේ චතුරඞ්ගයෙන් යුක්ත කර්මයට 'පත්තකල්ලය' යි කියනු ලැබේ. **පුබ්බකරණ පුබ්බකිච්චානි සමාපෙත්වා දෙසිතාපත්තිකස්ස සමග්ගස්ස භික්ඛුසඞ්ඝස්ස අනුමතියා පාතිමොක්ඛං උද්දිසිතුං ආරාධනං කරොම.**

මෙය කී කල්හි සඞ්ඝයා විසින් සාධුකාර දිය යුතු ය. ඉක්බිති ඤත්තිය කියා පාමොක් උදෙසිය යුතු ය.

**විශේෂ කරුණක්**

"පුබ්බකරණ පුබ්බකිච්චානි සමාපෙත්වා"- යනාදි පාඨය ප්‍රාතිමෝක්ෂයෙහි මිස, විනය පෙළෙහි හෝ අටුවාවෙහි දක්නට

Non-commercial distribution

නැත. ප්‍රාතිමෝක්ෂය වර්ණනා කරන කඞ්ඛාවිතරණී අටුවාවෙහි ද ඒ පාඨය ගැන කිසිවක් සඳහන් කර නැත. එයින් සිතා ගන්නට තිබෙන්නේ ඒ පාඨය ප්‍රාතිමෝක්ෂයට පසු කාලයේදී ඇතුළු කරන ලද්දක්ය කියා ය. එහි මුල් කොටස ඒ ඒ පිටපත්වල "පුබ්බකරණ පුබ්බකිච්චානි සමාපෙත්වා" යි ද "සමාදපෙත්වා" යි ද දක්නා ලැබේ.

"පාතිමොක්ඛං උද්දිසිතුං ආරාධනං කරොම" යන මෙහි අර්ථය බොහෝ දෙනා වරදවා තේරුම් ගනිති. එය පාමොක් උදෙසීමට ආරාධනා කරන භික්ෂුව විසින් කියන්නක් නොව, පාමොක් උදෙසන ස්ථවිරයන් විසින් කියන්නකි. එබැවින් **"ආරාධනං කරොම"** යන්නෙහි අර්ථය පාමොක් උදෙසීමට 'උත්සාහ කරමි' ය කියා ගතයුතු ය. 'පාමොක් උදෙසන ලෙස ඉල්ලමු' ය යි නො ගත යුතු ය. විනයාලංකාර ටීකාචාර්‍ය්‍යයෝ ඒ පාඨයට නො කැමැත්තක් දක්වති. **"පුබ්බකරණ පුබ්බකිච්චානි සම්මා නිට්ඨාපෙත්වා පත්තකල්ලඞගෙ සමානීතෙ සඞඝස්ස අනුමතියා පාතිමොක්ඛං උද්දිසිස්සාම"** යි කිය යුතු බව විනයාලංකාර ටීකාචාර්‍ය්‍යයෝ පවසති. මෙය කෙසේ කිව ද විනය කර්මයට හානියක් නො වන බව සැලකිය යුතු.

**පාරිසුද්ධිඋපෝසථය.**

ඉහත කී සඞ්ඝ උපෝසථය හෙවත් සුත්තුද්දේස උපෝසථය කිරීමට සෑහෙන පමණ භික්ෂූන් සීමාවට රැස් නො වී, තෙනමක් හෝ දෙනමක් සීමාවට රැස්වූ අවස්ථාවලදී කරන උපෝසථය පාරිසුඩි උපෝසථය ය. සීමාවට තෙනමක් රැස්වුව හොත් පූර්වකරණ පූර්වකෘත්‍යයන් කොට, එක් භික්ෂුවක් විසින් **"සුණන්තු මෙ ආයස්මන්තා අජ්ජුපොසථො** (පණ්ණරසො, චාතුද්දසො) **යදායස්මන්තානං පත්තකල්ලං මයං අඤ්ඤමඤ්ඤං පාරිසුද්ධි උපොසථං කරෙය්‍යාම"** යි ඤත්තිය තබා, පළමු කොට ස්ථවිර භික්ෂුව විසින් ඒකාංස කොට සිවුර පෙරවා උක්කුටිකව හිඳ වැඳ ගෙන **"පරිසුද්ධො අහං ආවුසො පරිසුද්ධොති මං ධාරෙථ"** යි තුන්වරක් කිය යුතු ය. ඉතිරි දෙනම විසින් ද එසේ ම- **"පරිසුද්ධො අහං භන්තෙ පරිසුද්ධොති මං ධාරෙථ"** යි තුන්වරක් කිය යුතු ය.

*Non-commercial distribution*

සීමාවට රැස් වූ භික්ෂූන් දෙනමක් වෙත් නම් පූර්ව කෘත්‍ය සියල්ල සම්පාදනය කොට ඤත්තිය නො තබා, කියන ලද පරිදි පාරිසුද්ධිය ඔවුනොවුන්ට ආරෝචනය කළ යුතු ය.

තවද, මහාපවාරණ දිනයෙහි පෙර වස් විසූ භික්ෂූන් වහන්සේලා පවාරණය කරන කල්හි, පසු වස් විසූ භික්ෂූන් විසින් හා වස් නො වැසූ භික්ෂූන් විසින් ද, වස් බිඳුණු භික්ෂූන් විසින් ද කායසාමාග්‍රිය දීම් වශයෙන් පවාරණ කර්මයට සහභාගි වී, **"පරිසුද්ධො අහං භන්තෙ පරිසුද්ධොති මං ධාරෙථ"** යි කියා පාරිශුද්ධිය ආරෝචනය කළ යුතු ය. පසු වස් විසූ භික්ෂූන් පවාරණය කරන කල්හි පෙර වස් විසූවන් හා වස් නො විසූවන් විසින් ද වස් බිඳුනවුන් විසින් ද කියන ලද පරිදි පාරිශුද්ධිය ආරෝචනය කළ යුතුය. පාමොක් උදෙසා අවසන් වූ පසු ඒ භික්ෂූන් සීමාවෙන් බැහැර යන්නට පෙර පැමිණි භික්ෂූන් විසින් ද, සුත්තුද්දේස උපෝසථය කළ භික්ෂූන්ට පාරිශුද්ධිය ආරෝචනය කළ යුතු ය.

**අධිට්ඨාන උපෝසථය.**

පොහෝ දිනයෙහි එක් භික්ෂුවක් පමණක් වුව හොත් සීමාවට ගොස්, සියලු පූර්වකෘත්‍යයන් කොට පොහෝ කිරීමට තවත් භික්ෂූන් නො පැමිණෙන බව සලකා, එය තුදුස්වක දිනයක් නම්, **"අජ්ජ මෙ චාතුද්දසො උපොසථොති අධිට්ඨාමි"** යි ද පසළොස්වක දිනයක් වේ නම්, **"අජ්ජ මෙ උපොසථො පණ්ණරසොති අධිට්ඨාමි"** යි ද තුන්වරක් කිය යුතු ය. එය අධිට්ඨාන උපෝසථ නම් වේ.

**වර්ජනීය පුද්ගලයෝ.**

ගිහියාය, භික්ෂුණියය, ශික්ෂමානාවය, සාමණේරයාය, සාමණේරියය, ශික්ෂාව ප්‍රතික්ෂේප කළ තැනැත්තාය, පරිජි ඇවතට පැමිණි තැනැත්තාය, ඇවත නො දැකීමෙන් උක්ෂේපනීය කර්මය කළ තැනැත්තාය, ඇවතට පිළියම් නො කිරීමෙන් උක්ෂේපනීය කර්මය කළ තැනැත්තාය, පාපදෘෂ්ටිය නො හැරීම නිසා උක්ෂේපනීය කර්මය කළ තැනැත්තාය, පණ්ඩකයා ය, ථෙය්‍යසංවාසකයාය, තිත්ථියපක්කන්තිකයාය, තිරච්ඡානගතයාය, මාතුඝාතකයාය, පිතුඝාතකයාය, අරහන්තඝාතකයාය, භික්ෂුණී

Non-commercial distribution

දූෂකයාය, සඞ්ඝභේදකයාය, ලෝහිතුප්පාදකයාය, උභතෝ-බ්‍යඤ්ජනකයාය යන මේ විසිඑක්දෙන පොහෝ කිරීමේදී අත්පසින් බැහැර කළ යුත්තෝ ය.

'අත්පසය' යි කියනුයේ දෙරියන් හමාරට ය. පොහෝ කරන සඞ්ඝයාගේ අත්පසින් ඒ පුද්ගලයෝ බැහැර කළ යුත්තාහු ය. ඒ පුද්ගලයන් විසිඑක් දෙනාගෙන් උක්ඛිත්තකයන් තිදෙනා අත්පසෙහි සිටියදී පෝය කිරීමෙන් සියලුම භික්ෂූන්ට පචිති ඇවැත් වේ. සෙස්සන් සිටියදී පෝය කිරීමෙන් දුකුළා ඇවැත් වේ.

Non-commercial distribution

# වස් විසීම

පෙර වස් විසීමය, පසු වස් විසීමය යි වස් විසීම් දෙකකි. ගිම්හාන ඍතුවේ අටවන පෝයවූ ඇසළ මස පුර පසළොස්වක දිනයේ පෝය කොට, අව පෑළවිය දිනයේ පෙරවස් එළඹිය යුතු ය. වස්සාන ඍතුවේ දෙවන පෝයවූ නිකිණි මස පුරපසළොස්වක් දිනයෙහි පෝය කොට, අව-පෑළවිය දිනයේදී පසු වස් එළඹිය යුතු ය. ඒ දෙදිනෙන් එක් දිනක වස් විසීම නො කළ භික්ෂුවට **"න භික්ඛවෙ! වස්සං න උපගන්තබ්බං, යො න උපගච්ඡෙය්‍ය ආපත්ති දුක්කටස්ස"** යන බුඩ ප්‍රඥප්තියේ සැටියට දුකුළා ඇවැත් වේ.

වස් එළඹෙන දිනයෙහි තමා වස් වසන විහාරය පිළිදැගුම් කර-ගෙන සවස් කාලයේදී මල්-පහන් පුද රත්නත්‍රය වැඳ, පිරිත් කියා දෙවියන්ට පින් දී, **"ඉමස්මිං විහාරෙ ඉමං තෙමාසං වස්සං උපෙමි"** යි එක් වරක් හෝ දෙවරක් හෝ තුන් වරක් හෝ කියා වස් එළඹිය යුතු ය.

"මෙහි වස් වසමි ය" යන අදහසින් යම්කිසි විහාරයක වෙසෙන භික්ෂුවකට දහම් දෙසීම් ආදි කටයුතුවල යෙදීම නිසා "ඉමස්මිං විහාරෙ ඉමං තෙමාසං වස්සං උපෙමි" යන වාක්‍යය කියා වස් ඉටා ගැනීමට අමතක වූයේ ද, වස් විසීමේ බලාපොරොත්තුව ඇති බැවින් වස් විසීම සිදු වේ. වස කඩා නොගෙන විසුව හොත් ඒ භික්ෂුවට පවාරණය කිරීමට බාධාවක් නැත්තේ ය.

**"න භික්ඛවෙ! අසෙනාසනිකෙන වස්සං උප ගන්තබ්බං. යො උපගච්ඡෙය්‍ය ආපත්ති දුක්කටස්ස.** යි වදරන ලද බැවින් වහලක්

Non-commercial distribution

ඇති, දෙරක් ඇති, සෙනසුනක් සොයා ගෙන ම වස් එළඹිය යුතු ය. ඉදින් වස් විසීමට සෙනසුනක් නැති නම්, කරවා දෙන දයකයකු ද නැති නම්, උපකාරකයන් සොයා ගෙන හෝ සෙනසුනක් කරවා ගත යුතු ය. උපකාරකයන් ද සොයා-ගත නො හැකි වේ නම්, තමා විසින් ම හෝ කර ගත යුතු ය. සෙනසුනක් නැතය කියා වස් නො වැස, ඇවතින් නො මිදිය හැකි ය.

**සත්තාහකරණීයයෙන් යාම.**

සත්තාහකරණීයයෙන් වස්වසන තැනින් බැහැර යන කල්හි, වස් විසූ සීමාව තුළදීම "සත්තාහකරණීයයෙන් යා යුතු කාරණය සිතා, මේ කාරණයට මම බැහැර ගොස් සත්දින ඇතුළත ආපසු එමි" යි සිතා ගෙන යා යුතු ය. යාමට පළමු එසේ සිතා-ගෙන විසූ භික්ෂුවට යන කල්හි අමතක වී ගියේ ද වරදක් නැත. සර්වාකාරයෙන් එය නො සිතා යන්නහුට වස්සච්ඡේදය වේය යි ආචාර්යයෝ කියති. පිටත යාමට ආරාධනාදි කරුණක් නැතිව, "සතිය තුළ ආපසු එමි" යි සිතා, බැහැර යන්නහුට 'ඇවැතක් වේය, වස්සච්ඡේදය නොවේ ය' යි ද ආචාර්යවරයෝ පවසති.

**"අන්තො උපචාර සීමායං ඨිතෙනෙව සත්තාහ කරණීය නිමිත්තං සල්ලක්ඛෙත්වා, ඉමිනා නිමිත්තෙන ගන්ත්වා, අන්තො සත්තාහෙ ආගමිස්සාමීති ආභොගං කත්වා ගන්තුං වට්ටති. පුරිමක්ඛණෙ ආභොගං කත්වා ගමනක්ඛණෙ විස්සරිත්වා ගතෙපි දෙසො නත්ථි. සකරණීයො පක්කමතීති වුත්තත්තා සබ්බථා පන ආභොගං අකත්වා ගතස්ස වස්සච්ඡෙදෙති වදන්ති. යො පන සත්තාහකරණීය නිමිත්තාභාවෙපි සත්තාහබ්භන්තරෙ ආගමිස්සාමීති ආභොගං කත්වා ගන්ත්වා සත්තාහබ්භන්තරෙ ආගච්ඡති තස්ස ආපත්තියෙව වස්සච්ඡෙදෙ නත්ථි. සත්තාහස්ස සන්නිවත්තත්තාති වදන්ති. වීමංසිත්වා ගහෙතබ්බං"** යනු විමති විනෝදනී ටීකා පාඨයෙකි.

සත්තාහරකරණීයයෙන් බැහැර ගිය භික්ෂුව සත්දින නො ඉක්මවා සත්වන දින අරුණට පළමුව, වස් වැසූ තැනට පැමිණිය යුතුය. ඉදින් ඉරිද වස් විසූ සීමාවෙන් පිට වී නම්, ඊට පසු ඉරිදට එළිවන්නට පළමු සෙනසුරාද ආපසු පැමිණිය යුතු ය. ඉරිද වන තෙක් පිටත විසූවහොත් වස්සච්ඡේදය

Non-commercial distribution

වේ. සත්තාහකරණීයයෙන් පිටත ගිය භික්ෂුවට අවසර ඇත්තේ පිටත සත්දින ඉක්මවීමට නො ව, සත් දින ඇතුළත ආපසු පැමිණීමට ය. පවාරණ දිනය සත්වන දිනය වී තිබියදී, සත්තාහ කරණීයයෙන් බැහැර ගිය භික්ෂුව යම්කිසි තැනකදී පවාරණය කොට, වස් විසූ තැනට ආපසු නායේ ද වස්සච්ඡේදය නො වේ. එසේ ගිය භික්ෂුවට සත්වන දිනයෙන් ඔබ වස් කාලය නැති බැවිනි.

**විශේෂ කරුණක්.**

පවාරණය ඒ දිනයෙහි කිරීමට නියමිත විනය කර්මයක් මිස, වස් අවසන් කිරීමක් නො වේ. පවාරණය කරන පොහෝ දිනය ද වස් කාලයට ම අයත් බැවින් 'පවාරණයෙන් වස ඉවරවීය' යි සිතා එදින වස් විසූ තැනින් නොයා යුතු ය. එදිනත් එහි ම විසිය යුතු ය. එදින වුව ද වස් විසූ තැන ගැන අපේක්ෂාව හැර ගියහොත් වස්සච්ඡේදය විය හැකි ය.

**සත්තාහකරණීයයෙන් යායුතු කරුණු.**

විනෝද ගමන්, වන්දනා ගමන්, ඥාති දර්ශන, මිත්‍ර දර්ශනාදී ඕනෑම කරුණකට සත්තාහකරණීයයෙන් යා යුතු බවක් විනයෙන් නො පෙනේ. " **ධම්මසවනත්ථාය අනිමන්තිතෙන ගන්තුං න වට්ටති උද්දෙස පරිපුච්ඡාදීනං අත්ථායපි ගන්තුං න ලභති**" යනුවෙන් විනය අටුවාවෙහි දහම් ඇසීම, උගෙනීම, පිළිවිසීම යන මේවාටත් ආරාධනයක් නැතුව නො යා යුතු බව දක්වා තිබේ. "**ආචරියං පස්සිස්සාමීති ගන්තුං ලභති**" යි ගුරුවරයා දක්නට යා හැකි බව කියා තිබේ.

**අනුජානාමි භික්ඛවෙ! සත්තන්නං සත්තාහකරණීයෙන අප්පහිතෙ'පි ගන්තුං, පගෙව පහිතෙ. භික්ඛුස්ස භික්ඛුනියා සික්ඛමානාය සාමණෙරස්ස සාමණෙරියා මාතුයා ච පිතුස්ස ච. අනුජානාමි භික්ඛවෙ ඉමෙසං සත්තන්නං සත්තාහකරණීයෙන අප්පහිතෙ'පි ගන්තුං, පගෙව පහිතෙ. සත්තාහං සන්නිවත්තො කාතබ්බො.**

Non-commercial distribution

යනුවෙන් භික්ඛුවය, භික්ෂුණීයය, ශික්ෂමානාවය, සාමණේර-යාය, සාමණේරියය, මවය, පියාය යන මේ සත් දෙනා උදෙසා, ආරාධනාවක් නැත ද සත්තාහකරණීයයෙන් යා යුතු බව තථාගතයන් වහන්සේ විසින් අනුදැන වදරා තිබේ.

"**අනුජානාමි භික්ඛවෙ! සඞ්ඝකරණීයෙන ගන්තුං සත්තාහං සන්නිවත්තො කාතබ්බො**" යි සඞ්ඝකරණීයයෙන් ද නිමන්ත්‍රණයක් නැතිව වුව ද සතියක් නැවතීමට යා හැකි බව වදරා තිබේ. සඞ්ඝකරණීය යනු විහාර-චෛත්‍ය-සඞ්ඝාවාසාදියේ ප්‍රතිසංස්කරණාදි වැඩ ය. ඒවාට කම්කරුවන් සෙවීම්-ද්‍රව්‍ය සෙවීම් ආදිය ය. සැම භික්ෂුවක් ම සඞ්ඝයාට ඇතුළත් කෙනකු වන බැවින් භික්ෂූන්ගේ පෞද්ගලික සේනාසන වල කටයුතු සඳහා යාම ද සඞ්ඝකරණීය පිණිස යාමම ය. ඉහත කී පුද්ගලයන්ගෙන් අන්‍යයන්ගේ වැඩ සඳහා සතිකරණයෙන් යා යුත්තේ ආරාධනාවක් ඇතහොත් ය. අන්තරායක් ඇති කල්හි වස් විසූ තැන හැර යාමෙන් වස්සච්ඡේදය වුව ද ඇවැත් නො වේ. ගුරුවරයා දක්නට ගිය අවස්ථාවකදී, ගුරුවරයාගේ කීම පරිදි එහි නැවතීමෙන් වස් බිඳීමෙන් ද ඇවැත් නො වේ.

Non-commercial distribution

# පවාරණය.

'ප්‍රතික්ෂේප කිරීමය, ආරාධනා කිරීමය' යි පවාරණය දෙවැදෑරුම් වේ. **"යො පන භික්ඛු භුත්තාවී පවාරිතො අනතිරිත්තං ඛාදනීයං වා භොජනීයං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පාචිත්තියං"** යන මේ සිකපදයෙහි දැක්වෙන පවාරණය ප්‍රතික්ෂේපය ය. වස් අවසන් වන පෝයෙහි කරන්නට නියමිතවූ මේ පවාරණය උපාසකෝපාසිකාවන්ගේ සිල් පවාරණය බඳු ප්‍රතික්ෂේපයක් නො වේ. දැකීමය, අනුන් කියනු ඇසීමය, සැක ඇතිවීමය යන මේ කරුණු තුනෙන්ම වරද ගැන, තමාට අවවාද අනුශාසනා කරන ලෙස සඞ්ඝයාගෙන් හෝ ගණයාගෙන් හෝ පුද්ගලයාගෙන් හෝ ඉල්ලීම මෙහි අදහස් කරන පවාරණය ය. මෙය වස් අවසන් කිරීමය යි වරදවා නො ගත යුතු.

පවාරණය වනාහි දින වශයෙන් චාතුද්දසී පවාරණයය, පණ්ණරසී පවාරණය ය, සාමග්ගි පවාරණය යයි තෙවැදෑරුම් වේ.

සඞ්ඝපවාරණයය, ගණපවාරණයය, පුග්ගලපවාරණය යි කාරක පුද්ගලයන්ගේ වශයෙන් තෙවැදෑරුම් වේ.

තේවාචික පවාරණයය, ද්වේවාචික පවාරණයය, ඒකවාචික පවාරණය යයි කතිව්‍යාකාරයෙන් තෙවදෑරුම් වේ. මෙසේ පවාරණය නව වැදෑරුම් වේ.

වස් අවසන් වන පෝය වස්සාන ඍතුවේ සවන පෝය බැවින් එය සැමකල්හි ම පණ්ණරසී දිනයක් වේ. බොහෝ සෙයින් පවාරණය කෙරෙන්නේ ඒ දිනයේ ය. වුවමනාවක් ඇති නම්

Non-commercial distribution

සඞ්ඝයා හට ඒ දිනයෙහි පවාරණය නො කොට වස්සාන ඍතුවේ සත්වන පෝයට හෝ අටවන පෝයට තබා ගත හැකි ය. චාතුද්දසී පවාරණයක් වන්නේ වස්සාන ඍතුවේ සත්වන පෝයෙහි පවාරණය කරත හොත් ය. වස්සාන ඍතුවේ අටවන පෝයෙහි කරන පවාරණයත් පණ්ණරසී පවාරණය ම ය.

සාමග්ගී උපෝසථයට සුදුසු කරුණක් වප්මස අව පෑළවියෙහි පටන් ඉල්මස පුර පසළොස්වක දක්වා ඇති එකුන් තිස් දිනය තුළ සිදු වී නම්, සාමග්ගීපවාරණය කළ යුතු ය. අනික් කලෙක එය නො කරනු ලැබේ. සඞ්ඝ උපෝසථයට සේ සඞ්ඝපවාරණයට සතර නමක්වූ භික්ෂූහු ප්‍රමාණ නො වෙති. සඞ්ඝපවාරණය කළ හැකි වීමට යටත් පිරිසෙයින් භික්ෂූන් පස්නමක් එක්විය යුතු ය.

**තේවාචික සඞ්ඝ පවාරණය.**

සීමාවට සඞ්ඝයා රැස්වූ පසු එක් භික්ෂුවක් විසින් "**සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං. අහං ආයස්මන්තං (තිස්සං) පවාරණා සදත්තිඨපනං අජ්ඣෙසෙයාං**" යන වාක්‍යයෙන් අජ්ඣෙසක සම්මුතිය ලබාගෙන "**සඞ්ඝො භන්තෙ ආයස්මන්තං (තිස්සං) පවාරණා සදත්තිඨපනං අජ්ඣෙසති. ඨපෙතු භන්තෙ ආයස්මා (තිස්සො) පවාරණා සදත්තිං**" යි තුන් වරක් කියා සඞ්ඝස්ථවිරයන් වහන්සේට හෝ අන් වියත් තෙර නමකට හෝ පවාරණාඥප්තිය තැබීමට ආරාධනා කළ යුතු ය.

ඉක්බිති ආරාධනා ලත් තෙරුන් වහන්සේ විසින් "**ආම ඨපෙමි ආවුසො**" යි පිළිවදන් දී: "**සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං අහං ආයස්මන්තං (නාගං) විනයං පුච්ඡෙයාං**" යන වැකිය කියා විනය පුච්ඡක ඥප්තිය තැබිය යුතු ය.

ආරාධනා කළ භික්ෂුව විසින් "**සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං අහං ආයස්මතා (තිස්සෙන) විනයං පුට්ඨො විස්සජ්ජෙයාං**" යි විනය විස්සජ්ජක ඥප්තිය තැබිය යුතු ය. ඉක්බිති මතු දැක්වෙන පරිදි විනය විචාරීම හා පිළිතුරු දීම කළ යුතු ය.

Non-commercial distribution

**ප්‍රශ්නය:-**

**"සම්මජ්ජනී පදීපො ච - උදකං ආසනෙන ච**
**පවාරණාය එතානි - පුබ්බකරණන්ති වුච්චති" යි**

අර්ථකථාචාර්‍ය්‍යයන් වහන්සේලා විසින් ප්‍රකාශිත පරිදි, පවාරණයට සඞ්ඝයා රැස්වීමට පළමු කළයුතු වූ හැමදීම ය, පහන් දැල්වීම ය, බොන පැන් - පරිභෝග පැන් එළවීම ය, අසුන් පැනවීම ය යන මේ කෘත්‍ය සතර කොට නිමවී ද?

**පිළිතුර:-** දැනට සූර්‍ය්‍යාලෝකය ඇති බැවින් පහන් දැල්වීම නුවුවමනා ය. සෙස්ස කොට නිමවී ය.

ප්‍ර: **"ඡන්දපවාරණා උතුක්ඛානං - භික්ඛු**
**ගණනා ච ඔවාදෙ**
**පවාරණා ය එතානි - පුබ්බකිච්චන්ති වුච්චති" යි**

අර්ථකථාචාර්‍ය්‍යයන් වහන්සේලා විසින් ප්‍රකාශිත පරිදි, ගෙනෙන ලද ඡන්දපවාරණයන් සඞ්ඝයා හට සැලකොට නිමවී ද?

උ: සීමස්ථක සියලු භික්ෂූන් වහන්සේලා මෙහි රැස්ව අත්පස නො පිරිහෙලා කායසාමාග්‍රිය දී වැඩ සිටින බැවින් ඡන්දපාරිසුද්ධීන් ගෙන ඒමක් නැත්තේ ය.

ප්‍ර: ඍතුව වනාහි හේමන්තය-ගිම්හානය-වස්සානය යි තෙවැදෑරුම් වේ. ඒ ඍතූන් අතුරෙන් දන් පැමිණ ඇති ඍතුව කිනම් ඍතුවක් ද?

උ: දැනට පැමිණ ඇති ඍතුව වස්සාන ඍතුව ය.

ප්‍ර: එක් එක් ඍතුවක පක්ෂ අට බැගින් ඇත්තේ ය. දැන් පැමිණ ඇත්තාවූ මේ වස්සාන ඍතුවෙන් කොතෙක් පක්ෂ ඉක්ම ගියේ ද? කොතෙක් පක්ෂ ශේෂව ඇත්තේ ද? මේ පැමිණ ඇති පක්ෂය කීවැනි පක්ෂය ද?

උ: මේ වස්සාන ඍතුවෙන් පක්ෂ පසක් ඉක්ම ගියේ ය. පක්ෂ දෙකක් ශේෂව ඇත්තේ ය. දැනට පැමිණ තිබෙන්නේ සවන පක්ෂය වේ.

Non-commercial distribution

ප්‍ර: දැන් මේ සීමාවට රැස්ව සිටින භික්ෂූන්ගේ සඞ්ඛ්‍යාව කොපමණ වන්නේ ද?

පිළිතුරු දෙනු.

ප්‍ර: අවවාද ලබාගැනීම සඳහා භික්ෂුණීන් විසින් කරන ලද ආයාචනය සඞ්ඝයාට සැලකොට තිබේ ද?

උ: මෙකල භික්ෂුණීන් නොමැති බැවින් ආයාචනයක් නැත්තේ ය.

ප්‍ර: **"පවාරණා යාවතිකා ච භික්ඛූ**
**කම්මප්පත්තා සභාගාපත්තියො ච**
**න විජ්ජන්ති වජ්ජනීයා ච පුග්ගලා**
**තස්මිං න හොන්ති පත්තකල්ලන්ති වුච්චති"** යි

අර්ථකථාචාර්යයන් වහන්සේලා විසින් ප්‍රකාශිත පරිදි, පවාරණය සාමාන්‍යයෙන් එකක් වුව ද, විශේෂ ලක්ෂණ වශයෙන් 'චාතුද්දසී-පණ්ණරසී-සාමග්ගී' ය යි දින වශයෙන් තුනක් ද, 'සඞ්ඝ-ගණ-පුග්ගල' ය යි කාරක පුද්ගලයන්ගේ වශයෙන් තුනක් ද, 'තේවාචික-ද්වේවාචික-ඒකවාචික' ය යි කර්තව්‍යාකාරයෙන් තුනක්ද වන බැවින් නව වැදෑරුම් වේ. දැනට කරන්නට යන මේ පවාරණය දින වශයෙන් කිනම් පවාරණයක් ද?

උ: පණ්ණරසී පවාරණය යි.

ප්‍ර: කාරක පුද්ගලයන්ගේ වශයෙන් කිනම් පවාරණයක් ද?

උ: සඞ්ඝපවාරණය යි.

ප්‍ර: කර්තව්‍යාකාර වශයෙන් කිනම් පවාරණයක් ද?

උ: තේවාචික පවාරණය යි.

ප්‍ර: තේවාචික පවාරණය යි කීයෙහි, එයට යටත් පිරිසෙයින් පස්නමක් හෝ පස්නමකට අධිකවූ හෝ භික්ෂු පිරිසක් වුවමනාය. එපමණ භික්ෂූහු දැනට මෙහි රැස්ව ඉන්නාහු ද?

උ: එසේ ය.

ප්‍ර: සියලුම භික්ෂූහු සභාගාපත්තීන්ගෙන් මිදුණාහු ද?

උ: භික්ෂූහු ඔවුනොවුන් ඇවැත් දෙසා ගැනීමෙන් පිරිසිදු වූහ.

Non-commercial distribution

ප්‍ර: එක්විසි වර්ජනීය පුද්ගලයන් සඞ්ඝයාගේ අත්පසින් බැහැර කොට නිමවී ද?

උ: එසේ ය.

ඉක්බිති විනය පුච්ඡක තෙරුන් වහන්සේ විසින් **"පුබ්බකරණ පුබ්බකිච්චානි සමාපෙත්වා දෙසිතාපත්තිකස්ස සමග්ගස්ස භික්ඛුසඞ්ඝස්ස අනුමතියා පවාරණා ඤත්තිං ඨපෙතුං ආරාධනා කරොම"** යි කිය යුතු ය. රැස්ව සිටින භික්ෂූන් වහන්සේලා විසින් සාධුකාර දීමෙන් එයට පිළිවදන් දිය යුතු ය.

**පවාරණා ඤත්තිය.**

**"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අජ්ජ පවාරණා පණ්ණරසී. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො තෙවාචිකං පවාරෙය්‍ය."**

මෙසේ ඤත්තිය තැබූ පසු සඞ්ඝස්ථවිරයන් වහන්සේ විසින් ඒකාංසකොට සිවුර පෙරවා උක්කුටිකයෙන් හිඳ වැඳගෙනඃ-

**"සඞ්ඝං අවුසො පවාරෙමි. දිට්ඨෙන වා සුතෙන වා පරිසංකාය වා වදන්තු මං ආයස්මන්තො අනුකම්පං උපාදය පස්සන්තො පටිකරිස්සාමි. දුතියම්පි ආවුසො සඞ්ඝං පවාරෙමි -පෙ- තතියම්පි ආවුසො සඞ්ඝං පවාරෙමි -පෙ- පස්සන්තො පටිකරිස්සාමි,"**

මෙසේ පවාරණය කළ යුතු ය. සඞ්ඝස්ථවිරයන් වහන්සේ පවාරණය කරන කල්හි සෙස්සන් අසුන්වල නො හිඳ, උක්කුටිකයෙන් හිඳිය යුතු ය. මහ තෙරුන් වහන්සේ පවාරණය කළ පසු වැඩිමහලු පිළිවෙළින් සෙසු භික්ෂූන් විසින් පවාරණය කළ යුතු ය. වැඩිමහල්ලන් පවාරණය කරන තුරු බාලයන් විසින් උක්කුටිකයෙන් ම හිඳිය යුතු ය. තමතමන් පවාරණය කළ පසු අස්නෙහි හිඳ ගැනීමට අවසර ඇත්තේ ය. නවකයන් විසින් මෙසේ පවාරණය කළ යුතු ය.

**සඞ්ඝං භන්තෙ පවාරෙමි. දිට්ඨෙන වා සුතෙන වා පරිසංකාය වා වදන්තු මං ආයස්මන්තො අනුකම්පං උපාදය පස්සන්තො පටිකරිස්සාමි. දුතියම්පි භන්තෙ සඞ්ඝං -පෙ- තතියම්පි භන්තෙ සඞ්ඝං -පෙ- පටිකරිස්සාමි.**

Non-commercial distribution

පවාරණය කරන සඞ්සයා අතර, පසු වස් වැසූ හෝ වස් නො වැසූ හෝ වස් බිඳුනාවූ හෝ භික්ෂූහු වෙත් නම්, ඔවුන් විසින් පාරිසුඩිය ආරෝචනය කළ යුතු ය. පසු වස් විසූ භික්ෂූන් පවාරණය කරන තැනක පෙර වස් විසූ භික්ෂූහු වෙත් නම්, ඔවුන් විසින් ද පාරිසුඩිය ආරෝචනය කළ යුතු ය.

මහාපවාරණ දිනයෙහි සීමාවකට රැස්වූ භික්ෂූන් අතර පසුවස් විසුවෝ බහුල වෙත් නම්, පවාරණාඥප්තිය නො තබා පාමොක් උදෙසිය යුතු ය. ඉන් පසු ඥප්තියක් නො තබා ම පෙරවස් විසූවන් විසින් ඒ භික්ෂූන් කෙරෙහි පවාරණය කළ යුතු ය. දෙ පිරිස සම වෙත් නම් පවාරණාඥප්තිය තබා පෙරවස් විසූවන් පවාරණ කළ යුතු ය. පසුවස් විසූවන් ඒ භික්ෂූන් කෙරෙහි පාරිසුඩිය ආරෝචනය කළ යුතු ය. පසු වස් පවාරණ දිනයෙහි පිළිපැදිය යුත්තේ ද එසේ ම ය. මහා පවාරණය කරන දිනයෙහි පෙරවස් හා පසු වස් විසූ භික්ෂූන් දෙනමක් පමණක් එක් සීමාවකට එක් වූවාහු නම්, පෙරවස් විසූ භික්ෂුව අනිත් භික්ෂුවට පවාරණය කළ යුතු ය. පසු වස් විසූ භික්ෂුව පාරිසුඩිය ආරෝචනය කළ යුතු ය.

**තේවාචික ගණ පවාරණය.**

පවාරණා දිනයෙහි සීමාවට රැස්වූ පිරිස සතර නමක් වේ නම්, එක් එක් නම ඉතිරි තෙනම කෙරෙහි පවාරණය කළ යුතු ය. එය ගණපවාරණය ය. එය ඥප්තිය තබා කළ යුතු ය. ඥප්තිය මෙසේ ය.

**සුණන්තු මෙ ආයස්මන්තො අජ්ජ පවාරණා (පණ්ණරසී) යදයස්මන්තානං පත්තකල්ලං මයං අඤ්ඤමඤ්ඤං පවාරෙය්‍යාම.**

මෙසේ ඥප්තිය තබා වැඩි මහලු භික්ෂුව විසින් සිවුරු ඒකාංස කොට පෙරවා උක්කුටිකයෙන් හිඳ වැඳ ගෙන-

**"අහං ආවුසො ආයස්මන්තෙ පවාරෙමි. දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා වදන්තු මං ආයස්මන්තො අනුකම්පං උපාදය පස්සන්තො පටිකරිස්සාමි. දුතියම්පි අහං ආවුසො -පෙ- තතියම්පි අහං ආවුසො ආයස්මන්තෙ පවාරෙමි -පෙ- පස්සන්තො පටිකරිස්සාමි"** යි

*Non-commercial distribution*

පවාරණය කළ යුතු ය. නවක භික්ෂූන් විසින්-

**"අහං භන්තෙ ආයස්මන්තෙ පවාරෙමි. දිට්ඨෙන වා සුතෙන වා පරිසඩ්කාය වා වදන්තු මං ආයස්මන්තො අනුකම්පං උපාදය පස්සන්තො පටිකරිස්සාමි. දුතියම්පි -පෙ- තතියම්පි -පෙ- පටිකරිස්සාමි"** මෙසේ පවාරණය කළයුතු.

**තේවාචික පුග්ගල පවාරණය.**

භික්ෂූන් තුන් නමක් හෝ දෙනමක් හෝ වූ කල්හි කරන පවාරණය, පුද්ගල පවාරණය ය. සීමාවට රැස්වූ භික්ෂූහු තුන් නමක් නම් ව්‍යක්ත භික්ෂුවක් විසින්-

**සුණන්තු මෙ ආයස්මන්තා අජ්ජ පවාරණා පණ්ණරසී යදායස්මන්තානං පත්තකල්ලං මයං අඤ්ඤමඤ්ඤං පවාරෙය්‍යාම."**

මෙසේ ඥත්තිය තැබිය යුතු ය. ඉක්බිති ස්ථවිර භික්ෂුව විසින් උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ-

**අහං ආවුසො ආයස්මන්තෙ පවාරෙමි. දිට්ඨෙන වා සුතෙන වා පරිසඩ්කාය වා වදන්තු මං ආයස්මන්තා අනුකම්පං උපාදය පස්සන්තො පටිකරිස්සාමි. දුතියම්පි -පෙ- තතියම්පි -පෙ- පටිකරිස්සාමි.**

මෙසේ ඉතිරි භික්ෂූන් දෙදෙනා කෙරෙහි පවාරණය කළ යුතු ය. නවක භික්ෂූන් විසින් "අහං භන්තෙ" යනාදීන් කියා පවාරණය කළයුතු.

**"ආයස්මන්තො-ආයස්මන්තා"** යන මේ වචන දෙක ගැන විශේෂයෙන් මතක තබා ගත යුතු ය. ආයස්මන්තො යනු බහු වචනය යි. ආයස්මන්තා යනු ද්විවචනය යි. බුදුසස්නෙහි ද්විවචනයක් වශයෙන් ව්‍යවහාර වන්නේ **"ආයස්මන්තා"** යන වචනය පමණෙකි.

භික්ෂූන් දෙදෙනෙක් පමණක් වූවාහු නම් ඤත්තිය තැබීමක් නො කොට ස්ථවිර භික්ෂුව විසින් සිවුර ඒකාංස කොට පොරවා උක්කුටිකව හිඳ ඇඳිලි බැඳ **"අහං ආවුසො ආයස්මන්තං පවාරෙමි. දිට්ඨෙන වා සුතෙන වා පරිසඩ්කාය වා වදතු මං ආයස්මා අනුකම්පං උපාදය. පස්සන්තො පටිකරිස්සාමි. දුතියම්පි -පෙ- තතියම්පි -පෙ-**

Non-commercial distribution

**පටිකරිස්සාමි**" යි අනික් භික්ෂුවට සැලකළ යුතු ය. නවක භික්ෂුව විසින් ඒ වාක්‍යය ම '**භන්තෙ**' යනු යොද ස්ථවිර භික්ෂුව කෙරෙහි පවාරණය කළ යුතු ය.

**අධිට්ඨාන පවාරණය**.

ඉදින් පවාරණ දිනයෙහි එක් භික්ෂුවක් පමණක් වී නම්, ඒ භික්ෂුව විසින් සීමාවට ගොස්, හැමද, පැන් එළවා තබා, අසුන් පනවා, පහන් දල්වා, එහි හිඳිය යුතු ය. එසේ හිඳිනා කල්හි තවත් භික්ෂූහු ආවාහු නම්, ඒ භික්ෂූන් සමග පවාරණය කළ යුතුය. නො ආවාහු නම් "**අජ්ජ මෙ පවාරණා (පණ්ණරසීති) අධිට්ඨාමි**" යි තෙවරක් කිය යුතුය. එය අධිට්ඨාන පවාරණය ය.

**ද්වේවාචිකාදි පවාරණා**

පවාරණ වාක්‍යය එක් වරක් කීමෙන් කරන පවාරණය 'ඒකවාචික පවාරණය' ය. පවාරණ වාක්‍යය දෙවරක් කියා කරන පවාරණය 'ද්වේවාචික පවාරණය' ය. සමාන වස් ඇති භික්ෂූන් සමූහ වශයෙන් එක් වර පවාරණය කිරීම 'සමාන වස්සික පවාරණය' ය, ඒ ක්‍රමවලින් පවාරණය කරන්නට සිදු වන්නේ බොහෝ භික්ෂූන් ඇති කාලවල ය. මෙකල එපමණ භික්ෂූන් නැති බැවින් ඒ පවාරණා කරන්නට අවස්ථා නො පැමිණේ. එබැවින් ඒවා මෙහි නො දක්වනු ලැබේ. දනු කැමතියන් **මහාවග පවාරණාක්ඛන්ධකයෙන්** බලා ගත යුතු ය.

Non-commercial distribution

# කඨිනාස්තරණ විනය කර්මය.

සඞ්ඝාටි-උත්තරාසඞ්ග-අන්තරවාසක යන නම් වලින් තුන් සිවුරු ඉටා, පරිභෝග කරන්නා වූ භික්ෂූන් වහන්සේට එක් රාත්‍රියකුදු තුන් සිවුරෙන් වෙන්ව විසුව හොත් නිසඟි පචිති ඇවැත් වේ. එබැවින් එසේ තුන් සිවුරු පරිහරණය කරන භික්ෂූන් වහන්සේට යන යන තැනට තුන් සිවුරු ගෙන යාමට සිදුවේ.

එය භික්ෂූන් වහන්සේට තරමක කරදරයකි. **කොසොල්** රජතුමාගේ සොහොයුරු වූ තිස් නමක් වූ **'භද්දවග්ගිය'** තෙරුන් වහන්සේලාට එයින් වූ කරදරය දුටු, මහාකාරුණික වූ තථාගතයන් වහන්සේ විසින් භික්ෂූන් වහන්සේට තරමක පහසුවක් ඇති කර දෙනු වස් **'අනුජානාමි භික්ඛවෙ! වස්සං වුත්ථානං භික්ඛූනං කඨිනං අත්ථරිතුං'** යි භික්ෂූන් වහන්සේට පඤ්චානිසංසයක් ලැබෙන්නා වූ 'කඨිනාස්තරණ විනය කර්මය' අනුදැන වදාළ සේක.

එය සිදු කරන්නේ මෙසේ යඃ-

ගිහිවූ හෝ පැවිදි වූ හෝ යම් කිසි සැදැහැවතකු විසින් කඨිනත්ථාරයට නියමිත කාලය තුළදී, පෙර වස් වැස පවාරණය කළ භික්ෂූන් විෂයෙහි **"ඉමං කඨිනචීවරං සඞ්ඝස්ස දෙම"** යි චීවරයක් සඟසතු කොට පිදූ කල්හි, මහා සඞ්ඝයා වහන්සේ විසින් එය ගෙන සීමාවට රැස්ව, කඨිනාස්තරණ විනය කර්මය කරනු සඳහා, එය දීමට සුදුසු භික්ෂුවක් තෝරා, මතු දැක්වෙන කර්මවාක්‍යය කියා, කඨින වස්ත්‍රය ඒ භික්ෂුවට ප්‍රදානය කළ යුතු ය.

Non-commercial distribution

කර්මවාක්‍යය මෙසේ ය :-

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, ඉදං සඞ්ඝස්ස කඨිනදුස්සං උප්පන්නං, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ඉමං කඨිනදුස්සං (තිස්සස්ස) භික්ඛුනො දදෙය්‍ය කඨිනං අත්ථරිතුං, එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, ඉදං සඞ්ඝස්ස කඨිනදුස්සං උප්පන්නං, සඞ්ඝො ඉමං කඨිනදුස්සං (තිස්සස්ස) භික්ඛුනො දෙති කඨිනං අත්ථරිතුං, යස්සායස්මතො ඛමති ඉමස්ස කඨිනදුස්සස්ස (තිස්සස්ස) භික්ඛුනො දානං කඨිනං අත්ථරිතුං, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.**

**දින්නං ඉදං සඞ්ඝෙන කඨිනදුස්සං (තිස්සස්ස) භික්ඛුනො කඨිනං අත්ථරිතුං, ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.**

මෙසේ සඞ්ඝයා විසින් එක් භික්ෂුවකට දෙන ලද ඒ කඨින වස්ත්‍රය, පූජාකළ පින්වතුන් විසින් ම කපා මසා-පඬුපොවා, අධිෂ්ඨානයට යෝග්‍ය වන පරිදි පිළියෙල කර තිබෙන වස්ත්‍රයක් හෙවත් සිවුරැක් වේ නම්, වස් වැසූ සීමාව තුළ හිඳ, එහි කප් බින්දු තබා, එය දෙපොට සිවුරක් නම්, තමාගේ පරණ සඞ්ඝාටිය පච්චුධරණය කොට "**ඉමං සඞ්ඝාටිං අධිට්ඨාමි**" යි තුන් වරක් කියා, එය ඉටා ගත යුතු ය. තනි පොට සිවුරක් වී නම්, පරණ උත්තරාසඞ්ගය පච්චුද්ධරණය කොට "**ඉමං උත්තරාසඞ්ගං අධිට්ඨාමි**" යි තුන්වරක් කියා එය ඉටා ගත යුතු ය. අඳනයක් නම්, පරණ අන්තරවාසකය පච්චුද්ධරණය කොට, "**ඉමං අන්තරවාසකං අධිට්ඨාමි**" යි තුන්වරක් කියා එය ඉටා ගත යුතු ය.

ඉක්බිති ඒ චීවරය අතට ගෙන එය සඞ්ඝාටිය නම්, "**ඉමාය සඞ්ඝාටියා කඨිනං අත්ථරාමි**" යි තුන් වරක් කිය යුතු ය.

Non-commercial distribution

උත්තරාසඞ්ගය නම්, "**ඉමිනා උත්තරාසඞ්ගෙන කඨිනං අත්ථරාමි**" යි ද, අන්තරවාසකය නම් "**ඉමිනා අන්තරවාසකෙන කඨිනං අත්ථරාමි**" යි ද කිය යුතු ය. එසේ කීම කඨිනාස්තරණ විනය කර්මය ය. එය කළ කල්හි ඒ භික්ෂූන් වහන්සේට බුඩාඥාව වූ පරිදි අනාමන්තචාරාදි පඤ්චානිසංසය ලැබෙන්නේ ය. ඉක්බිති ඒ භික්ෂුව විසින් කඨිනාස්තරණ කර්මය අනුමෝදන් කරවිය යුතු ය.

එය කරන්නේ මෙසේ ය:-

ඒ භික්ෂුව විසින් සිවුර ඒකාංස කොට පොරවා ඇදිලි බැඳ, සඞ්ඝයාහට තමා සඞ්ඝස්ථවිර නම් "**අත්ථතං ආවුසො සඞ්ඝස්ස කඨිනං ධම්මිකො කඨිනත්ථාරො අනුමොදථ**" යි තුන් වරක් කිය යුතු ය. තමාට වැඩිමහල්ලෝ එහි වෙත් නම් "**අත්ථතං භන්තෙ සඞ්ඝස්ස කඨිනං ධම්මිකො කඨිනත්ථාරො අනුමොදථ**" යි කිය යුතු ය. අනුමෝදන් වන භික්ෂූන් විසින් "**අත්ථතං භන්තෙ සඞ්ඝස්ස කඨිනං ධම්මිකො කඨිනත්ථාරො අනුමෝදමි**" යන වැකිය, ඒකාංස කොට පෙරවා උක්කුටිකයෙන් හිඳ ඇදිලි බැඳගෙන කියා, කඨිනත්ථාරය අනුමෝදන් විය යුතු ය. ඉන් පසු අනුමෝදන් වූ භික්ෂූන්ට ද පඤ්චානිසංසය හිමි වේ. **කඨින වස්ත්‍රය වැඩ නො නිම වූ වස්ත්‍රයක් වේ නම්-**

"**පුබ්බකරණං සත්තහි ධම්මෙහි සඞ්ගහිතං; ධොවනෙන විචාරණෙන ඡෙදනෙන බන්ධනෙන සිබ්බනෙන රජනෙන කප්පකරණෙන**"

යනුවෙන් දැක්වෙන සේදීමය, නූල්ගසා කඩ වෙන් කිරීමය, කැපීමය, බොරුනූල් දැමීම ආදියෙන් කඩ එකතු කිරීමය, මැසීමය, පඬුපෙවීමය, කප් බින්දු තැබීමය යන පූර්වකෘත්‍ය සත එදින ම කොට නිමවා, එදින ම කඨිනත්ථාරය කළ යුතු ය.

"**කඨිනං කෙන දින්නං වට්ටති? යෙන කෙනචි දෙවෙන වා මනුස්සෙන වා පඤ්චන්නං වා සහධම්මිකානං අඤ්ඤතරෙන දින්නං වට්ටති**" යනු අටුවා හෙයින් යම් කිසි මනුෂ්‍යයකු විසින් හෝ දෙවියකු විසින් හෝ භික්ෂුවක විසින් හෝ භික්ෂුණියක විසින් හෝ සාමණේරයකු විසින් හෝ සමාණේරියක විසින්

Non-commercial distribution

හෝ ශික්ෂමානාවක විසින් හෝ දෙන ලද වස්ත්‍රය කඨිනයට සුදුසු වන්නේ ය.

කඨිනය දිය යුතු සැටි නො දන්නා පින්වතකු විසින් එය කෙසේ දිය යුතුදැයි භික්ෂූන්ගෙන් විචාළ හොත්, තුන් සිවුරු අතුරෙන් එක්තරා සිවුරකට පොහෝනා වස්ත්‍රයක් ඉර උදවන වේලෙහි **"කඨින දුස්සං දෙම"** කියා දිය යුතු බවත්, එය කිරීමට ඉදිකටු-නූල් හා පඬුත්, එයට සහභාගි වන භික්ෂූන්ට දනයත් දිය යුතු බව, ඒ පින්වතාට කිය යුතු ය. ඒ බව විනය අටුවාවෙහි දක්වා තිබේ. කඨිනය සඳහා වස්ත්‍රයක්ම දිය යුතු,ය කියා හෝ කොට නිමවූ සිවුරක් දිය යුතුය කියා හෝ විනය පාළියෙහි කඨිනය දීම පිළිබඳ වචන මාත්‍රයකුදු සඳහන් කොට නැත. අටුවාවෙහි 'තුන් සිවුරෙන් එකකට පොහෝනා වස්ත්‍රයක් දිය යුතුය' යි දක්වා තිබෙන්නේ වැඩ නිම කළ සිවුරක් නො දිය යුතු නිසා නොව ඒ කාලයේ පැවති සිරිත අනුව ය. අතීත කාලයේ සිවුරු මසා ගැනීම කරන ලද්දේ භික්ෂූන් විසිනි. දයකයෝ සිවුරු පිණිස වස්ත්‍ර ම පිදූහ.

**"සඞ්ඝෙන පන කස්ස දාතබ්බං? යො ජිණ්ණචීවරො හොති. සචෙ බහූ ජිණ්ණචීවරා, බුඩ්ඪස්ස දාතබ්බං. බුඩ්ඪෙසුපි යො මහාපරිසො තදහෙව චීවරං කත්වා අත්ථරිතුං සක්කොති, තස්ස දාතබ්බං. සචෙ බුඩ්ඪො න සක්කොති නවකතරො සක්කොති, තස්ස දාතබ්බං. 'අපි ච සඞ්ඝෙන මහාථෙරස්ස සඞ්ගහං කාතුං වට්ටති. තස්මා තුම්හෙ භන්තෙ ගණ්හථ, මයං කත්වා දස්සාමී'ති වත්තබ්බං"**

යනුවෙන් අටුවාවෙහි දැක්වෙන පරිදි, යම්කිසි දයකයකු විසින් කඨිනය පිණිස පුදන ලද වස්ත්‍රය සඞ්ඝයා විසින්, ඒ පිරිසෙහි වූ භික්ෂූන් අතුරෙන් දිරාගිය සිවුරු ඇති භික්ෂුවට දිය යුතු ය. දිරාගිය සිවුරු ඇත්තෝ නැත්තාහු හෝ බොහෝ දෙනෙක් අත්තාහු හෝ වෙත් නම්, ඒ වස්ත්‍රය වෘද්ධයාට දිය යුතු ය. වෘද්ධයන් අතුරෙනුදු එදින ම කපා-මසා-පඬුපොවා සිවුර කොට නිමවා, කඨිනය ඇතිරීමට සමත් මහපිරිස් ඇති තැනැත්තකුට දිය යුතු ය. ඉදින් වෘද්ධයා එසේ කිරීමට සමත් නො වී නවකයෙක් සමත් වේ නම්, නවකයාට කඨින වස්ත්‍රය දිය

Non-commercial distribution

යුතු ය. සඞ්ඝයා විසින් මහ තෙරුන් වහන්සේට සඞ්ග්‍රහ කිරීම වටනේ ය. එබැවින් "නුඹ වහන්සේ පිළිගනු මැනව, අපි එය නුඹ වහන්සේට කර දෙන්නෙමුය" යි සඞ්ඝයා විසින් මහා ස්ථවිරයන් වහන්සේට කිය යුතු ය.

**කඨින චීවරය සමග පිරිනමන පරිෂ්කාර.**

කඨින චීවරයක් පුදන කල්හි දයකයෝ එහි පරිවාර පරිෂ්කාර වශයෙන් තවත් චීවරාදි බොහෝ වස්තූන් පුදති. ඒවා 'කඨිනානිසංස පරික්ඛාර' නම්. ඒවා ගැන පිළිපැදිය යුතු අන්දම **විනය අටුවාවෙහි** දැක්වෙන්නේ මෙසේ ය.

**එවං අත්ථතෙ පන කඨිනෙ, සචෙ කඨින චීවරෙන සද්ධිං ආභතං ආනිසංසං දයකා 'යෙන අම්හාකං කඨිනං ගහිතං තස්සෙව දෙමා'ති දෙන්ති, භික්ඛුසඞ්ඝො අනිස්සරො. අථ අවිචාරෙත්වාව දත්වා ගච්ඡන්ති, භික්ඛුසඞ්ඝො ඉස්සරො. තස්මා සචෙ කඨිනත්ථාරකස්ස සෙසචීවරානි'පි දුබ්බලානි හොන්ති. සඞ්ඝෙන අපලොකෙත්වා තෙසම්'පි අත්ථාය වත්ථානි දතබ්බානි, කම්මවාචා පන එකාව වට්ටති. අවසෙසෙ කඨිනානිසංසෙ බලවවත්ථානි වස්සාවාසිකඨිතිකාය දතබ්බානි. ඨිතිකාය අභාවෙ ථෙරාසනතො පට්ඨාය දතබ්බානි. ගරුභණ්ඩං න භාජෙතබ්බං.**

එහි තේරුම මෙසේ ය.:-

'මෙසේ කඨිනය අතුළ කල්හි ඒ කඨින චීවරය සමඟ ගෙන ආ ආනිසංස පරිෂ්කාරයන් දයකයෝ "අප්ගේ කඨිනය ගන්නා තෙරුන් වහන්සේට ම දෙමුය" කියා දෙත් නම්, ඒවා භික්ෂු සඞ්ඝයාට අයිති නැත. දයකයෝ ඒවා ගැන කිසිවක් නො කියා ගියාහු නම්, ඒ පිරිකර සඞ්ඝයාට අයිතිය. එබැවින් කඨිනය ලැබූ භික්ෂුවගේ අන් සිවුරුත් දුබලවී ඇත් නම්, සංඝයාට දන්වා ඒ සිවුරු පිණිස ද කඨිනත්ථාරකයාට වස්ත්‍ර දිය යුතු ය. කර්මවාක්‍යය කියයුත්තේ කඨින චීවරය සඳහා පමණෙකි. ඉතිරි කඨිනානිසංසයන්ගෙන් බලවත් වස්ත්‍ර (ශක්තිමත් හොඳ වස්ත්‍ර) වස්සාවාසිකඨිතිකාවෙන් දිය යුතු ය. ඨිතිකාවක් නැතහොත්,

Non-commercial distribution

මහතෙරුන් වහන්සේගේ පටන් පිළිවෙළින් දිය යුතු ය. ගරුභාණ්ඩ නො බෙදිය යුතුය.

බොහෝ භික්ෂූන් වහන්සේලා වාසය කරන තැන් වලට සාඞ්ඝික වශයෙන් ලැබෙන සිවුරු වැඩිමහලු පිළිවෙළින් ලැබෙන ලැබෙන සැටියට බෙදා දෙනු ලැබේ. එය කරන්නේ මෙසේය:- අද සිවුරු පසක් ලද හොත් මහතෙරුන්වහන්සේගේ පටන් පිළිවෙළින් පස් නමකට ඒ සිවුරු දෙති. ඊට පසු ලැබෙන සිවුරු සවෙනි තෙරුන් වහන්සේගේ පටන් පිළිවෙළින් දෙනු ලැබේ. "ඨිතිකාවය" යි කියනුයේ සිවුරු දීම නැවතුණු තැන ය. පිළිවෙළින් සිවුරු දීගන අවුත් නැවතුණු තැනක් ඇති නම්, කඨිනානිසංස වස්ත්‍ර ඒ ඨිතිකාවේ පටන් බෙදනු ලැබේ.

**කඨින විපත්ති.**

කඨිනය අතුළේ වී නමුත් කඨිනාස්තරණ විනය කර්මය සිඩියට නො පැමිණීමේ කරුණු සූවිස්සක් **මහා වග්ගපාළි-යෙහි** වදරා තිබේ. ඒ සූවිස්ස සංග්‍රහ කොට ගත හොත් කරුණු කීපයෙකි.

අධිෂ්ඨානයට යෝග්‍ය සිවුරක් වන පරිදි සිවුර පිළිබඳව කළයුතු දෑ සම්පූර්ණ නො කළ සිවුරකින් කඨිනය අතුළේ ද එය සිඩියට නො පැමිණේ. මහා වග්ගයෙහි දේශිත සූවිසි විපත්තීන් ගෙන් බොහෝ ගණනක් කියන ලද කරුණෙහි සඞ්ග්‍රහ වේ.

**"න නිමිත්ත කතෙන අත්ථතං හොති කඨිනං. න පරිකථා කතෙන අත්ථතං හොති කඨිනං"** (මහා වග්ගපාළි) මේ වස්ත්‍රය හොඳය, මෙය කඨින චීවරයකට සුදුසුය යනාදීන් නිමිති ඇති කිරීමෙන් ලබාගත් වස්ත්‍රයෙන් කඨිනය අතුළේ ද සිද්ධියට නො පැමිණේ. "කඨින දීම හොඳ පින්කමෙකි, වෙන අවුරුදුවල නම්, මේ කාලයේ කඨින දෙනවාය, මේ අවුරුද්දේ ඒ ගැන සූදනමක් නො පෙනේය" යනාදීන් වටින් පිටින් කථා කොට උපදවා ගත් වස්ත්‍රයෙන් කඨිනය අතුළේ ද සිද්ධියට නො පැමිණේ. මේ කරුණු දෙක විශේෂයෙන් භික්ෂූන් විසින් මතක තබා ගත යුතු කඨින විපත්ති දෙකකි.

Non-commercial distribution

මෙය විස්තර කරන විනය අටුවාවෙහි "**කඨිනං නාම අති උක්කට්ඨං වට්ටති. මාතරංපි විඤ්ඤාපෙතුං න වට්ටති. ආකාසතො ඔතිණ්ණ සදිසමෙව වට්ටති**" යි කියා තිබේ. එහි තේරුම 'කඨින ඉතා උත්කෘෂ්ඨ වූයේ ම වටනේ ය, මවටවත් කියා ලබා ගන්නට නො වටනේය, භික්ෂුවක ගේ කිසිම නිමිත්ත කරණයක් හෝ පරිකථාවක් හෝ ඉල්ලීමක් හෝ නැතිව, අහසින් වැටුනාක් මෙන් ලද වස්ත්‍රයක් ම කඨිනය පිණිස වටනේය' යනු යි.

මෙහි අහසින් වැටීමේ උපමාව දක්වා තිබෙන්නේ ඉහත දැක්වූ ඉල්ලීම්, නිමිති පහළ කිරීම්, වටින් පිටින් කථා කිරීම් වලින් තොරව, දයකයකුගේ කැමැත්තෙන් ම පුදන ලද්දක් විය යුතු බව දැක්වීම පිණිස ය.

ඇතැම්හු "**ආකාසතො ඔතිණ්ණ සදිසමෙව වට්ටති**" යන අටුවා පාඨය වරදවා තේරුම් ගෙන කඨිනය කලින් භික්ෂූන්ට දැනුම් දීමක් නො කොට හදිසියෙන් දිය යුත්තකැ යි කියති. කඨිනයක් දෙන බව කලින් භික්ෂූන්ට දැන්වීමෙන් වන කඨින විපත්තියක් නැත. කඨිනය දීම සම්බන්ධයෙන් නො දන්නා දෙයක් භික්ෂූන්ගෙන් අසා ගැනීමෙන් හෝ එසේ අසන කෙනකුට ඒ කාරණය කියා දීමෙන් හෝ වන කඨින විපත්තියක් ද නැත. කඨිනයක් දෙනු කැමති දයකයාගේ ඉල්ලීම පිරිදි භික්ෂුවක් විසින් ඒ කටයුත්තට වුවමනා පමණ භික්ෂූන් වහන්සේලා පමුණුවා දීමෙන් වන කඨින විපත්තියක් ද නැත.

"**න කුක්කුකතෙන අත්‍ථතං හොති කඨිනං**" යනු වදළ බැවින් තාවකාලික වශයෙන් දෙන වස්ත්‍රයකින් කඨිනය අතුළේ ද සිධියට නො පැමිණේ.

"**න සන්නිධිකතෙන අත්‍ථතං හොති කඨිනං**" යි වදළ බැවින් සන්නිධි කළ චීවරයෙන් අතුළේ ද කඨිනාස්තරණය සිදු නො වේ. 'කරණසන්නිධිය, නිචයසන්නිධිය' යි සන්නිධිය දෙ-වැදෑරුම් වේ. සඞ්ඝයා විසින් භික්ෂුවකට කඨින වස්ත්‍රය දුන් පසු, එදිනම සිවුරක් නො කොට, එය තබා ගෙන සිට, පසුදිනකදී සිවුරක් කිරීම '**කරණසන්නිධි**' නම්. එබඳු සිවුරකින් කඨිනය අතුළේ ද කඨිනාස්තරණ විනය කර්මය සිද්ධ නො වේ. කඨිනය පිණිස ලද වස්ත්‍රය එදින

Non-commercial distribution

ම යම්කිසි භික්ෂුවකට නොදී පසු දිනක දීම **'නිචයසන්නිධි'** නම්. එබඳු සිවුරකින් කඨිනය අතුළේ ද සිඩියට නො පැමිණේ.

"**න නිස්සග්ගියෙන අත්ථතං හොති කඨිනං**" යි වදාළ බැවින් සිවුර කර ගෙන යන කල්හි නිමවන්නට කලින් අරුණ නැගීම වූ සිවුරෙන් කඨිනය අතුළේ ද නො අතුළේ වේ.

"**න අඤ්ඤත්‍ර සඞ්ඝාටියා අත්ථතං හොති කඨිනං**" යනාදිය වදාළ බැවින් සඞ්ඝාටිය - උත්තරාසඞ්ගය - අන්තර වාසකය යන මේ තුන හැර අනිකකින් කඨිනය අතුළේ ද නො අතුළේ වේ.

**කලින් කළ සිවුරෙන් කඨිනය ඇතිරීම.**

"**න අඤ්ඤත්‍ර පඤ්චකෙන වා අතිරේක පඤ්චකෙන වා තදහෙව සඤ්ඡින්නෙන සමණ්ඩලිකතෙන අත්ථතං හොති කඨිනං**" යනු වදාළ බැවින් කඨින වස්ත්‍රය ලැබූ ඒ දිනයෙහි ම පස්කඩක් කොට හෝ පස්කඩකට වැඩි කඩ ගණනකට හෝ කපා, මහාමණ්ඩල අර්ධ මණ්ඩල දක්වා නො කළා වූ, කඩ නො කැපූ හෝ කඩ දෙක තුනකට කපා කළා වූ හෝ සිවුරකින් කඨිනය අතුළේ ද නො අතුළේ වේ.

බොහෝ දෙනා 'කලින් කර තිබෙන සිවුරකින් කඨිනය ඇතිරීම වරදය' යි ගන්නේ ඉහත කී පාඨය වරදවා තේරුම් ගැනීමෙනි. ඒ පාඨයෙන් දක්වන ප්‍රධාන කාරණය කඩ නො කැපූ හෝ පසකට අඩු කඩ ඇත්තා වූ හෝ චීවරය කඨිනාස්තරණයට නුසුදුසු බව ය. "**තදහෙව**" යන වචනය ඒ පාඨයට යොද තිබෙන්නේ ඉහත දැක්වූ සන්නිධිය හා නිස්සග්ගිය සම්බන්ධයෙනි. කලින් කඨින වස්ත්‍රයෙහි කර තුබූ දෙයක් සම්බන්ධයෙන් සන්නිධියක් නො වේ. එය වන්නේ සඞ්ඝයා විසින් වස්ත්‍රය ලැබූ පසු එදින ම සියල්ල නිම කොට කඨිනය නො ඇතිරීමෙනි.

කඨින වස්ත්‍රය ලැබ එය සඞ්ඝයා විසින් සුදුසු භික්ෂුවකට දුන් පසු කළ යුතු සත්වැදෑරුම් පූර්වකෘත්‍යය කළ යුතු ය. කළ යුතු පූර්වකෘත්‍යයන් අතුරෙන් යම් යම් කෘත්‍යයක් ඒ වස්ත්‍රයෙහි කලින් කෙරී තිබේ නම්, ඒවා නැවත කරන්නට වුවමනාවක් නැත.

Non-commercial distribution

පූර්වකෘත්‍යයන් කළ යුතු වන්නේ ඒවා කෙරී නැතහොත් ය. මසා පඬුපොවා ඇති වස්ත්‍රයක් ලද හොත් එහි පූර්වකෘත්‍ය වශයෙන් කරන්නට ඉතිරි වී ඇත්තේ කප්බින්දු තැබීම පමණෙකි. එය කොට, ඉටා, එයින් කඨිනය අතුළ කල්හි කඨිනාස්තරණ සිද්ධිය වේ.

"එවඤ්ච පන භික්ඛවෙ පබ්බාජෙතබ්බො, උපසම්පා-දෙතබ්බො, පඨමං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා එකංසං උත්තරාසඞ්ගං කාරාපෙත්වා භික්ඛූනං පාදෙ වන්දපෙත්වා" යනාදීන් **මහාවග්ගපාළියෙහි** පැවිදි කරන සැටි වදරා තිබේ. යම් කිසිවකු කලින් කෙස්-රැවුල් බා-ගෙන පැවිදි-වන්නට පැමිණිය හොත් ඉහත කී දේශනය අකුරට ම පිළිපදින්නට, ඔහුගේ හිස නැවත කෙස් සිටවා කපන්නට හෝ කපා පැවිදි කර වීමට, නැවත කෙස්-රැවුල් වැඩෙන තුරු බලා සිටින්නට හෝ වුවමනා නැත. කෙස්-රැවුල් පහ කිරීම සිදුවී තිබෙන බැවින් සිවුරු හඳවා, ඔහු පැවිදි කළ යුතු ය.

එමෙන් පූර්වකෘත්‍යයන් සිදුවී තිබෙන කඨිනවස්ත්‍රයක් ලදහොත් එහි නැවත පූර්වකෘත්‍යයන් කරන්නට වුවමනා නැත. ඇත්තේ නො නිමි පූර්වකෘත්‍යයක් වේ නම්, එය කොට කඨිනය ඇතිරීමට ය. කලින් කෙස්-රැවුල් කපා ගෙන උන්නහුගේ පැවිද්ද සිදුවන්නාක් මෙන් කලින් පූර්වකෘත්‍ය නිම වී ඇති සිවුරෙන් කරන කඨිනාස්තරණය ද සිදු වේ. කලින් කර තිබීමෙන් එයට වන බාධාවක් නැත. එබැවින් විනය අටුවාවෙහි-

**"එවං දින්නෙ පන කඨිනෙ සචෙ තං කඨින දුස්සං නිට්ඨිතපරිකම්මමෙව හොති, ඉච්චෙතං කුසලං ච නො චෙ නිට්ඨිතපරිකම්මං අහං ථෙරොති වා බහුස්සුතොති වා එකෙනා පි අකාතුං න ලබ්භති. සබ්බෙහෙව සන්නිපතිත්වා ධොවනසිබ්බන-රජනානි නිට්ඨාපෙතබ්බානි."**

**මෙසේ කඨිනය දුන් කල්හි ඉදින් ඒ කඨින වස්ත්‍රය වැඩ ඉවරවූවක් වේ නම් එසේ ම හොඳ ය.** ඉදින් වැඩ ඉවර වූවක් නොවේ නම් 'මම ස්ථවිර වෙමි ය., මම බහුශ්‍රැත වෙමිය'යි එක් භික්ෂුවක් විසිනුදු නො කරන්නට නො ලබයි. හැමදෙනා ම රැස්ව, සේදීම්-මැසීම්-පඬුපෙවීම් නිමකළ යුතුය' යනු එහි තේරුම යි.

Non-commercial distribution

ත්‍රිපිටකධාරී ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ ගේ **පාළි මුත්තක විනය විනිච්ඡයෙහි** ද ඒ පාඨය එසේ ම සඳහන් වේ. ඒ පාඨය **විනයාලංකාර ටීකාවෙහි** වර්ණනා කර ඇත්තේ මෙසේ යː-

**"සවෙ තං කඨිනදුස්සං නිට්ඨිතපරිකම්මමෙව හොතීති ඉමිනා කඨිනදුස්සං නාම න කෙවලං පකති සාටකමෙවː අථ බො පරිනිට්ඨිතසත්තවිධපුබ්බකිච්චං චීවරම්පි හොතීති දස්සෙති** (තස්මා නිට්ඨිත චීවරම්පි හොතීති දස්සෙති.) **තස්මා නිට්ඨිත-චීවරස්මිං දින්නෙ සත්තවිධපුබ්බකිච්චකරණෙන අත්ථො නත්ථි. කෙවලං පච්චුද්ධරණාදීනි යෙව කාතබ්බානි. සචෙ පන කිඤ්චි අපරිනිට්ඨිතා හොති. අන්තමසො කප්ප බින්දුමත්තම්පි. තං නිට්ඨාපෙත්වා පච්චුද්ධරණාදීනි කාතබ්බානි."**

එහි තේරුම මෙසේ යː- "සවෙ තං කඨිනදුස්සං නිට්ඨිත-පරිකම්මමේව හොති" යන මේ පාඨයෙන් කඨින වස්ත්‍රය නම්, හුදෙක් 'ප්‍රකෘති වස්ත්‍රයක්ම නොවේ ය. නිමියාවූ සත් වැදෑරුම් පූර්වකෘත්‍යය ඇති චීවරයක් වේය' යි දක්වයි. එ බැවින් වැඩ නිමවූ සිවුරක් (කඨිනය සඳහා දුන් කල්හි) සත් වැදෑරුම් පූර්වකෘත්‍යයෙන් වුවමනාවක් නැත. හුදෙක් පච්චුද්ධරණාදිය පමණක් කළ යුතු ය. ඉදින් කිසි පූර්වකෘත්‍යයක් නිම කොට නැත්තේ නම්, යටත් පිරිසෙයින් කප්බින්දු තැබීම් මාත්‍රය පමණක්වත් ඉතිරිව ඇත්තේ නම්, එය නිම කොට පච්චුද්ධරණාදිය කළ යුතු ය.

දායකයා විසින් කලින් කපා, මසා, පඬුපොවා, දුන් සිවුරෙන් කඨිනය අතුළ යුතු බව වජිරබුද්ධි ටීකාවෙහි මෙසේ දැක් වේ.

**පරිනිට්ඨිතපුබ්බකරණමෙව චෙ දායකො සඞ්ඝස්ස දෙති. සම්පටිච්ඡිත්වා කම්මවාචාය දාතබ්බං. තෙන ච තස්මිං යෙව සීමා-මණ්ඩලෙ අධිට්ඨහිත්වා අත්ථරිත්වා සඞ්ඝො අනුමොදාපෙතබ්බො. කතපුබ්බකරණස්ස පුන කත්තබ්බාභාවතො.**

ඉදින් දායකයා කරන ලද පූර්වකරණ ඇති වස්ත්‍රයක් ම සංඝයාට දේ නම්, සඞ්ඝයා විසින් පිළිගෙන කර්ම වාක්‍යයෙන් කඨිනත්ථාරකයාට දිය යුතු ය. කඨිනත්ථාරකයා විසින් (සීමා මණ්ඩලය වස් වැසූ සීමාවට ද අයත් නම්) ඒ සීමා මණ්ඩලයේදී ම ඉටා කඨිනය අතුරා සඞ්ඝයාට අනුමෝදන් කරවිය යුතු ය.

Non-commercial distribution

එසේ කළ යුත්තේ කරන ලද පූර්වකෘත්‍යය ඇති වස්ත්‍රයෙහි නැවත කළ යුත්තක් නැති නිසා ය, යනු එහි තේරුම ය.

තවද "**තදහෙව සඤ්ජිත්තෙනාති සඞ්ඝෙන කඨිනත්ථාරකස්ස කම්මවාචං වත්වා දින්නෙනෙව තදහෙව සඤ්ජිත්තෙන සමණ්ඩලීකතෙන භවිතබ්බං -පෙ- න දයකෙන දීයමානං**" යි වජිරබුද්ධි ටීකාවෙහි ම මහාවග්ගපාළියෙහි එන "**තදහෙව සඤ්ජිත්තෙන සමණ්ඩලීකතෙන**" යනාදි පාඨය සඞ්ඝයා විසින් කඨිනත්ථාරකයාට කර්මවාක්‍යය කියා දුන් කඨින වස්ත්‍රය පිළිබඳ වූවක් මිස, දයකයා අතේ තිබෙන වස්ත්‍රය පිළිබඳ වූවක් නො වන බව දක්වා තිබේ. දයකයා කොතෙක් කල් තබාගෙන මැසීම් ආදිය කළත් එය දයකයාගේ සන්නිධියක් මිස, භික්ෂු සඞ්ඝයාගේ සන්නිධියක් නොවන බැවින් කලින් මසා තිබූ සිවුර, කඨිනය ඇතිරීමට නො ගත යුත්තක් නො වේ. කඨිනය ගැන '**මාතිකට්ඨ කථාවෙහි**' දැක්වෙන්නේ මෙසේ යඃ-

"සචෙ පුරිමවස්සං වුත්ථානං ගහට්ඨපබ්බජිතෙසු යො කොචි ධම්මෙන සමෙන චීවරං දෙති, ඉමිනා කඨිනං අත්ථරථාති, තං ඛන්ධකෙ වුත්තාය ඤත්තිදුතියකම්මවාචාය කඨිනත්ථාරාරහස්ස භික්ඛුනො දතබ්බං. තෙන තදහෙව පඤ්ච වා අතිරෙකානි වා ඛණ්ඩානි ඡින්දිත්වා සඞ්ඝාටි වා උත්තරාසඞ්ගො වා අන්තර-වාසකො වා කාතබ්බො. සෙසභික්ඛූහි තස්ස සහායෙහි භවිතබ්බං. **සචෙ කතචීවරමෙව උප්පජ්ජති සුන්දරමෙව**. අච්ඡින්නා සිබ්බිතං පන න වට්ටති.,

එහි තේරුම මෙසේ යඃ- ඉදින් පෙරවස් වැස නිමකළ භික්ෂූන්ට ගිහිපැවිද්දන් අතුරෙන් යම්කිසිවෙක් 'මෙයින් කඨිනය අතුරත්වා'යි දැහැමින් සෙමින් සිවුරක් දේද, එය ඛන්ධකයෙහි කියන ලද ඤත්තිදුතියකම්මවාචාවෙන් කඨිනාස්තරණයට සුදුසු භික්ෂුවකට දිය යුතු ය. ඒ භික්ෂුව විසින් එදින ම පසක්වූ හෝ අධික වූ හෝ කඩ කපා සඞ්ඝාටියක් හෝ උත්තරාසඞ්ගයක් හෝ අන්තර වාසකයක් හෝ කළ යුතු ය. සෙසු භික්ෂූන් විසින් ඒ භික්ෂුවට සහාය විය යුතු ය. **ඉදින් කළ සිවුරක් ම උපන්නේ නම්, යහපත් ම ය**. කඩ නො කැපූ නො මැසූ සිවුර වනාහි නො වටනේ ය.

Non-commercial distribution

මෙසේ අටුවා-ටීකා වල නොයෙක් තැන්වල දයකයන් විසින් කලින් කපා,මසා, පඬුපොවා, පුදන ලද චීවරය ද කඨිනයට සුදුසු බව දක්වා තිබෙන්නේ "න අඤ්ඤත්‍ර පඤ්චකෙන වා අතිරේක පඤ්චකෙන වා තදහෙව සඤ්ඡින්නෙන සමණ්ඩලීකතෙන අත්ථතං හොති කඨිනං" යන බුඩවචනය තේරුම් ගන්නට නුපුළුවන් වීමෙන් හෝ වරදවා තේරුම් ගැනීමෙන් හෝ නොව, එහි අර්ථය බුදුන් වහන්සේගේ අදහසේ හැටියට හරියට ම තේරුම් ගැනීමෙනි.

මේ අටුවාටීකාවන් ලියා තිබෙන්නේ ද මෙකල මෙන් භික්ෂූන් විනයට එතරම් ගෞරවයක් නො දක්වන, විනය පොත-පත භාවිත නො කරන කාලයකදී නොව, ඉතා ආදරයෙන්-ගෞරවයෙන් විනය සිකපද අකුරට ම පිළිපදින, විනය උගෙනීම - උගැන්වීම ආදරයෙන් කරන භික්ෂූන් විසූ කාලයේදී ය. ඒ කාලයේදී ද කඨිනාස්තරණය සඳහා නිකම්ම වස්ත්‍රය පමණක් නොව, දයකයන් විසින් කලින් වැඩ නිම කොට පිදූ චීවරයන් ද ගත් බවට කිසිදු සැකයක් නැත. එබැවින් කලින් කරන ලද සිවුරුවලින් කඨිනය ඇතිරීම අද ඊයේ පටන් ගත් අලුත් දෙයක් නො වන බව ද දත යුතුය.

"කඨිනය සඳහා කලින් මැසූ සිවුරු ගතයුතු බවක් බුඩදේශනාවේ නැත. එය අටුවා මතයකැ" යි ඇතැම් කෙනෙක් කියති. විනය පිළිබඳව අටුවා මතය ය - බුඩමතය ය කියා දෙකක් නැත්තේ ය. විනය අඩු-වැඩි කිරිමේ හෝ වෙනස් කිරීමේ බලයක් අටුවාචාරීන් වහන්සේලාට නැත. උන් වහන්සේලා බුඩ-මතයට විරුද්ධ දෙයක් නො පවසන්නාහ. අටුවාවෙන් කරන්නේ ඒ ඒ කරුණු පිළිබඳ වූ බුඩ-මතය පැහැදිලි කිරීමය. එබැවින් කඨිනය පිණිස කලින් මැසූ සිවුර ගැනීමය, වස්ත්‍රය ගැනීමය යන දෙක ම බුඩමතය ම බව දත යුතු ය.

**නවීන පොතක අදහස්.**

දයකයන් විසින් කපා, මසා, පඬුපොවා පුදන කඨිනය අවලංගු වන සැටියට අටුවාපාඨ තෝරන්නට මහෝත්සාහයක් ගෙන තිබෙන එක්තරා මහාස්ථවිර නමකගේ නවීන පොතක, දයකයා ගෙන් ලද වස්ත්‍රය, සඞ්ඝයා විසින් ම සිවුරක් කොට

Non-commercial distribution

කඨිනය අතුරන භික්ෂුවට දීම ය, ලද ප්‍රකාර වස්ත්‍රය දීමය. යි දෙයාකාර දීමක් ඇති බව කියා:

**"එවං දින්නෙ පන කඨිනෙ සචෙ තං නිට්ඨිතපරිකම්මං හොති ඉච්චෙතං කුසලං. නො චෙ නිට්ඨිතපරිකම්මං හොති සබ්බෙහෙව සන්නිපතිත්වා ධොවනසිබ්බනරජනානි නිට්ඨාපෙතබ්බානි"**

යන අටුවා පාඨයෙන් සඞ්ඝයා විසින් අත්ථාරක භික්ෂුවට පැවරූ කඨින වස්ත්‍රය නිම කළ පරිකර්ම ඇත්තේ නො වේ නම්, සියල්ලන් ම එකතුව සේදීම මැසීම පඬුරුදීම නිම කළ යුතු යයි දක්වන බව කියා තිබේ. ඒ අටුවා පාඨයෙන් පෙනෙන්නේ ද කඨින වස්ත්‍රය සඞ්ඝයා විසින් භික්ෂුවකට පැවරීමෙන් පසු සේදීම් ආදියට සියලු භික්ෂූන් සහභාගි විය යුතු බව ය. එහෙත් අර නවීන පොතෙහි "**පවරා සිවුරු කිරීම ද. සිවුරු කොට පැවරීම ද** යන දෙක්හි ම සඞ්ඝයා එක්විය යුතු ම වේ. අහක් වී නම් දුකුළා ඇවැත් වේය" යි කියා තිබේ.

**අටුවාවෙහි නො කී. පැවරීමට කලින් සිවුරු කිරීමට එක් නො වීමෙන් දුකුළා ඇවැත්** වීම ඒ තෙරුන් වහන්සේ විසින් කොහින් සොයා ගත්තේ දැයි නො දනිමු. අටුවාචාරීන් වහන්සේගේ අදහස "එවං දින්නෙ පන කඨිනෙ" යනාදි පාඨයෙන් කඨින සිවුර නිමවීමට හැමදෙනා වහන්සේ ම එක්විය යුතු බව දැක්වීම නම්, ඒ සඳහා එපමණ දිග වගන්තියක් කීමට වුමවනා නැත. එසේ නම් කිය යුත්තේ "එවං දින්නෙ පන කඨිනෙ සබ්බෙහෙව සන්නිපතිත්වා ධොවන සිබ්බන රජනානි නිට්ඨාපෙතබ්බා" කියා ය. එසේ කී කල්හි වචන බොහෝ ගණනකුත් නැතිව, කිසි අවුලකුත් නැතිව, කවර අවස්ථාවකදී වුව ද කඨිනචීවරකරණයට එක්විය යුතු බව ප්‍රකාශ වේ.

චීවරකරණයට එක්විය යුතු බව දක්වන්නට කියන වාක්‍යය මැදට, ඒ සඳහා ම නම්, "සචෙ තං නිට්ඨිතපරිකම්මං හොති ඉච්චෙතං කුසලං නො ච නිට්ඨිතපරිකම්මං හොති" යනු යෙදීම නිෂ්ඵලය. එය යෙදූ කල්හි භික්ෂුවකට දීමට කලින් කඨින චීවරය කරනවා නම්, එයට සඞ්ඝයා එක්විය යුතු බව ද නො කිය වේ. ග්‍රන්ථ කරණයෙන් අතිශයින් ව්‍යක්තවූ තියුණු බුද්ධිය ඇත්තාවූ-

Non-commercial distribution

අටුවාචාරීන් වහන්සේ එබඳු අවුලක් කරගතිත් ද? අටුවාචාරීන් වහන්සේ "සචෙ තං නිට්ඨිතපරිකම්මං හොති" යි කියා තිබෙන්නේ සඞ්ඝයා විසින් කළ සිවුරක් ගැන නොව, දායකයා විසින් කොට පුදන ලද චීවරයක් ගැන ය. එසේ අර්ථය ගත් කල්හි කිසිදු අවුලක් නැත්තේ ය.

සඞ්ඝයා විසින් කඨින චීවරය කොට පසුව කඨිනත්ථාරක භික්ෂුවට පැවරීමේ සිරිතක් ඇති බව නවීන පොතෙහි දැක්වෙන නමුත්, පාළියෙහි හෝ අටුවාටීකාවල හෝ කිසි තැනක භික්ෂුවකට කඨින වස්ත්‍රය සඞ්ඝයා විසින් දීමට කලින්, පූර්වකරණය සිදු කිරීමේ සිරිතක් ඇති බව දක්වා නැත. එය ඒ තෙරුන් වහන්සේගේ හැඟීම් මාත්‍රයෙකි. කඨිනදුස්සයක් උපන් කල්හි සඞ්ඝයා විසින් පිළිපැදිය යුතු ආකාරය **පරිවාර පාළියෙහි** දැක්වෙන්නේ මෙසේ ය.

**"සචෙ සඞ්ඝස්ස කඨිනදුස්සං උප්පන්නං හොති, සඞ්ඝෙන කථං පටිපජ්ජිතබ්බං? අත්ථාරකෙන කථං පටිපජ්ජිතබ්බං? අනුමොදකෙන කථං පටිපජ්ජිතබ්බං? සඞ්ඝෙන ඤත්තිදුතියකම්මෙන කඨිනත්ථාරකස්ස භික්ඛුනො දාතබ්බං. තෙන කඨිනත්ථාරකෙන භික්ඛුනා තදහෙව ධොවිත්වා විමජ්ජිත්වා විචාරෙත්වා ඡින්දිත්වා සිබ්බෙත්වා රජිත්වා කප්පං කත්වා කඨිනං අත්ථරිතබ්බං."**

'ඉදින් සඞ්ඝයා හට කඨිනදුස්සයක් උපන හොත් සඞ්ඝයා විසින් කෙසේ පිළිපැදිය යුතු ද? අත්ථාරකයා කෙසේ පිළිපැදිය යුතු ද? අනුමෝදකයා කෙසේ පිළිපැදිය යුතු ද? සඞ්ඝයා විසින් ඤත්තිදුතියකර්මයෙන් අත්ථාරක භික්ෂුවට දිය යුතු ය. ඒ කඨිනත්ථාරක භික්ෂුව විසින් එදින ම සෝද, මිරිකා, විචාරා, කඩ කපා මසා, පඬු රදවා, කප් බිංදු තබා කඨිනය අතුළ යුතුය යනු එහි තේරුම ය.

නිකම්ම වස්ත්‍රය කඨිනත්ථාරක භික්ෂුවට සඞ්ඝයා විසින් පැවරීමක් මිස සිවුරක් කොට පැවරීමක් එහි නො කියැවේ. පූර්ව කරණය සඞ්ඝයාට නොව කඨිනත්ථාරකයාට අයත් වැඩක් බව ද, කියන ලද පරිවාර පාඨයෙන් පෙනේ. කඨිනත්ථාරයට සුදුසු භික්ෂුවගේ අඞ්ග දක්වීමේදී "පුබ්බකරණං ජානාති" යි පූර්වකරණය දනගැනීම පළමු වන අඞ්ගය වශයෙන් දේශනය කර තිබෙන්නේ

Non-commercial distribution

ද, පූර්ව කරණය කඨිනත්ථාරක භික්ෂුව අයත් කායඝීයක් වන නිසා ය. සඞ්ඝයාට අයත් කායඝීය නම්, කඨිනත්ථාරක භික්ෂුව හට පූර්ව කරණය සඳහා සහාය වීම ය.

භික්ෂුවකට පැවරීමට කලින් සඞ්ඝයා විසින් කඨින චීවරය කිරීම "**කඨිනස්ස පුබ්බකරණං ආදි. කිරියා මජ්ඣෙ. අත්ථාරො පරියොසානං.**" යන පරිවාර පාඨයට ද විරුද්ධ ය. පූර්ව කරණය කඨිනය පැවරීමට කලින් කරනවා නම්, චීවරය පැවරීම කඨිනයාගේ මැදට යා යුතුය. පරිවාරයෙහි කඨිනයාගේ මැද වශයෙන් දැක්වෙන්නේ පච්චුද්ධාර - අධිට්ඨාන කිරියා දෙක ය. කරුණු මෙසේ හෙයින් සඞ්ඝයා විසින් සිවුරක් කොට කඨිනත්ථාරකයාට දීමේ ක්‍රමය-

"එවං දින්නෙ පන කඨිනෙ" යනාදි අටුවා පාඨයේ අර්ථය අවුල් කරනු සඳහා, ඒ මහ තෙරුන් වහන්සේ විසින් මවා ගත් කඨිනය පැවරීමේ ක්‍රමයක් බව කිය යුතු ය. එසේ කිරීමේ චාරිත්‍රයක් විනයෙහි සඳහන් නො වතුදු එයින් කඨින විපත්තියක් වන බවක් නම් නො කිය හැකි ය.

"**කරණවිපන්නං නාම තදහෙව ඡින්දිත්වා අකතං**" යන අටුවා පාඨයත් ඒ පොතෙහි දායකයන් විසින් කර දෙන චීවරය කඨිනයට නුසුදුසු බව දැක්වීමට ගෙන හැර දක්වා තිබේ. මෙය විනය නො දන්නවුන් මුළා කරනු පිණිස ගෙනහැර දැක්වීමට කදිම අටුවා පාඨයෙකි. කඨිනක්ඛන්ධකයෙහි කඨිනය පිළිබඳව කියා ඇති කරුණු නො දන්නාවූ ද, කඨින විපත් තුන ගැන ම නො දන්නාවූ ද, ඕනෑම කෙනකු ඒ පාඨය දක්වා මුළා කළ හැකි ය. "කරණ විපන්නං නාම තදහෙව ඡින්දිත්වා අකතං" යන අටුවාපාඨයේ අදහස නිවැරදිව තේරුම් ගත හැක්කේ කඨින විපත් තුන ම එක් තැන් කොට බැලීමෙනි.

"**වත්ථුවිපන්නය, කාලවිපන්නය, කරණවිපන්නය**" යි කඨිනත්ථාර විපත් තුනක් පරිවාර පාලියෙහි දැක් වේ. එයින් "**වත්ථුවිපන්නය**" යනු කඨින වස්ත්‍රය අකප්පිය වස්ත්‍රයක් වීම ය. කඨින වස්ත්‍රය චීවරයකට නුසුදුසු අකප්පිය වස්ත්‍රයක් වී නම්,

Non-commercial distribution

පූර්ව කරණාදිය කොට එයින් කඨිනය අතුළේ ද සිද්ධියට නො පැමිණේ.

"**කාලවිපන්නං නාම අජ්ජ දයකෙහි දින්නං ස්වෙ සඞ්ඝො කඨිනත්ථාරකස්ස දෙති**" යි අටුවාවෙහි දැක්වෙන පරිදි, "අද ලද කඨිනදුස්සය සඞ්ඝයා කඨිනත්ථාරකයාට අදම නො දී සෙට දේ නම්" කඨින චීවරය කාලවිපන්න වේ. **කාලවිපන්න** චීවරයෙන් කරන කඨිනත්ථාරය ද සිද්ධියට නො පැමිණේ.

"**කරණවිපන්නං නාම තදහෙව ඡින්දිත්වා අකතං**" යි අටුවාවෙහි දැක්වෙන පරිදි සඞ්ඝයා විසින් කඨිනත්ථාරකයාට වස්ත්‍රය දුන් ඒ දිනයෙහි ම පූර්වකරණය නො කොට පසු දිනක පූර්වකරණය සම්පූර්ණ කළ චීවරය **කරණ විපන්න** නම් වේ. එයින් කරන කඨිනත්ථාරය ද සිඩියට නො පැමිණේ.

කඨිනය පිළිබඳව ඇත්තාවූ සියළුම නීති-රීති ඇත්තේ සාප්පුවල හෝ දයකයන් ළඟ හෝ තිබෙන වස්ත්‍රය හෝ සිවුරු පිළිබඳව නො ව, සඞ්ඝයා හට පුදන ලද වස්ත්‍ර හෝ සිවුරු පිළිබඳව ය. කඨිනය පිණිස දයකයකු විසින් නිකම්ම වස්ත්‍රයක් මිස, සිවුරක් නො පිදිය යුතුය කියා හෝ සිවුරක් දුන හොත් එය නො පිළිගත යුතුය, එයින් කඨිනය නො අතුළ යුතුය කියා හෝ විනය නීතියක් නැත. ඉදින් දයකයකු විසින් වැඩ නිම කළ සිවුරක් ම කඨිනය පිණිස පූජාකරන ලද්දේ නම්, එය පිළි-ගෙන සඞ්ඝයා විසින් කඨිනත්ථාරක භික්ෂුවට දිය යුතු ය.

කැපීම් මැසීම් ආදී පූර්වකරණය එහි කෙරී තිබෙන බැවින් කඨිනත්ථාරක භික්ෂුව විසින් 'පූර්ව කරණය සම්පූර්ණ කරන්නට ය' කියා, එහි පඩු සෝද හැර නැවත එය කපා මසා පඩුපොවා ගැනීමට වුවමනාවක් නැත. ඒවා ඒ සිවුරෙහි කෙරී ඇති බැවින් නැවත නො කළාට කරණවිපත්තියක් නැත. එය කරණ සම්පත්තියෙන් යුක්ත ය. කපා, මසා පඩුපොවා ඇති සිවුරක්, කරණසම්පත්තිය ඇති කර ගැනීමට ය කියා විනාශ කරනවා නම් එය මහ විහිළුවකි. එබඳු නිෂ්ඵල වැඩ කරන්නට, බුදුන් වහන්සේ නියම නො කරන සේක. එබැවින් කලින් දයකයකු විසින් කරන

Non-commercial distribution

ලද චීවරයෙන් කඨිනය ඇතිරීමෙන්, කරණවිපන්න කඨිනයක් නො වන බවත්, අද ලැබුණු වස්ත්‍රයෙහි පූර්වකරණය පසු දිනක කිරීමෙන් ම චීවරය කරණවිපන්න වන බවත් තේරුම් ගත යුතු ය.

## කඨින විචාරණය.

උපෝසථ, පවාරණ විනය කර්මයන්හි මෙන් ම කඨිනය පැවරීමේදී ද කළ යුතු විනය විචාරණයක් ඇත්තේ ය. එය විනයාලඞ්කාරයෙහි මෙසේ දැක් වේ.

"කඨිනදුස්සං ලභිත්වා සඞ්ඝෙ සීමාය සන්නිපතිතෙ එකෙන භික්ඛුනා භන්තෙ! සඞ්ඝස්ස ඉදං කඨිනදුස්සං උප්පන්නං, සඞ්ඝො ඉදං කඨිනදුස්සං ඉත්ථං නාමස්ස භික්ඛුනො දදෙය්‍ය කඨිනං අත්ථරිතුන්ති වුත්තේ, අඤ්ඤෙන යො ජිණ්ණචීවරෝ තස්සාති වත්තබ්බං. පුන පුරිමෙන බහූ ජිණ්ණචීවරාති වා නත්ථි ඉධ ජිණ්ණචීවරොති වා වුත්තෙ, අපරෙන තෙනහි වුඩ්ඪස්සාති වත්තබ්බං. පුන පුරිමෙන කො එත්ථ වුඩ්ඪොති වුත්තෙ, ඉතරෙන ඉත්ථං නාමො භික්ඛූති වත්තබ්බො. පුන පුරිමෙන සො භික්ඛු තදහෙව චීවරං කත්වා අත්ථරිතුං සක්කොතීති වුත්තෙ, අපරෙන සො සක්කොති වා සඞ්ඝො මහාථෙරස්ස සඞ්ගහං කරිස්සතීතිවා වත්තබ්බො. පුන පුරිමෙන සො මහාථෙරො අට්ඨහි අඞ්ගෙහි සමන්නාගතොති වුත්තෙ ඉතරෙන ආම සමන්නාගතොති වත්තබ්බො. තතො සාධු සුට්ඨු තස්ස දතබ්බන්ති වුත්තෙ බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො."

තේරුම මෙසේ යඃ-

කඨිනදුස්සය ලැබ සඞ්ඝයා සීමාවට රැස්වූ කල්හි එක් භික්ෂුවක් විසින් ස්වාමීනි! සඞ්ඝයාහට මේ කඨින දුස්සය උපන්නේය, සංඝයා මේ කඨිනදුස්සය කඨිනය ඇතිරීම පිණිස මෙනම් භික්ෂුවට දෙන්නේයයි කී කල්හි අනික් භික්ෂුවක් විසින් 'යමෙක් දිරා-ගිය සිවුරක් ඇත්තේ ද ඒ භික්ෂුවටය' යි කිය යුතුය. නැවත පළමු භික්ෂුව විසින් 'දිරූ සිවුරු ඇත්තෝ බොහෝ ය කියා හෝ මෙහි දිරූ සිවුරු ඇති භික්ෂුවක් නැත ය'යි හෝ කී කල්හි,

Non-commercial distribution

අනික් භික්ෂුව විසින් 'එසේ නම් වැඩයාවය'යි කිය යුතුය. පළමු භික්ෂුව විසින් 'මේ පිරිසෙහි වැඩයා කවරේදැ' යි කී කල්හි, අනික් භික්ෂුව විසින් 'මෙනම් ඇති භික්ෂුව ය' යි කිය යුතු ය. නැවත පළමු භික්ෂුව විසින් "ඒ වැඩ භික්ෂුව අද ම සිවුරු කොට කඨිනය අතුරන්නට සමත් වේ දැ'යි කී කල්හි, අනික් භික්ෂුව විසින් 'ඔහුට එසේ කළ හැක්කේය' කියා හෝ 'සංඝයා මහතෙරුන් වහන්සේට සංග්‍රහ කෙරේය' කියා හෝ කිය යුතුය. නැවත පළමු භික්ෂුව විසින් 'ඒ මහාස්ථවිර තෙමේ අෂ්ටාංගයෙන් යුක්තවේදැ' යි කී කල්හි, අනික් භික්ෂුව විසින් 'එසේ ය; අෂ්ටාංගයෙන් යුක්තය' යි කිය යුතු ය. ඉන්පසු, 'යහපති; ඒ භික්ෂුවට දිය යුතුය' යි කී කල්හි, ව්‍යක්ත භික්ෂුවක් විසින් කර්මවාක්‍යය කියා ඒ භික්ෂුවට කඨිනදුස්සය පැවරිය යුතු ය.

**කඨිනදුස්සය පැවරීමට සුදුසු පුද්ගලයා.**

කඨින දුස්සය පැවරීමට සියල්ලෝ ම සුදුසු නො වෙති. **"අට්ඨහංගෙහි සමන්නාගතො පුග්ගලො භබ්බො කඨිනං අත්ථරිතුං. කතමෙහි අට්ඨහංගෙහි? පුබ්බකරණං ජානාති. පච්චුද්ධාරං ජානාති. අධිට්ඨානං ජානාති. අත්ථාරං ජානාති. මාතිකං ජානාති. පළිබොධං ජානාති. උද්ධාරං ජානාති. ආනිසංසං ජානාති. ඉමෙහි අට්ඨහංගෙහි සමන්නාගතො පුග්ගලො භබ්බො කඨිනං අත්ථරිතුං"**

යනුවෙන් **පරිවාරපාළියෙහි** පුබ්බකරණය දැනීමය, පච්චුද්ධාරය දැනීමය, අධිට්ඨානය දැනීමය, අත්ථාරය දැනීමය, මාතිකාව දැනීමය, පළිබෝධය දැනීමය, උද්ධාරය දැනීමය, ආනිසංසය දැනීමය යන අංග අටින් යුක්ත වන භික්ෂුව ම කඨිනත්ථාරයට සුදුසු වන බව වදරා තිබේ. කඨිනයක් ගැනීමට සුදුසු පුද්ගලයකු වනු පිණිස කියන ලද කරුණු අට භික්ෂූන් වහන්සේලා විසින් උගත යුතුය.

**පුබ්බකරණය.**

පුබ්බකරණය දැනීමයයි කියනුයේ පුබ්බකරණය ගැන විනය පොතේ එන වාක්‍ය දැන ගැනීම නො ව, සංඝාටි-උත්තරාසංග-

Non-commercial distribution

අන්තරවාසක යන මේ සිවුරු තුන නූල් ගසා කපා-ගෙන මසා ගැනීමටත් සමත් වීම ය.

**පච්චුද්ධාරය හා අධිට්ඨානය.**

මේ කරුණු දෙක ද කඨිනය අතුරන භික්ෂූන් වහන්සේලා විසින් විශේෂයෙන් දැනගත යුතු ය. මේ කඨින කථාවෙහි අදහස් කරන පච්චුද්ධාරය පරිවාරයෙහි දැක්වෙන්නේ '**පච්චුද්ධාරො තීහි ධම්මෙහි සඞ්ගහිතො, සඞ්ඝාටියා උත්තරාසඞ්ගෙන අන්තරවාසකෙන**' යි සඞ්ඝාටි-උත්තරාසඞ්ග-අන්තරවාසක යන තුන් සිවුර පිළිබඳ වූ පච්චුද්ධාරය ය කියා ය.

මෙකල තිචීවරාධිට්ඨානයෙන් සිවුරු ඉටාගෙන පරිහරණය කරන භික්ෂූහු අල්ප වෙති. බොහෝ භික්ෂූහු පහසුව සඳහා පරික්ඛාරචෝළ වශයෙන් සිවුරු ඉටාගෙන පරිභෝග කෙරෙති. එසේ පරිභෝග කරන භික්ෂුවට කඨින චීවරය ඉටා ගැනීමට පෙර, පච්චුද්ධාරයක් කරන්නට සඞ්ඝාටියක් හෝ උත්තරාසඞ්ගයක් හෝ අන්තරවාසකයක් හෝ නැත. පරික්ඛාරචෝළ වශයෙන් ඉටා ගත් සිවුරු පච්චුද්ධරණය කිරීම මේ කාරණයට ප්‍රමාණ නොවේ. එසේ ඇති කල්හි කඨිනය අතුළ හැකිවීමට භික්ෂුව විසින් කළ යුත්තේ කුමක් ද යන බව **විනයාලංකාර ටීකාවේ** දැක්වෙන්නේ මෙසේ යඃ-

**තිචීවරාධිට්ඨානස්ස දුප්පරිහාරියත්තා සබ්බදා ධාරෙතුං අසක්කොන්තො හුත්වා පරික්ඛාරචොළවසෙන ධාරෙන්තො' පි තං පච්චුද්ධාරිත්වා ආසන්නෙ කාලෙ තිචීවරාධිට්ඨානෙන අධිට්ඨහන්තො' පි කඨිනං අත්ථරිතුං ලභති යෙව.**

'සෑම කල්හි තිචීවරාධිට්ඨානයෙන් ඉටා සිවුරු පරිහරණය අපහසු බැවින් පරික්ඛාරචෝළ වශයෙන් ඉටා සිවුරු පරිභෝග කරන භික්ෂුව ද පරික්ඛාර චෝළ වශයෙන් ඉටාගෙන පරිහරණය කරන සිවුරු පච්චුද්ධරණය කොට, කඨිනය ඇතිරීමට සමීපකාලයේදී තිචීවරාධිට්ඨාන විධියෙන් අධිෂ්ඨාන කරගත් කල්හි කඨිනය ඇතිරීමට සුදුසු වේය.' යනු එහි අදහසයි.

Non-commercial distribution

එබැවින් පරික්ඛාරචෝළ අධිට්ඨානයෙන් සිවුරු, ඉටා පරිභෝග කරන භික්ෂුවකට කඨින චීවරයක් ගන්නට සිදුවුවහොත්, ඒ භික්ෂුව විසින් තමා පරික්ඛාරචෝළ වශයෙන් පරිභෝග කරන සිවුරු වලින්, දෙපොට සිවුරක් හා තනිපොට සිවුරක් ද අඳනයක් ද ගෙන "**ඉමානි චීවරානි පරික්ඛාරචොළානි පච්චුද්ධරාමි**" යි කියා ඒවා පච්චුද්ධරණය කොට, නැවත ඒවා තිචීවරාධිට්ඨාන විධියෙන් එකින් එක ඉටා-ගෙන ඒ තුන් සිවුරෙන් එකක් පච්චුද්ධරණය කොට එය වෙනුවට කඨින චීවරය ඉටා කඨිනය ඇතිරීම කළ යුතුය. පච්චුද්ධාර - අධිෂ්ඨාන කර්ම දෙක සම්පූර්ණ වන්නේ එසේ කළ කල්හිය.

**මාතෘකා අට**

කඨිනය ඇතිරීම එක් භික්ෂුවක් විසින් කරන්නක් වුව ද අනුමෝදන් වන්නාවූ භික්ෂූන්ට ද එය අයත් වේ. එබැවින් පරිවාර පාළියෙහි "**ද්වින්නං පුග්ගලානං අත්ථතං හොති කඨිනං, අත්ථාරකස්ස ච අනුමොදකස්ස ච**" යනුවෙන් 'අස්තාරකයා ය, අනුමෝදකයා ය යන දෙදෙනාට ම කඨිනය අතුරන ලද්දේ වේ' ය යි වදරන ලදී.

අත්ථාරක අනුමෝදක දෙපක්ෂයට ම අයත් වන්නාවූ ඒ කඨිනාස්තරණ කර්මය සන්සිඳී යන, එහි බලය නැති වී යන, කඨිනාස්තරණය අවලංගු වී යන කරුණු අටක් ඇත්තේ ය. කඨිනාස්තරණය අවලංගුවී යාමට 'කඨිනුද්ධාරය' යි ද 'කඨිනුබ්භාරය' යි ද කියනු ලැබේ. කඨිනුද්ධාරය වීමෙන් කඨිනාස්තරණයෙන් ලැබෙන පඤ්චානිසංසය ද නැති වන්නේ ය.

"**අට්ඨිමා භික්ඛවෙ මාතිකා කඨිනස්ස උබ්භාරාය, පක්කමනන්තිකා, නිට්ඨානන්තිකා, සන්නිට්ඨානන්තිකා, නාසනන්තිකා, සවනන්තිකා, ආසාවච්ඡෙදිකා, සීමාතික්කන්තිකා, සහුබ්භාරාති**'

යනුවෙන් මහාවග්ගපාළියෙහි කඨිනක්ඛන්ධකයෙහි කඨිනෝද්ධාරය පිළිබඳවූ මාතෘකා අටක් වදරා තිබේ. කඨිනාස්තරණයට සුදුසු පුද්ගලයාගේ අඞ්ගවල 'මාතිකං ජානාති' යනුවෙන් දැක්වෙන්නේ ඒ මාතෘකා අට දැන ගැනීම ය. මාතෘකා මෙසේ දත යුතු ය.

Non-commercial distribution

### 1. පක්කමනන්තිකා.

යම් භික්ෂුවක් වැඩ නිමවූ තමාගේ සිවුර ගෙන, වස් විසූ ස්ථානයට නැවත නො එන බලාපොරොත්තුවෙන් ඒ ස්ථානයෙන් බැහැර ගියේ නම්, ඒ භික්ෂුවට උපචාර සීමාව ඉක්මවනු සමග ම කඨිනුද්ධාරය වේ. ඉන් පසු ඒ භික්ෂුව කඨිනය ඇතිරීම නිසා ලැබෙන පඤ්චානිසංසයට අහිමි වේ. මේ කඨිනෝද්ධාරය විහාරයෙන් පිටවී යාම අවසන් කොට ඇති බැවින් 'පක්කමනන්තික' නම් වේ.

### 2. නිට්ඨානන්තිකා.

වස්විසූ ස්ථානයේදී තමා ලත් වස්ත්‍ර ගෙන, අන් විහාරයකට ගිය භික්ෂුව වස්සාවාසික සීමාවෙන් බැහැරදී "මම නැවත වස් විසූ විහාරයට නොයමි" යි සිතා ගත හොත්, ඒ භික්ෂුවට කඨිනත්ථාරයේ බලය ඇත්තේ ගෙන ගිය වස්ත්‍රයෙන් සිවුර කොට නිමවන තුරු පමණි. සිවුරේ වැඩ නිමවෙනු සමග ඒ භික්ෂුවට කඨිනෝද්ධාරය වේ. මේ කඨිනෝද්ධාරය සිවුරේ වැඩ නිමවීම කෙළවර කොට ඇති බැවින් 'නිට්ඨානන්තික' නම් වේ.

### 3. සන්නිට්ඨානන්තිකා.

වස් විසූ තැනින් තමා ලත් වස්ත්‍රය ගෙන, විහාරයෙන් බැහැර ගිය පසු භික්ෂුව විසින් "මම වස් විසූ තැනට ද නැවත නොයමි ය. මේ චීවරය ද නොකරමිය" යි සිතා ගත හොත් එයින් ඒ භික්ෂුවට කඨිනෝද්ධාරය වේ. නිශ්චය කර ගැනීම කෙළවර කොට ඇති බැවින් ඒ කඨිනෝද්ධාරය 'සන්නිට්ඨානන්තික' නම් වේ.

### 4. නාසනන්තිකා.

වස් විසූ තැනදී ලත් සිවුරු පිළිගෙන, බැහැර ගිය භික්ෂුව එහි දී "මම මෙහි ම මේ චීවරය කරමිය" නැවත වස්විසූ තැනට නො යමි ය, යි සිතා ගෙන ඒ සිවුර කරන කල්හි චීවරය සොරු ගැනීමෙන් හෝ අන් ආකාරයකින් හෝ නැති වී නම්, එයින් ඒ

Non-commercial distribution

භික්ෂුවට කඨිනෝද්ධාරය වේ. නැතිවීම කෙළවර කොට ඇති බැවින් ඒ කඨිනෝද්ධාරය 'නාසනන්තික' නම් වේ.

**5. සවනන්තිකා.**

අතුරන ලද කඨිනය ඇති භික්ෂුව තමා ලත් වස්ත්‍රය ගෙන, පසුව විහාරයට එන අදහසින් බැහැර යයි. එහිදී ඒ භික්ෂුවට 'මෙහි ම මේ චීවරය කරමි' යි සිතෙයි. භික්ෂුව එහිදීම සිවුර කරයි. සිවුරේ වැඩ අවසන් කර ගෙන ඉන්නාවූ ඒ භික්ෂුවට 'විහාරස්ථ සඞ්ඝයා විසින් කඨිනය උදුරන ලදය' යන ආරංචිය සැලවෙයි. එයින් ඒ භික්ෂුවට ද කඨිනෝද්ධාරය වේ. ඒ කඨිනෝද්ධාරය ආරංචිය ඇසීම කෙළවර කොට ඇති බැවින් 'සවනන්තික'. නම් වේ.

**6. ආසාවච්ඡෙදිකා.**

අතුරන ලද කඨිනය ඇත්තාවූ භික්ෂුව වස් විසූ තැනදී සිවුරු නො ලැබ, සිවුරු ගැන බලාපොරොත්තුවෙන් බැහැර යයි. ඒ භික්ෂුවට වස් විසූ විහාරයෙන් බැහැරදී "මම වස් විසූ තැනට නැවත නොයමිය, මෙහිම හිඳ සිවුරු බලාපොරොත්තු වෙමිය' යි සිතෙයි. ඒ භික්ෂුව එහි වෙසෙමින් සිවුරු බලාපොරොත්තු වන තැනට එළඹෙයි. ඉදින් බලපොරොත්තු තැනින් සිවුරු නො ලැබී ඒ භික්ෂුවගේ බලාපොරොත්තුව සුන්වී නම්, එයින් ඒ භික්ෂුවට කඨිනෝද්ධාරය වේ. ඒ කඨිනෝද්ධාරය ආශාව සිඳීමෙන් වන නිසා 'ආසාවච්ඡෙදික' නම්.

**7. සීමාතික්කන්තිකා**

අතුරන ලද කඨිනය ඇති භික්ෂු තෙමේ චීවර වස්ත්‍රය ගෙන, විහාරයට ආපසු එන බලාපොරොත්තුවෙන් බැහැර යයි. හේ එහිදී සිවුර කරයි. 'සිවුරේ වැඩ ඉවරවූ පසු ඒ භික්ෂුව විහාරයට එමිය' යන අදහස ඇතුව එහිම කඨිනෝද්ධාර කාලය අවසන්වන තෙක් වෙසෙයි. ඒ භික්ෂුවට කාලය ඉක්මීමෙන් කඨිනෝද්ධාරය වේ. ඒ කඨිනෝද්ධාරය චීවර කාලයාගේ අන්තිම දිනයවූ සීමාව ඉක්මීමෙන් වන නිසා 'සීමාතික්කන්තික' නම් වේ.

Non-commercial distribution

## 8. සඟුබ්භාරා.

අතුරන ලද කඨිනය ඇත්තාවූ භික්ෂුව නැවත ඒ විහාරයට එන බලාපොරොත්තුවෙන් සිවුර ගෙන බැහැර යයි. හේ චීවරය කොට නිමවා නැවත එන බලාපොරොත්තුවෙන් එහිම කල් යවා, විහාරයේ භික්ෂූන් කඨිනය උදුරන අවස්ථාවෙහි නැවත විහාරයට පැමිණේ. ඒ භික්ෂුවට විහාරයේ භික්ෂූන්ට කඨිනෝද්ධාරය වනු සමගම කඨිනෝද්ධාරය වේ. ඒ කඨිනෝද්ධාරය විහාරයෙහි භික්ෂූන්ට වනු සමග ම වන බැවින් 'සඟුබ්භාර' නම් වේ. කඨිනෝද්ධාරයන් පිළිබඳ විස්තරය **කඨිනක්ඛන්ධයෙන්** දත යුතුය.

### පළිබෝධ දෙක.

"ආවාසපළිබෝධය, චීවරපළිබෝධය" යි කඨිනය සම්බන්ධයෙන් දතයුතු පළිබෝධ දෙකකි. කඨිනාස්තරණය කළ විහාරයෙහි ම වාසය කළ යුතු බව හා එයින් බැහැර ගියේ ද නැවත ඒමේ බලාපොරොත්තුව තබා ගත යුතු බව ආවාස පළිබෝධය ය. භික්ෂුවගේ චීවරය නොකළ බව හෝ නො නිම කරන ලද බව හෝ සිවුරක් ලබාගැනීමේ බලාපොරොත්තුව ඇති බව හෝ චීවර පළිබෝධය ය.

**"කතමෙ ච භික්ඛවෙ! ද්වෙ කඨිනස්ස පළිබොධා? ආවාසපළිබොධො ච, චීවරපළිබොධො ච. කථඤ්ච භික්ඛවෙ! ආවාසපළිබෝධො හොති? ඉධ භික්ඛවෙ! භික්ඛු වසති වා යස්මිං ආවාසෙ සාපෙක්ඛා වා පක්කමති පච්චෙස්සති එවං ඛො භික්ඛවෙ! ආවාසපළිබොධො හොති. කථං ච භික්ඛවෙ! චීවරපළිබොධො හොති? ඉධ භික්ඛවෙ! භික්ඛුනො චීවරං අකතං වා හොති විප්පකතං වා චීවරාසා වා අනුපච්ඡින්නා එවං ඛො භික්ඛවෙ! චීවරපළිබොධො හොති. ඉමෙ ඛො භික්ඛවෙ! කඨිනස්ස ද්වෙ පළිබෝධා."**

යනුවෙන් කඨිනක්ඛන්ධකයෙහි පළිබෝධ දෙක වදරා ඇත්තේ ය. කඨිනාස්තරණය කළ විහාරයේ විසීම ගැන බලාපොරොත්තුව ඇති තාක් ආවාස පළිබෝධය පවතී. විහාරය ගැන අපේක්ෂාව හැර දැමීමෙන් ආවාස පළිබෝධය නැති වේ. සිවුරක් කර ගැනීමේ

Non-commercial distribution

හෝ ලබා ගැනීමේ ආශාව පවත්නා තුරු චීවරපළිබෝධය පවතී. සිවුර කර ගැනීමෙන් හෝ වස්ත්‍රය විනාශ වීමෙන් ද බලාපොරොත්තු වන සිවුර නො ලැබී බලාපොරොත්තු කඩවීමෙන් ද චීවර පළිබෝධය නැති වේ. අට වැදෑරුම් මාතෘකාවන්ගේ වශයෙන් ඉහත කී කඨිනෝද්ධාරයන් වන්නේ මේ පළිබෝධ දෙක සිඳී යාමෙනි. ආවාස පළිබෝධය සිඳ, විහාරයෙන් බැහැරවූ භික්ෂුවට චීවර පළිබෝධය සිඳෙන තුරු කඨිනාස්තරණයේ බලය පවතී. චීවර පළිබෝධය සිඳුණු පසු ඒ බලය කෙළවර වේ. ඉන්පසු ඒ භික්ෂුවට පඤ්චානිසංසය නැත. චීවර පළිබෝධය සිඳී ඇති භික්ෂුවට විහාරය ගැන අපේක්ෂාව හැර දැමීම සමගම කඨිනෝද්ධාරය වේ.

## කඨිනෝද්ධාර විනය කර්මය.

යම්කිසි විහාරයක කඨිනය අතුළ හොත් හේමන්ත ඍතුවේ අවසානය තෙක් ඒ විහාරයෙහි උපදනා සිවුරු සියල්ල කඨිනය අතුළ භික්ෂූන්ටම හිමි වේ. සෙස්සන්ට හිමි නොවේ. එබැවින් යම් කිසි සැදැහැවතකුට අන්‍ය භික්ෂූන්ට ද හිමිවන ලෙස බොහෝ සිවුරු සඞ්ඝයාහට පුදන්නට වුවමනා වී කඨිනෝද්ධාරය කරන ලෙස සඞ්ඝයාගෙන් ඉල්ලා සිටියහොත් සඞ්ඝයා විසින් කඨිනෝද්ධාරය කළ යුතු ය. ඉන් පසු ඒ විහාරයට ලැබෙන සිවුරු සියලු ම භික්ෂූන්ට සමසේ බෙද දිය යුතු ය.

**කඨිනෝද්ධාර කර්මවාක්‍යය මෙසේ ය.'**

**"සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො කඨිනං උද්ධරෙය්‍ය. එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. සඞ්ඝො කඨිනං උද්ධරති. යස්සායස්මතො ඛමති කඨිනස්ස උබ්භාරො. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය. උබ්භතං සඞ්ඝෙන කඨිනං. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි."**

Non-commercial distribution

කඨිනත්ථාරමූලක ආනිසංසයට වඩා උද්ධාරමූලක ආනිසංසය මහත් වේ නම් කඨිනෝද්ධාරය කළ යුතු ය. උද්ධාරමූලක ආනිසංසය අල්ප වේ නම් නො කළ යුතුය. දයකයාගේ ශ්‍රද්ධාව රකිනු පිණිස ආනිසංසය සමවන කල්හි ද කඨිනය උදුළ යුතුය. ධාර්මික කඨිනෝද්ධාරයට විරුද්ධ වීමෙන් ඇවැත් වේ.

## කඨිනානිසංසය.

කඨිනය අතුළ භික්ෂූන්ට ඒ විනයකර්මය නිසා බුද්ධාඥාව පරිදි ලැබෙන අනුසස් පසක් ඇත්තේ ය. එයට 'කඨිනානිසංසය' යි කියනු ලැබේ. තවද කඨින චීවරය නිසා ලැබෙන චීවරාදි පරිෂ්කාරයන්ට ද කඨිනානිසංසය ය යි කියනු ලැබේ. කඨිනදයකයාට ඒ පිනෙන් ලැබෙන විපාකයට ද ඒ නම කියනු ලැබේ. කඨිනත්ථාරය කළ භික්ෂූන්ට බුද්ධාඥාව පරිදි ලැබෙන ආනිසංස පස, ඒ පිනෙන් ලැබෙන ඵලයක් නො වන බව දත යුතු ය. භික්ෂුවට ලැබෙන ආනිසංස පඤ්චකය **කඨිනක්ඛන්ධකයෙහි** මෙසේ වදරා තිබේ,

**අත්ථතකඨිනානං වො භික්ඛවෙ! පඤ්චකප්පිස්සන්ති අනාමන්තචාරො, අසමාදනචාරො, ගණභෝජනං, යාවදත්ථචීවරං, යො ච තත්ථ චීවරුප්පාදෙ සො නෙසං භවිස්සති.**

මෙයින් කඨිනය අතුළ භික්ෂූන්ට ඒ හේතුවෙන් කරුණු පසක් කැප වන බව ප්‍රකාශිතය, ඒවා මෙසේ යඃ-

1. **අනාමන්තචාරො.**

**"යො පන භික්ඛු නිමන්තිතො ස භත්තො සමානො සන්තං භික්ඛුං අනාපුච්ඡා පුරෙභත්තං වා පච්ඡාභත්තං වා කුලෙසු චාරිත්තං ආපජ්ජෙය්‍ය අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං. තත්‍රායං සමයො චීවරදන සමයො, චීවරකාරසමයො, අයං තත්ථ සමයො."**

මෙය ප්‍රාතිමෝක්ෂයේ අචේලක වග්ගයේ සවන ශික්ෂාපදය ය. මේ සිකපදයේ සැටියට විහාරයෙහි වෙසෙන භික්ෂුවකගෙන් නො විචාරා ගෙවල්වලට යාමෙන් වන ඇවත කඨිනය ඇතුළ

Non-commercial distribution

භික්ෂූන්ට නොවේ. කඨිනය ඇතිරීමෙන් පසු නො විචාරා කුලවල හැසිරීමට නිදහස ලැබේ.

2. අසමාදනචාරො.

**"නිට්ඨිතචීවරස්මිං. පන භික්ඛුනා උබ්භතස්මිං කඨිනෙ. එකරත්තං'පි චෙ භික්ඛු තිචීවරෙන විප්පවසෙය්‍ය අඤ්ඤත්‍ර භික්ඛු සම්මුතියා. නිස්සග්ගියං පාචිත්තියං."**

මෙය ප්‍රාතිමෝක්ෂයේ නිසගි-පචිතිවල දෙවන සිකපදය ය. මේ සිකපදයේ සැටියට අධිෂ්ඨාන කරගෙන සිටින තුන් සිවුරෙන් වෙන්ව, රාත්‍රිය ඉක්මවීමෙන් වන ඇවත කඨිනය අතුළ භික්ෂූන්ට නො වේ.

3. ගණභොජනං.

**"ගණභොජනෙ අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං. තත්ථායං සමයො. ගිලානසමයො චීවරදනසමයො චීවරකාරසමයො අද්ධානගමනසමයො නාවාභිරූහනසමයො මහාසමයො සමණ-භත්තසමයො අයං තත්ථ සමයො."**

මේ ප්‍රාතිමෝක්ෂයේ භෝජන වග්ගයේ දෙවන සික-පදය ය. මේ සිකපදයේ සැටියට ගණභෝජනය වැළඳීමෙන් වන ඇවත කඨිනය අතුළ භික්ෂූන්ට නො වේ.

4. යාවදත්ත චීවරං.

**"නිට්ඨිතචීවරස්මිං පන භික්ඛුනා උබ්භතස්මිං කඨිනෙ දසාහපරමං අතිරෙකචීවරං ධාරෙතබ්බං: තං අතික්කාමයතො නිස්සග්ගියං පාචිත්තියං."**

මේ නිසගි-පචිතිවල පළමුවන සික පදය ය. මේ සිකපදයේ සැටියට දසදිනකට වඩා කල් අතිරේක චීවර තබාගැනීමෙන් වන ඇවත කඨිනය අතුළ භික්ෂූන්ට නොවේ.

5. යො ච තත්ථ චීවරුප්පාදෙ
සො නෙසං භවිස්සති.

කඨිනය අතුළ සීමාව තුළ මතකවස්ත්‍ර වශයෙන් හෝ සැදැහැවතුන් විසින් සඟ සතු කොට පිදීමෙන් හෝ ඒ ඉඩමේ

Non-commercial distribution

උපදනා දෙයින් හෝ අන් ආකාරයකින් හෝ සඟ සතු සිවුරු උපනහොත් කඨිනානිසංස කාලය තුලදී, ඒ සියල්ල කඨිනය අතුළ භික්ෂූන්ට හිමි වේ. සාංඝික වශයෙන් ලැබෙන සිවුරු හැර, අන් වස්තු කඨිනත්ථාරයේ බලයෙන් හිමි නොවේ. ඒවා සැමට ම හිමි ය. මේ ආනිසංස පස ලැබීම කඨිනත්ථාරයෙන් භික්ෂූන්ට වන විශේෂ ප්‍රයෝජනය ය.

**කඨිනත්ථාර කාලය හා ආනිසංස කාලය**

"**කඨිනස්ස අත්ථාරමාසො ජානිතබ්බොති. වස්සානස්ස පච්ඡිමො මාසො ජානිතබ්බො.**" යනු පරිවාර පාළි හෙයින් වස්සාන සෘතුවේ අවසාන මාසය කඨිනත්ථාර කාලය සැටියට දත යුතුය. එනම්:- වප් මස අව-පෑළවියෙහි පටන් ඉල්මස පුර-පසළොස්වක දක්වා ඇති එකුන්තිස් දිනය යි. කඨිනාස්තරණ විනය කර්මයේ බලය කඨිනය අතුළ දිනයේ පටන් හේමන්ත සෘතුවේ අවසාන දිනය වූ, මැදින් මස පුර පසළොස්වක් පොහෝ දිනය දක්වා පවත්නේ ය. එතෙක් කඨිනය අතුළ භික්ෂූන්ට කියන ලද පඤ්චානිසංසය ඇත්තේ ය.

අධිෂ්ඨානය හෝ විකප්පනය නො කළ අතිරේක සිවුරු ඇත්තේ නම්, ඒ දිනයෙහි ඒවායේ අධිෂ්ඨානාදිය කරගත යුතු ය. කඨිනය අතුළ නො අතුළ සියලු භික්ෂූන්ට වස්සාන සෘතුවේ අවසාන මාසය වූ එකුන් තිස් දිනය චීවර කාලය ය. කඨිනය අතුළ භික්ෂූන්ට වප්මස අව-පෑළවියෙහි පටන් මැදින් මස පුර-පසළොස්වක දිනය දක්වා ඇති පස් මස ම චීවර කාලය වන්නේ ය. චීවර කාලයේ අතිරේක චීවරයන් තබා ගැනීමෙන් ඇවැත් නො වේ.

**කඨිනත්ථාරය ලබන නො ලබන භික්ෂූහු.**

"**කඨිනත්ථාරං කෙ ලභන්ති? කෙ න ලභන්ති? ගණනවසෙන තාව පච්ඡිමකොටියා පඤ්චජනා ලභන්ති. උද්ධං සතසහස්සම්පි. පඤ්චන්නං හෙට්ඨා න ලභන්ති. වුත්ථවස්සවසෙන පුරිමිකාය වස්සං උපගන්ත්වා පඨමපවාරණාය පවාරිතා ලභන්ති. ඡින්නවස්සා වා පච්ඡිමිකාය උපගතා වා න ලභන්ති.**"

Non-commercial distribution

යනුවෙන් විනය අටුවාවෙහි දැක්වෙන පරිදි කඨිනාස්තරණ විනය කර්මය සිදු කිරීමට යටත් පිරිසෙයින් භික්ෂූන් වහන්සේලා පස් නමක් සිටිය යුතු ය. කඨිනය අතුරන්නේ එක් භික්ෂුවක් විසිනි. එය කළ හැක්කේ සඞ්ඝයා විසින් භික්ෂුවකට දෙන ලද සිවුරකිනි. ඒ නිසා සිවුරු දීමට එය පිළිගන්නා භික්ෂුව හැර තවත් සතර නමක් සිටිය යුතු ය. කඨිනයක් ඇතිරිය හැකි වීමට යටත් පිරිසෙයින් භික්ෂූන් පස්නමක් සිටිය යුත්තේ එහෙයිනි. කඨිනය අතුළ හැක්කේ පෙර වස් වැස ප්‍රථම පවාරණයෙන් පවාරණය කළ භික්ෂුවට පමණෙකි. කඨින වස්ත්‍රය පැවරීමට කවර භික්ෂුවකට වුවද සභාය විය හැකි ය. කඨිනානිසංසය ලබන්නේ ද පෙරවස් වැස පවාරණය කළ භික්ෂූහුම ය. සෙස්සෝ නො ලබති. එක් විහාරයක අතුළ කඨිනයේ අනුසස් අන්‍ය විහාරයක වස් වැස පවාරණය කළ භික්ෂූහු ද නො ලබති. යම් කිසි තැනක පෙරවස් වැස පවාරණය කළ එක් භික්ෂුවකුදු වේ නම්, අන්‍ය භිකෂූන්ගේ සභාය ලබා ඒ භික්ෂුවට එතැන කඨිනය අතුළ හැකි ය.

Non-commercial distribution

# අපටිච්ඡන්න මානත.

ගරුකාපත්තියකට පැමිණි භික්ෂුව විසින් එදින ම අන්‍ය භික්ෂුවකට ඒ බව ආරෝචනය කළ යුතු ය. රාත්‍රිකාලයේදී ඇවතට පැමිණියේ ද පසුදින අරුණු නැගීමට පෙර ඒ රාත්‍රියේදී ම අන්‍ය භික්ෂුවකට ආරෝචනය කළ යුතු ය. ආරෝචනය කිරීමට අන්තරායාදියක් නැතිව, එදින ම ආරෝචනය නො කෙළේ නම්, අතිරේක වශයෙන් දුකුළා ඇවතක් ද වේ. ආරෝචනය කරන භික්ෂුව විසින් එක් භික්ෂුවක් වෙත ගොස්, සිවුර ඒකාංස කොට පෙරවා, උක්කුටිකයෙන් හිඳ, ඇදිලි බැඳ, "තුය්හං සන්තිකෙ එකං ආපත්තිං ආවිකරොමි" කියා හෝ "ආචික්ඛාමි" කියා හෝ "ආරොචෙමි" කියා හෝ "මම එකං ආපත්තිං ආපන්නභාවං ජානාහි" කියා හෝ ආරෝචනය කළ යුතුය. දැනට ඇවැත් දෙසීමේදී භාවිත කරන පරිදි "අහං භන්තෙ සබ්බාපත්තියො ආවිකරොමි" කියා හෝ ආරෝචනය කළ යුතු ය.

අරුණට පළමුව නැගිට තුනුරුවන් වැඳ දිනපතා ඇවැත් දෙසා ගන්නා භික්ෂූන්ට ආපත්ති පටිච්ඡන්නයක් නො වේ. අපටිච්ඡන්න ගරුකාපත්තිවලින් නැගී සිටීමට සදිනක් මානත් පුරා, අබ්භාන කර්මය කර ගත යුතු ය. ඇවැත් කොතෙක් ඇතත් සියල්ලේම ශුද්ධිය පිණිස එකවර ම මානත පිරිය හැකි ය. එය කරන කල්හි සීමාවකට සඞ්ඝයා රැස්කරවා මානත ලබා-ගෙන පිරිය යුතු ය. එය කළ යුත්තේ මෙසේ ය.

Non-commercial distribution

**අප්පටිච්ඡන්න මානත**
**ඉල්ලීමේ වාක්‍යය**

**අහං භන්තෙ! සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජිං. අප්පටිච්ඡන්නායො. සො'හං භන්තෙ සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං අප්පටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං යාචාමි.**

සීමාවේදී සඞ්ඝයා ඉදිරියේ ඒකාංස කොට පෙරවා උක්කුටිකයෙන් හිඳ අඳිලි-බැඳ ඉහත කී වාක්‍යය තුන්වරක් කියා මානත ඉල්ලිය යුතු ය.

මානත දෙන කර්මවාක්‍යය.

**"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො, අයං (තිස්සො) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජි, අප්පටිච්ඡන්නායො. සො සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං අප්පටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං යාචති. සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො තාසං සම්බහුලානං ආපත්තීනං අප්පටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං දදෙය්‍ය. එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (තිස්සො) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජි, අප්පටිච්ඡන්නායො. සො සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං අප්පටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං යාචති. සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො තාසං සම්බහුලානං ආප්පත්තීනං අප්පටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං දෙති. යස්සායස්මතො ඛමති, (තිස්සස්ස) භික්ඛුනො තාසං සම්බහුලානං ආපත්තීනං අප්පටිච්ඡ-න්නානං ඡාරත්තං මානත්තස්ස දානං, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.**

**දුතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ භන්තෙ! -පෙ- සො භාසෙය්‍ය**

**තතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ භන්තෙ! -පෙ- සො භාසෙය්‍ය.**

**දින්නං සඞ්ඝෙන (තිස්සස්ස) භික්ඛුනො තාසං සම්බහුලානං ආපත්තීනං අප්පටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි."**

නම යොදා කර්මවාක්‍යය කිය යුතු.

සඞ්ඝයාගෙන් මානත ලබා ගත් භික්ෂුව විසින් එතැනදී ම සඞ්ඝයා ඉදිරියේ දී මානත සමාදන් විය යුතු ය. මානත් සමාදන් වීමේ වාක්‍යය මෙසේ යः-

**"මානත්තං සමාදියාමි. වත්තං සමාදියාමි."**

සිවුර ඒකාංස කොට පෙරවා උක්කුටිකයෙන් හිඳ, සඞ්ඝයාට වැඳ-ගෙන ඉහත කී වාක්‍යය තුන් වරක් කීමෙන් මානත්තසමාදනය සිදු වේ.

සමාදනයෙන් පසු සඞ්ඝයා හට මානත ආරෝචනය කළ යුතු ය. ආරෝචනය කිරීමේ වාක්‍යය මෙසේ යः-

**අහං භන්තෙ! සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජිං. අප්පටිච්ඡන්නායො. සො'හං භන්තේ සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං අප්පටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං යාචිං. තස්ස මෙ සඞ්ඝො තාසං සම්බහුලානං ආපත්තීනං අප්පටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං අදාසි. සො'හං මානත්තං චරාමි. වෙදයාමහං භන්තෙ! වෙදයතීති මං සඞ්ඝො ධාරෙතු.**

මෙසේ තෙවරක් මානත සඞ්ඝයා හට ආරෝචනය කළ යුතු. එසේ එක්වරක් සඞ්ඝයාගෙන් සීමාවකදී මානත ලබාගත් භික්ෂුවට කැමති විටෙක එය නික්ෂේප කළ හැකිය. නැවත සඞ්ඝයාගෙන්

Non-commercial distribution

නො ගෙන සමාදන් විය හැකිය. මානත හෝ පිරිවෙස හෝ සමාදන් වී පුරන කාලයේදී හමුවන සියලු ම භික්ෂූන්ට එය ආරෝචනය කළ යුතු ය. නො කළ හොත් රත්තිච්ඡේදය හා වත්තභේදයෙන් දුකුළා ඇවතක් ද වේ. රත්තිච්ඡේදය යනු ඒ දවස නැතිවීම ය. මානත පුරන අතර දුර යන භික්ෂුවක් වුව ද දැක, ඒ භික්ෂුවට ආරෝචනය කර ගත හො හැකි වී නම්, ඒ දිනය අහෝසි වේ. ඒ දිනය වෙනුවට තවත් දිනයක් මානත පිරිය යුතු වේ. සැම තැනම සිට ගෙන වත්-මානත් පිරිම පහසු නො වන බැවින් සුදුසු තැනකට වී එය පුරන්නට පටන් ගන්නා තුරු මානත නික්ෂේප කළ යුතුය. මානතගත් සීමාවේදී ම සමාදන් වී සඞ්ඝයාට ආරෝචනය කොට-

**"මානත්තං නික්ඛිපාමි. වත්තං නික්ඛිපාමි."**

යි තුන්වරක් කියා නික්ෂේප කරනු. ඉන්පසු නැවත සමාදන් වන තුරු ඒ භික්ෂුව ප්‍රකෘති භික්ෂුවකි. මානත පුරන භික්ෂුවක් විසින් පිරිය යුතු ප්‍රතිපත්ති පිරිය යුතු වන්නේ මානත සමාදන් වී ඉන්නා කාලයේදී ය.

මානත පිරූ පමණින් ශුද්ධිය නො ලැබේ. ශුද්ධිය ලැබීමට සදිනක් මානත පුරා නැවත අබ්භාන කර්මය කළ යුතු ය. අබ්භාන කර්මයක් කිරීමට විසි නමකට නො අඩු භික්ෂූන් පිරිසක් සීමාවකට රැස් කර ගත යුතු ය. එය වහා කර ගත හැකි කාර්‍ය්‍යයක් නො වන බැවින් දින සම්පූර්ණවූ පසු මානත නික්ෂේප කොට වාසය කළ යුතුය. අබ්භාන කර්මයට සුදුසු වන්නේ මානත සමාදන් වී සිටින භික්ෂුව ය. එබැවින් සඞ්ඝයා රැස් කර-ගෙන අබ්භාන කර්මයට සැරසෙන කල්හි, ඒ සීමා මාලකයේදී නැවතත් මානත සමාදන් වී සඞ්ඝයාට ආරෝචනය කොට, ඊට පසු මතු දැක්වෙන වාක්‍යයෙන් අබ්භාන කර්මය කරන ලෙස සඞ්ඝයාගෙන් ඉල්ලිය යුතු ය.

**අබ්භාන යාචන වාක්‍යය.**

**අහං භන්තෙ! සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජිං. අප්පටිච්ඡන්නායො. සො'හං භන්තෙ සඞ්ඝං තාසං සම්බහුලානං**

Non-commercial distribution

ආපත්තිතං අප්පටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං යාචිං. තස්ස මෙ සඞ්ඝො තාසං සම්බහුලානං ආපත්තීනං අප්පටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං අදාසි. සො'හං භන්තෙ චිණ්ණමානත්තො සඞ්ඝං අබ්භානං යාචාමි.

මෙසේ තුන්වරක් කියනු.

අබ්භාන කර්ම වාක්‍යය.

"සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (තිස්සො) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජි, අප්පටිච්ඡන්නායො. සො සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං අප්පටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං යාචි. සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො තාසං සම්බහුලානං ආපත්තීනං අප්පටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං අදාසි. සො චිණ්ණමානත්තො සඞ්ඝං අබ්භානං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො (තිස්සං) භික්ඛුං අබ්භෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (තිස්සො) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජි අප්පටිච්ඡන්නායො. සො සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං අප්පටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං යාචි. සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො තාසං සම්බහුලානං ආපත්තීනං අප්පටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං අදාසි. සො චිණ්ණමානත්තො සඞ්ඝං අබ්භානං යාචති. සඞ්ඝො තිස්සං භික්ඛුං අබ්භෙති.

Non-commercial distribution

**යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො අබ්භානං, සො තුණ්හස්ස, යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.**

**දුතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ -පෙ- භාසෙය්‍ය.**

**තතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ -පෙ- භාසෙය්‍ය.**

**අබ්භිතො සඞ්ඝෙන (තිස්සො) භික්ඛු. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි"**

**ආපත්ති පටිච්ඡාදනය**

ගරුකාපත්තියට පැමිණි තැනැත්තා එදින ම ඒ බව අන්‍ය භික්ෂුවකට ආරෝචනය කළ යුතුය. එසේ ආරෝචනය නො කොට යම් පමණ දින ගණනක් ඇවත සඟවා ගෙන විසුවේ වේ නම්, භික්ෂුව විසින් මානත් පිරීමට පෙරාතුව ඒ දින ගණනට පිරිවෙස් පිරිය යුතු ය. පිරිවෙස් නුපුරා මානත පමණක් පුරා අබ්භානය කෙළේ ද පටිච්ඡන්නාපත්තීන් පිළිබඳ ශුද්ධිය නො වේ.

**"ආපත්ති ච හොති ආපත්තිසඤ්ඤී ච, පකතත්තො ච හොති පකතත්තසඤ්ඤී ච, අන්තරායිකො ච හොති අන්තරායිකසඤ්ඤී ච, පහු ච හොති පහුසඤ්ඤී ච, ඡාදෙතුකාමො ච හොති ඡාදෙති ච"**

යනුවෙන් දශාකාරයකින් ආපත්ති පටිච්ඡාදනය දක්වා තිබේ. ගරුකාපත්තියක් වී ගරුකාපත්තියක් වීය යන හැඟීම ඇතුව එදින ම භික්ෂුව ආරෝචනය නො කිරීමෙන් ආපත්තිය පටිච්ඡාදනය කෙළේ වේ. ආපත්තියට පැමිණියේ ද ඒ බව නො දැන ආරෝචනය නො කිරීමෙන් පටිච්ඡාදනය කෙළේ නො වේ. ගරුකාපත්තිය ලහුකාපත්තියකැයි සිතා ආරෝචනය නො කළේ ද පටිච්ඡන්න නො වේ. ගරුකාපත්තියකට පැමිණ තමා පැමිණි ඇවත ගරුකාපත්තියක් ද ලහුකාපත්තියක් දැයි නො දැන

Non-commercial distribution

ඇවත සැඟවීමේ අදහසින් ආරෝචනය නො කෙළේ ද පටිච්ඡන්න වේ.

සඞ්ඝයා විසින් උක්ෂේපනීය කර්මය කොට බැහැර නො කරන ලද ප්‍රකෘති භික්ෂුවක්ව, තමා ප්‍රකෘති භික්ෂුවක යන හැඟීම ඇතිව ඇවත ආරෝචනය නො කෙළේ නම් පටිච්ඡන්න වේ. 'මා හට සඞ්ඝයා විසින් උක්ෂේපනීය කර්මය කර ඇත. මම ප්‍රකෘති භික්ෂුවක් නො වෙමි ය'යි සිතා ආරෝචනය නො කිරීමෙන් ඇවත පටිච්ඡන්න නො වේ. ප්‍රකෘති භික්ෂුවක් නො වී ප්‍රකෘති භික්ෂුවක් වෙමිය යන හැඟීම ඇතිව ආරෝචනය නො කෙළේ ද ඇවත පටිච්ඡන්න නො වේ.

භික්ෂුවක් වෙත ගොස් ආපත්තිය ආරෝචනයට බාධා වන දශවැදෑරුම් අන්තරායන් අතුරෙන් එකකුදු නැතිව අන්තරායක් නැතය යන හැඟීම ද ඇතිව ආරෝචනය නො කිරීමෙන් ඇවත පටිච්ඡන්න වේ. අන්තරාය දශයය යනු රාජාන්තරායය, චෝරා-න්තරායය, අග්‍න්‍යන්තරායය, උදකාන්තරායය, මනුස්සාන්තරායය, අමනුස්සාන්තරාය ය, වාළාන්තරායය, සිරිංසපාන්තරායය, ජීවිතාන්තරාය ය, බ්‍රහ්මචරියාන්තරායය යන මොහු ය. තමා වෙසෙන තැන සිට ආරෝචනය කළ යුතු භික්ෂුව වෙසෙන තැනට යන අතරමග අන්තරායයන් ඇති කල්හි, ගොස් ආරෝචනය නො කළේ ද ආපත්තිය පටිච්ඡන්න නො වේ.

ඇවත ආරෝචනය කරනු සඳහා භික්ෂුවක් කරා යා හැකි ශක්තිය තිබියදී, ඒ බව දැන, ගොස් ආරෝචනය නො කිරීමෙන් ආපත්තිය සඟවන ලද්දේ වේ. යා හැකි ශක්තිය නැති කමින් ආරෝචනය නො කිරීමෙන් ඇවත පටිච්ඡන්න නො වේ. යා හැකි ශක්තිය ඇත ද අල්පාබාධයක් නිසා යා නො හැකිය යන හැඟීමෙන් ආරෝචනය නො කෙළේ ද පටිච්ඡන්න නො වේ.

ආපත්තිය සඟවන අදහස ඇතිව ආරෝචනය නො කෙළේ නම්, ආපත්තිය පටිච්ඡාදනය කෙළේ වේ. සඟවන අදහස කලින් ඇති වී පසුව එය වෙනස් වී ඇරුණෙට පළමු ආරෝචනය කරන ලදුයේ නම්, පටිච්ඡාදනය කෙළේ නො වේ. භික්ෂූන් නැති තැනකදී ඇවැතට පැමිණ ආරෝචනය කිරීමට භික්ෂුවකගේ පැමිණීම

Non-commercial distribution

බලාපොරොත්තුවෙන් ඉන්නා තැනැත්තාට දින ගත වූයේ ද ඇවත පටිච්ඡන්න නො වේ. ආරෝචනය කිරීම සඳහා සභාග භික්ෂුවක් වෙත යන්නහුට දින බොහෝ ගත වූයේ ද ඇවත පටිච්ඡන්න නොවේ. ඇවත ආරෝචනය කිරීමට භික්ෂුවක් බලාපොරොත්තු වන තැනැත්තාට, පළමු හමුවන භික්ෂුව තමාගේ ආචාර්‍ය්‍යවරයාය-උපාධ්‍යායාචාර්‍ය්‍යවරයාය යි ලජ්ජාවෙන් ආරෝචනය නො කළේ ද ආපත්ති පටිච්ඡාදනය කෙළේ වේ. ආරෝචනය කළ කල්හි තැන තැන කියා අවමන් කරන සතුරු පුද්ගලයන්ට ආරෝචනය නො කෙළේ ද, ආපත්ති පටිච්ඡාදනය කෙළේ නො වේ.

**"ආපත්තිනුක්ඛිත්තමනන්තරාය**
**පහුත්තතායො තථා සඤ්ඤිතා ච.**
**ඡාදෙතුකාමො අථ ඡාදනාති**
**ඡන්නා දසඞ්ගෙහරුණුග්ගමම්හි."**

ගරුකාපත්තියක් වීමය, උක්ෂේපනීය කර්‍මය නො කරන ලද භික්ෂුවක් වීමය, අන්තරායක් නැති බවය, භික්ෂුවක් කරා යා හැකි ශක්තිය ඇති බවය, ඒ හැඟීම් සතර ඇති බවය, ඇවත සඟවනු කැමති බවය, සැඟවීමය යන අඞ්ග දශයෙන් පසුදින අරුණු නැගීමේදී ඇවත සඟවන ලද්දේ වේය. යනු එහි තේරුම යි.

## අග්ඝසමෝධාන පරිවාසය.

තෙළෙස් සඟවෙසෙස් ඇවැත් අතුරෙන් පළමුවන දෙවන ඇවැත් දෙක ලෙහෙසියෙන් පැමිණිය හැකි ඇවැත් දෙකකි. සමහර විට ඒ ඇවැත් වලට පැමිණත් ඒ බව නො දැන තිබිය හැකිය. ඒ නිසා පැරණි තෙරුන් වහන්සේලා වර්ෂයකට වරක් හෝ වර්ෂ දෙකතුනකට වරක් හෝ තමන්ගේ ශුද්ධිය පිණිස වත්-මානත් පුරා අබ්භාන කර ගත්හ. පෘථග්ජන භික්ෂුවකට ඇවතකට නො පැමිණ සැම කල්හිම විසීම පහසු කාර්‍ය්‍යයක් නො වේ. එබැවින් එක් එක් භික්ෂුවකට බොහෝ සඟවෙසෙස් ඇවැත් විය හැකි ය. විනය හොඳින් නො දන්නා භික්ෂූන්ට වඩාත් ඒ ඇවැත් සිදුවිය හැකිය.

එක් භික්ෂුවකට අප්පටිච්ඡන්න ඇවැත් ද බොහෝ තිබිය හැකි ය. එක් දිනක් වූ පටිච්ඡන්න ඇවැත් ද බොහෝ තිබිය

Non-commercial distribution

හැකි ය. දෙ දින-තුන් දින-සතර දින-පස් දින-සදින-සත් දින-අට දින-නව දින-දශ දින එකොළොස් දින-දෙළොස් දින-තෙළෙස් දින-තුදුස් දින පටිච්ඡන්න ඇවැත් ද බොහෝ තිබිය හැකි ය. අරුණට පළමුව දිනපතා නැගිට තුණුරුවන් වැඳ, ඇවැත් දෙසා ගන්නා භික්ෂූන්ට පටිච්ඡන්න ඇවැත් නො තිබිය හැකි ය. සවස තුනුරුවන් වැඳ දිනපතා ඇවැත් දෙසා ගන්නා භික්ෂූන්ට එක් දවසකට වඩා පටිච්ඡන්න ඇවැත් නො තිබිය හැකි ය.

නො වරදවා පොහෝ කරන භික්ෂූන්ට තුදුස් දිනකට වඩා පටිච්ඡන්න ඇවැත් නො තිබිය හැකිය. ඒ එකකුත් නො කරන්නාවූ භික්ෂූන්ගේ ඇවැත් පටිච්ඡන්න වී ඇති කාලය ප්‍රමාණ කිරීම ද පහසු නැත. පටිච්ඡන්නාපටිච්ඡන්න ආපත්ති දෙවර්ගය ම ඇති භික්ෂුව විසින් ඒවායින් ශුධ වීම පිණිස, පළමු කොට පටිච්ඡන්නාපත්තීන් සඳහා පිරිවෙස් පිරිය යුතු ය. ඊට පසු පටිච්ඡන්නාපටිච්ඡන්න ආපත්ති දෙවර්ගය ම එක්කොට සියල්ල සඳහා සදිනක් මානත් පිරිය යුතු ය. එක් දින පටිච්ඡන්න ඇවැත්ය, දෙ දින පටිච්ඡන්න ඇවැත් ය යනාදි වශයෙන් බොහෝ ඇවැත් ඇත්තාවූ භික්ෂුව විසින්, ඉතා වැඩි ගණනක් දින සඟවන ලද ඇවැත්වලට, එයට අඩු දින ගණන් සැඟවූ ඇවැත් එක් කොට, වැඩි ගණනක් දින පටිච්ඡන්නවූ ඇවැත්වල දින ගණනට පිරිවෙස් පිරිය යුතු ය. එසේ කළ කල්හි සියල්ලෙන් ම ශුද්ධිය ලැබේ. ඉතාම වැඩි දින ගණනක් පටිච්ඡන්න වූ ඇවැත්වලට අඩු දිනගණන් පටිච්ඡන්න ඇවැත් එක්කොට සමාදන් වන්නාවූ පිරිවෙස **'අග්ඝසමෝධාන පරිවාස'** නම් වේ.

එය පිරීමේ ක්‍රමය මෙසේ යඃ- දස දිනක් පටිච්ඡන්නවූ ඇවැත්වලට ඉතිරි ඇවැත් එක්කොට පිරිවෙස් පිරීම මෙහි දක්වනු ලැබේ. එය අනුව අඩු වැඩි දින ගණන් පටිච්ඡන්න ඇවැත් මුල් කොට පිරිවෙස් පුරන සැටි තේරුම් ගත යුතු ය.

**අග්ඝසමෝධාන පරිවාසය ඉල්ලීමේ වාක්‍යය.**

**අහං භන්තෙ ! සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජිං. සම්බහුලා ආපත්තියො එකාහපටිච්ඡන්නායො. සම්බහුලා ආපත්තියො ද්වීහපටිච්ඡන්නායො. සම්බහුලා ආපත්තියො තීහපටිච්-**

Non-commercial distribution

ජන්නායො. සම්බහුලා ආපත්තියො චතූහපටිච්ජන්නායො. සම්බහුලා ආපත්තියො පඤ්චාහ පටිච්ජන්නායො. සම්බහුලා ආපත්තියො ජාහපටිච්ජන්නායො. සම්බහුලා ආපත්තියො සත්තාහපටිච්ජන්නායො. සම්බහුලා ආපත්තියො අට්ඨාහපටිච්ජන්නායො. සම්බහුලා ආපත්තියො නවාහපටිච්ජන්නායො. සම්බහුලා ආපත්තියො දසාහ-පටිච්ජන්නායො. සො 'හං භන්තෙ ! සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං යා ආපත්තියො දසාහපටිච්ජන්නායො. තාසං අග්ඝෙන සමොධානපරිවාසං යාචාමි.

සීමාවේදී සිවුර ඒකාංස කොට පොරවා උක්කුටිකයෙන් හිඳ, සඞ්ඝයාට වැඳ ගෙන, මේ වාක්‍යය තුන් වරක් කියා පිරිවෙස ඉල්ලනු.

අග්ඝසමෝධාන පරිවාසදන

කර්ම වාක්‍යය.

"සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (තිස්සො) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජි. සම්බහුලා ආපත්තියො එකාහපටිච්ඡන්නායො, සම්බහුලා ආපත්තියො ද්වීහපටිච්ඡන්නායො, සම්බහුලා ආපත්තියො තීහපටිච්ඡන්නායො, සම්බහුලා ආපත්තියො චතූහපටිච්ඡන්නායො, සම්බහුලා ආපත්තියො පඤ්චාහ පටිච්ඡන්නායො, සම්බහුලා ආපත්තියො ඡාහපටිච්ඡන්නායො, සම්බහුලා ආපත්තියො සත්තාහ පටිච්ඡන්නායො, සම්බහුලා ආපත්තියො අට්ඨාහපටිච්ඡන්නායො, සම්බහුලා ආපත්තියො නවාහ පටිච්ඡන්නායො, සම්බහුලා ආපත්තියො දසාහපටිච්ඡන්නායො, සො සඞ්ඝං තාසං ආපත්තීනං යා ආපත්තියො දසාහපටිච්ඡන්නායො. තාසං අග්ඝෙන සමො-ධානපරිවාසං යාචති. යදි සඞ්ඝස්ස පත්ත-කල්ලං සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො තාසං

Non-commercial distribution

ආපත්තීනං යා ආපත්තියො දසාහපටිච්ඡන්නායො, තාසං අග්ඝෙන සමොධානපරිවාසං දදෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (තිස්සො) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජි, සම්බහුලා ආපත්තියො එකාහපටිච්ඡන්නායො, සම්බහුලා ආපත්තියො ද්වීහ-පටිච්ඡන්නායො, සම්බහුලා ආපත්තියො තීහපටිච්ඡන්නායො, සම්බහුලා ආපත්තියො චතුහපටිච්ඡන්නායො, සම්බහුලා ආපත්තියො පඤ්චාහපටිච්ඡන්නායො, සම්බහුලා ආපත්තියො ඡාහපටිච්ඡන්නායො, සම්බහුලා ආපත්තියො සත්තාහපටිච්ඡන්නායො, සම්බහුලා ආපත්තියො අට්ඨාහ පටිච්ඡන්නායො, සම්බහුලා ආපත්තියො නවාහපටිච්ඡන්නායො, සම්බහුලා ආපත්තියො දසාහපටිච්ඡන්නායො, සො සඞ්ඝං තාසං ආපත්තීනං යා ආපත්තියො දසාහ පටිච්ඡන්නායො, තාසං අග්ඝෙන සමොධාන පරිවාසං යාචති. සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො තාසං ආපත්තීනං යා ආපත්තියො දසාහපටිච්ඡන්නායො තාසං අග්ඝෙන සමොධාන පරිවාසං දෙති. යස්සායස්මතො ඛමති, (තිස්සස්ස) භික්ඛුනො තාසං ආපත්තීනං යා ආපත්තියො දසාහපටිච්ඡන්නායො, තාසං අග්ඝෙන සමොධාන පරිවාසස්ස දානං. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

Non-commercial distribution

දුතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ -පෙ- සො භාසෙය්‍ය.

තතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ -පෙ- සො භාසෙය්‍ය.

දින්නො සඞ්ඝෙන (තිස්සස්ස) භික්ඛුනො තාසං ආපත්තීනං යා ආපත්තියො දසාහ පටිච්ඡන්නායො තාසං අග්ඝෙන සමොධාන පරිවාසො, ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි”

පිරිවෙස ගත් පසු එහිදී ම සමාදන්ව සඞ්ඝයාහට ආරෝචනය කළ යුතු.

සමාදන් වීමේ වාක්‍යය.

පරිවාසං සමාදියාමි. වත්තං සමාදියාමි.

තුන්වරක් කියනු.

පිරිවෙස ආරෝචනය කරන වාක්‍යය.

අහං භන්තෙ! සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජිං. සම්බහුලා ආපත්තියො එකාහපටිච්ඡන්නායො, සම්බහුලා ආපත්තියො ද්වීහපටිච්ඡන්නායො, සම්බහුලා ආපත්තියො තීහපටිච්ඡන්නායො, සම්බහුලා ආපත්තියො චතුහපටිච්ඡන්නායො, සම්බහුලා ආපත්තියො පඤ්චාහ පටිච්ඡන්නායො, සම්බහුලා ආපත්තියො ඡාහපටිච්ඡන්නායො, සම්බහුලා ආපත්තියො සත්තාහපටිච්ඡන්නායො, සම්බහුලා ආපත්තියො අට්ඨාහපටිච්ඡන්නායො, සම්බහුලා ආපත්තියො නවාහපටිච්ඡන්නායො, සම්බහුලා ආපත්තියො දසාහපටිච්ඡන්නායො, සො'හං භන්තෙ! සඞ්ඝං තාසං ආපත්තීනං යා ආපත්තියො දසාහ පටිච්ඡන්නායො තාසං අග්ඝෙන සමොධාන පරිවාසං යාචිං. තස්ස මෙ සඞ්ඝො තාසං ආපත්තීනං යා ආපත්තියො දසාහපටිච්ඡන්නායො තාසං අග්ඝෙන සමොධානපරිවාසං අදාසි, සො'හං පරිවසාමි. වෙදයාමහං භන්තෙ! වෙදයතීති මං සඞ්ඝො ධාරෙතු.

මෙසේ තුන් වරක් ආරෝචනය කරනු. ඉක්බිති පිරිවෙස නික්ෂේප කොට සුදුසු තැනකට ගොස් සමාදන් වෙමින් දින

Non-commercial distribution

සම්පූර්ණ වන තෙක් පුරනු. නික්ෂේප කිරීමේ වාක්‍යය "**පරිවාසං නික්ඛිපාමි. වත්තං නික්ඛිපාමි**" යනුයි. තුන් වරක් කියනු. වත් මානත් නික්ෂේප කිරීම වනාහි එක් භික්ෂුවක් වෙත ද කළ හැකි ය. සීමාවේදී සඞ්ඝයා ඉදිරියේ වත හෝ මානත නික්ෂේප කිරීම අමතක වී ගියහොත්, එක් භික්ෂුවක් වෙත ගොස්, නික්ෂේප කළ යුතුය. ඉදින් ඒ භික්ෂුව කලින් ආරෝචනය නො කළ භික්ෂුවක් නම් ආරෝචනය කොට නික්ෂේප කළ යුතු ය. සීමාවේ ආරෝචනය කරද්දී සිටි භික්ෂුවක් වේ නම්, ආරෝචනය නො කොට ම නික්ෂේප කළ යුතු ය.

වත හෝ මානත ආරෝචනය කිරීමේදී එක් භික්ෂුවකට ආරෝචනය කරන කල්හි "**වෙදයතීති මං ආයස්මා ධාරෙතු**" යි ද, දෙනමකට ආරෝචනය කිරීමේදී "**වෙදයාමහං ආයස්මන්තා ධාරෙන්තු**" යි ද, තෙනමකට ආරෝචනය කිරීමේදී "**වෙදයතීති මං ආයස්මන්තො ධාරෙන්තු**" යි ද කිය යුතු.

වත්-මානත් ඉල්ලීමේදී හා කර්මවාක්‍ය කීමේදී ද ආරෝචනය කිරීමේදී ද, එකොළොස් දිනය පටන් තුදුස් දින දක්වා පටිච්ඡන්න ඇවැත් ගැන "**එකාදසාහපටිච්ඡන්නායො ද්වාදසාහපටිච්ඡන්නායො තෙරසාහ පටිච්ඡන්නායො චුද්දසාහපටිච්ඡන්නායො**" යි යොද කියනු. පසළොස් දිනක් පටිච්ඡන්න ආපත්ති ගැන "**පක්ඛපටිච්ඡන්නායො**" යි යොදනු. සොළොස් දින පටන් එකුන් තිස් දින දක්වා ඇති දින ගණන් පටිච්ඡන්න ඇවැත් ගැන "**අතිරෙකපක්ඛපටිච්ඡන්නායො**" යි යොදනු. මසක් පටිච්ඡන්න ඇවැත් ගැන "**මාසපටිච්ඡන්නායො**" යි යොදනු. ඉන් ඔබ්බට ද "**අතිරෙකමාසපටිච්ඡන්නායො ද්වෙමාසපටිච්ඡන්නායො අතිරෙක ද්වෙමාසපටිච්ඡන්නායො**" යනාදීන් යොද කියනු. වර්ෂයක් පටිච්ඡන්න ඒවා ගැන '**එකසංවච්ඡර පටිච්ඡන්නායො**'යි යොදනු. ඉන් ඔබ්බට '**අතිරෙක එකසංවච්ඡර ද්විසංවච්ඡර අතිරෙක ද්විසංවච්ඡර**' යනාදීන් යොද ගත යුතු.

පිරිවෙස පුරා අවසන්වූ පසු පිරිවෙස් පිරූ ඇවැත් වලට හා අප්පටිච්ඡන්න ඇවැත් වලට ද මානත ගත යුතු ය. මානත ගැනීමේදී පිරිවෙස නික්ෂේප කොට විසුයේ නම් සීමාමාලකයේදී නැවත සමාදන්ව සඞ්ඝයා හට ආරෝචනය කළ යුතු ය. මානත

Non-commercial distribution

ලැබීමට සුදුසු වන්නේ පිරිවෙස් සමාදන්ව ඉන්නා තැනැත්තා ය. පිරිවෙස නික්ෂේප කොට සිටින අතර මානත ගත්තේ ද එය ලැබුයේ නො වේ. එබැවින් එසේ ගෙන පුරන මානත නිෂ්ඵල ය. පිරිවෙස් පිරූ දිනවල් ද සමහර විට යම් යම් කරුණු වලින් රත්තිච්ඡේදය වීමෙන් නිෂ්ඵල වී තිබිය හැකි ය. නියමිත දින ගණනින් එක් දිනයකුදු පිරිවෙස් පිරීම අඩුවී තුබුණහොත් ඒ තැනැත්තා ද මානත ලැබීමට සුදුසු නො වේ. පිරිවෙස සම්පූර්ණ නො කොට මානත ගෙන පිරූයේ ද නිෂ්ඵල ය. එබැවින් පිරිවෙස් පිරීම ද පරෙස්සමෙන් කළ යුතු ය. රත්තිච්ඡේදය වීම ගැන සැක ඇති දින වී නම්, ඒ දින වෙනුවට නැවත වත පුරා නිසැකවූ කල්හි ම මානත ගත යුතු ය.

**අග්ඝසමෝධාන මානත ඉල්ලීමේ වාක්‍යය.**

**අහං භන්තෙ! සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජිං. සම්බහුලා ආපත්තියො එකාහපටිච්ඡන්නායො -පෙ- සම්බහුලා ආපත්තියො දසාහපටිච්ඡන්නායො. සො'හං භන්තෙ! සඞ්ඝං තාසං ආපත්තීනං යා ආපත්තියො දසාහපටිච්ඡන්නායො තාසං අග්ඝෙන සමොධාන පරිවාසං යාචිං. තස්ස මෙ සඞ්ඝො තාසං ආපත්තීනං යා ආපත්තියො දසාහපටිච්ඡන්නායො තාසං අග්ඝෙන සමොධාන-පරිවාසං අදාසි. සො'හං භන්තෙ! පරිවුත්ථ පරිවාසො. අහං භන්තෙ! සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජිං අප්පටිච්ඡන්නායො. සො'හං භන්තෙ! සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං පටිච්ඡන්නානඤ්ච අප්පටිච්ඡන්නානඤ්ච ඡාරත්තං මානත්තං යාචාමි.**

තුන් වරක් ඉල්ලනු.

මානත්ත දන කර්මවාක්‍යය.

"සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. අයං (තිස්සො) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජි. සම්බහුලා ආපත්තියො එකාහපටිච්ඡන්නායො -පෙ- සම්බහුලා ආපත්තියො දසාහපටිච්ඡන්නායො. සො සඞ්ඝං තාසං ආපත්තීනං යා ආපත්තියො

Non-commercial distribution

දසාහපටිච්ඡන්නායො තාසං අග්ඝෙන සමොධානපරිවාසං යාචි. සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො තාසං ආපත්තීනං යා ආපත්තියො දසාහපටිච්ඡන්නායො තාසං අග්ඝෙන සමොධානපරිවාසං අදාසි. සො පරිවුත්ථ පරිවාසො. අයං (තිස්සො) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජි අප්පටිච්ඡන්නායො. සො සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං පටිච්ඡන්නානඤ්ච අප්පටිච්ඡන්නානඤ්ච ඡාරත්තං මානත්තං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො තාසං සම්බහුලානං ආපත්තීනං පටිච්ඡන්නානඤ්ච අපටිච්ඡන්නානඤ්ච ඡාරත්තං මානත්තං දදෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (තිස්සො) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජි. සම්බහුලා ආපත්තියො එකාහපටිච්ඡන්නායො, -පෙ- සම්බහුලා ආපත්තියො දසාහපටිච්ඡන්නායො, සො සඞ්ඝං තාසං ආපත්තීනං යා ආපත්තියො දසාහපටිච්ඡන්නායො. තාසං අග්ඝෙන සමොධානපරිවාසං යාචි. සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො තාසං ආපත්තීනං යා ආපත්තියො දසාහපටිච්ඡන්නායො, තාසං අග්ඝෙන සමොධානපරිවාසං අදාසි. සො පරිවුත්ථ පරිවාසො, අයං (තිස්සො) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජි, අප්පටිච්ඡන්නායො. සො සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං පටිච්ඡන්නානඤ්ච අප්පටිච්ඡන්නානඤ්ච ඡාරත්තං මානත්තං යාචති.

Non-commercial distribution

සඞෙඝා (තිස්සස්ස) භික්ඛුනො තාසං සම්බහුලානං ආපත්තීනං පටිච්ඡන්නානඤ්ච අප්පටිච්ඡන්නානඤ්ච ඡාරත්තං මානත්තං දෙති. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො තාසං සම්බහුලානං ආපත්තීනං පටිච්ඡන්නානඤ්ච අප්පටිච්ඡන්නානඤ්ච ඡාරත්තං මානත්තස්ස දානං. සො තුණ්හස්ස, යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

දුතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ -පෙ- සො භාසෙය්‍ය.

තතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ -පෙ- සො භාසෙය්‍ය.

දින්නං සඞෙඝන (තිස්සස්ස) භික්ඛුනො තාසං සම්බහුලානං ආපත්තීනං පටිච්ඡන්නානඤ්ච අප්පටිච්ඡන්නානඤ්ච ඡාරත්තං මානත්තං. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි."

මානත ලැබීමෙන් පළමු සමාදන් වී තුබූ පරිවාසය අභාවප්‍රාප්ත විය. දැන් සීමාවේදී ම ලැබූ මානත සමාදන් වී සඞ්ඝයාට ආරෝචනය කළ යුතු ය.

**සමාදන් වීමේ වාක්‍යය**

**මානත්තං සමාදියාමි. වත්තං සමාදියාමි.**

තුන් වරක් කියනු.

**මානත ආරෝචනය කිරීමේ වාක්‍යය.**

**අහං භන්තෙ සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජිං. සම්බහුලා ආපත්තියො එකාහපටිච්ඡන්නායො, සම්බහුලා ආපත්තියො ද්වීහපටිච්ඡන්නායො, සම්බහුලා ආපත්තියො තීහපටිච්ඡන්නායො,**

Non-commercial distribution

සම්බහුලා ආපත්තියො චතුහපටිච්ඡන්නායො, සම්බහුලා ආපත්තියො පඤ්චාහපටිච්ඡන්නායො. සම්බහුලා ආපත්තියො ඡාහ පටිච්ඡන්නායො. සම්බහුලා ආපත්තියො සත්තාහ පටිච්ඡන්නායො. සම්බහුලා ආපත්තියො අට්ඨාහ පටිච්ඡන්නායො. සම්බහුලා ආපත්තියො නවාහ පටිච්ඡන්නායො. සම්බහුලා ආපත්තියො දසාහ පටිච්ඡන්නායො, සො'හං භන්තෙ! සඞ්ඝං තාසං ආපත්තීනං යා ආපත්තියො දසාහපටිච්ඡන්නායො තාසං අග්ඝෙන සමොධාන පරිවාසං යාචිං. තස්ස මෙ සඞ්ඝො තාසං ආපත්තීනං යා ආපත්තියො දසාහ පටිච්ඡන්නායො තාසං අග්ඝෙන සමොධානපරිවාසං අදාසි. සො'හං භන්තේ! පරිවුත්ථ පරිවාසො. අහං භන්තෙ! සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජිං. අප්පටිච්ඡන්නායො සො'හං භන්තේ! සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං පටිච්ඡන්නානඤ්ච අප්පටිච්ඡන්නානඤ්ච ඡාරත්තං මානත්තං යාචිං. තස්ස මෙ සඞ්ඝො තාසං සම්බහුලානං ආපත්තීනං පටිච්ඡන්නානඤ්ච අප්පටිච්ඡන්නානඤ්ච ඡාරත්තං මානත්තං අදාසි. සො'හං මානත්තං චරාමි. වෙදයාම'හං භන්තෙ! වෙදයතීති මං සඞ්ඝො ධාරෙතු.

මෙසේ තුන්වරක් ආරෝචනය කරනු. ඉන්පසු නික්ෂේප කරනු. කැමති නම්, **"මානත්තං නික්ඛිපාමි. වත්තං නික්ඛිපාමි."** යි තුන්වාරයක් කියා නික්ෂේප කරනු. පිරිවෙස එක් භික්ෂුවක් වෙසෙන තැනදී ද පිරිය හැකිය. මානත පිරීමට යටත් පිරිසෙයින් භික්ෂූන් සතර නමක් සිටිය යුතු ය. එබැවින් සඞ්ඝයා ඇති තැනකට ගොස් දින සයක් සම්පූර්ණ වන තුරු මානත පිරිය යුතු ය. දිනපතාම එය සඞ්ඝයාට ආරෝචනය කළ යුතුය. මානත සදිනක් පුරා අවසන් කළ පසු විසි නමකට නො අඩු භික්ෂූන් පිරිසක් සීමාවට රැස් කරවා අබ්භාන කර්මය කර ගත යුතු ය. එසේ කරන කල්හි මානත නික්ෂේප කොට සිටියේ නම්, සඞ්ඝයා ඉදිරියේදී නැවත සමාදන්ව ආරෝචනය ද කොට අබ්භානය ඉල්ලිය යුතු ය.

**අබ්භානයාචන වාක්‍යය.**

අහං භන්තෙ! සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජිං. සම්බහුලා ආපත්තියො එකාහපටිච්ඡන්නායො. -පෙ- සම්බහුලා

Non-commercial distribution

ආපත්තියො දසාහපටිච්ඡන්නායො. සො'හං භන්තෙ! සඞ්ඝං තාසං ආපත්තීනං යා ආපත්තියො දසාහපටිච්ඡන්නායො. තාසං අග්ඝෙන සමොධානපරිවාසං යාචිං. තස්ස මෙ සඞ්ඝො තාසං ආපත්තීනං. යා ආපත්තියො දසාහපටිච්ඡන්නායො තාසං අග්ඝෙන සමොධානපරිවාසං අදසි. සො'හං භන්තෙ පරිවුත්ථ පරිවාසො. අහං භන්තෙ සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජිං. අප්පටිච්ඡන්නායො. සො'හං භන්තෙ! සංඝං තාසං සම්බහුලානං ආපත්තීනං පටිච්ඡන්නානඤ්ච අප්පටිච්ඡන්නානඤ්ච ඡාරත්තං මානත්තං යාචිං. තස්ස මෙ සඞ්ඝො තාසං සම්බහුලානං ආපත්තීනං පටිච්ඡන්නානඤ්ච අප්පටිච්ඡන්නානඤ්ච ඡාරත්තං මානත්තං අදාසි. සො'හං භන්තෙ! චිණ්ණමානත්තො සඞ්ඝං අබ්භානං යාචාමි.

මෙසේ තුන් වරක් ඉල්ලනු.

අබ්භාන කර්ම වාක්‍යය.

"සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (තිස්සො) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජි. සම්බහුලා ආපත්තියො එකාහපටිච්ඡන්නායො, -පෙ- සම්බහුලා ආපත්තියො දසාහපටිච්ඡන්නායො, සො සඞ්ඝං තාසං ආපත්තීනං යා ආපත්තියො දසාහපටිච්ඡන්නායො තාසං අග්ඝෙන සමොධාන-පරිවාසං යාචි. සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො තාසං ආපත්තීනං යා ආපත්තියො දසාහපටිච්ඡන්නායො තාසං අග්ඝෙන සමොධානපරිවාසං අදසි. සො පරිවුත්ථ පරිවාසො, අයං (තිස්සො) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජි, අප්පටි-ච්ඡන්නායො, සො සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං පටිච්ඡන්නානඤ්ච අප්පටිච්ඡන්නා-නඤ්ච ඡාරත්තං මානත්තං යාචි. සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො තාසං සම්බහුලානං ආපත්තීනං

Non-commercial distribution

පටිච්ඡන්නානඤ්ච අප්පටිච්ඡන්නානඤ්ච ඡාරත්තං මානත්තං අදාසි. සො චිණ්ණමානත්තො සඞ්ඝං අබ්භානං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (තිස්සං) භික්ඛුං අබ්භෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (තිස්සො) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජි. සම්බහුලා ආපත්තියො එකාහපටිච්ඡන්නායො, -පෙ- සම්බහුලා ආපත්තියො දසාහපටිච්ඡන්නායො, සො සඞ්ඝං තාසං ආපත්තීනං යා ආපත්තියො දසාහපටිච්ඡන්නායො, තාසං අග්ගෙන සමොධාන පරිවාසං යාචි. සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො තාසං ආපත්තීනං යා ආපත්තියො දසාහපටිච්ඡන්නායො තාසං අග්ගෙන සමොධානපරිවාසං අදාසි. සො පරිවුත්ථ පරිවාසො, අයං (තිස්සො) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජි, අප්පටිච්ඡන්නායො. සො සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං පටිච්ඡන්නානඤ්ච අප්පටිච්ඡන්නානඤ්ච ඡාරත්තං මානත්තං යාචි. සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො තාසං සම්බහුලානං ආපත්තීනං පටිච්ඡ-න්නානඤ්ච අප්පටිච්ඡන්නානඤ්ච ඡාරත්තං මානත්තං අදාසි. සො චිණ්ණමානත්තො සඞ්ඝං අබ්භානං යාචති. සඞ්ඝො (තිස්සං) භික්ඛුං අබ්භෙති. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො අබ්භානං. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

Non-commercial distribution

දුතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ -පෙ- සො භාසෙය්‍ය.

තතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ -පෙ- සො භාසෙය්‍ය.

අබ්භිතො සඞ්ඝෙන (තිස්සො) භික්ඛු. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි..

**සුද්ධන්තපරිවාසය.**

තමාට සිදුවූ ඇවැත්වල ප්‍රමාණයත්, සැඟවූ දින ප්‍රමාණයත් නො දන්නාවූ බොහෝ ඇවැත් ඇති භික්ෂුව, 'සුද්ධන්තපරිවාසය' ගෙන පිරිය යුතු ය. ඇවැත් ආරෝචනය නො කර විසූ කාල-ප්‍රමාණය සලකා, එපමණ දින ගණනක් ඒ පිරිවෙස පුරා මානත ගෙන සදිනක් පුරා අබ්භාන කර්මය කර ගත යුතු ය.

උපසම්පදවෙන් පසු කවදවත් ආපත්ති ආරෝචනයක් කර නැති නම්, ඇවැත් ද වී නම්. උපසම්පද වී ගත වූ කාල ප්‍රමාණයට ම වත පිරිය යුතු ය.

**සුද්ධන්තපරිවාසයාචන වාක්‍යය.**

**අහං භන්තෙ! සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජිං. ආපත්තිපරියන්තං න ජානාමි. රත්තිපරියන්තං න ජානාමි. ආපත්තිපරියන්තං නස්සරාමි. රත්ති පරියන්තං නස්සරාමි. ආපත්තිපරියන්තෙ වෙමතිකො. රත්තිපරියන්තෙ වෙමතිකො. සො'හං භන්තෙ! සඞ්ඝං තාසං ආපත්තීනං සුද්ධන්තපරිවාසං යාචාමි.**

තුන් වරක් කියනු.

පරිවාසදාන කර්ම වාක්‍යය.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. අයං (තිස්සො) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජි. ආපත්තිපරියන්තං න ජානාති. රත්ති පරියන්තං න ජානාති. ආපත්ති පරියන්තං නස්සරති.

Non-commercial distribution

රත්තිපරියන්තං නස්සරති. ආපත්තිපරියන්තෙ වෙමතිකො. රත්තිපරියන්තෙ වෙමතිකො. සො සඞ්ඝං තාසං ආපත්තීනං සුද්ධන්තපරිවාසං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො තාසං ආපත්තීනං සුද්ධන්තපරිවාසං දදෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. අයං (තිස්සො) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජි. ආපත්තිපරියන්තං න ජානාති. රත්තිපරියන්තං න ජානාති. ආපත්තිපරියන්තං නස්සරති. රත්තිපරියන්තං නස්සරති. ආපත්තිපරියන්තෙ වෙමතිකො. රත්තිපරියන්තෙ වෙමතිකො. සො සඞ්ඝං තාසං ආපත්තීනං සුද්ධන්තපරිවාසං යාචති. සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො තාසං ආපත්තීනං සුද්ධන්ත පරිවාසං දෙති. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො තාසං ආපත්තීනං සුද්ධන්තපරිවාසස්ස දානං. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

දුතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ -පෙ- සො භාසෙය්‍ය.

තතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ -පෙ- සො භාසෙය්‍ය.

දින්නො සඞ්ඝෙන (තිස්සස්ස) භික්ඛුනො තාසං ආපත්තීනං සුද්ධන්තපරිවාසො. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.

Non-commercial distribution

**පරිවාස සමාදන වාක්‍යය.**

**පරිවාසං සමාදියාමි. වත්තං සමාදියාමි.**

තුන් වරක් කියා සමාදන් විය යුතු.

**ආරෝචනය කරන වාක්‍යය.**

**අහං භන්තෙ! සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජිං. ආපත්තිපරියන්තං න ජානාමි. රත්තිපරියන්තං න ජානාමි. ආපත්තිපරියන්තං නස්සරාමි. රත්තිපරියන්තං නස්සරාමි. ආපත්ති පරියන්තෙ වෙමතිකො. රත්තිපරියන්තෙ වෙමතිකො. සො'හං භන්තෙ! සඞ්ඝං තාසං ආපත්තීනං සුද්ධන්තපරිවාසං යාචිං. තස්ස මෙ සඞ්ඝො තාසං ආපත්තීනං සුද්ධන්තපරිවාසං අදසි. සො'හං පරිවසාමි වෙදයාමහං භන්තෙ වෙදයතීති මං සඞ්ඝො ධාරෙතු.**

මෙසේ තුන් වාරයක් ආරෝචනය කරනු. එක් නමට දෙනමට තුන් නමට ආරෝචනයේදී සුදුසු පරිදි වාක්‍යය යොදගත යුතු ය. නික්ෂේප කිරීමේදී "**පරිවාසං නික්ඛිපාමි. වත්තං නික්ඛිපාමි**" යි තුන්වරක් කියනු. ඒ දෙ පදයෙන් එක් පදයකිනුදු නික්ෂේපය වේ. "**එකපදෙනා'පි වෙතථ නික්ඛිත්තො හොති පරිවාසො. ද්වීහි පන සුනික්ඛිත්තො යෙව**" යනු අටුවා යි. මෙසේ ගන්නා ලද පිරිවෙස විවේකස්ථානයකට ගොස්, තමාගේ අතීතය කල්පනා කොට සැකයක් ඉතිරි නො වන පරිදි සෑහෙන දින ගණනක් හොඳින් පුරා මානත ගත යුතු ය. බොහෝ ඇවැත් ඇති තැනැත්තාට අපටිච්ඡන්න ඇවැත් ද තිබිය හැකි බැවින් මානත ගැනීමේදී පිරිවෙස් පිරූ පටිච්ඡන්න ආපත්තිවලට, අපටිච්ඡන්න ආපත්ති ද එක්කොට, සියල්ලට ම මානත ගත යුතු ය. මානත ගැනීමේදී පිරිවෙස නික්ෂේප කොට සිටියේ නම් සීමාවේදී පළමු කොට පිරිවෙස සමාදන් වී ආරෝචනය කළ යුතු ය. මානත සඞ්ඝයාගෙන් ඉල්ලිය යුත්තේ ඊට පසුව ය..

**මානත ඉල්ලීමේ වාක්‍යය.**

**අහං භන්තෙ! සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජිං. ආපත්තිපරියන්තං න ජානාමි. රත්තිපරියන්තං න ජානාමි. ආපත්තිපරියන්තං නස්සරාමි. රත්තිපරියන්තං නස්සරාමි. ආපත්ති-පරියන්තෙ වෙමතිකො. රත්තිපරියන්තෙ වෙමතිකො. සො'හං භන්තෙ!**

Non-commercial distribution

සඞ්ඝං තාසං ආපත්තීනං සුද්ධන්තපරිවාසං යාචිං. තස්ස මෙ සඞ්ඝො තාසං ආපත්තීනං සුද්ධන්තපරිවාසං අදාසි. සො'හං භන්තෙ! පරිවුත්ථ පරිවාසො. අහං භන්තෙ! සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජිං. අප්පටිච්ඡන්නායො. සො'හං භන්තෙ! සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං පටිච්ඡන්නානඤ්ච අප්පටිච්ඡන්නානඤ්ච ඡාරත්තං මානත්තං යාචාමි.

තුන් වරක් කියනු.

මානත දෙන කම් වාක්‍යය.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. අයං (තිස්සො) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජි. ආපත්තිපරියන්තං න ජානාති. රත්තිපරියන්තං න ජානාති. ආපත්තිපරියන්තං නස්සරති. රත්තිපරියන්තං නස්සරති. ආපත්තිපරියන්තෙ වෙමතිකො. රත්තිපරියන්තෙ වෙමතිකො. සො සඞ්ඝං තාසං ආපත්තීනං සුද්ධන්ත පරිවාසං යාචි. සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො තාසං ආපත්තීනං සුද්ධන්තපරිවාසං අදාසි. සො පරිවුත්ථපරිවාසො. අයං (තිස්සො) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජි අප්පටිච්ඡන්නායො. සො සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං පටිච්ඡන්නානඤ්ච අප්පටිච්ඡන්නානඤ්ච ඡාරත්තං මානත්තං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො තාසං සම්බහුලානං ආපත්තීනං පටිච්ඡන්නානඤ්ච අප්පටිච්ඡන්නානඤ්ච ඡාරත්තං මානත්තං දදෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. අයං (තිස්සො) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජි.

Non-commercial distribution

ආපත්තිපරියන්තං න ජානාති. රත්තිපරියන්තං න ජානාති. ආපත්තිපරියන්තං නස්සරති. රත්තිපරියන්තං නස්සරති. ආපත්තිපරියන්තෙ වෙමතිකො. රත්තිපරියන්තෙ වෙමතිකො. සො සඞ්ඝං තාසං ආපත්තීනං සුද්ධන්තපරිවාසං යාචි. සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො තාසං ආපත්තීනං සුද්ධන්තපරිවාසං අදාසි. සො පරිවුත්ථපරිවාසො, අයං (තිස්සො) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජි අප්පටිච්ඡන්නායො. සො සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං පටිච්ඡන්නානඤ්ච අප්පටිච්ඡන්නානඤ්ච ඡාරත්තං මානත්තං යාචති. සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො තාසං සම්බහුලානං ආපත්තීනං පටිච්ඡන්නානඤ්ච අප්පටිච්ඡන්නානඤ්ච ඡාරත්තං මානත්තං දෙති, යස්සායස්මතො ඛමති, (තිස්සස්ස) භික්ඛුනො තාසං සම්බහුලානං ආපත්තීනං පටිච්ඡන්නානඤ්ච අප්පටිච්ඡන්නානඤ්ච ඡාරත්තං මානත්තස්ස දානං. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

දුතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ -පෙ- සො භාසෙය්‍ය.

තතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ -පෙ- සො භාසෙය්‍ය.

දින්නං සඞ්ඝෙන (තිස්සස්ස) භික්ඛුනො තාසං සම්බහුලානං ආපත්තීනං පටිච්ඡන්නානඤ්ච අප්ප-ටිච්ඡන්නානඤ්ච ඡාරත්තං මානත්තං. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.

Non-commercial distribution

මානත ලැබීමෙන් පසු සීමාවෙහිදී ම සිවුර ඒකාංස කොට පොරවා උක්කුටිකව හිඳ සඞ්ඝයාට වැඳ-ගෙන "**මානත්තං සමාදියාමි. වත්තං සමාදියාමි**" යි තෙවරක් කියා මානත සමාදන්ව සඞ්ඝයාට ආරෝචනය කළයුතු.

**මානත ආරෝචනය කිරීමේ වාක්‍යය.**

**අහං භන්තෙ! සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජිං. ආපත්තිපරියන්තං න ජානාමි. රත්තිපරියන්තං ජානාමි. ආපත්තිපරියන්තං නස්සරාමි. රත්තිපරියන්තං නස්සරාමි. ආපත්තිපරියන්තෙ වෙමතිකො. රත්ති පරියන්තෙ වෙමතිකො. සො'හං භන්තෙ! සඞ්ඝං තාසං ආපත්තීනං සුද්ධන්තපරිවාසං යාචිං. තස්ස මෙ සඞ්ඝො තාසං ආපත්තීනං සුද්ධන්තපරිවාසං අදසි. සො'හං භන්තෙ! පරිවුත්ථ පරිවාසො. අහං භන්තෙ සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජිං අප්පටිච්ඡන්නායො. සො'හං භන්තෙ! සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං පටිච්ඡන්නානඤ්ච අප්පටිච්ඡන්නානඤ්ච ඡාරත්තං මානත්තං යාචිං. තස්ස මෙ සඞ්ඝො තාසං සම්බහුලානං ආපත්තීනං පටිච්ඡන්නානඤ්ච අප්පටිච්ඡන්නානඤ්ච ඡාරත්තං මානත්තං අදසි. සො'හං මානත්තං චරාමි. වෙදයාම'හං භන්තෙ වෙදයතීති මං සඞ්ඝො ධාරෙතු.**

මෙසේ තුන් වරක් ආරෝචනය කරනු. ඉක්බිති "**මානත්තං නික්ඛිපාමි. වත්තං නික්ඛිපාමි**" යි සඞ්ඝයාට වැඳ-ගෙන තුන්වරක් කියා මානත නික්ෂේප කොට ගොස්, සතර නමකට නො අඩු භික්ෂූන් ඇති විහාරයක වෙසෙමින් සදිනක් මානත පුරා, අබ්භාන කර්මය කර ගත යුතු ය. අබ්භාන කර්මය කරවා ගැනීමේදී, විසි නමකට නො අඩු භික්ෂු පිරිසක් සීමාවකට රැස්කරවා ගෙන තමා මානත නික්ෂේප කොට විසුයේ නම්, සීමාවේදී නැවත මානත සමාදන් වී සඞ්ඝයාහට ආරෝචනය කොට අබ්භානකර්මය කරවා ගත යුතු ය.

**සුද්ධන්ත අබ්භාන යාචන වාක්‍යය.**

**අහං භන්තෙ! සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජිං. ආපත්තිපරියන්තං න ජානාමි. රත්තිපරියන්තං න ජානාමි. ආපත්තිපරියන්තං නස්සරාමි. රත්තිපරියන්තං නස්සරාමි.**

Non-commercial distribution

ආපත්තිපරියන්තෙ වෙමතිකො. රත්තිපරියන්තෙ වෙමතිකො. සො'හං භන්තෙ! සඞ්ඝං තාසං ආපත්තීනං සුද්ධන්තපරිවාසං යාචිං. තස්ස මෙ සඞ්ඝො තාසං ආපත්තීනං සුද්ධන්තපරිවාසං අදාසි. සො'හං භන්තෙ පරිවුත්ථපරිවාසො. අහං භන්තෙ! සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො අපජ්ජිං අප්පටිච්ඡන්නායො. සො'හං භන්තෙ! සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං පටිච්ඡන්නානඤ්ච අප්පටිච්ඡන්නානඤ්ච ඡාරත්තං මානත්තං යාචිං. තස්ස මෙ සඞ්ඝො තාසං සම්බහුලානං ආපත්තීනං පටිච්ඡන්නානඤ්ච අප්පටිච්ඡන්නානඤ්ච ඡාරත්තං මානත්තං අදාසි. සො'හං භන්තෙ! චිණ්ණමානත්තො සඞ්ඝං අබ්භානං යාචාමි.

සිවුර ඒකාංස කොට පෙරවා උක්කුටිකයෙන් හිඳ සඞ්ඝයාට වැඳ-ගෙන මේ වාක්‍යය තුන් වරක් කියා අබ්භානය ඉල්ලනු.

සුද්ධන්ත අබ්භාන කර්ම වාක්‍යය.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. අයං (තිස්සො) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජි. ආපත්තිපරියන්තං න ජානාති. රත්ති-පරියන්තං න ජානාති. ආපත්තිපරියන්තං නස්සරති. රත්තිපරියන්තං නස්සරති. ආපත්තිපරියන්තෙ වෙමතිකො. රත්තිපරියන්තෙ වෙමතිකො. සො සඞ්ඝං තාසං ආපත්තීනං සුද්ධන්තපරිවාසං යාචි. සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො තාසං ආපත්තීනං සුද්ධන්තපරිවාසං අදාසි. සො පරිවුත්ථපරිවාසො. අයං (තිස්සො) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජි අප්පටිච්ඡන්නායො. සො සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං පටිච්ඡන්නානඤ්ච අප්පටිච්ඡන්නානඤ්ච ඡාරත්තං මානත්තං යාචි. සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො තාසං සම්බහුලානං ආපත්තීනං පටිච්ඡන්නානඤ්ච අප්පටිච්ඡන්නානඤ්ච ඡාරත්තං මානත්තං අදාසි. සො චිණ්ණමානත්තො

Non-commercial distribution

සඞ්ඝං අබ්භානං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො තිස්සං භික්ඛුං අබ්භෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (තිස්සො) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජි. ආපත්තිපරියන්තං න ජානාති. රත්තිපරියන්තං න ජානාති. ආපත්තිපරියන්තං නස්සරති. රත්තිපරියන්තං නස්සරති. ආපත්තිපරියන්තෙ වෙමතිකො. රත්තිපරියන්තෙ වෙමතිකො. සො සඞ්ඝං තාසං ආපත්තීනං සුද්ධන්තපරිවාසං යාචි. සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො තාසං ආපත්තීනං සුද්ධන්තපරිවාසං අදාසි. සො පරිවුත්ථපරිවාසො, අයං (තිස්සො) භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජි අප්පටිච්ඡන්නායො. සො සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං පටිච්ඡන්නානඤ්ච අප්පටිච්ඡන්නානඤ්ච ඡාරත්තං මානත්තං යාචි. සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො තාසං සම්බහුලානං ආපත්තීනං පටිච්ඡන්නානඤ්ච අප්පටිච්ඡන්නානඤ්ච ඡාරත්තං මානත්තං අදාසි. සො චිණ්ණමානත්තො සඞ්ඝං අබ්භානං යාචති. සඞ්ඝො (තිස්සං) භික්ඛුං අබ්භෙති. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො අබ්භානං. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

දුතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ -පෙ- සො භාසෙය්‍ය.

තතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ -පෙ- සො භාසෙය්‍ය.

Non-commercial distribution

**අබහිතො සඞෙඝන (තිසෙසා) භිකඛු. ඛමති සඞඝසස තසමා තුණහී. එවමෙතං ධාරයාමි.**

ගරුකාපත්තීන්ගෙන් ශුද්ධිය ලැබීමේ ක්‍රම රාශියක් විනයෙහි ඇත්තේය. මෙහි දක්වා ඇත්තේ ක්‍රම තුනය. දැනට භික්ෂූන් අතර භාවිතා වන්නේ ද ඒ ක්‍රම තුනය. ඒ ක්‍රම තුනෙන් සකල ගරුකාපත්තීන්ගෙන්ම ශුද්ධිය ලැබිය හැකි ය. මෙහි කර්මවාක්‍යයන් දක්වා ඇත්තේ 'තිස්ස' යන නාමය සමග ය. භික්ෂුවකට විනය කර්ම කිරීමේදී කර්මවාක්‍යයෙහි 'තිස්ස' යනු යෙදී ඇති තැන්වලට ඒ භික්ෂුවගේ නම යොදා කර්ම වාක්‍යය කිය යුතු ය. එසේ අපහසු කමක් ඇත්තේ නම් කර්මවාක්‍යය කියන භික්ෂුව විසින් කර්මාපේක්ෂකයාගේ නම තාවකාලික වශයෙන් 'තිස්ස' ය කියා සම්මත කොට, මෙහි ඇති සැටියට ම කර්මවාක්‍යය කිය යුතු ය. නාම සම්මුතිය කොට කර්මවාක්‍යය කියනු කැමති නම් කර්මාචාර්යවරයා විසින් -

"ස්වාමීනි! මහා සඞ්ඝයා වහන්ස! කර්මවාක්‍යය කීමේ පහසුව සඳහා කර්මාපේක්ෂක වූ................ භික්ෂුවගේ පුරාණ නාමය ඉවත් කොට ඒ භික්ෂුවට 'තිස්ස' යන නාමය සම්මත කරමි. ඒ බව මහා සඞ්ඝයා වහන්සේ දැන වදරන සේක්වා. කර්මාපේක්ෂකයා විසින් ද දැන ගනු ලැබේවා"

මෙසේ නාමය සම්මත කළ යුතු ය. නාම සම්මුතිය කළ හොත් පොතේ ඇති සැටියට ම කර්මවාක්‍යය කිය යුතු ය.

**වත්මානත් පිරීම ගැන දතයුතු කරුණු.**

ඉංග්‍රීසි ක්‍රමයේ සැටියට පැය සූවිස්සක් එක් දිනයෙකි. නක්ෂත්‍ර ක්‍රමයේ සැටියට සැට පැයක් එක් දිනයකි. ඉංග්‍රීසි ක්‍රමයේ සැටියට දිනයේ පටන් ගැනීම හා අවසානය වන්නේ මධ්‍යම රාත්‍රියෙහිය. නක්ෂත්‍ර ක්‍රමයේ සැටියට සූර්යයාගේ උදයෙන් දිනයේ පටන් ගැනීම සලකනු ලැබේ. විනය ක්‍රමයේ සැටියට අරුණෝදයෙන් දිනයේ පටන් ගැනීම සළකනු ලැබේ.

**"සූරස්සොදයතො පුබ්බුට්ඨිතරංසි සියාරුණො"**

Non-commercial distribution

යනුවෙන් අභිධානප්පදීපිකාවෙහි උදවන සූර්යයාගේ පළමු නැගී එන රශ්මිය 'අරුණය' යි දක්වා තිබේ. අරුණ යනු මදරත් පැහැයට ද නමකි. ඒ නම පළමුවෙන් උදවන හිරු-රැසට තබා ඇත්තේ, ඒ හිරු-රැසත් මඳ රත් පැහැය ඇති බැවිනි. ඒ රශ්මිය සූර්යෝදයට පැය බාගයකට කලින් නැගෙනහිරදිග අහසෙහි දක්නා ලැබේ. ඒ ආලෝකය අහසෙහි දෘශ්‍යමානවීමෙන් විනය ක්‍රමයේ සැටියට අතීත දිනයේ ඉක්මීමත්, වර්තමාන දිනයේ පටන් ගැනීමත් සලකනු ලැබේ.

වත්-මානත් පිරීමේදී දිනය ගණන් ගනුයේ, දිනයට අයත් සම්පූර්ණ පැය ගණන ම වත සමාදන්ව වීසීමෙන් නොව, අරුණෝදයේදී සමාදන්ව විසීමෙනි. දවසේ පැය සූවිස්සෙන් කවර පැයකදී වත සමාදන් වුව ද අරුණෝදය තෙක් එය රැකියහොත් එක් දිනයක් ලැබුණු සැටියට සලකනු ලැබේ. උදයේ වත සමාදන්වූ භික්ෂුව අරුණෝදයට මොහොතකට වුව ද කලින් වත නික්ෂේප කළේ නම්, ඒ භික්ෂුවට දිනය නො ලැබේ. මෙහි දින ගණන් ගැනීම කරනුයේ අරුණෝදයෙනි.

වත්-මානත් සමාදන්ව වෙසෙන කාලයේදී දුර යන භික්ෂුවක් වුවත් දුටහොත්, භික්ෂුවකගේ හඬක් හෝ ඇසුණ හොත්, ඒ භික්ෂුවට ආරෝචනය කළ යුතු ය. නො කළහොත් රත්තිච්ඡේදය වේ. වත්ත භේදයෙන් දුකුළා ඇවතකුදු වේ. රත්තිච්ඡේද වීමය යන්නෙහි තේරුම ඒ දිනය ගණන් ගැනෙන දිනයක් නො වීම ය. ආරෝචනය කරන්නට උත්සාහ කොට නො කළ හැකි වී නම් ඇවැත් නො වේ. රත්තිච්ඡේදය වේ. එබැවින් බොහෝ භික්ෂූන් යන-එන තැන්වල හා දුර යන භික්ෂූන් පෙනෙන තැන්වලද වත් පිරීම අපහසු ය. දුර යනෙන භික්ෂූන් ඇති බැවින් හා පෙනෙන බැවින් ද දහවල් කාලයේ වත පිරීම ද අපහසු ය.

කොහෙත් ම භික්ෂූන් නැති තැන ද වත නො පිරිය හැකි ය., පිරිවෙස පිරිය හැකි වීමට යටත් පිරිසෙයින් එක් භික්ෂුවක්වත් සිටිය යුතු ය. මානත පිරිය හැකි වීමට සතර නමකට නොඅඩු භික්ෂු පිරිසක් සිටිය යුතු ය. එබැවින් තමා වෙසෙන විහාරයෙහි

Non-commercial distribution

තවත් භික්ෂූන් නො මැති නම්, භික්ෂූන් ඇති විහාරයකට යා යුතුය. තමා වෙසෙන විහාරයට හෝ භික්ෂූන් පමුණුවා ගත යුතු ය. නිතර රථවාහන ගමන් කරන මහා මාර්ගාසන්නයේ පිහිටි විහාරවල ද වත් පිරීම අපහසු ය. වාහනවලින් යන-එන භික්ෂූන් දුටු විට, ඔවුනට ආරෝචනය කරන්නට නො ලැබෙන හෙයිනි. වත් පුරන භික්ෂුව තමා වෙසෙන විහාරය එයට සුදුසු තැනක් වේ නම්, එහි ම වත පිරිය යුතු ය. එසේ නො වේ නම්, සුදුසු විහාරයකට ගොස් වත පිරිය යුතු ය. දුර යන භික්ෂූන් දැක ආරෝචනය කර ගත නො හැකි වී නම්, රත්තිච්ඡේදය වන බැවින් රාත්‍රිකාලයේ වත සමාදන් වී අරුණෙන් පසු නික්ෂේප කළ යුතු ය. දින ගණන පිරෙන තුරු එසේ කළයුතු ය.

**වත් පුරන භික්ෂූන්ගේ ප්‍රතිපත්ති ක්‍රමය.**

පිරිවෙස් හා මානත් පුරන භික්ෂූන් විසින් පිළිපැදිය යුතු කරුණු රාශියකි. ඒවායින් සමහරක් කඩවීමෙන් රත්තිච්ඡේදය හා දුකුළා ඇවැත් වේ. සමහරක් කඩ කිරීමෙන් දුකුළා ඇවැත් පමණක් වේ. ඒවායින් වඩාත් සැලකිය යුත්තේ රත්තිච්ඡේදය වන කරුණු ය. වත් පිරුයේ ද නො දැන වුවද රත්තිච්ඡේදය වීමෙන් දින සම්පූර්ණ නො වී අබ්භාන කරන ලදුයේ ද ශුධියට නො පැමිණේ. එබැවින් රත්තිච්ඡේදය නො වීමට විශේෂයෙන් පරෙස්සම් විය යුතු ය.

**"තයො බො උපාලි! පාරිවාසිකස්ස භික්ඛුනො රත්තිච්ජෙද සහවාසො. විප්පවාසො. අනාරොචනා ඉමෙ බො උපාලි! තයො පාරිවාසිකස්ස භික්ඛුනො රත්තිච්ජෙද"**

යනුවෙන් සහවාසයය, විප්පවාසයය, අනාරෝචනය යි පාරිවාසික භික්ෂුවට රත්තිච්ඡේදය වන කරුණු තුනක් **චූලවග්ගපාළියෙහි** වදරා තිබේ. **'සහවාසය'** යනු ප්‍රකෘති භික්ෂුවක් සමග හෝ වත්මානත් පුරන භික්ෂුවක් සමග හෝ එක් ගෙයක එක් පියැස්සක් යට ශයනය කිරීම ය. ශයනය කිරීමය යනු නින්ද යාම ම නො වන බව ද සැලකිය යුතුය. නින්ද ගියේ හෝ වේවා නො ගියේ හෝ වේවා නිදන ඉරියව්වෙන් විසීම ම මෙහි අදහස් කරන

Non-commercial distribution

ශයනය ය. වාඩි වී කණුවකට හෝ බිත්තියකට හෝ හේත්තු වී සිටීමේදී නින්ද ගියේ ද ශයනය කෙළේ නො වේ. භික්ෂූන් දෙනමක් එක් ගෙයක වෙසෙන කල්හි එක නමක් ශයනය කරද්දී අනෙක් නම අන් ඉරියව්වකින් විසුවහොත් රත්තිච්ඡේදය නො වේ. දෙදෙනා ම එකවර ශයනය කළහොත් රත්තිච්ඡේදය වේ. දෙදෙනා ම පිරිවෙස් පුරන්නෝ වෙත් නම්, දෙදෙනාට ම රත්තිච්ඡේදය වේ. වත් සමාදන්වූ භික්ෂුවක් ශයනය කරන ගෙට ඒ නමගේ දැනුමක් නැතිව අන් භික්ෂුවක් රාත්‍රියේ වැද, ශයනය කෙළේ ද පාරිවාසිකයාට රත්තිච්ඡේදය වේ. නො දන්නා බැවින් ඇවැත් නො වේ.

**'විප්පවාසය'** යනු භික්ෂූන්ගෙන් වෙන්ව භික්ෂූන් නැති තැනක අරුණ ඉක්මවීමය. **'අනාරෝචනය'** යනු භික්ෂුවක් දැක හෝ භික්ෂුවකගේ හඬ අසා හෝ ආරෝචනය නො කිරීම ය. ගඟකින් මෙතෙර සිටින පාරිවාසික භික්ෂුවක් විසින් ගඟින් එතෙර භික්ෂුවක් දුට ද ආරෝචනය කර ගත නො හැකි වීනම් රත්තිච්ඡේදය වේ.

**"චත්තාරො ඛො උපාලි! මානත්තචාරිකස්ස භික්ඛුනො රත්තිච්ඡෙදා. සහවාසො. විප්පවාසො. අනාරොචනා. ඌනෙ ගණෙ චරණං. ඉමෙ ඛො උපාලි! චත්තාරො මානත්තචාරි කස්ස භික්ඛුනො රත්තිච්ඡෙදා"**

යනුවෙන් සහවාසයය, විප්පවාසයය, අනාරෝචනය ය, අඩු පිරිසෙහි මානත පිරීමය යන කරුණු සතර මානත් පුරන භික්ෂුවගේ රත්තිච්ඡේද කාරණ වශයෙන් වදරා තිබේ. අඩු පිරිසෙහි මානත පිරීමය යනු සතර නමකට අඩු පිරිසෙහි මානත පිරීම ය.

පාරිවාසිකයා විසින් ද, මානත් පුරන්නා විසින් ද වත්-මානත් සමාදන්ව සිටින කාලය තුළදී තමා උපාධ්‍යාය වී උපසම්පද නො කළ යුතු ය. කර්මවාක්‍යය හෝ නො කිය යුතු ය. ඒවා කළ යුතු ම අවස්ථාවක් පැමිණියේ හොත් වත නික්ෂේප කොට කළ යුතුය. නිස නො දිය යුතු ය. තමාගෙන් නිස සමාදන් වී සිටින අන්තේවාසිකයෝ වෙත් නම්, "මම විනය කර්මයක් කරමිය. මාහට වත් නො කළ යුතු ය. ගම් වැදීම් ආදිය සඳහා මගෙන් නො විචාළ යුතු ය" යි ඒ භික්ෂූන්ට කිය යුතු ය. සාමණේරයන්ට ද උපාධ්‍යාය

Non-commercial distribution

නො විය යුතු ය. කලින් තමාගෙන් උපාධ්‍යාය ගත් සාමණේරයෝ වෙත් නම්, ඔවුනට ද එසේම කිය යුතු ය. එසේ කී පසුත් ගුරු ගෞරවයෙන් වත් කරත් නම්, පිළිගැනීමෙන් ඇවැත් නො වේ. යම් ආපත්තියකට වත සමාදන් වූයේ නම් ඒ ඇවතට හෝ එවැනි ඇවතකට හෝ නො පැමිණිය යුතු ය.

විහාරයේ ප්‍රධානයකු වශයෙන් ක්‍රියා නො කළ යුතු ය. පොහෝ දිනයන්හි පාමොක් උදෙසීම හෝ පාමොක් උදෙසීමට ආරාධනය හෝ නො කළ යුතු ය. භික්ෂූන්ට චෝදනා නො කළ යුතු ය. තමා මහලු වුව ද ප්‍රකෘති භික්ෂූන්ගේ ඉදිරියෙන් ගමන් නො කළ යුතු ය. ආසනයෙහි නො හිඳිය යුතු ය. දායකයන්ගේ ආරාධනා පිළිගෙන භික්ෂූන් කැඳවා ගෙන නො යා යුතු ය. සඞ්ඝයා සමග යන කල්හි දෙළොස් රියනක් උපචාරය හැර එකලාව යා යුතු ය. දන ශාලාදියෙහි හිඳින කල්හි ද අන්තිම කෙළවරේ අසුන ගත යුතුය. ප්‍රකෘති භික්ෂූන් බිම ඉන්නා කල්හි ආසනයෙහි නො හිඳිය යුතු ය. ප්‍රකෘති භික්ෂූන් නීචාසනයෙහි ඉන්නා කල්හි තමා උච්චාසනයෙහි නො හිඳිය යුතු ය. විහාරයෙහි වාසය පිණිස සියල්ලට ලාමක සෙනසුන ගත යුතු ය. පොහෝ කිරීමට පවාරණය කිරීමට සඞ්ඝයා රැස්වූ කල්හි ද වත ආරෝචනය කළ යුතු ය. ඒ කාලයේදී වත්මානත් පුරන ඇවතකට නැවත නො පැමිණිය යුතු ය. එවැනි අන් ඇවැතකට ද නො පැමිණිය යුතු ය. වත සමාදන්ව ඉන්නා අවස්ථාවේදී නැවත ගරුකාපත්තියකට පැමිණිය හොත් මුල පටන් නැවත වත්මානත් පුරන්නට සිදු වේ. ඒ ගැන විස්තර **චූලවග්ග පාළියෙන් හා විනය අටුවාවෙන්** දැන ගත යුතු ය.

පිරිවෙස නික්ෂේප නො කොට ම පුරනවා නම් ආරෝචනය කළ භික්ෂූන්ට නැවත ආරෝචනය නො කළාට වරදක් නැත. ආගන්තුකයකු මුණ ගැසුණහොත් ආරෝචනය කළ යුතු ය. දිනපතා නික්ෂේප කරමින් රාත්‍රි කාලයෙහි පමණක් සමාදන් වේ නම්, සමාදන් වන වාරයක් පාසා දිනපතා ම ආරෝචනය කළ යුතු ය. මානත වනාහි නික්ෂේප නො කෙළේ ද, දිනපතා ම සඞ්ඝයාට ආරෝචනය කළ යුතු ය.

Non-commercial distribution

**වත්-මානත් දීමේදී සැලකිය යුත්තක්.**

සමහර අවස්ථාවලදී භික්ෂූන් මඳවීම නිසා කලින් පිරිවෙස්-මානත් ගත් භික්ෂූන් ම ඒවා දීමටත් සහභාගි කරවා ගන්නට සිදු වේ. එබඳු අවස්ථාවලදී පිරිවෙස හෝ මානත නික්ෂේප කොට මිස, සමාදන්වී සිට ගෙන ම තවත් භික්ෂුවකට පිරිවෙස හෝ මානත දීමට සහභාගි නො විය යුතු ය. පිරිවෙස්-මානත් සමාදන්ව වෙසෙන භික්ෂුව ද සඞ්ඝයාට ගණන් ගෙන, දෙන පිරිවෙස හෝ මානත සිඩියට නො පැමිණේ. එය අකර්මයක් වේ. අබ්භාන කර්මය කිරීමේදී ද එය එසේ ම ය.

**පාරිවාසික චතුත්‍ථො චෙ භික්ඛවෙ! පරිවාසං දදෙය්‍ය, මූලාය පටිකස්සෙය්‍ය, මානත්තං දදෙය්‍ය, වීසො අබ්භෙය්‍ය, අකම්මං න ච කරණීයං. මූලාය පටිකස්සනාරහ චතුත්‍ථො චෙ භික්ඛවෙ! පරිවාසං දදෙය්‍ය, මූලාය පටිකස්සෙය්‍ය, මානත්තං දදෙය්‍ය, වීසො අබ්භෙය්‍ය, අකම්මං න ච කරණීයං. මානත්තාරහ චතුත්‍ථො චෙ භික්ඛවෙ! පරිවාසං දදෙය්‍ය, මූලාය පටිකස්සෙය්‍ය, මානත්තං දදෙය්‍ය, වීසො අබ්භෙය්‍ය, අකම්මං න ච කරණීයං. මානත්තචාරිකචතුත්‍ථො චෙ භික්ඛවෙ! පරිවාසං දදෙය්‍ය, මූලාය පටිකස්සෙය්‍ය, මානත්තං දදෙය්‍ය, වීසො අබ්භෙය්‍ය,අකම්මං න ච කරණීයං. අබ්භානාරහ චතුත්‍ථො චෙ භික්ඛවෙ! පරිවාසං දදෙය්‍ය, මූලාය පටිකස්සෙය්‍ය, මානත්තං දදෙය්‍ය, වීසො අබ්භෙය්‍ය, අකම්මං න ච කරණීයං.**

මෙය **මහාවග්ග පාළියේ චම්පෙය්‍ය ඛන්ධකයේ** එන දේශනයකි.

## තීර්ථක පරිවාසය.

බුදුසසුනෙහි පැවිද්ද හා උපසම්පදව ලැබීමට නග්න තීර්ථකයෙකු පැමිණියහොත් ඔහු පැවිදි කොට සාර මසක් පිරිවෙස් දිය යුතු ය. ඔහු උපසම්පද කළ යුත්තේ සාරමස පිරිවෙස් පුරා සම්පූර්ණ කළ පසුව ය. අන්‍යතීර්ථක පූර්වකයා විසින් සඞ්ඝයා වෙත එළඹ, සිවුර ඒකාංස කොට පොරවා භික්ෂූන්ගේ පා වැඳ, උක්කුටිකව හිඳ, වැඳ-ගෙන, මෙසේ පිරිවෙස් ඉල්ලිය යුතු ය.

**අහං භන්තෙ! (තිස්සො) අඤ්ඤතිත්ථියපුබ්බො ඉමස්මිං ධම්මවිනයෙ ආකඞ්ඛාමි උපසම්පදං, සො'හං භන්තෙ! සඞ්ඝං චත්තාරො**

Non-commercial distribution

**මාසෙ පරිවාසං යාචාමි. දුතියම්පි අහං භන්තෙ -පෙ- තතියම්පි අහං භන්තෙ -පෙ- පරිවාසං යාචාමි.**

පිරිවෙස දෙන කර්ම වාක්‍යය.

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (තිස්සො) අඤ්ඤතිත්ථියපුබ්බො ඉමස්මිං ධම්මවිනයෙ ආකඞ්ඛති උපසම්පදං. සො සඞ්ඝං චත්තාරො මාසෙ පරිවාසං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (තිස්සස්ස) අඤ්ඤතිත්ථියපුබ්බස්ස චත්තාරො මාසෙ පරිවාසං දදෙය්‍ය, එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (තිස්සො) අඤ්ඤතිත්ථිය පුබ්බො ඉමස්මිං ධම්මවිනයෙ ආකඞ්ඛති උපසම්පදං, සො සඞ්ඝං චත්තාරො මාසෙ පරිවාසං යාචති. සඞ්ඝො (තිස්සස්ස) අඤ්ඤතිත්ථිය පුබ්බස්ස චත්තාරො මාසෙ පරිවාසං දෙති, යස්සායස්මතො ඛමති (තිස්සස්ස) අඤ්ඤතිත්ථිය පුබ්බස්ස චත්තාරො මාසෙ පරිවාසස්ස දානං, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය. දින්නො සඞ්ඝෙන (තිස්සස්ස) අඤ්ඤතිත්ථිය පුබ්බස්ස චත්තාරො මාසෙ පරිවාසො. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.**

සාරමස පිරිවෙස් පුරා භික්ෂූන් සතුටු කළ පසු අන්‍යතීර්ථක පූර්වකයා උපසම්පද කළ යුතු ය. විස්තර **මහාඛන්ධකයෙන්** දත යුතු ය.

**කුටිවස්තු දේශනා කර්මය.**

කුටිකාරක භික්ෂුව විසින් කුටිය කරන බිම පිරිසිදු කොට සඞ්ඝයා වෙත එළඹ, සිවුර ඒකාංස කොට පෙරවා වැඩිමහලු

Non-commercial distribution

භික්ෂූන්ගේ පා වැඳ, උක්කුටිකව හිඳ, ඇඳිලි බැඳ, මෙසේ තුන් වරක් සඞ්ඝයාගෙන් ඉල්ලුම් කළ යුතු ය.

**"අහං භන්තෙ! සඤ්ඤාචිකාය කුටිං කත්තුකාමො අස්සාමිකං අත්තුද්දෙසං. සො'හං භන්තෙ! සඞ්ඝං කුටිවත්ථුඔලොකනං යාචාමි."**

මෙසේ කුටිකාරක භික්ෂුව විසින් අයැදි කල්හි සඞ්ඝයා වහන්සේ එහි ගොස්, ගෙබිම බලනු රිසි සේක් නම්, එසේ කිරීම යහපති. නො එසේ නම්, ගෙබිම පරීක්ෂා කිරීමට යැවීම සඳහා උපද්‍රව ඇති-නැති බව හා උපචාරය ඇතිනැති බව තේරුම් ගැනීමට සමත් ව්‍යක්ත භික්ෂූන් වහන්සේ සඞ්ඝයා විසින් සම්මත කොට යැවිය යුත්තාහු ය.

සම්මත කිරීමේ කර්ම වාක්‍යය.

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (තිස්සො) භික්ඛු සඤ්ඤාචිකාය කුටිං කත්තුකාමො අස්සාමිකං අත්තුද්දෙසං. සො සඞ්ඝං කුටිවත්ථුඔලොකනං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (බුද්ධරක්ඛිතඤ්ච ධම්මරක්ඛිතඤ්ච) භික්ඛූ සම්මන්නෙය්‍ය (තිස්සස්ස) භික්ඛුනො කුටිවත්ථුං ඔලොකෙතුං; එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (තිස්සො) භික්ඛු සඤ්ඤාචිකාය කුටිං කත්තුකාමො අස්සාමිකං අත්තුද්දෙසං. සො සඞ්ඝං කුටිවත්ථුඔලොකනං යාචති. සඞ්ඝො (බුද්ධරක්ඛිතඤ්ච ධම්මරක්ඛිතඤ්ච) භික්ඛූ සම්මන්නති (තිස්සස්ස) භික්ඛුනො කුටිවත්ථුං ඔලොකෙතුං. යස්සායස්මතො ඛමති (බුද්ධරක්ඛිතස්ස ච ධම්මරක්ඛිතස්ස ච) භික්ඛූනං සම්මුති (තිස්සස්ස) භික්ඛුනො කුටිවත්ථුං ඔලොකෙතුං, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.**

Non-commercial distribution

**සම්මතා සඞ්ඝෙන (බුද්ධරක්ඛිතො ච ධම්ම-රක්ඛිතො ච) භික්ඛූ (තිස්සස්ස) භික්ඛුනො කුටිවත්ථුං ඔලොකෙතුං, ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.**

සම්මුතිය ලැබූ භික්ෂූන් විසින් කුටිය කරන ඉඩමට ගොස්, එය උපද්‍රව සහිත තැනක් ද, කුටිය වටා ගොනුන් දෙදෙනකු යෙදූ කරත්තයකට යාමට තරමට ඉඩ ඇති තැනක් ද යන බව විමසා, උපද්‍රව ඇති තැනක් හෝ උපචාරය නැති තැනක් හෝ වේ නම්, එහි කුටිය නො කළ යුතු බව කුටිකාරක භික්ෂුවට කිය යුතු ය. ඉදින් තැන යහපත් වේ නම්, කුටිය තැනීමට යෝග්‍ය වේ නම්, ඒ බව සඞ්ඝයාට දැන්විය යුතු ය. ඉන්පසු කුටිකාරක භික්ෂුව විසින් සඞ්ඝයා වෙත එළඹ, වැඩිමහලු භික්ෂූන්ගේ පා වැඳ උක්කුටිකව හිඳ ඇඳිලි බැඳ කුටිවස්තු දේශනය කිරීමට අයැදිය යුතු ය.

**කුටිවස්තු දේශනය ඉල්ලීමේ වාක්‍යය.**

**අහං භන්තෙ! සඤ්ඤාචිකාය කුටිං කත්තුකාමො අස්සාමිකං අත්තුද්දෙසං. සො'හං භන්තෙ! සඞ්ඝං කුටිවත්ථුදෙසනං යාචාමි. දුතියම්පි -පෙ- තතියම්පි -පෙ- යාචාමි."**

කුටිවස්තු දේශනය කිරීමේ

කර්ම වාක්‍යය.

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (තිස්සො) භික්ඛු සඤ්ඤාචිකාය කුටිං කත්තුකාමො අස්සාමිකං අත්තුද්දෙසං, සො සඞ්ඝං කුටිවත්ථුදෙසනං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො කුටිවත්ථුං දෙසෙය්‍ය. එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (තිස්සො) භික්ඛු සඤ්ඤාචිකාය කුටිං කත්තුකාමො අස්සාමිකං අත්තුද්දෙසං. සො සඞ්ඝං කුටිවත්ථු දෙසනං යාචති.**

Non-commercial distribution

**සඞෙඝා (තිස්සස්ස) භිකඛුනො කුටිවත්ථුං දෙසෙති. යසසායසමතො ඛමති (තිස්සස්ස) භිකඛුනො කුටිවත්ථු දෙසනා, සො තුණ්හස්ස, යස්ස නකඛමති සො භාසෙය්‍ය.**

**දෙසිතං සඞෙඝන (තිස්සස්ස) භිකඛුනො කුටිවත්ථු. ඛමති සඞඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.**

කුටිවස්තු දේශනය කරවා ගැනීමේ තේරුම, කුටියක් හෙවත් ආවාසයක් තනා ගැනීමට සඞ්ඝයාගේ අනුමතිය ලබා ගැනීම ය. එසේ නො කොට තමාගේ ප්‍රයෝජනය පිණිස දායකයන්ගෙන් ඉල්ලා ගත් දෙයින් කුටියක් තැනූ භික්ෂුවට සඝවෙසෙස් ඇවැත් වේ.

**මහල්ලක විහාර වස්තු දේශනය.**

දායකයකු ඇතිව මහා ආවාසයක් කරන-කරවන භික්ෂුව විසින් ද සඞ්ඝයා ලවා වස්තුදේශනය කරවා ගෙන ම එය කළ යුතු ය. එසේ නො කොට කුටිය කළ හොත් සඝවෙසෙස් ඇවැත් වේ.

**ඉඩම බැලීමට ඉල්ලීමේ වාක්‍යය.**

අහං භන්තෙ! මහල්ලකං විහාරං කත්තුකාමො සස්සාමිකං අත්තුද්දෙසං. සො'හං භන්තෙ! සඞ්ඝං විහාරවත්ථු ඔලොකනං යාචාමි. දුතියම්පි -පෙ- තතියම්පි -පෙ-"

විහාර වස්තු ඕලෝකන සම්මුතිය
දෙන කර්ම වාක්‍යය.

**සුණාතු මෙ භන්තෙ! සඞෙඝා, අයං (තිස්සො) භිකඛු මහල්ලකං විහාරං කත්තුකාමො සසසාමිකං අත්තුදෙදසං. සො සඞඝං විහාරවත්ථු ඔලොකනං**

Non-commercial distribution

යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (බුද්ධරක්ඛිතඤ්ච ධම්මරක්ඛිතඤ්ච) භික්ඛූ සම්මන්නෙය්‍ය (තිස්සස්ස) භික්ඛුනො විහාරවත්ථුං ඔලොකෙතුං. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (තිස්සො) භික්ඛු මහල්ලකං විහාරං කත්තුකාමො සස්සාමිකං අත්තුද්දෙසං. සො සඞ්ඝං විහාරවත්ථු විලොකනං යාචති. සඞ්ඝො (බුද්ධරක්ඛිතඤ්ච ධම්මරක්ඛිතඤ්ච) භික්ඛූ සම්මන්නති (තිස්සස්ස) භික්ඛුනො විහාරවත්ථුං ඔලොකෙතුං. යස්සායස්මතො ඛමති (බුද්ධරක්ඛිතස්ස ච ධම්මරක්ඛිතස්ස ච) භික්ඛූනං සම්මුති (තිස්සස්ස) භික්ඛුනො විහාරවත්ථුං ඔලොකෙතුං සො තුණ්හස්ස. යස්ස නක්ඛමති. සො භාසෙය්‍ය.

සම්මතා සඞ්ඝෙන (බුද්ධරක්ඛිතො ච ධම්මරක්ඛිතො ච) භික්ඛූ (තිස්සස්ස) භික්ඛුනො විහාරවත්ථුං ඔලොකෙතුං. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.

**විහාරවත්ථු දේශනය ඉල්ලීමේ වාක්‍යය.**

අහං භන්තෙ! මහල්ලකං විහාරං කත්තුකාමො සස්සාමිකං අත්තුද්දෙසං, සො'හං භන්තෙ! සඞ්ඝං විහාරවත්ථු දෙසනං යාචාමි. දුතියම්පි -පෙ- තතියම්පි -පෙ-.

විහාරවත්ථු දේශන කර්ම වාක්‍යය.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (තිස්සො) භික්ඛු මහල්ලකං විහාරං කත්තුකාමො සස්සාමිකං

Non-commercial distribution

අත්තුද්දෙසං. සො සඞ්ඝං විහාරවත්ථුං දෙසනං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො විහාරවත්ථුං දෙසෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (තිස්සො) භික්ඛු මහල්ලකං විහාරං කත්තුකාමො සස්සාමිකං අත්තුද්දෙසං. සො සඞ්ඝං විහාරවත්ථුං දෙසනං යාචති. සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො විහාරවත්ථුං දෙසෙති. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො විහාරවත්ථු දෙසනා, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

දෙසිතං සඞ්ඝෙන (තිස්සස්ස) භික්ඛුනො විහාර-වත්ථු. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.

සමනුභාෂණ කර්මය.

යම්කිසි භික්ෂුවක් සඞ්ඝයා භේද කිරීමට තැත් කෙරේ නම්, භේදයට හේතු වන කරුණක් ඉදිරිපත් කර ගෙන ක්‍රියා කෙරේ නම්, සඞ්ඝභේදයට තැත් කරන ඒ භික්ෂුව හමුවන භික්ෂූන් විසින් "ඇවැත්ති! සමගි සඞ්ඝයා භේද කිරීමට උත්සාහ නො කරව, යි ඒ භික්ෂුවට අවවාද කළ යුතු ය. දෙවනුවත් තුන්වෙනුවත් අවවාද කළ යුතු ය. එබඳු භික්ෂුවක් ගැන ආරංචිය ඇසූ භික්ෂූන් විසින් ද සඞ්ඝභේදයට තැත් කරන භික්ෂුව සොයා ගොස් අවවාද කළ යුතුය. අවවාදය අසාද එය නො හරනා භික්ෂුවට, දුකුළා ඇවැත් වේ. සඞ්ඝභේදයට තැත් කරන භික්ෂුව ගැන අසා, අවවාද නො කරන්නා වූ භික්ෂූන්ට ද දුකුළා ඇවැත් වේ. සඞ්ඝභේදයට තැත් කරන භික්ෂුව අවවාදය අසාත් එය අත් නො හරීනම්, අන්‍ය භික්ෂූන් විසින් ඒ භික්ෂුව බලහත්කාරයෙන් වුව ද සඟ මැදට ගෙන සමනුභාෂණ කර්මය කළ යුතු ය.

Non-commercial distribution

කර්ම වාක්‍යය.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. අයං (තිස්සො) භික්ඛු සමග්ගස්ස සඞ්ඝස්ස භෙදාය පරක්කමති. සො තං වත්ථුං න පටිනිස්සජ්ජති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (තිස්සං) භික්ඛුං සමනුභාසෙය්‍ය තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. අයං (තිස්සො) භික්ඛු සමග්ගස්ස සඞ්ඝස්ස භෙදාය පරක්කමති. සො තං වත්ථුං න පටිනිස්සජ්ජති. සඞ්ඝො (තිස්සං) භික්ඛුං සමනුභාසති තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො සමනුභාසනා තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

දුතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ -පෙ- සො භාසෙය්‍ය.

තතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. අයං (තිස්සො) භික්ඛු සමග්ගස්ස සඞ්ඝස්ස භෙදාය පරක්කමති. සො තං වත්ථුං න පටිනිස්සජ්ජති. සඞ්ඝො (තිස්සං) භික්ඛුං සමනුභාසති තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො සමනුභාසනා තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

Non-commercial distribution

**සමනුභට්ඨො සඞ්ඝෙන (තිස්සො) භික්ඛු තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.**

මේ සමනුභාෂණ කර්මය කිරීමේදී සඞ්ඝභේදයට තැත් කරන භික්ෂුවට අදහස නො හළහොත් ඥප්තිය අවසානයේදී දුකුළා ඇවැත් වේ. ප්‍රථම අනුශ්‍රාවණය අවසානයේදී ථුලසි ඇවැත් වේ. දෙවන අනුශ්‍රාවණය අවසානයෙහි ද ථුලසි ඇවැත් වේ. කර්මවාක්‍යාවසානයෙහි සඟවෙසෙස් ඇවැත් වේ.

**සඞ්ඝභේදකයන්ට පක්ෂවන භික්ෂූන්ට**
**කරන සමනුභාෂණ කර්මය.**

සඞ්ඝභේදයට තැත් කරන භික්ෂුවට පක්ෂවන භික්ෂූන්ට ද, අන්‍ය භික්ෂූන් විසින් එසේ නො කරන ලෙස අවවාද කළ යුතු ය. දෙවනුවත්-තුන්වෙනුවත් අවවාද කළ යුතුය, නො පිළිගතහොත් දුකුළා ඇවැත් වේ. දැන ගෙන අවවාද නො කරන භික්ෂුවට ද දුකුළා ඇවැත් වේ. අවවාදය නො පිළිගතහොත් බලයෙන් ම වුව ද ඒ භික්ෂූන් සඟ මැදට පමුණුවා අවවාද කළ යුතු ය. නො පිළිගතහොත් සමනුභාෂණ කර්මය කළ යුතු ය.

කර්ම වාක්‍යය.

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, (බුද්ධරක්ඛිතො ච ධම්මරක්ඛිතො ච) භික්ඛූ (තිස්සස්ස) භික්ඛුනො සඞ්ඝභෙදාය පරක්කමන්තස්ස අනුවත්තකා වග්ග-වාදකා තෙ තං වත්ථුං න පටිනිස්සජ්ජන්ති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (බුද්ධරක්ඛිතඤ්ච ධම්මරක්ඛිතඤ්ච) භික්ඛූ සමනුභාසෙය්‍ය තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය. එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, (බුද්ධරක්ඛිතො ච ධම්මරක්ඛිතො ච) භික්ඛූ (තිස්සස්ස) භික්ඛුනො**

*Non-commercial distribution*

**සඞ්ඝභෙදය පරක්කමන්තස්ස අනුවත්තකා වග්ගවාදකා. තෙ තං වත්ථුං න පටිනිස්සජ්ජන්ති. සඞ්ඝො (බුද්ධරක්ඛිතඤ්ච ධම්මරක්ඛිතඤ්ච) භික්ඛූ සමනුභාසති තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය. යස්සායස්මතො ඛමති (බුද්ධරක්ඛිතස්ස ච ධම්මරක්ඛිතස්ස ච) භික්ඛූනං සමනුභාසනා තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.**

**දුතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ -පෙ- සො භාසෙය්‍ය. තතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ -පෙ- සො භාසෙය්‍ය.**

**සමනුභට්ඨා සඞ්ඝෙන (බුද්ධරක්ඛිතො ච ධම්මරක්ඛිතො ච) භික්ඛු තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.**

දුර්වච භික්ෂුන්ට කරන
සමනුභාෂණ කර්මය.

"ඇවැත්නි; මෙය කළ යුතු ය, මෙය නො කළ යුතුය, ඔබ වහන්සේ මෙනම් ඇවතට පැමිණියාහුය" යනාදීන් භික්ෂූන් විසින් බුදුන් වහන්සේ විසින් පනවා වදාළ සික පද අනුව භික්ෂුවකට අවවාද කරන කල්හි, යම් භික්ෂුවක් එයට ඉඩ නො දේ නම්, "ඇවැත්නි! මාගේ හොඳ නරකින් ඔබ වහන්සේලාට කාරියක් නැත, ඔබවහන්සේලා ඔබ වහන්සේලාට ඇති වැඩක් බලා ගන්නාහුය. මම ද ඔබ වහන්සේලාට හොඳක් නරකක් නො කියමි. ඔබ වහන්සේලා ද මට කිසිවක් නො කියන්නාහුය, යි කියා නම්, භික්ෂූන් විසින් ඒ භික්ෂුවට එසේ නො කරන ලෙස අවවාද කළ යුතු ය. දෙවනුව

Non-commercial distribution

ද, තුන්වනුව ද එසේම අවවාද කළ යුතු ය. නො පිළිගනිත-හොත් ඒ භික්ෂුවට දුකුළා ඇවැත් වේ.

දැනගෙන අවවාද නො කළ හොත් ඒ භික්ෂූන්ට ද දුකුළා ඇවැත් වේ. ඉදින් ඒ භික්ෂුව අවවාදය නො පිළිගත්තේ නම්, සඟමැදට පමුණුවා ද අවවාද කළ යුතුය. දෙවනුවත් තුන්වනුවත් අවවාද කළ යුතුය. නො පිළිගතහොත් සමනුභාෂණ කර්මය කළ යුතු ය.

කර්ම වාක්‍යය මෙසේය:-

**සුණාතු මෙ භන්තෙ! අයං (තිස්සො) භික්ඛු භික්ඛූහි සහධම්මිකං වුච්චමානො අත්තානං අවචනීයං කරොති. සො තං වත්ථුං න පටිනිස්සජ්ජති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (තිස්සං) භික්ඛුං සමනුභාසෙය්‍ය තස්ස පටිනිස්සග්ගාය. එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. අයං (තිස්සො) භික්ඛු භික්ඛූහි සහධම්මිකං වුච්චමානො අත්තානං අවචනීයං කරොති. සො තං වත්ථුං න පටිනිස්සජ්ජති. සඞ්ඝො (තිස්සං) භික්ඛුං සමනුභාසති තස්ස පටිනිස්සග්ගාය. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො සමනුභාසනා තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය. සො තුණ්හස්ස - යස්ස නක්ඛමති. සො භාසෙය්‍ය. දුතියම්පි එතමත්ථං වදමි. -පෙ- තතියම්පි එතමත්ථං වදමි -පෙ-**

**සමනුභට්ඨො සඞ්ඝෙන (තිස්සො) භික්ඛු තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.**

Non-commercial distribution

මේ කර්මවාක්‍යයාගේ අවසානයෙහි දුර්වච භික්ෂුවට සඟ-වෙසෙස් ඇවැත් වේ.

## පබ්බාජනීය කර්මය.

"පබ්බාජනීය" කර්මය යනු වාසය කරන විහාරයෙන් හා ගමෙන් බැහැර කිරීම ය. එය කළ යුත්තේ කුල දූෂණය කරන භික්ෂූන්ට ය. ඒ කර්මය පළමුවරට කර තිබෙන්නේ කීටාගිරියෙහි විසූ අස්සජි පුනබ්බසුක යන භික්ෂූන්ට ය **'අස්සජි පුනබ්බසුක'** යන දෙදෙනා ෂඩ් වර්ගික භික්ෂූන්ට අයත් දෙනමකි. එය කරන කල්හි කුලදූෂණය කරන භික්ෂුව සඟ මැදට පමුණුවා, චෝදනා කොට, වරද සිහි කරවා ඇවත දක්වා කළ යුතු ය.

## පබ්බාජනීය කර්ම වාක්‍යය.

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, ඉමෙ (අස්සජි පුනබ්බසුකා) භික්ඛූ කුලදූසකා පාපසමාචාරා. ඉමෙසං පාපකා සමාචාරා දිස්සන්ති චෙව සුය්‍යන්ති ච. කුලානි ච ඉමෙහි දුට්ඨානි දිස්සන්ති චෙව සුය්‍යන්ති ච. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (අස්සජි පුනබ්බසුකානං) භික්ඛූනං (කීටාගිරිස්මා) පබ්බාජනීය කම්මං කරෙය්‍ය. න (අස්සජි පුනබ්බ-සුකෙහි) (කීටාගිරිස්මිං) වත්ථබ්බන්ති. එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, ඉමෙ (අස්සජි පුනබ්බසුකා) භික්ඛූ කුලදූසකා පාපසමාචාරා. ඉමෙසං පාපකා සමාචාරා දිස්සන්ති චෙව සුය්‍යන්ති ච. කුලානි ච ඉමෙහි දුට්ඨානි දිස්සන්ති චෙව සුය්‍යන්ති ච. සඞ්ඝො (අස්සජි පුනබ්බසුකානං) භික්ඛූනං (කීටාගිරිස්මා) පබ්බාජනීය කම්මං කරොති න (අස්සජි පුනබ්බසුකෙහි) භික්ඛූහි (කීටාගිරිස්මිං)**

Non-commercial distribution

**වත්ථබ්බන්ති. යස්සායස්මතො ඛමති (අස්සජි පුනබ්බසුකානං) භික්ඛූනං (කීටාගිරිස්මා) පබ්බාජනීයකම්මස්සකරණං, න (අස්සජි පුනබ්බසුකෙහි) භික්ඛූහි (කීටාගිරිස්මිං) වත්ථබ්බන්ති. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය. දුතියම්පි එතමත්ථං වදාමි, -පෙ- තතියම්පි එතමත්ථං වදාමි. -පෙ-**

**කතං සඞ්ඝෙන (අස්සජි පුනබ්බසුකානං) භික්ඛූනං (කීටාගිරිස්මා) පබ්බාජනීය කම්මං, න (අස්සජි පුනබ්බසුකෙහි) භික්ඛූ (කීටාගිරිස්මිං) වත්ථබ්බන්ති. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී එවමෙතං ධාරයාමි.**

පබ්බාජනීය කර්මය කරන ලද භික්ෂුව විසින් පිරිය යුතු වත් අටළොසෙකි. සඞ්ඝයාට කීකරුව ඒ වත් අටළොස පුරා භික්මී පබ්බාජනීය කර්මය අවලංගු කරන ලෙස සඞ්ඝයාගෙන් ඉල්ලා සිටි කල්හි සඞ්ඝයා විසින් එය අවලංගු කරනු ලැබේ. අස්සජි පුනබ්බසුකයෝ පබ්බාජනීය කර්මයෙන් නො හික්මී එය කළා වූ භික්ෂූන්ට ගර්හා කරන්නට පටන් ගත්හ.

කුලදූෂණය කිරීමෙන් පබ්බාජනීය කර්මය කරන ලද යම් කිසි භික්ෂුවක් විහාරයෙන් බැහැර නො වී "මේ භික්ෂූහු ඡන්දදියෙන් අගතියට යන්නෝ ය. මෙබඳු ඇවැත් නිසා ඇතැමෙකුට පබ්බාජනීය කර්මය කරන්නාහ. ඇතැමෙකුට නො කරන්නාහ" යි කර්මය කළ භික්ෂූන්ට ගර්හා කෙරේ නම්, දක්නා වූ-අසන්නා වූ අන්‍ය භික්ෂූන් විසින් ඒ භික්ෂුවට විහාරයෙන් බැහැර වන ලෙසත්, සඞ්ඝයාට ගර්හා නො කරන ලෙසත් තුන්වර දක්වා අවවාද කළ යුතුය. නොපිළිගනී නම්, සඟ මැදට ගෙන ඒ භික්ෂුවට අවවාද කළ යුතුය. සඟ මැදදී ද නො පිළිගනී නම්, ඒ භික්ෂුවට සමනුභාෂණ කර්මය කළ යුතුය.

Non-commercial distribution

සමානුභාෂණ කර්ම වාක්‍යය.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. අයං (තිස්සො) භික්ඛු සඞ්ඝෙන පබ්බාජනීය කම්මකතො. භික්ඛු ඡන්දගාමිතා දොසගාමිතා මොහගාමිතා භයගාමිතා පාපෙති. සො තං වත්ථුං න පටිනිස්සජ්ජති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං. සඞ්ඝො (තිස්සං) භික්ඛුං සමනුභාසෙය්‍ය තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (තිස්සො) භික්ඛු සඞ්ඝෙන පබ්බාජනීය කම්මකතො. භික්ඛු ඡන්දගාමිතා දොසගාමිතා මොහගාමිතා භයගාමිතා පාපෙති. සො වත්ථුං න පටිනිස්සජ්ජති. සඞ්ඝො (තිස්සං) භික්ඛුං සමනුභාසති තස්ස පටිනිස්සග්ගාය. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො සමනුභාසනා තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය. දුතියම්පි එතමත්ථං වදාමි - පෙ - තතියම්පි එතමත්ථං වදාමි -පෙ-.

සමනුභට්ඨො සඞ්ඝෙන (තිස්සො) භික්ඛු තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.

මේ කර්මවාක්‍යය කියා අවසාන කරනු සමග ම පබ්බාජනීය කර්මය කළ භික්ෂූන්හට ගර්හා කරන භික්ෂූහු සඝවෙසෙස් ඇවතට පැමිණෙති.

Non-commercial distribution

**පබ්බාජනීය කර්මය සංසිඳවීම.**

පබ්බාජනීය කර්මය කරන ලද භික්ෂුව යම් විහාරයක වෙසෙමින් යම් ගමක කුලදූෂණය කෙළේ නම්, ඒ විහාරයෙහි වෙසෙමින් කුලදූෂණය කළ ගමෙහි පිඩු පිණිස නො හැසිරිය යුතුය. ඒ විහාරයෙහි වෙසෙමින් අන් ගමක පිඩු පිණිස නොහැසිරිය යුතු ය. අනික් විහාරයක වෙසෙමින් හෝ ඒ ගමෙහි පිඩු පිණිස නො හැසිරිය යුතුය. පබ්බාජනීය කර්මය කරන ලද භික්ෂුවට නියමිත අටොළොස් වත පිරිය යුතුය. වත් පිරීම පිළිබඳ කාල නියමයක් නැත. පස්දිනක් වුවද ප්‍රමාණය. වත් පුරා පබ්බාජනීය කර්මය සන්සිඳවන ලෙස ඒ භික්ෂුව විසින් සඞ්ඝයා වෙත එළඹ, සිවුර ඒකාංස කොට පෙරවා මහලු භික්ෂූන්ගේ පා වැඳ උක්කුටිකව හිඳ ඇඳිලි බැඳ යාඥා කළ යුතුය.

**සන්සිඳවීම ඉල්ලීමේ වාක්‍යය.**

**අහං භන්තෙ! සඞ්ඝෙන පබ්බාජනීය කම්මකතො. සම්මා වත්තාමි. ලොමං පාතෙමි. නෙත්ථාරං වත්තාමි. පබ්බාජනීය කම්මස්ස පටිප්පස්සද්ධිං යාචාමි. දුතියම්පි -පෙ- යාචාමි. තතියම්පි -පෙ- යාචාමි.**

කර්මය සන්සිඳවීමේ කර්ම වාක්‍යය.

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. අයං (තිස්සො) භික්ඛු සඞ්ඝෙන පබ්බාජනීය කම්මකතො. සම්මාවත්තති. ලොමං පාතෙති. නෙත්ථාරං වත්තති. පබ්බාජනීය කම්මස්ස පටිප්පස්සද්ධිං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො පබ්බාජනීය කම්මං පටිප්පස්සම්භෙය්‍ය. එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. අයං (තිස්සො) භික්ඛු පබ්බාජනීය කම්මකතො. සම්මා වත්තති. ලොමං පාතෙති. නෙත්ථාරං වත්තති. පබ්බාජනීය**

Non-commercial distribution

කම්මස්ස පටිප්පස්සද්ධිං යාචති. සඬ්ඝො (තිස්සස්ස) භික්ඛුනො පබ්බාජනීයකම්මං පටිප්පස්සම්හෙති. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො පබ්බාජනීය කම්මස්ස පටිප්පස්සද්ධි. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය. දුතියම්පි එතමත්ථං වදාමි. -පෙ- තතියම්පි එතමත්ථං වදාමි.

සුණාතු මෙ භන්තෙ! සඬ්ඝො. අයං (තිස්සො) භික්ඛු සඬ්ඝෙන පබ්බාජනීය කම්මකතො. සම්මා වත්තති. ලොමං පාතෙති. නෙත්ථාරං වත්තති. පබ්බාජනීය කම්මස්ස පටිප්පස්සද්ධිං යාචති. සඬ්ඝො (තිස්සස්ස) භික්ඛුනො පබ්බාජනීය කම්මං පටිප්පස්සම්හෙති. යස්සායස්මතො ඛමති. (තිස්සස්ස) භික්ඛුනො පබ්බාජනීය කම්මස්ස පටිප්පස්සද්ධි. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

පටිප්පස්සද්ධං සඬ්ඝෙන (තිස්සස්ස) භික්ඛුනො පබ්බාජනීයකම්මං. ඛමති සඬ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.

පබ්බාජනීය කර්මය සන්සිඳවීමෙන් පසු ඒ භික්ෂුවට ඒ විහාරයේ වාසය කිරීමට ලැබේ. එහෙත් ඒ භික්ෂුව විසින් දූෂණය කළ කුලවලින් සිවුපසය නො පිළිගත යුතු ය. ඒ භික්ෂුව පසු කාලයේදී රහත් වුවද රහත් වීමෙන් පසු ද කුලවලින් ප්‍රත්‍යය නො පිළිගත යුතු ය. දිවි හිමියෙන් ඒ භික්ෂුවට ඒ කුලවලින් ගන්නා ප්‍රත්‍යය ඇකැප ය. ඒ කුලවල මිනිසුන් "නුඹ වහන්සේ අප දෙන ප්‍රත්‍යය නො පිළි ගන්නේ කුමක් හෙයින් දැ'යි අසා, "පෙර මා විසින් කුල දූෂණය කර ඇති නිසා ය'යි කී කල්හි, ඒ මනුෂ්‍යයෝ 'අපි නුඹ වහන්සේට ඒ නිසා නො දෙමුය, දැන් නුඹ වහන්සේ ගේ

Non-commercial distribution

සිල්වත් බව සලකා ම දෙන්නෙමුය'යි කියන්නාහු නම්, ඉන් පසු ඔවුන්ගේ ප්‍රත්‍යය පිළිගැනීමෙන් ඇවැත් නො වේ.

**අන්‍යවාදකාරෝපන කර්මය.**

අන්‍යවාදකාරෝපන කර්මය නො මනා ක්‍රියා කොට ඇවැත් වලට පැමිණ ඒවා ගැන සඞ්ඝ මධ්‍යයේදී විමසන කල්හි, අනිකක් කියා වරද වසා ගන්නට තැත් කරන භික්ෂූන් සඳහා නියමිත කර්මයෙකි.

කර්මවාක්‍යය මෙසේය:-

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. අයං (ජන්තො) භික්ඛු සඞ්ඝමජ්ඣෙ ආපත්තියා අනුයුඤ්ජියමානො අඤ්ඤෙනඤ්ඤං පටිචරති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං. සඞ්ඝො (ජන්තස්ස) භික්ඛුනො අඤ්ඤවාදකං රොපෙය්‍ය. එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. අයං (ජන්තො) භික්ඛු සඞ්ඝමජ්ඣෙ ආපත්තියා අනුයුඤ්ජියමානො අඤ්ඤෙනඤ්ඤං පටිචරති. සඞ්ඝො (ජන්තස්ස) භික්ඛුනො අඤ්ඤවාදකං රොපෙති. යස්සායස්මතො ඛමති (ජන්තස්ස) භික්ඛුනො අඤ්ඤවාදකස්ස රොපනා. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති. සො භාසෙය්‍ය.**

**රොපිතං සඞ්ඝෙන (ජන්තස්ස) භික්ඛුනො අඤ්ඤවාදකං. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.**

මේ කර්මය කරන්නට පෙර සඟ මැද විචාරන කල අනිකක් කීමෙන් දුකුළා ඇවැත් වේ. අඤ්ඤවාදකාරෝපනයෙන් පසු අනිකක් කීමෙන් පචිති ඇවැත් වේ.

Non-commercial distribution

**විහේසකාරෝපන කර්මය.**

විහේසකාරෝපන කර්මය, වරද කොට සඟ මැද විචාරන කල්හි තුෂ්ණීම්භූතව හිඳ, සඞ්ඝයා වෙහෙසන භික්ෂූන්ට කරන කර්මයෙකි.

කර්ම වාක්‍යය මෙසේය:-

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (ඡන්නො) භික්ඛු සඞ්ඝමජ්ඣෙ ආපත්තියා අනුයුඤ්ජියමානො තුණ්හීභූතො සඞ්ඝං විහෙසෙති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (ඡන්නස්ස) භික්ඛුනො විහෙසකං රොපෙය්‍ය. එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (ඡන්නො) භික්ඛු සඞ්ඝමජ්ඣෙ ආපත්තියා අනුයුඤ්ජියමානො තුණ්හීභූතො සඞ්ඝං විහෙසෙති. සඞ්ඝො (ඡන්නස්ස) භික්ඛුනො විහෙසකං රොපෙති. යස්සායස්මතො ඛමති, (ඡන්නස්ස) භික්ඛුනො විහෙසකස්ස රොපනා, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.**

**රොපිතං සඞ්ඝෙන (ඡන්නස්ස) භික්ඛුනො විහෙසකං. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.**

මේ කර්මය කිරීමෙන් පසු සඟ මැද ඇවතින් විචාරන කල්හි කථා නො කොට සඞ්ඝයා වෙහෙසන භික්ෂුවට පචිති ඇවැත් වේ.

**පාපදෘෂ්ටි ගෙන සිටින භික්ෂූන්ට කරන සමනුභාෂණ කර්මය.**

බුද්ධ කාලයේ අරිෂ්ඨ නැමැති භික්ෂුවක් "පස්කම් සැප විඳින්නා වූ මේ ගිහියෝ සෝවාන් වෙති, සකෘදගාමී වෙති. අනාගාමී වෙති.

Non-commercial distribution

භික්ෂූහු ද මනාප රූප දර්ශනය කෙරෙමින්, ශබ්දයන් අසමින්, ගන්ධයන් ආඝ්‍රාණය කරමින්, රසයන් ආස්වාදනය කරමින්, මෘදු වස්ත්‍රාදියේ පහස විඳිමින් රහත් වෙති. එසේ තිබියදී ස්ත්‍රී ස්පර්ශය වූ එක් දෙයක් පමණක් අන්තරායික වන්නට කරුණක් නැතය" යන දෘෂ්ටිය ගත්තේ ය. ඒ කාරණය නිමිත්ත කොට එබඳු දෘෂ්ටි ගෙන එය නො හැර තදින් අල්ලා ගෙන ඉන්නා භික්ෂූන්ට සමනුභාෂණ කර්මයක් බුදුන් වහන්සේ නියම කළ සේක.

එය කරන්නේ මෙසේ ය. එබඳු පාප දෘෂ්ටියක් ගෙන සිටින්නා වූ භික්ෂුවට දක්නා වූ ද ඇසුවා වූ ද භික්ෂූන් විසින් ඒ දෘෂ්ටිය අත හරිනු පිණිස තුන්වර දක්වා අවවාද කළ යුතු ය. අවවාදය පිළිගෙන දෘෂ්ටිය නො හළේ නම්, දුකුළා ඇවැත් වේ. දැක ද අසා ද අවවාද නො කරන්නා වූ භික්ෂූන්ට ද දුකුළා ඇවැත් වේ. අවවාදය පිළිගෙන දෘෂ්ටිය නො හරිතහොත් ඒ භික්ෂුව සඟ මැදට පමුණුවා ද, තුන්වර දක්වා අවවාද කළ යුතු ය. නො පිළිගතහොත් දුකුළා ඇවැත් නැවත ද වේ. එසේ ද නො පිළිගනී නම්, ඒ භික්ෂුවට සමනුභාෂණ කර්මය කළ යුතු ය.

කර්ම වාක්‍යය

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. (තිස්සස්ස) භික්ඛුනො එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං. තථා.හං භගවතා ධම්මං දෙසිතං ආජානාමි. යථා යෙ මෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා. තෙ පටිසෙවතො නාලං අන්තරායායාති. සො තං දිට්ඨිං න පටිනිස්සජ්ජති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො (තිස්සං) භික්ඛුං සමනුභාසෙය්‍ය තස්සා දිට්ඨියා පටිනිස්සග්ගාය. එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. (තිස්සස්ස) භික්ඛුනො එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං. "තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා**

Non-commercial distribution

යෙ මෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායාති." සො තං දිට්ඨිං න පටිනිස්සජ්ජති. සඞ්ඝො (තිස්සං) භික්ඛුං සමනුභාසති තස්සා දිට්ඨියා පටිනිස්සග්ගාය. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො සමනුභාසනා තස්සා දිට්ඨියා පටිනිස්සග්ගාය. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

දුතියම්පි එතමත්ථං වදාමි. -පෙ- තතියම්පි එතමත්ථං වදාමි.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, (තිස්සස්ස) භික්ඛුනො එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං, තථාහං භගවතො ධම්මං දෙසිතං ආජානාමි, යථා යෙ මෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායාති. සො තං දිට්ඨිං න පටිනිස්සජ්ජති. සඞ්ඝො (තිස්සං) භික්ඛුං සමනුභාසති තස්සා දිට්ඨියා පටිනිස්සග්ගාය. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො සමනුභාසනා තස්සා දිට්ඨියා පටිනිස්සග්ගාය. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

සමනුභට්ඨො සඞ්ඝෙන (තිස්සො) භික්ඛු තස්සා දිට්ඨියා පටිනිස්සග්ගාය. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි

මේ කර්මය අවසන් වනු සමග ම දෘෂ්ටිය ගෙන සිටින භික්ෂුවට පචිති ඇවැත් වේ.

Non-commercial distribution

## මිසදිටු ගත් සාමණේරයන්ට කරන නිස්සාරණ කර්මය

සාමණේරයෙක් බුදුන්ගේ හෝ දහම්හි හෝ සඟුන්ගේ හෝ අගුණ කියා නම්, අකප්පියය කැප යයි කියා නම්, මිසදිටු ගන්නේ නම්, ඔහුට තුන්වර දක්වා ඒ වරද හරනා පිණිස අවවාද කළ යුතු ය. ඉදින් සාමණේරයා ඒ ලබ්ධිය නො හරින්නේ නම් සඞ්ඝයා රැස් කොට සඟ මැදදී ඒ ලබ්ධිය හැර දමන ලෙස කිය යුතු ය. ඉදින් සාමණේරයා ලබ්ධිය හළේ නම් යහපති. නො හරණේ නම්, ඔහුට නිස්සාරණ කර්මය කළ යුතු ය, එය චතුර්විධ කර්මයන් අතුරෙන් අපලෝකන කර්මයෙකි. එය කරන කල්හි ව්‍යක්ත භික්ෂුවක් විසින් මතු දැක්වෙන වාක්‍යයෙන් සාමණේරයා බැහැර කරන බව දැන්විය යුතු ය.

කර්ම වාක්‍යය.

**සඞ්ඝං භන්තෙ! පුච්ඡාමි. අයං (කණ්ඨකො) සාමණෙරො බුද්ධස්ස ධම්මස්ස සඞ්ඝස්ස අවණ්ණවාදී මිච්ඡාදිට්ඨිකො, යං අඤ්ඤෙ සාමණෙරා ලභන්ති භික්ඛූහි සද්ධිං ද්විරත්තතිරත්තං සහසෙය්‍යං, තස්සා අලාභාය නිස්සාරණා රුච්චති සඞ්ඝස්ස.**

**දුතියම්පි සඞ්ඝං භන්තෙ පුච්ඡාමි. -පෙ- නිස්සාරණා රුච්චති සඞ්ඝස්ස.**

**තතියම්පි සඞ්ඝං භන්තෙ පුච්ඡාමි. -පෙ- නිස්සාරණා රුච්චති සඞ්ඝස්ස.**

මෙසේ සඞ්ඝයාට දන්වා "නො හික්මුණු සාමණේරය! යව විනාශ වෙව" යි සාමණේරයාට කිය යුතු ය. මෙසේ නිස්සාරණය කළ සාමණේරයා සියලුම භික්ෂූන් විසින් වර්ජනය කළ යුතු ය. එසේ බැහැර කළ සාමණේරයාට සංග්‍රහ කරන්නා වූ ද, ඒ සාමණේරයාගේ උපස්ථානය පිළිගන්නා වූ ද, ඔහු හා ධර්මාමිෂ

Non-commercial distribution

සම්භෝගය කරන්නා වූ ද, එක් ආවාසයක සයනය කරන්නා වූ ද භික්ෂුවට පචිති ඇවැත් වේ.

ඕසාරණය.

නිස්සාරණය කරනු ලැබූ සාමණේරයා භික් මී දුර්ලබ්ධි හැර සඞ්ඝයාගෙන් ක්ෂමාව ඇයද සිටිය හොත්, ඔහු නිස්සාරණ කර්මය ඉවත් කරන ලෙස තුන්වරක් යාඥා කරවා අපලෝකන කර්මයෙන් ම නිස්සාරණය කළ යුතු ය.

කර්ම වාක්‍යය.

**සඞ්ඝං භන්තෙ! ආපුච්ඡාමි. අයං (කණ්ඨකො) සාමණෙරො බුද්ධස්ස ධම්මස්ස සඞ්ඝස්ස අවණ්ණවාදී මිච්ඡාදිට්ඨිකො, යං අඤ්ඤෙ සාමණෙරා ලභන්ති දවිරත්ත තිරත්තං භික්ඛූහි සද්ධිං සහසෙය්‍යං, තස්සා අලාභාය නිස්සාරිතො. ස්වායං ඉදානි ඔරතො විරතො ලජ්ජිධම්මං ඔක්කන්තො, හිරොත්තප්පෙ පතිට්ඨිතො, කතදණ්ඩ කම්මො, අච්චයං දෙසෙති. ඉමස්ස සාමණෙරස්ස යථා පුරෙ කායසම්භොග සාමග්ගිදානං. රුච්චති සඞ්ඝස්ස.**

**දුතියම්පි -පෙ- තතියම්පි -පෙ-**

බ්‍රහ්ම දණ්ඩය.

සබ්‍රහ්මචාරීන්ගේ අවවාදනුශාසනා නො පිළිගනිමින් භික්ෂූන්ට ආක්‍රෝශ කරමින් හැසුරුණු ඡන්න නම් වූ භික්ෂුවට තථාගතයන් වහන්සේ බ්‍රහ්ම දණ්ඩය නියම කළ සේක. **"යො අඤ්ඤෙදා'පි භික්ඛු මුඛරො හොති භික්ඛුං දුරුත්තවචනෙහි සට්ටෙන්තො ඛුංසෙන්තො වම්භෙන්තො විහරති තස්සා'පි දාතබ්බො"** යනුවෙන් භික්ෂූන්ට නො මනා වචනයෙන් බෙණෙමින් කරදර කරන අන්‍ය පරුෂ භික්ෂූන්ට ද ඒ දඬුවම දියයුතු බව විනය අටුවාවෙහි දක්වා ඇත්තේ ය. ඒ දඬුවම දියයුත්තේ ද අපලෝකන කර්මයෙනි.

Non-commercial distribution

කර්ම වාක්‍යය.

**භන්තෙ (ඉත්ථං නාමො) භික්ඛු මුඛරො. භික්ඛු දුරුත්තවචනෙහි ඝට්ටෙන්තො විහරති. සො භික්ඛු යං ඉච්ඡෙය්‍ය තං වදෙය්‍ය. භික්ඛූහි (ඉත්ථං නාමො) භික්ඛු නෙව වත්තබ්බො, න ඔවදිතබ්බො, න අනුසාසිතබ්බො. සඞ්ඝං භන්තෙ පුච්ඡාමි (ඉත්ථන්නාමස්ස) භික්ඛුනො බ්‍රහ්මදණ්ඩස්ස දානං. රුච්චති සඞ්ඝස්ස.**

**දුතියම්පි -පෙ- තතියම්පි -පෙ-**

මේ කර්මය කළ පසු ඒ භික්ෂුව කුමක් කීවත් අන්‍ය භික්ෂූන් ඔහුට කිසිවක් නො කියනු ලැබේ. අවවාදනුශාසනා නො කරනු ලැබේ. ඒ භික්ෂුව පසුව හික්මී නපුරු ගති හැර සඞ්ඝයාගෙන් සමාව ඉල්ලුව හොත් එය සඞ්ඝයා විසින් නැවත ඉවත් කරනු ලැබේ.

ඉවත් කිරීමේ කර්ම වාක්‍යය.

**භන්තෙ! භික්ඛුසඞ්ඝො (අසුකස්ස) භික්ඛුනො බ්‍රහ්මදණ්ඩං අදාසි. සො භික්ඛු සොරතො නිවාතවුත්ති ලජ්ජිධම්මං ඔක්කන්තො, හිරොත්තප්පෙ පතිට්ඨිතො, පටිසඞ්ඛා ආයතිං සංවරෙ තිට්ඨති. සඞ්ඝං භන්තෙ! පුච්ඡාමි තස්ස භික්ඛුනො බ්‍රහ්මදණ්ඩස්ස පටිප්පස්සද්ධිං. රුච්චති සඞ්ඝස්ස.**

**දුතියම්පි -පෙ- තතියම්පි -පෙ-**

**මෝහාරෝපන කර්මය.**

ඇතැම් භික්ෂූහු පාමොක් උදෙසන කල්හි සැලකිල්ලෙන් නො අසා, පසුව වරද කොට, "මෙය වරදක් බව-මෙයට ඇවතත් ඇති බව-අපි කලින් දැන නො සිටියෙමුය, මෙබඳු සික‍්පදයක්

Non-commercial distribution

ඇති බව අප දැන ගත්තේ දැන්ය'යි කියමින් කළ වරද නො දැනීමෙන් කළ එකක් බව සඞ්ඝයාට ඇඟවීමට උත්සාහ කරති. මෝහාරෝපන කර්මය එසේ කරන භික්ෂූන් හික්මවීම සඳහා නියමිත කර්මයෙකි.

සිකපද, නො දැනීම ඇවතින් මිදීමට කරුණක් නො වේ. එබැවින් කලින් දැන නො සිටීමෙන් වරද කළ බව කියන භික්ෂුව ලවා සිදු වූ ඇවැත දෙසවා, ඒ භික්ෂුව කලින් දෙතුන් වරක්වත් පාමොක් ඇසීමට පැමිණි බව භික්ෂූහු දනිත් නම්, වරද කළ භික්ෂුවට මෝහාරෝපන කර්මය කළ යුතුය.

එය කරන කර්ම වාක්‍යය මෙසේ ය.

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. අයං (තිස්සො) භික්ඛු පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ න සාධුකං අට්ඨිකත්වා මනසිකරොති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං. සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො මොහං ආරොපෙය්‍ය. එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. අයං (තිස්සො) භික්ඛු පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ න සාධුකං අට්ඨිකත්වා මනසිකරොති. සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො මොහං ආරොපෙති. යස්සායස්මතො ඛමති. (තිස්සස්ස) භික්ඛුනො මොහස්ස ආරොපනා, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.**

**ආරොපිතො සඞ්ඝෙන (තිස්සස්ස) භික්ඛුනො මොහො. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.**

මේ කර්මය කළ පසුත් සිකපදය නො දත් බව කියන භික්ෂුවට පචිති ඇවැත් වේ.

Non-commercial distribution

**තජ්ජනීය කර්මය.**

බුද්ධකාලයේදී භික්ෂූන් හා නිතර ඩබර කර ගත්තාවූ, කෝලාහල කරගත්තාවූ, වාද ඇති කර ගත්තාවූ, සඞ්ඝයාට නිතර නඩු පැමිණිලි කළාවූ, එබඳු අන්‍ය භික්ෂූන්ටත් එසේ කිරීමට අනුශාසනය කළා වූ **පණ්ඩුක ලෝහිතක** යන භික්ෂූන් දෙදෙන නිමිත්ත කොට, එබඳු භික්ෂූන් හික්මවනු පිණිස තථාගතයන් වහන්සේ මේ තජ්ජනීය කර්මය වදාළසේක. එය කරන කල්හි කෝලාහල කරන භික්ෂූන් සඟ මැදට පමුණුවා, ඔවුනට චෝදනා කොට කළ වරද මතක් කරදී, සිදු වූ ඇවැත දක්වා කර්මය කළ යුතු ය.

කර්ම වාක්‍යය මෙසේය.

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, ඉමෙ (පණ්ඩුක ලොහිතකා) භික්ඛූ අත්තනා භණ්ඩනකාරකා කලහකාරකා විවාදකාරකා භ ස්සකාරකා සඞ්ඝෙ අධිකරණකාරකා, යෙපි චඤ්ඤෙ භික්ඛූ භණ්ඩනකාරකා කලහකාරකා විවාදකාරකා භස්සකාරකා සඞ්ඝෙ අධිකරණකාරකා, තෙ උපසඞ්කමිත්වා එවං වදන්ති "මා ඛො තුම්හෙ ආයස්මන්තො එසො අජෙසි, බලවා බලවං පටිමන්තෙථ, තුම්හෙ තෙන පණ්ඩිතතරා ච බ්‍යත්තතරා ච බහුස්සුතතරා ච අලමත්තතරා ච, මා චස්ස භායිත්ථ, මයම්පි තුම්හාකං පක්ඛා භවිස්සමා" ති. තෙන අනුප්පන්නානි චෙව භණ්ඩනානි උප්පජ්ජන්ති උප්පන්නානි ච භණ්ඩනානි භීයොභාවාය වෙපුල්ලාය සංවත්තන්ති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (පණ්ඩුක ලොහිතකානං) භික්ඛූනං තජ්ජනීයකම්මං කරෙය්‍ය. එසා ඤත්ති.**

Non-commercial distribution

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, ඉමෙ (පණ්ඩුක ලොහිතකා) භික්ඛූ අත්තනා භණ්ඩන කාරකා -පෙ- සඞ්ඝො අධිකරණ කාරකා, යෙපි චඤ්ඤෙ භික්ඛූ භණ්ඩනකාරකා -පෙ- සඞ්ඝෙ අධිකරණ-කාරකා, තෙ උපසඞ්කමිත්වා එවං වදන්ති "මා ඛො තුම්හෙ ආයස්මන්තො එසො අජෙසි, බලවා බලවං පටිමන්තෙථ තුම්හෙ තෙන පණ්ඩිතතරා ච බ්‍යත්තතරා ච බහුස්සුතතරා ච අලමත්තතරා ච මා චස්ස භායිත්ථ, මයම්පි තුම්හාකං පක්ඛා භවිස්සාමා" ති තෙන අනුප්පන්නානි ච භණ්ඩනානි උප්පජ්ජන්ති. උප්පන්නානි ච භණ්ඩනානි භීය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තන්ති. සඞ්ඝො (පණ්ඩුක ලොහිතකානං) භික්ඛූනං තජ්ජනීය කම්මං කරොති. යස්සායස්මතො ඛමති (පණ්ඩුක ලොහිතකානං) භික්ඛූනං තජ්ජනීය කම්මස්ස කරණං. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති. සො භාසෙය්‍ය.

දුතියම්පි එතමත්ථං වදම්. සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, ඉමෙ (පණ්ඩුක ලොහිතකා) භික්ඛූ අත්තනා භණ්ඩනකාරකා -පෙ- සඞ්ඝෙ අධිකරණකාරකා, යෙ'පි චඤ්ඤෙ භික්ඛූ භණ්ඩනකාරකා -පෙ- සඞ්ඝෙ අධිකරණකාරකා, තෙ උපසඞ්කමිත්වා එවං වදන්ති බලවා බලවං පටිමන්තෙථ, තුම්හෙ තෙන පණ්ඩිතතරා ච බ්‍යත්තතරා ච බහුස්සුතතරා ච අලමත්තතරා ච,. මා චස්ස භායිත්ථ, මයම්පි තුම්හාකං පක්ඛා භවිස්සාමා"ති. තෙන අනුප්පන්නානි චෙව භණ්ඩනානි උප්පජ්ජන්ති. උප්පන්නානි ච

Non-commercial distribution

භණ්ඩනානි භියෝභාවාය වෙපුල්ලාය සංවත්තන්ති. සඞ්ඝො (පණ්ඩුක ලොහිතකානං) භික්ඛූනං තජ්ජනීයකම්මං කරොති යස්සායස්මතො ඛමති (පණ්ඩුක ලොහිතකානං) භික්ඛූනං තජ්ජනීය කම්මස්ස කරණං. සො තුණ්හස්ස, යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

තතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, ඉමෙ (පණ්ඩුක ලොහිතකා) භික්ඛූ අත්තනා භණ්ඩනකාරකා -පෙ- සඞ්ඝෙ අධිකරණකාරකා, යෙ'පි චඤ්ඤෙ භික්ඛූ භණ්ඩනකාරකා -පෙ- සඞ්ඝෙ අධිකරණකාරකා තෙ උපසඞ්කමිත්වා එවං වදන්ති "මා ඛො තුම්හෙ ආයස්මන්තො එසො අජෙසි, බලවා බලවං පටිමන්තෙථ තුම්හෙ තෙන පණ්ඩිතතරා ච ව්‍යත්තතරා ච බහුස්සුතතරා ච අලමත්තතරා ච, මා චස්ස භායිත්ථ, මයම්පි තුම්හාකං පක්ඛා භවිස්සාමා" ති තෙන අනුප්පන්නානි චෙව භණ්ඩනානි උප්පජ්ජන්ති. උප්පන්නානි ච භණ්ඩනානි භියෝභාවාය වෙපුල්ලාය සංවත්තන්ති. සඞ්ඝො (පණ්ඩුක ලොහිතකානං) භික්ඛූනං තජ්ජනීය කම්මං කරොති. යස්සා- යස්මතො ඛමති. (පණ්ඩුක ලොහිතකානං) භික්ඛූං තජ්ජනීයකම්මස්ස කරණං, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති. සො භාසෙය්‍ය.

කතං සඞ්ඝෙන (පණ්ඩුක ලොහිතකානං) භික්ඛූනං තජ්ජනීය කම්මං. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.

Non-commercial distribution

## තජ්ජනීය කර්මය කරන ලද භික්ෂූන් විසින් පිළිපැදිය යුතු අටොළොස් වත

තජ්ජනීය කර්මය කරනු ලැබූ භික්ෂුව විසින් -

1. උපාධ්‍යාය වී හෝ කර්මාචාර්‍ය වී හෝ උපසම්පද නො කළ යුතු ය.
2. උපාධ්‍යාය වී කුල දරුවන් පැවිදි නො කළ යුතු ය.
3. භික්ෂූන්ට නිස නො දිය යුතු ය.
4. භික්ඛුනෝවාද සම්මුතිය නො පිළිගත යුතු ය.
5. කලින් සම්මුතිය ලබා ඇත්තේ ද භික්ෂුණීන්ට අවවාද නො කළ යුතු ය.
6. යම් ඇවතක් නිසා තජ්ජනීය කර්මය කරන ලදුයේ නම්, ඒ ඇවතට නො පැමිණිය යුතු ය.
7. එවැනි අන් ඇවතකට ද නො පැමිණිය යුතු ය.
8. එයට පවිටු ඇවතකට ද නො පැමිණිය යුතු ය.
9. තජ්ජනීය කර්මයට ගර්හා නො කළ යුතු ය.
10. ඒ කර්මය කළ භික්ෂූන්ට ද ගර්හා නො කළ යුතු ය.
11. ප්‍රකෘති භික්ෂුවකගේ උපෝසථය නො තැබිය යුතු ය.
12. ප්‍රකෘති භික්ෂුවකගේ පවාරණය නො තැබිය යුතු ය.
13. ප්‍රකෘති භික්ෂුවක් ඇසිය යුත්තකු නො කළ යුතු ය.
14. විහාරයෙහි දෙටුබව නො කළ යුතු ය.
15. වරදක් කීමට ප්‍රකෘති භික්ෂුවක් ලවා අවකාශ නො කරවා ගත යුතු ය.
16. ප්‍රකෘති භික්ෂුවකට චෝදනා නො කළ යුතු ය.
17. අනුන් ලවා ඔවුන් ගේ ඇවැත් සිහි නො කර විය යුතු ය.
18. භික්ෂූන් කෝලාහල කිරීමෙහි නො යෙදවිය යුතු ය.

Non-commercial distribution

**තජ්ජනීය කර්මය ඉවත් කිරීම.**

තජ්ජනීය කර්‍මය කරනු ලැබූ භික්ෂූන් විසින් ඉහත කී අටොළොස් වත පුරා හික්මී, සඞ්ඝයාගෙන් කර්මය ඉවත් කරන ලෙස ඉල්ලා සිටියහොත්, සඞ්ඝයා විසින් තජ්ජනීය කර්මය ඉවත් කළ යුතු ය. ඒ භික්ෂූන් විසින් සඞ්ඝයා වෙත එළඹ, සිවුරු ඒකාංස කොට පොරවා, වැඩි මහලු භික්ෂූන්ගේ පා වැඳ, උක්කුටිකව හිඳ ඇඳිලි බැඳ, මතු දැක්වෙන වාක්‍යය තුන්වරක් කියා තජ්ජනීය කර්මය ඉවත් කරන ලෙස ඉල්ලිය යුතු ය.

**මයං භන්තෙ සඞ්ඝෙන තජ්ජනීයකම්මකතා. සම්මා වත්තාම. ලොමං පාතෙම. නෙත්ථාරං වත්තාම. තජ්ජනීයකම්මස්ස පටිප්පස්සද්ධිං යාචාම. දුතියම්පි -පෙ- තතියම්පි -පෙ-**

ඉවත් කිරීමේ කර්‍ම වාක්‍යය.

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, ඉමෙ (පණ්ඩුක ලොහිතකා) භික්ඛූ සඞ්ඝෙන තජ්ජනීයකම්මකතා. සම්මා වත්තන්ති. ලොමං පාතෙන්ති. නෙත්ථාරං වත්තන්ති. තජ්ජනීයකම්මස්ස පටිප්පස්සද්ධිං යාචන්ති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (පණ්ඩුක ලොහිතකානං) භික්ඛූනං තජ්ජනීයකම්මං පටිප්පස්සම්භෙය්‍ය. එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, ඉමෙ (පණ්ඩුක ලොහිතකා) භික්ඛූ සඞ්ඝෙන තජ්ජනීයකම්මකතා. සම්මා වත්තන්ති. ලොමං පාතෙන්ති. නෙත්ථාරං වත්තන්ති. තජ්ජනීයකම්මස්ස පටිප්පස්සද්ධිං යාචන්ති. සඞ්ඝො (පණ්ඩුක ලොහිතකානං) භික්ඛූනං තජ්ජනීය කම්මං පටිප්පස්සම්භෙති. යස්සායස්මතො ඛමති. (පණ්ඩුක ලොහිතකානං) භික්ඛූනං තජ්ජ-**

Non-commercial distribution

නීය කම්මස්ස පටිප්පස්සද්ධි, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

දුතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. ඉමෙ (පණ්ඩුක ලොහිතකා) -පෙ- සඞ්ඝො (පණ්ඩුක ලොහිතකානං) භික්ඛූනං තජ්ජනීයකම්මං පටිප්පස්සම්භෙති. යස්සායස්මතො ඛමති (පණ්ඩුක ලොහිතකානං) භික්ඛූනං තජ්ජනීය කම්මස්ස පටිප්පස්සම්භෙති, යස්සායස්මතො ඛමති (පණ්ඩුක ලොහිතකානං) භික්ඛූනං තජ්ජනීයකම්මස්ස පටිප්පස්සද්ධි. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

තතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. ඉමෙ (පණ්ඩුක ලොහිතකා) භික්ඛූ -පෙ- තජ්ජනීයකම්මස්ස පටිප්පස්සද්ධිං යාචන්ති. සඞ්ඝො (පණ්ඩුක ලොහිතකානං) භික්ඛූනං තජ්ජනීයකම්මං පටිප්පස්සම්භෙති. යස්සායස්මතො ඛමති (පණ්ඩුක ලොහිතකානං) භික්ඛූනං තජ්ජනීයකම්මස්ස පටිප්පස්සද්ධි, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

පටිප්පස්සද්ධං සඞ්ඝෙන (පණ්ඩුක ලොහිත-කානං) භික්ඛූනං තජ්ජනීයකම්මං ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.

**නියස්ස කර්‍මය**

නුසුදුසු පරිදි ගිහියන් හා ආශ්‍රය කළාවූ, බාලවූ අව්‍යක්තවූ, එහෙයින් ම නිතර ඇවැත්වලට පැමිණියා වූ, බොහෝ ඇවැත්වලට පැමිණියාවූ, පිරිවෙස් ගැනීම්-මානත් ගැනීම්-අබ්භාන කරවා ගැනීම් ආදියෙන් නිතර සඞ්ඝයාට කරදර ඇති කළාවූ **සෙය්‍යසක**

Non-commercial distribution

භික්ෂුව නිමිත්ත කොට තථාගතයන් වහන්සේ විසින් නියස්ස කර්මය වදාරන ලද්දේ ය. නියස්ස කර්මයෙහි අදහස භික්ෂුවකට නිස සමාදන් වී ආචාර්යවරයකු යටතේ විසීමට නියම කිරීම ය. එය කරන කල්හි ආපත්ති බහුල අඥාන භික්ෂුව සහ මැදට පමුණුවා, චෝදනා කොට වරද සිහි කරවා ඇවැත් දක්වා කළ යුතු ය.

කර්මවාක්‍යය මෙසේ ය:-

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (සෙය්‍යසකො) භික්ඛු බාලො අව්‍යත්තො ආපත්ති බහුලො අනපදානො ගිහී සංසට්ඨො විහරති අනනුලොමිකෙහි ගිහී සංසග්ගෙහි. අපිස්සු භික්ඛූ පකතා පරිවාසං දෙන්තා මූලාය පටිකස්සන්තා මානත්තං දෙන්තා අබ්භෙන්තා. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (සෙය්‍යසකස්ස) භික්ඛුනො නියස්ස කම්මං කරෙය්‍ය නිස්සාය තෙ වත්ථබ්බන්ති. එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. අයං (සෙය්‍යසකො) භික්ඛු බාලො අව්‍යත්තො ආපත්ති බහුලො අනපදානො ගිහී සංසට්ඨො විහරති අනනුලොමිකෙහි ගිහී සංසග්ගෙහි. අපිස්සු භික්ඛූ පකතා පරිවාසං දෙන්තා මූලාය පටිකස්සන්තා මානත්තං දෙන්තා අබ්භෙන්තා. සඞ්ඝො (සෙය්‍යසකස්ස) භික්ඛුනො නියස්ස කම්මං කරොති නිස්සාය තෙ වත්ථබ්බන්ති. යස්සායස්මතො ඛමති (සෙය්‍යසකස්ස) භික්ඛුනො නියස්ස කම්ම කරණං, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.**

**දුතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (සෙය්‍යසකො) භික්ඛු බාලො අව්‍යත්තො**

Non-commercial distribution

ආපත්තිබහුලො අනපදානො ගිහීසංසට්ඨො විහරති අනනුලෝමිකෙහි ගිහීසංසග්ගෙහි. අපිස්සු භික්ඛු පකතා පරිවාසං දෙන්තා මූලාය පටිකස්සන්තා මානත්තං දෙන්තා අබ්භෙන්තා. සඞ්ඝො (සෙය්‍යස-කස්ස) භික්ඛුනො නියස්ස කම්මං කරොති නිස්සාය තෙ වත්ථබ්බන්ති. යස්සායස්මතො ඛමති (සෙය්‍යසකස්ස) භික්ඛුනො නියස්ස කම්මස්ස කරණං නිස්සාය තෙ වත්ථබ්බන්ති, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

තතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො, අයං (සෙය්‍යසකො) භික්ඛු බාලො අව්‍යත්තො ආපත්ති බහුලො අනපදානො ගිහී සංසට්ඨො විහරති, අනනුලොමිකෙහි ගිහී සංසග්ගෙහි. අපිස්සු භික්ඛු පකතා පරිවාසං දෙන්තා මූලාය පටිකස්සන්තා මානත්තං දෙන්තා අබ්භෙන්තා. සඞ්ඝො (සෙය්‍ය-සකස්ස) භික්ඛුනො නියස්ස කම්මං කරොති නිස්සාය තෙ වත්ථබ්බන්ති. යස්සායස්මතො ඛමති (සෙය්‍යසකස්ස) භික්ඛුනො නියස්ස කම්මස්ස කරණං, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

කතං සඞ්ඝෙන (සෙය්‍යසකස්ස) භික්ඛුනො නියස්ස කම්මං නිස්සාය තෙ වත්ථබ්බන්ති. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.

**නියස්ස කර්මය ඉවත් කිරීම**

නියස්ස කර්මය කරනු ලැබූ භික්ෂුව විසින් පිළිපැදිය යුත්තේ ද තජ්ජනීය කර්මය කරන ලද භික්ෂූන් විසින් පිළිපැදිය යුතු

Non-commercial distribution

පරිදිම ය. ගුරුවරයකු ඇසුරු කර වෙසෙමින් අටළොස් වත පුරා හික්මී, නියස්ස කර්මය ඉවත් කරන ලෙස සඞ්ඝයාට යාඥා කළ යුතු ය. එකල්හි සඞ්ඝයා විසින් නියස්ස කර්මය ඉවත් කරනු ලැබේ.

**ඉවත් කිරීම ඉල්ලීමේ වාක්‍යය**

**අහං භන්තෙ සඞ්ඝෙන නියස්ස කම්ම කතො සම්මා වත්තාමි. ලොමං පාතෙමි. නෙත්ථාරං වත්තාමි. නියස්ස කම්මස්ස පටිප්පස්සද්ධිං යාචාමි. දුතියම්පි -පෙ- තතියම්පි -පෙ-**

නියස්ස කර්මය ඉවත් කිරීමේ

කර්ම වාක්‍යය.

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. අයං (සෙය්‍යසකො) භික්ඛු සඞ්ඝෙන නියස්ස කම්ම කතො සම්මා වත්තති. ලොමං පාතෙති. නෙත්ථාරං වත්තති. නියස්ස කම්මස්ස පටිප්පස්සද්ධිං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං. සඞ්ඝො (සෙය්‍යසකස්ස) භික්ඛුනො නියස්ස කම්මං පටිප්පස්සම්භෙය්‍ය. එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. අයං (සෙය්‍යසකො) භික්ඛු සඞ්ඝෙන නියස්ස කම්ම කතො සම්මා වත්තති. ලොමං පාතෙති. නෙත්ථාරං වත්තති. නියස්ස කම්මස්ස පටිප්පස්සද්ධිං යාචති. සඞ්ඝො (සෙය්‍යසකස්ස) භික්ඛුනො නියස්ස කම්මං පටිප්පස්සම්භෙති. යස්සායස්මතො ඛමති (සෙය්‍යසකස්ස) භික්ඛුනො නියස්ස කම්මස්ස පටිප්පස්සද්ධි, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.**

**දුතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අයං (සෙය්‍යසකො) භික්ඛු සඞ්ඝෙන නියස්ස**

Non-commercial distribution

කම්මකතො. සම්මා වත්තති. ලොමං පාතෙති. නෙත්ථාරං වත්තති. තියස්ස කම්මස්ස පටිප්පස්සද්ධිං යාචති. සඞ්ඝො (සෙය්‍යසකස්ස) භික්ඛුනො තියස්ස කම්මං පටිප්පස්සම්භෙති. යස්සායස්මතො ඛමති (සෙය්‍යසකස්ස) භික්ඛුනො තියස්ස කම්මස්ස පටිප්පස්සද්ධි, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

තතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (සෙය්‍යසකො) භික්ඛු සඞ්ඝෙන තියස්ස කම්මකතො. සම්මා වත්තති. ලොමං පාතෙති. නෙත්ථාරං වත්තති. තියස්ස කම්මස්ස පටිප්පස්සද්ධිං යාචති. සඞ්ඝො (සෙය්‍යසකස්ස) භික්ඛුනො තියස්ස කම්මං පටිප්පස්සම්භෙති. යස්සායස්මතො ඛමති (සෙය්‍යසකස්ස) භික්ඛුනො තියස්ස කම්මස්ස පටිප්පස්සද්ධි. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

පටිප්පස්සද්ධං සඞ්ඝෙන (සෙය්‍යසකස්ස) භික්ඛුනො තියස්ස කම්මං. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.

### පටිසාරණීය කර්‍මය

බුදු සස්නෙහි පැහැදී සිටින සඞ්ඝයාහට උවටැන් කරන **'චිත්ත'** නම් ගෘහපතියාට බැණ, ඔහුගේ ආවාසයද හැර ගිය, **'සුධම්ම'** නම් භික්ෂුව නිමිත්ත කොට, තථාගතයන් වහන්සේ පටිසාරණීය කර්‍මය වදාළ-සේක. එය කරනුයේ සඞ්ඝයාට උපස්ථාන කරන, බුදු සස්නෙහි පැහැදී සිටින, ශාසනාලය ඇති ගිහියන්ට අපහාස කොට ඔවුන්ගේ සිත් රිදවන, ඔවුන් බුදු

Non-commercial distribution

සස්නෙහි කලකිරවන භික්ෂූන්ට ය. එසේ කරන භික්ෂුව සඟ මැදට ගෙන චෝදනා කොට වරද සිහි කරවා ඇවැත දක්වා ඒ කර්මය කළ යුතු ය.

කර්ම වාක්‍යය.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (සුධම්මො) භික්ඛු (චිත්තං ගහපතිං) සද්ධං පසන්නං දායකං කාරකං සඞ්ඝුපට්ඨාකං හීනෙන ඛුංසෙති. හීනෙන වම්භෙති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (සුධම්මස්ස) භික්ඛුනො පටිසාරණීය කම්මං කරෙය්‍ය, (චිත්තො තෙ ගහපති) ඛමාපෙතබ්බොති. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො අයං (සුධම්මො) භික්ඛු (චිත්තං ගහපතිං) සද්ධං පසන්නං දායකං කාරකං සඞ්ඝුපට්ඨාකං හීනෙන ඛුංසෙති. හීනෙන වම්භෙති. සඞ්ඝො (සුධම්මස්ස) භික්ඛුනො පටිසාරණීය කම්මං කරොති (චිත්තො තෙ ගහපති) ඛමාපෙතබ්බොති. යස්සායස්මතො ඛමති (සුධම්මස්ස) භික්ඛුනො පටිසාරණීයස්ස කම්මස්සකරණං. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

දුතියම්පි එතමත්ථං වදාමි. සුණාතු -පෙ-

තතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (සුධම්මො) භික්ඛු (චිත්තං ගහපතිං) සද්ධං පසන්නං දායකං කාරකං සඞ්ඝුපට්ඨාකං හීනෙන ඛුංසෙති. හීනෙන වම්භෙති. සඞ්ඝො (සුධම්මස්ස) භික්ඛුනො පටිසාරණීය කම්මං කරොති (චිත්තො තෙ ගහපති) ඛමාපෙතබ්බොති. යස්සායස්මතො ඛමති

Non-commercial distribution

**(සුධම්මස්ස) භික්ඛුනො පටිසාරණීය කම්මස්ස කරණං (චිත්තං ගහපතිං) ඛමාපෙතබ්බොති. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.**

**කතං සඞ්ඝෙන (සුධම්මස්ස) භික්ඛුනො පටිසාරණීය කම්මං (චිත්තං ගහපතිං) ඛමාපෙතබ්බොති. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.**

පටිසාරණීය කර්මය කරනු ලැබූ භික්ෂුව විසින් ද සඞ්ඝයා විසින් එය ඉවත් කරන තුරු තජ්ජනීය කර්මය කරනු ලැබූ භික්ෂූන් විසින් පිරිය යුතු අටළොස් වත අනුව පිළිපැදිය යුතු ය. සඞ්ඝයා විසින් කර්මය ඉවත් කරනු ලබන්නේ අපහාස කිරීමෙන් කලකිරවන ලද තැනැත්තා ක්ෂමා කරවා නැවත පැහැද වීමෙන් පසු ය. **චිත්ත ගෘහපතියා** කලකිරවූ සුධම්ම භික්ෂු තෙමේ පටිසාරණීය කර්මය කරනු ලැබීමෙන් පසු ක්ෂමා කරවා චිත්ත ගෘහපතියා නැවත පැහැදවීමට **'මච්ඡිකා සණ්ඩයට'** ගියේ ය. එහෙත් දෙම්නසට පැමිණ සිටි සුධම්ම භික්ෂුව චිත්ත ගෘහපති වෙත ගොස් කථාකිරීමට අසමත්ව සැවැත් නුවරට පෙරළා පැමිණියේ ය.

චිත්ත ගෘහපතියා ක්ෂමා කරවන ලද්දේදැ. යි භික්ෂූන් විසින් විචාළ කල්හි නො හැකි වූ බව සුධම්ම භික්ෂුව කීය. ඒ බව තථාගතයන් වහන්සේට සැලකළ කල්හි තථාගතයන් වහන්සේ සුධම්ම භික්ෂුවට චිත්ත ගෘහපතියා ක්ෂමා කරවන්නට භික්ෂුවක් දූතයකු කොට දීමට අනු දැන වදාළසේක. දූතයකු දීමේදී දූත ක්‍රියාව කරන ලෙස භික්ෂුවකගෙන් ඉල්ලා කැමති කරවා-ගෙන සම්මත කොට දිය යුතු ය.

දූතයකු දීමේ කර්ම වාක්‍යය.

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (තිස්සං) භික්ඛුං (සුධම්මස්ස)**

Non-commercial distribution

**භික්ඛුනො අනුදූතං දදෙය්‍ය (චිත්තං ගහපතිං) ඛමාපෙතුං. එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. සඞ්ඝො (තිස්සං) භික්ඛුං (සුධම්මස්ස) භික්ඛුනො අනුදූතං දෙති (චිත්තං ගහපතිං) ඛමාපෙතුං. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො (සුධම්මස්ස) භික්ඛුනො අනුදූතස්ස දානං (චිත්තං ගහපතිං) ඛමාපෙතුං. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.**

**දින්නො සඞ්ඝෙන (තිස්සො) භික්ඛු (සුධම්මස්ස) භික්ඛුනො අනුදූතො (චිත්තං ගහපතිං) ඛමාපෙතුං. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.**

පටිසාරණීය කර්මය කරන ලද භික්ෂුව විසින් අනුදූතයකු වශයෙන් සඞ්ඝයා විසින් දුන් භික්ෂුව සමග වරද කළ ගෘහපතියා වෙත ගොස්, ක්ෂමාව ඇයැදිය යුතු ය. ඉදින් එයින් ගිහියා ක්ෂමා වී සිත පහද නො ගත්තේ නම්, අනුදූත භික්ෂුව විසින් "ගෘහපතිය! මේ භික්ෂුවට සමාවුව මැනව, මේ භික්ෂු තෙමේ ඔබගේ හොඳහිත බලාපොරොත්තු වන්නේය, යි කිය යුතු ය.

එයින් ද ගෘහපතියා සමා නො වන්නේ නම්, "ගෘහපතිය මේ භික්ෂුවට සමා වන ලෙස මම ඔබෙන් ඉල්ලමිය" යි කිය යුතුය. එයිනුත් ගෘහපතියා සමා නුවූයේ නම්, "ගෘහපතිය සඞ්ඝයාගේ ඉල්ලීම පරිදි මේ භික්ෂුවට සමාවන්නය" යි කිය යුතුය. එයින්ද සමා නුවූයේ නම් ගෘහපතියාට පෙනෙන ඇසෙන ලෙස වරද කළ භික්ෂුව ලවා සිවුරු ඒකාංස කොට පෙරවවා, උක්කුටිකයෙන් හිඳවා, ඇඳිලි බඳවා, ඇවැත දෙසවිය යුතුය.

**පටිසාරණීය කම්මය ඉවත් කිරීම.**

පටිසාරණීය කර්මය කරනු ලැබූ භික්ෂුව තමා විසින් අවමන් කොට කලකිරවන ලද දයකයාගෙන් ක්ෂමාව ගෙන සිත

Non-commercial distribution

පහදවා භික්ෂූන්ගේද සිත පහදවා සඞ්ඝයා වෙත එළඹ, සිවුර ඒකාංස කොට පෙරවා, වැඩිමහලු භික්ෂූන්ගේ පා වැඳ උක්කුටිකව හිඳ ඇදිලි බැඳ, මතු දැක්වෙන වාක්‍යය කියා පටිසාරණීය කර්මයාගේ සන්සිඳවීම ඉල්ලිය යුතු ය.

**අහං භන්තෙ! සඞ්ඝෙන පටිසාරණීය කම්මකතො. සම්මා වත්තාමි. ලොමං පාතෙමි. නෙත්ථාරං වත්තාමි. පටිසාරණීයස්ස කම්මස්ස පටිප්පස්සද්ධිං යාචාමි. දුතියම්පි -පෙ- තතියම්පි -පෙ-**

පටිසාරණීය කර්මය ඉවත් කිරීමේ
කර්ම වාක්‍යය.

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. අයං (සුධම්මො) භික්ඛු සඞ්ඝෙන පටිසාරණීය කම්මකතො සම්මා වත්තති. ලොමං පාතෙති. නෙත්ථාරං වත්තති. පටිසාරණීයස්ස කම්මස්ස පටිප්පස්සද්ධිං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (සුධම්මස්ස) භික්ඛුනො පටිසාරණීය කම්මං පටිප්පස්සම්භෙය්‍ය. එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. අයං (සුධම්මො) භික්ඛු සඞ්ඝෙන පටිසාරණීය කම්මකතො සම්මා වත්තති. ලොමං පාතෙති. නෙත්ථාරං වත්තති. පටිසාරණීයස්ස කම්මස්ස පටිප්පස්සද්ධිං යාචති. සඞ්ඝො (සුධම්මස්ස) භික්ඛුනො පටිසාරණීය කම්මං පටිප්පස්සම්භෙති.යස්සායස්මතො ඛමති (සුධම්මස්ස) භික්ඛුනො පටිසාරණීයස්ස කම්මස්ස පටිප්පස්සද්ධි, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.**

**දුතියම්පි එතමත්ථං වදාමි. -පෙ-**

**තතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. අයං (සුධම්මො) භික්ඛු සඞ්ඝෙන පටිසාරණීය**

Non-commercial distribution

**කම්මකතො සම්මා වත්තති. ලොමං පාතෙති. නෙත්ථාරං වත්තති. පටිසාරණීයස්ස කම්මස්ස පටිප්පස්සද්ධිං යාචති. සඞ්ඝො (සුධම්මස්ස) භික්ඛුනො පටිසාරණීය කම්මං පටිප්පස්සම්භෙති. යස්සා-යස්මතො ඛමති. (සුධම්මස්ස) භික්ඛුනො පටිසාරණී-යස්ස කම්මස්ස පටිප්පස්සද්ධි. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.**

**පටිප්පස්සද්ධං සඞ්ඝෙන (සුධම්මස්ස) භික්ඛුනො පටිසාරණීය කම්මං. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.**

**පත්තනික්කුජ්ජන කර්මය**

පත්තනික්කුජ්ජන කර්මය යනු භික්ෂූන්ට වරද කළ ගිහියන්ට දඬුවම් පිණිස කරන කර්මයෙකි. එහි අදහස වරද කළ ගිහියා සංඝයා විසින් වර්ජනය කිරීම ය. පත්තනික්කුජ්ජනය කළ ගිහියා භික්ෂූන් විසින් හළ යුතුය. කිසිම භික්ෂුවක් විසින් ඔහු දෙන කිසිවක් නො පිළිගත යුතුය. පිඩු සිඟා යාමේදී ද ඔහුගේ ගෙය හැර යා යුතු ය. ඒ කර්මය **දබ්බමල්ලපුත්ත** තෙරුන් වහන්සේට බොරු චෝදනාවක් ඇති කළ **'වඩ්ඪ'** නම් ලිච්ඡවි පුත්‍රයා නිමිත්ත කොට පනවන ලද්දකි.

**අට්ඨහි භික්ඛවෙ! අඞ්ගෙහි සමත්තාගතස්ස උපාසකස්ස පත්තො නික්කුජ්ජිතබ්බො. භික්ඛූනං අලාභාය පරිසක්කති, භික්ඛූනං අනත්ථාය පරිසක්කති. භික්ඛූනං අවාසාය පරිසක්කති. භික්ඛූනං අක්කොසති පරිභාසති භික්ඛූ භික්ඛූහි භෙදෙති. බුද්ධස්ස අවණ්ණං භාසති. ධම්මස්ස අවණ්ණං භාසති. සඞ්ඝස්ස අවණ්ණං භාසති. අනුජානාමි භික්ඛවෙ! ඉමෙහි අට්ඨහඞ්ගෙහි සමත්තාගතස්ස උපාසකස්ස පත්තං නික්කුජ්ජිතුං.**

තථාගතයන් වහන්සේ විසින් මෙසේ වදාළ පරිදි භික්ෂූන්ට අලාභ කරන්නා වූ ද, අනර්ථ කරන්නාවූ ද භික්ෂූන්ට වාසස්ථාන

Non-commercial distribution

නැති කරන්නාවූ ද, ආක්‍රෝශ පරිභව කරන්නාවූ ද, භික්ෂූන් ඔවුනොවුන් බිඳවන්නාවූ ද, බුදුනට දෙස් කියන්නාවූ ද, දහමට දෙස් කියන්නාවූ ද, සඟනට දෙස් කියන්නාවූ ද, උපාසකයනට පත්තනික්කුජ්ජන කර්මය කළ යුතු ය.

පත්තනික්කුජ්ජන කර්ම වාක්‍යය.

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. (වඩ්ඪො ලිච්ඡවී) ආයස්මන්තං (දබ්බං මල්ලපුත්තං) අමූලිකාය සීල-විපත්තියා අනුද්ධංසෙති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (වඩ්ඪස්ස ලිච්ඡවිස්ස) පත්තං නික්කුජ්ජෙය්‍ය අසම්භොගං සඞ්ඝෙන කරෙය්‍ය. එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. (වඩ්ඪො ලිච්ඡවී) ආයස්මන්තං (දබ්බං මල්ලපුත්තං) අමූලිකාය සීලවිපත්තියා අනුද්ධංසෙති. සඞ්ඝො (වඩ්ඪස්ස ලිච්ඡවිස්ස) පත්තං නික්කුජ්ජති, සම්භොගං සඞ්ඝෙන කරොති. යස්සායස්මතො ඛමති (වඩ්ඪස්ස ලිච්ඡවිස්ස) පත්තස්ස නික්කුජ්ජනා අසම්භොගං සඞ්ඝෙන කරණං, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.**

**නික්කුජ්ජිතො සඞ්ඝෙන (වඩ්ඪස්ස ලිච්ඡවිස්ස) පත්තො අසම්භොගො සඞ්ඝෙන, ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.**

**පත්ත නික්කුජ්ජනය ඉවත් කිරීම.**

පත්තනික්කුජ්ජන කර්මය කරනු ලැබූ තැනැත්තා එය ඉවත් කරවා ගනු කැමති වේ නම්, වරද පිළිගෙන සඞ්ඝයාගෙන් සමාව ලබාගෙන, සඞ්ඝයා වෙත එළඹ, උතුරුසළුව ඒකාංස කොට පෙරවා, භික්ෂූන්ගේ පා වැඳ උක්කුටිකව හිඳ වැඳ ගෙන, මේ වාක්‍යය කියා පත්තනික්කුජ්ජන කර්මය ඉවත් කරන ලෙස ඇයැදිය යුතු ය.

Non-commercial distribution

සඞ්ඝෙන මෙ භන්තෙ! පත්තො නික්කුජ්ජිතො, අසම් - භොගොම්හි සඞ්ඝෙන, සො'හං භන්තෙ සම්මා වත්තාමි. ලොමං පාතෙමි. නෙත්ථාරං වත්තාමි, සඞ්ඝං පත්තුක්කුජ්ජනං යාචාමි. දුතියම්පි -පෙ- තතියම්පි -පෙ-

පත්තනික්කුජ්ජනය ඉවත් කිරීමේ

කර්ම වාක්‍යය.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. සඞ්ඝෙන (වඩ්ඪස්ස ලිච්ඡවිස්ස) පත්තො නික්කුජ්ජිතො අසම්භොගො සඞ්ඝෙන, සො සම්මා වත්තති. ලොමං පාතෙති. නෙත්ථාරං වත්තති. සඞ්ඝං පත්තුක්කුජ්ජනං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (වඩ්ඪස්ස ලිච්ඡවිස්ස) පත්තං උක්කුජ්ජෙය්‍ය, සම්භොගං සඞ්ඝෙන කරෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. සඞ්ඝෙන (වඩ්ඪස්ස ලිච්ඡවිස්ස) පත්තො නික්කුජ්ජිතො අසම්භොගො සඞ්ඝෙන, සො සම්මා වත්තති. ලොමං පාතෙති. නෙත්ථාරං වත්තති. සඞ්ඝං පත්තුක්කුජ්ජනං යාචති. සඞ්ඝො (වඩ්ඪස්ස ලිච්ඡවිස්ස) පත්තං උක්කුජ්ජති, සම්භොගං සඞ්ඝෙන කරොති. යස්සායස්මතො ඛමති (වඩ්ඪස්ස ලිච්ඡවිස්ස) පත්තස්ස උක්කුජ්ජනා සම්භොගං සඞ්ඝෙන කරණං, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

උක්කුජ්ජිතො සඞ්ඝෙන (වඩ්ඪස්ස ලිච්ඡවිස්ස) පත්තො, සම්භොගො සඞ්ඝෙන, ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.

Non-commercial distribution

**ඇවැත් නො පිළිගන්නා භික්ෂූන්ට කරන උක්ඛේපනීය කර්‍මය.**

බුදුරජාණන් වහන්සේ කොසඹෑ නුවර ඝෝෂිතාරාමයෙහි වැඩ වෙසෙන කල්හි, ඡන්න ස්ථවිරයෝ වරද කොට ඇවැතට පැමිණ, භික්ෂූන් විසින් ඇවැතට පැමිණි බව කී කල්හි, ඇවතට පැමිණි බව පිළිගැනීමට නො කැමැති වූහ. භික්ෂූන් විසින් ඒ බව තථාගතයන් වහන්සේට සැල කළ කල්හි ඡන්න ස්ථවිරයන්ට 'උක්ඛේපනීය කර්‍මය' නියම කළ-සේක. උක්ඛේපනීය කර්‍මයේ අදහස වරද කරන භික්ෂුව සඞ්ඝයා විසින් සම්භෝගයට නො ගන්නකු කොට බැහැර කිරීම ය. එය කරන කල්හි ඇවත නො පිළිගන්නා භික්ෂුවට චෝදනා කොට කළ වරද සිහි කරවා ඇවත දක්වා කළ යුතු ය.

කර්‍ම වාක්‍යය.

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (ඡන්නො) භික්ඛු ආපත්තිං ආපජ්ජිත්වා න ඉච්ඡති ආපත්තිං පස්සිතුං, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (ඡන්නස්ස) භික්ඛුනො ආපත්තියා අදස්සනෙ උක්ඛෙපනීයකම්මං කරෙය්‍ය අසම්භොගං සඞ්ඝෙන. එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (ඡන්නො) භික්ඛු ආපත්තිං ආපජ්ජිත්වා න ඉච්ඡති ආපත්තිං පස්සිතුං. සඞ්ඝො (ඡන්නස්ස) භික්ඛුනො ආපත්තියා අදස්සනෙ උක්ඛෙපනීයකම්මං කරොති අසම්භොගං සඞ්ඝෙන. යස්සායස්මතො ඛමති (ඡන්නස්ස) භික්ඛුනො ආපත්තියා අදස්සනෙ උක්ඛෙපනීයස්ස කම්මස්ස කරණං. අසම්භොගං සඞ්ඝෙන, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.**

Non-commercial distribution

දුතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ -පෙ-

තතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. අයං (ජනෙතා) භික්ඛු ආපත්තිං ආපජ්ජිත්වා න ඉච්ඡති ආපත්තිං පස්සිතුං. සඞ්ඝො (ජනනස්ස) භික්ඛුනො ආපත්තියා අදස්සනෙ උක්ඛෙපනීයකම්මං කරොති අසම්භොගං සඞ්ඝෙන. යස්සායස්මතො ඛමති (ජනනස්ස) භික්ඛුනො ආපත්තියා අදස්සනෙ උක්ඛෙපනීයස්ස කම්මස්ස කරණං, අසම්භොගං සඞ්ඝෙන සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

කතං සඞ්ඝෙන (ජනනස්ස) භික්ඛුනො ආපත්තියා අදස්සනෙ උක්ඛෙපනීයකම්මං අසම්භොගං සඞ්ඝෙන. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.

**උක්ඛේපනීය කර්මය කරන ලද භික්ෂුව විසින් පිළිපැදිය යුතු නීති.**

1. උපාධ්‍යායාචාර්‍ය්‍ය හෝ කර්මාචාර්‍ය්‍ය වී උපසම්පද නො කළ යුතු ය
2. නිස නො දිය යුතු ය.
3. උපාධ්‍යාය වී අලුත් සාමණේරයන් නො ගත යුතු ය.
4. භික්ඛුනෝවාද සම්මුතිය නො පිළිගත යුතු ය.
5. සම්මුතිය ලබා සිටියේ ද භික්ෂුණීන්ට අවවාද නො කළ යුතු ය.
6. යම් ඇවතක් නො පිළිගැනීමෙන් උක්ඛේපනීය කර්මය කරන ලද ද, ඒ ඇවතට නැවත නො පැමිණිය යුතු ය.
7. එබඳු අනික් ඇවැතකට ද නො පැමිණිය යුතු ය.
8. එයට පවිටු ඇවතකට ද නො පැමිණිය යුතු ය.

Non-commercial distribution

9. විනය කර්මයට ගර්හා නො කළ යුතු ය.

10. ඒ කර්මය කළ භික්ෂූන්ට ගර්හා නො කළ යුතු ය.

11-21 ප්‍රකෘති භික්ෂුවකගේ වැඳීම, දුටුවිට ආසනයෙන් නැඟී සිටීම, ඇඳිලි බැඳ වැඳීම, පවන් සැලීම් ආදි සුදුසු වැඩ කිරීම, අසුන් පැනවීම, යහන් පැනවීම, පා-දෝනා පැන් තැබීම, පා පුටු තැබීම, සේදීමේදී පය උලන දේ තැබීම, පාසිවුරු පිළිගැනීම, නෑමෙහිදී පිට ඇතිල්ලීම යන මේවා නො පිළිගත යුතු ය.

22. ප්‍රකෘති භික්ෂුවකට ශීල විපත්තියෙන් චෝදනා නො කළ යුතු ය.

23. ආචාර විපත්තියෙන් චෝදනා නො කළ යුතු ය.

24. දිට්ඨි විපත්තියෙන් චෝදනා නො කළ යුතු ය.

25. ආජීව විපත්තියෙන් චෝදනා නො කළ යුතු ය.

26. භික්ෂුවක් භික්ෂූන් හා නො බිඳ විය යුතු ය.

27. ශ්වේත වස්ත්‍රාදිය නො දැරිය යුතු ය.

28. කුසචීරාදි තීර්ථක චීවර නො දැරිය යුතු ය.

29. භික්ෂූන් සේවනය කළ යුතු ය.

30. භික්ෂු ශික්ෂාවෙහි හික්මිය යුතු ය.

31. ප්‍රකෘති භික්ෂුවක් හා එක් වහලක් ඇති ආවාසයක නො විසිය යුතු ය.

32. එක් වහලක් ඇති අනාවාසයකද නො විසිය යුතු ය.

33. එක් වහලක් ඇති ආවාසයක හෝ අනාවාසයක නො විසිය යුතු ය.

34. ප්‍රකෘති භික්ෂුව දැක අස්නෙන් නැඟී සිටිය යුතු ය.

35. විහාරයෙහි දී හෝ පිටතදී හෝ ප්‍රකෘති භික්ෂුවකට අප්‍රසාදය නො දැක්විය යුතු ය.

36. ප්‍රකෘති භික්ෂුවකට උපෝසථය නො තැබිය යුතු ය.

37. පවාරණය නො තැබිය යුතු ය.

38. ප්‍රකෘති භික්ෂුව සවචනීයකු නො කළ යුතු ය.

Non-commercial distribution

39. විහාරයෙහි ප්‍රධානත්වය නො කළ යුතු ය.
40. චෝදනාවට අවසර නො ගත යුතු ය.
41. චෝදනා නො කළ යුතු ය.
42. ඇවැත් සිහි නො කරවිය යුතු ය.
43. භික්ෂූන් භික්ෂූන් හා කලහයට නො යෙදවිය යුතු ය.

**ඇවැත් නො පිළිගැනීමේ උක්ඛේපනීය කර්‍මය ඉවත් කිරීම.**

උක්ඛේපනීය කර්‍මය කරන ලද භික්ෂුව වත් පුරා සඞ්ඝයා සතුටු කොට සඞ්ඝයා වෙත එළඹ, සිවුරු ඒකාංස කොට පොරවා, මහලු භික්ෂූන්ගේ පා වැඳ, උක්කුටිකව හිඳ, කර්‍මය ඉවත් කරන ලෙස මතු දැක්වෙන වාක්‍යය කියා ඉල්ලිය යුතු ය.

**අහං භන්තෙ! සඞ්ඝෙන ආපත්තියා අදස්සනෙ උක්ඛෙපනීය කම්මකතො සම්මා වත්තාමි. ලොමං පාතෙමි. නෙත්ථාරං වත්තාමි. ආපත්තියා අදස්සනෙ උක්ඛෙපනීයස්ස කම්මස්ස පටිප්පස්සද්ධිං යාචාමි. දුතියම්පි -පෙ- තතියම්පි -පෙ-**

කර්ම වාක්‍යය.

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (ජනෙතා) භික්ඛු සඞ්ඝෙන ආපත්තියා අදස්සනෙ උක්ඛෙපනීයකම්මකතො සම්මා වත්තති. ලොමං පාතෙති. නෙත්ථාරං වත්තති. ආපත්තියා අදස්සනෙ උක්ඛෙපනීයස්ස කම්මස්ස පටිප්පස්සද්ධිං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (ජනතස්ස) භික්ඛුනො ආපත්තියා අදස්සනෙ උක්ඛෙපනීයකම්මං පටිප්පස්සම්භෙය්‍ය. එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (ජනෙතා) භික්ඛු සඞ්ඝෙන ආපත්තියා අදස්සනෙ උක්ඛෙපනීයකම්මකතො සම්මා වත්තති. ලොමං පාතෙති.**

Non-commercial distribution

නෙත්ථාරං වත්තති. ආපත්තියා අදස්සනෙ උක්ඛෙපනීය කම්මස්ස පටිප්පස්සද්ධිං යාචති. සඞ්ඝො (ඡන්නස්ස) භික්ඛුනො ආපත්තියා අදස්සනෙ උක්ඛෙපනීයකම්මං පටිප්පස්සම්භෙති. යස්සායස්මතො ඛමති, (ඡන්නස්ස) භික්ඛුනො ආපත්තියා අදස්සනෙ උක්ඛෙපනීය කම්මස්ස පටිප්පස්සද්ධි, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

දුතියම්පි එතමත්ථං වදාමි. සුණාතු -පෙ-

තතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (ඡන්නො) භික්ඛු ආපත්තියා අදස්සනෙ උක්ඛෙපනීයකම්මකතො සම්මා වත්තති. ලොමං පාතෙති. නෙත්ථාරං වත්තති. ආපත්තියා අදස්සනෙ උක්ඛෙපනීයකම්මස්ස පටිප්පස්සද්ධිං යාචති. සඞ්ඝො (ඡන්නස්ස) භික්ඛුනො ආපත්තියා අදස්සනෙ උක්ඛෙපනීයකම්මං පටිප්පස්සම්භෙති. යස්සායස්මතො ඛමති (ඡන්නස්ස) භික්ඛුනො ආපත්තියා අදස්සනෙ උක්ඛෙපනීයස්සකම්මස්ස පටිප්පස්සද්ධි, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

පටිප්පස්සද්ධං සඞ්ඝෙන (ඡන්නස්ස) භික්ඛුනො ආපත්තියා අදස්සනෙ උක්ඛෙපනීයකම්මං. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.

**ඇවතට පිළියම් නො කරනු කැමති භික්ෂුවට කරන උක්ඛේපනීය කර්මය.**

බුදුරජාණන් වහන්සේ කොසඹෑ නුවර ඝෝෂිතාරාමයෙහි වැඩ වෙසෙන සමයෙහි, ඡන්න ස්ථවිරයෝ ඇවැතට පැමිණ එයට

Non-commercial distribution

ප්‍රතිකාර කරන්නට නො කැමැති වූහ. එය නිමිත්ත කොට තථාගතයන් වහන්සේ ඇවතට පිළියම් නො කරනු කැමැත්ත නිසා ද, ඡන්න ස්ථවිරයන්හට සඞ්ඝයාගේ සම්භෝගයෙන් බැහැර කිරීම ඇති උක්ඛේපනීය කර්මය කරන ලෙස නියම කළ සේක. එය ද ඇවතට පිළියම් නො කරන භික්ෂුව සහ මැදට පමුණුවා චෝදනා කොට වරද සිහි කරවා ඇවැත දක්වා කළ යුතු ය.

කර්ම වාක්‍යය.

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (ඡන්නො) භික්ඛු ආපත්තිං ආපජ්ජිත්වා න ඉච්ඡති ආපත්තිං පටිකාතුං. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (ඡන්නස්ස) භික්ඛුනො ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛෙපනීය කම්මං කරෙය්‍ය අසම්භොගං සඞ්ඝෙන. එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (ඡන්නො) භික්ඛු ආපත්තිං ආපජ්ජිත්වා න ඉච්ඡති ආපත්තිං පටිකාතුං. සඞ්ඝො (ඡන්නස්ස) භික්ඛුනො ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛෙපනීය කම්මං කරොති අසම්භොගං සඞ්ඝෙන. යස්සායස්මතො ඛමති, (ඡන්නස්ස) භික්ඛුනො ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛෙපනීයස්ස කම්මස්ස කරණං අසම්භොගං සඞ්ඝෙන, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.**

**දුතියම්පි එතමත්ථං වදාමි. සුණාතු -පෙ-**

**තතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (ඡන්නො) භික්ඛු ආපත්තිං ආපජ්ජිත්වා**

Non-commercial distribution

න ඉච්ඡති ආපත්තිං පටිකාතුං. සඞ්ඝො (ජනනස්ස) භික්ඛුනො ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛෙපනීයකම්මං කරොති. අසම්භොගං සඞ්ඝෙන. යස්සායස්මතො ඛමති (ජනනස්ස) භික්ඛුනො ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛෙපනීයස්ස කම්මස්ස කරණං අසම්භොගං සඞ්ඝෙන, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

කතං සඞ්ඝෙන (ජනනස්ස) භික්ඛුනො ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛෙපනීයකම්මං අසම්භොගං සඞ්ඝෙන. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.

**උක්ඛේපනීය කර්මය ඉවත් කිරීම.**

ඇවතට පිළියම් නො කිරීමේ වරදින් උක්ඛේපනීය කර්මය කරන ලද කල්හි ද භික්ෂුව විසින් නීති තෙසාළිස අනුව පිළිපැද සඞ්ඝයා සතුටු කරවා සඞ්ඝයා වෙත එළඹ, වැඩි මහලු භික්ෂූන්ගේ පා වැඳ, උක්කුටිකව හිඳ, ඇඳිලි බැඳ මතු දක්වන වාක්‍යයෙන් කර්මය ඉවත් කරන ලෙස ඉල්ලිය යුතු ය. එසේ කළ කල්හි සඞ්ඝයා විසින් කර්මය ඉවත් කරනු ඇත.

**අහං භන්තෙ! සඞ්ඝෙන ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛෙපනීයකම්මකතො සම්මා වත්තාමි. ලොමං පාතෙමි. නෙත්ථාරං වත්තාමි. ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛෙපනීයස්ස කම්මස්ස පටිප්පස්සද්ධිං යාචාමි. දුතියම්පි -පෙ- තතියම්පි -පෙ-**

ඉවත් කිරීමේ කර්ම වාක්‍යය.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. අයං (ජනෙතා) භික්ඛු සඞ්ඝෙන ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛෙපනීයකම්මකතො සම්මා වත්තති. ලොමං පාතෙති.

Non-commercial distribution

නෙත්ථාරං වත්තති. ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛෙපනීයස්ස කම්මස්ස පටිප්පස්සද්ධිං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (ජනස්ස) භික්ඛුනො ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛෙපනීය කම්මං පටිප්පස්සම්භෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (ජනො) භික්ඛු සඞ්ඝෙන ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛෙප-නීයකම්මකතො සම්මා වත්තති. ලොමං පාතෙති. නෙත්ථාරං වත්තති. ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛෙපනීයස්ස කම්මස්ස පටිප්පස්සද්ධිං යාචති. සඞ්ඝො (ජනස්ස) භික්ඛුනො ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛෙපනීයකම්මං පටිප්පස්සම්භෙති. යස්සායස්මතො ඛමති (ජනස්ස) භික්ඛුනො ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛෙපනීයස්ස කම්මස්ස පටිප්පස්සද්ධි, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

දුතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ -පෙ-

තතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (ජනො) භික්ඛු සඞ්ඝෙන ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛෙපනීයකම්මකතො සම්මා වත්තති. ලොමං පාතෙති. නෙත්ථාරං වත්තති. ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛෙපනීයස්ස කම්මස්ස පටිප්පස්සද්ධිං යාචති. සඞ්ඝො (ජනස්ස) භික්ඛුනො ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛෙපනීය කම්මං පටිප්පස්සම්භෙති. යස්සායස්මතො ඛමති

Non-commercial distribution

(ජනහස්ස) භික්ඛුනො ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛෙපනීයස්ස කම්මස්ස පටිප්පස්සද්ධි. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති. සො භාසෙය්‍ය.

පටිප්පස්සද්ධං සඞ්ඝෙන (ජනහස්ස) භික්ඛුනො ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛෙපනීයකම්මං. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.

**පාපදෘෂ්ටිය නො හරනා භික්ෂුවට කරන උක්ඛෙපනීය කර්මය.**

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි, 'අරිට්ඨ' නම් භික්ෂුවක් "මෘදු වූ කොට්ට-මෙට්ට-ඇතිරිලි ආදියේ ස්පර්ශය කැප නම්, ස්ත්‍රී ස්පර්ශයත් කැප විය යුතු ය. එය අන්තරායික නො වේය" යන දෘෂ්ටිය ඇති කර ගත්තේ ය. ඒ බව ඇසූ භික්ෂූහු ඒ දෘෂ්ටිය දුරු කරනු පිණිස අරිට්ඨ නමැති භික්ෂුවට නොයෙක් ආකාරයෙන් අනුශාසනා කළහ. එහෙත් අරිට්ඨ භික්ෂුව නො පිළිගත්තේ ය. භික්ෂූහු ඒ බව තථාගතයන් වහන්සේට සැල කළෝ ය. බුදුරජාණන් වහන්සේ විසින් ද අවවාද කොට, නො පිළි ගත්තා වූ ඒ භික්ෂුවට උක්ඛෙපනීය කර්මය කර, සම්භෝගයෙන් බැහැර කරන ලෙස තථාගතයන් වහන්සේ වදාළ සේක. දෘෂ්ටිය නො හරනා භික්ෂුවට උක්ඛෙපනීය කර්මය කරන කල්හි, ඒ භික්ෂුව සහ මැදට පමුණුවා චෝදනා කොට වරද සිහි කරවා ඇවත දක්වා කර්මය කළ යුතු ය.

කර්ම වාක්‍යය.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. (අරිට්ඨස්ස භික්ඛුනො ගද්ධබාධිපුබ්බස්ස) එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං. "තථා'හං භගවතා ධම්මං දෙසිතං ආජානාමි. යථා යෙ මෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං

Non-commercial distribution

අන්තරායායාති." සො තං දිට්ඨිං නප්පටිනිස්සජ්ජති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (අරිට්ඨස්ස භික්ඛුනො ගද්ධබාධිපුබ්බස්ස) පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛෙපනීය කම්මං කරෙය්‍ය අසම්භොගං සඞ්ඝෙන. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, (අරිට්ඨස්ස භික්ඛුනො ගද්ධබාධිපුබ්බස්ස) එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං "තථා'හං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා යෙ මෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායාති." සො තං දිට්ඨිං නප්පටිනිස්සජ්ජති. සඞ්ඝො (අරිට්ඨස්ස භික්ඛුනො ගද්ධබාධිපුබ්බස්ස) පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛෙප-නීයකම්මං කරොති අසම්භොගං සඞ්ඝෙන. යස්සායස්මතො ඛමති (අරිට්ඨස්ස භික්ඛුනො ගද්ධබාධිපුබ්බස්ස) පාපිකාය දිට්ඨියා අප්පටිනි-ස්සග්ගෙ උක්ඛෙපනීයස්ස කම්මස්ස කරණං අසම්භොගං සඞ්ඝෙන, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

දුතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ -පෙ-

තතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො (අරිට්ඨස්ස භික්ඛුනො ගද්ධබාධිපුබ්බස්ස) එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං "තථා'හං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා යෙ මෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තෙ පටිසෙවතො

Non-commercial distribution

නාලං අන්තරායායාති. සො තං දිට්ඨිං නප්පටිනි-ස්සජ්ජති. සඞ්ඝො (අරිට්ඨස්ස භික්ඛුනො ගද්ධබාධිපුබ්බස්ස) පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛෙපනීයකම්මං කරොති අස-ම්භොගං සඞ්ඝෙන. යස්සායස්මතො ඛමති (අරිට්ඨස්ස භික්ඛුනො ගද්ධබාධිපුබ්බස්ස) පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛෙපනීයස්ස කම්මස්ස කරණං අසම්භොගං සඞ්ඝෙන, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

කතං සඞ්ඝෙන (අරිට්ඨස්ස භික්ඛුනො ගද්ධබාධි-පුබ්බස්ස) පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛෙපනීයකම්මං අසම්භොගං සඞ්ඝෙන. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.

පාප දෘෂ්ටිය නො හැරීම නිසා උක්ඛේපනීය කර්‍මය කරන ලද භික්ෂූන් විසින් පිළිපැදිය යුතු වත් හෙවත් නීති අටොළොසෙකි. ඒ මෙසේ ය.

(1) උපසම්පද නො කළ යුතු ය.

(2) නිස නො දිය යුතු ය.

(3) සාමණේරයන් නො ගත යුතු ය.

(4) භික්ඛුනෝවාදක සම්මුතිය නො පිළිගත යුතුය.

(5) කලින් සම්මුතිය ලබා ඇත්තේ ද භික්ෂුණීන්ට අවවාද නො කළ යුතු ය.

(6) උක්ඛේපනීය කර්‍මයට හේතු වූ ඇවතට නැවත නො පැමිණිය යුතු ය.

(7) එවැනි අනික් ඇවතකට ද නො පැමිණිය යුතු ය.

(8) එයට ලාමක ඇවතකට ද නො පැමිණිය යුතු ය.

Non-commercial distribution

(9) උක්ඛේපනීය කර්මයට ගර්හා නො කළ යුතු ය.
(10) කර්මය කළ භික්ෂූන්ට ගර්හා නො කළ යුතු ය.
(11) ප්‍රකෘති භික්ෂුවගේ උපෝසථය නො තැබිය යුතු ය.
(12) පවාරණය නො තැබිය යුතු ය.
(13) කිය යුත්තකු නො කළ යුතු ය.
(14) විහාරයේ ප්‍රධානත්වය නො කළ යුතු ය.
(15) චෝදනාවට අවසර නො ඉල්ලිය යුතු ය.
(16) චෝදනා නො කළ යුතු ය.
(17) වරද සිහි කරවීම නො කළ යුතු ය.
(18) භික්ෂූන් භික්ෂූන් සමග කලහයට නො යෙදවිය යුතු ය.

**උක්ඛේපනීය කර්මය ඉවත් කිරීම ඉල්ලීමේ වාක්‍යය.**

**අහං භන්තෙ! සඞ්ඝෙන පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛෙපනීයකම්මකතො සම්මා වත්තාමි. ලොමං පාතෙමි. නෙත්ථාරං වත්තාමි. පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛෙපනීයස්ස කම්මස්ස පටිප්පස්සද්ධිං යාචාමි. දුතියම්පි -පෙ- තතියම්පි -පෙ-**

කර්ම වාක්‍යය.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (තිස්සො) භික්ඛු සඞ්ඝෙන පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛෙපනීයකම්මකතො සම්මා වත්තති, ලොමං පාතෙති. නෙත්ථාරං වත්තති. පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛෙපනීයස්ස කම්මස්ස පටිප්පස්සද්ධිං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛෙපනීයකම්මං පටිප්පස්ස-මෙභෙය්‍ය. එසා ඤත්ති.

Non-commercial distribution

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. අයං (තිස්සො) භික්ඛු සඞ්ඝෙන පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛෙපනීයකම්මකතො සම්මා වත්තති. ලොමං පාතෙති. නෙත්ථාරං වත්තති. පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උපෙඛපනීයස්ස කම්මස්ස පටිප්පස්සද්ධිං යාචති. සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛෙපනීය කම්මං පටිප්පස්සම්භෙති. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛෙපනීයස්ස කම්මස්ස පටිප්පස්සද්ධි, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

දුතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ -පෙ-

තතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. අයං (තිස්සො) භික්ඛු සඞ්ඝෙන පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛෙපනීයකම්මකතො සම්මා වත්තති. ලොමං පාතෙති. නෙත්ථාරං වත්තති. පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛෙපනීයස්ස කම්මස්ස පටිප්පස්සද්ධිං යාචති. සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො පාපිකාය දිට්ඨියා උක්ඛෙපනීයකම්මං පටිප්පස්සම්භෙති. යස්සා-යස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛෙපනීයස්ස කම්මස්ස

Non-commercial distribution

පටිප්පස්සද්ධි, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

පටිප්පස්සද්ධං සඞ්ඝෙන (තිස්සස්ස) භික්ඛුනො පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛෙපනීයකම්මං. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.

Non-commercial distribution

# සම්මුති

## කප්පිය භූමි සම්මුතිය

**න භික්ඛවෙ! අන්තො වුත්ථං අන්තො පක්කං සාමං පක්කං පරිභුඤ්ජිතබ්බං. යො පරිභුඤ්ජෙය්‍ය ආපත්ති දුක්කටස්ස.** මේ මහාවග්ගපාළියේ භේසජ්ජක්ඛන්ධකයේ එන විනය නීතියෙකි. එහි "**අන්තො වුත්ථ**" යනු භික්ෂූන්ට අයත් වූ සාඞ්ඝික වූ හෝ පෞද්ගලික වූ හෝ සහසෙය්‍යාපත්තිය සිදුවීමට ප්‍රමාණ වන, ගෙයක් තුළ රාත්‍රියක් තැබූ භික්ෂූන්ට ම අයත් වන, සහල් ආදි ආහාරෝපකරණයෝ ය. ඒවා වැළඳීමෙන් භික්ෂුවට දුකුළා ඇවැත් වේ. "**අන්තොපක්ක**" යනු භික්ෂූන් අයත් ගෙයක පිසන ලද ආහාරය ය. එය වැළඳීමෙන්ද භික්ෂුවට දුකුළා ඇවැත් වේ. ඒ විනය නීතිය ඇත ද විහාරයෙහි සහල් ආදිය තබා ගැනීමෙන් වැළකීමෙන් හා විහාරයෙහි ආහාර පිසවා ගැනීමෙන් වැළකීමෙන් ද, භික්ෂූන් වහන්සේට කරදර ඇති වන අවස්ථා ද ඇත්තේ ය. එබඳු අවස්ථාවක් පැමිණියහොත් ඇවතින් මිදී, විහාරයෙහි ආහාර ද්‍රව්‍ය තබා ගැනීමත්, පිස ගැනීමත්, කරගත හැකිවනු පිණිස තථාගතයන් වහන්සේ විසින් කප්පිය භූමි සම්මුතිය අනුදැන වදරන ලදී.

## කප්පිය භූමිය සම්මත කරන කර්ම වාක්‍යය.

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (ඉත්ථන්නාමං) විහාරං කප්පිය-භූමිං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.**

*Non-commercial distribution*

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, සඞ්ඝො (ඉත්ථන්නාමං) විහාරං කප්පියභූමිං සම්මන්නති. යස්සායස්මතො ඛමති (ඉත්ථන්නාමස්ස) විහාරස්ස කප්පිය භූමියා සම්මුති. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.**

**සම්මතො සඞ්ඝෙන (ඉත්ථන්නාමො) විහාරො කප්පියභූමි. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.**

සඞ්ඝාරාමයක ඇති ආවාසවලින් කවරක් වුව ද මෙසේ කප්පිය කුටිය සැටියට සම්මත කර ගත හැකිය. ඉන් පසු එහි තබාගන්නා ලද ආහාරද්‍රව්‍ය වැළඳීමෙන් ඇවැත් නො වේ. එහි පිසූ ආහාර වැළඳීමෙන් ද ඇවැත් නො වේ.

"**අනුජානාමි භික්ඛවෙ චතස්සො කප්පියභූමියො උස්සාවනන්තිකං, ගොනිසාදිකං, ගහපතිං, සම්මුතිං**" යනුවෙන් උස්සාවනන්තික කුටියය, ගෝනිසාදික කුටියය, ගහපති කුටියය, සම්මුති කුටියය යි කප්පිය කුටි සතරක් තථාගතයන් වහන්සේ අනුදැන වදරා තිබේ.

එයින් '**උස්සාවනන්තික කප්පිය කුටිය**' ගෙය තැනීමේදී ම භික්ෂූන් එකතුව කප්පිය කුටියක් වශයෙන් කරන ලද ගෙය ය. 'උස්සාවනන්තික කුටිය' කිරීම ද එක්තරා විනය කර්මයෙකි. එය කරන්නේ මෙසේ යඃ- කුටිය කණු සිටුවා කරන්නක් නම්, පළමුවන කණුව සිට වීමේදී භික්ෂූන් එකතුව "**කප්පියකුටිං කරොම, කප්පිය කුටිං කරොම**" යි කියමින් කණුව සිටවිය යුතු ය. මිනිසුන් ලවා ඔසවා කණුව සිට වන්නේ නම් භික්ෂූන් ද එයට අත ගසා "**කප්පිය කුටිං කරොම, කප්පිය කුටිං කරොම**" යි කිය යුතු ය. කණුව සිටුවා ඉවර වීමත් "කප්පිය කුටිං කරොම" යනු කියා ඉවර වීමත් එකවර සිදුවිය යුතු ය. පෙර පසු වුව හොත් කුටිය කප්පිය කුටියක් නොවේ. භික්ෂූන් බොහෝ දෙනකුන් එක්ව එය කළ යුත්තේ කවරකුගේ හෝ කීම කණුව සිටුවා අවසන්වීම හා එකවර අවසන් වීමෙන් කප්පිය කුටි කරණය සිදුවීම පිණිස ය. ගලින් හෝ

Non-commercial distribution

මැටියෙන් හෝ බිත්ති තනා කරන කුටියක් නම්, පොළොවෙන් මතු වී සිටින පළමුවන ගල හෝ පළමු වන මැටි පිඩ "කප්පිය කුටිං කරොම, කප්පිය කුටිං කරොම" යි කියමින් තැබිය යුතු ය.

"**ගෝනිසාදිකා කප්පිය භූමිය**" යනු ගවයන්ට ඇතුළු විය නො හෙන පරිදි වැට ආදියක් නැති ආරාම භූමිය ය. එවැනි භූමියක පිහිටි පරික්ෂේපයක් ඇත්තා වූ ගෙවල් ද ගෝනිසාදික කප්පිය කුටීහු ම වෙති.

'**ගහපති කප්පිය කුටිය**' යනු අනුපසම්පන්නයන් විසින් කප්පිය කුටියක් වශයෙන් දෙන ලද්ද වූ හෝ අනුපසම්පන්නයන් අයත් වූ හෝ ගෙය ය.

'**සම්මුති කප්පිය කුටිය**' යනු ඉහති කී පරිදි ඤත්තිදුතිය කම්මවාචාවෙන් සඞ්ඝයා විසින් සම්මත කරන ලද ගෙය ය. මේ කුටි සතරෙන් කවරක වුව ද තබන ලද්ද වූ ද, පිසින ලද්ද වූ ද, දෙය වැළඳීමෙන් ඇවැත් නො වේ.

**සේඛ සම්මුතිය.**

සැවැත් නුවර එක් ගෙයක අඹු සැමි දෙදෙන ම භික්ෂූන් වහන්සේ කෙරෙහි ඉතා ප්‍රසන්න වූහ. ඔවුහු ක්‍රමයෙන් ධනයෙන් පිරිහෙන්නට වූහ. එහෙත් ඔවුහු දීම අඩු නො කළෝ ය. ඇතැම් දිනවල ඒ පවුලෙහි පෙරබත් කල ඔවුන්ගේ නිවෙසෙහි පිළියෙල වන සියල්ලම භික්ෂූන්ට දී, තුමූ නිරාහාරව ද වෙසෙති. එය දත් මනුෂ්‍යයෝ, "මේ භික්ෂූහු පමණ නො සලකා අනුන්ගේ දේ පිළිගනිති" යි භික්ෂූන්ට නින්ද කළහ. භික්ෂූන්ට එය ඇසී ඔවුහු තථාගතයන් වහන්සේට ඒ බව දැන්වූහ. එකල්හි තථාගතයන් වහන්සේ ශ්‍රද්ධාවෙන් වැඩෙන, ධනයෙන් පිරිහෙන, පවුල්වලට 'සේඛ සම්මුතිය' දීමට අනු-දැන වදළ සේක.

**සේඛ සම්මුති කර්ම වාක්‍යය.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. (ඉත්ථන්නාමං) කුලං සද්ධාය වඩ්ඪති. භොගෙන හායති. යදි**

Non-commercial distribution

**සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (ඉත්ථන්නාමස්ස) කුලස්ස සෙඛසම්මුතිං දදෙය්‍ය. එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, (ඉත්ථන්නාමං) කුලං සද්ධාය වඩ්ඪති. භොගෙන හායති. සඞ්ඝො (ඉත්ථන්නාමස්ස) කුලස්ස සෙඛසම්මුතිං දෙති. යස්සායස්මතො ඛමති (ඉත්ථන්නාමස්ස) කුලස්ස සෙඛසම්මුතියා දානං, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.**

**දින්නා සඞ්ඝෙන (ඉත්ථන්නාමස්ස) කුලස්ස සෙඛසම්මුති. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.**

නො ගිලන් භික්ෂුවක් විසින් සේඛ සම්මුතිය ලත් කුලයට ආරාධනාවක් නැතුව ගොස්, ඔවුන් දෙන ආහාරයක් සියතින් පිළිගෙන වැළඳුයේ නම්, පාටිදේසනීය නම් ඇවතක් වේ. ඔවුන් විසින් ගෙයින් පිටතට ගෙනැවිත් දෙන දෙයක් පිටතදී පිළිගෙන වැළඳීමෙන් ඇවැත් නො වේ.

### චීවර පටිග්ගාහක සම්මුතිය.

බුද්ධ කාලයේදී මිනිස්සු සඞ්ඝයා හට පිදීම පිණිස සිවුරු ගෙන විහාරයට එති. ඒවා දෙන්නට කෙනකු සොයා ගත නො හැකිව, මනුෂ්‍යයෝ ගෙන ආ සිවුරු ආපසු ගෙන යති. එයින් සඞ්ඝයාට සිවුරු ලැබීම අඩු විය. භික්ෂූහු ඒ බව තථාගතයන් වහන්සේට සැල කළහ. එකල්හි තථාගතයන් වහන්සේ අගතියට නො යන, යහපත් වචනයෙන් අනුමෝදනාව කොට මිනිසුන් පැහැදවීමට සමත් භික්ෂුවක් චීවර ප්‍රතිග්‍රාහකයකු වශයෙන් සම්මත කිරීමට අනු-දැන වදළ සේක.

Non-commercial distribution

චීවර ප්‍රතිග්‍රාහක සම්මුති
කර්ම වාක්‍යය.

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (තිස්සං) භික්ඛුං චීවර-පටිග්ගාහකං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, සඞ්ඝො (තිස්සං) භික්ඛුං චීවරපටිග්ගාහකං සම්මන්නති. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො චීවරපටිග්ගාහකස්ස සම්මුති. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.**

**සම්මතො සඞ්ඝෙන (තිස්සො) භික්ඛු චීවර-පටිග්ගාහකො. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.**

**චීවර නිදහක සම්මුතිය.**

එකල්හි සිවුරු පිළිගැනීමේ සම්මුතිය ලත් භික්ෂූහු සිවුරු පිළිගෙන, ඒවා ඒ ඒ තැන්වල ම තිබෙන්නට හැර යති. එයින් සඞ්ඝයාට ලැබෙන සිවුරු නැති වන්නට විය. ඒ බව භික්ෂූන් බුදුන් වහන්සේට සැල කළ කල්හි, පඤ්චාඞ්ගයකින් යුක්ත භික්ෂුවක් සිවුරු පරෙස්සම් කරන්නකු වශයෙන් සම්මත කරන්නට අනුදැන වදළ-සේක.

කර්ම වාක්‍යය.

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (තිස්සං) භික්ඛුං චීවරනිදහකං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.**

Non-commercial distribution

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. සඞ්ඝො (තිස්සං) භික්ඛුං චීවරනිදහකං සම්මන්නති. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො චීවරනිදහකස්ස සම්මුති. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.**

**සම්මතො සඞ්ඝෙන (තිස්සො) භික්ඛු චීවර-නිදහකො, ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.**

භණ්ඩාගාර සම්මුතිය.

එකල්හි සිවුරු පරෙස්සම් කරන්නා වූ භික්ෂූන්ට ඒවා තැබීමට සුදුසු නියමිත තැනක් නො තිබුණෙන් නොයෙක් තැන්වල සිවුරු තැබූහ. ඒ සිවුරු මීයෝ ද කෑහ. වේයෝද කෑහ. ඒ බව තථාගතයන් වහන්සේට සැල කළ කල්හි භාණ්ඩාගාරයක් සම්මත කිරීමට අනුදැන වදළ සේක.

කර්ම වාක්‍යය.

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (ඉත්ථන්නාමං) විහාරං භණ්ඩාගාරං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. සඞ්ඝො (ඉත්ථන්නාමං) විහාරං භණ්ඩාගාරං සම්මන්නති. යස්සායස්මතො ඛමති. (ඉත්ථන්නාමස්ස) විහාරස්ස භණ්ඩාගාරස්ස සම්මුති, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.**

**සම්මතො සඞ්ඝෙන (ඉත්ථන්නාමො) විහාරො භණ්ඩාගාරං, ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.**

Non-commercial distribution

**භාණ්ඩාගාරික සම්මුතිය.**

එකල්හි පරෙස්සම් කරන්නකු නුවූයෙන් සඞ්ඝයාගේ භාණ්ඩාගාරයේ ද සිවුරු පරෙස්සම් නො වී ය. ඒ බව බුදුරජාණන් වහන්සේට සැල කළ කල්හි පඤ්චාඞ්ගයකින් යුක්ත භික්ෂුවක් භාණ්ඩාගාරිකයකු කොට සම්මත කරන්නට අනුදැන වදළ සේක.

කර්ම වාක්‍යය.

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (තිස්සං) භික්ඛුං භණ්ඩා-ගාරිකං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, සඞ්ඝො (තිස්සං) භික්ඛුං භණ්ඩාගාරිකං සම්මන්නති. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො භණ්ඩාගාරිකස්ස සම්මුති, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.**

**සම්මතො සඞ්ඝෙන (තිස්සො) භික්ඛු භණ්ඩා-ගාරිකො; ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.**

**චීවර භාජක සම්මුතිය.**

සඞ්ඝයාට ලැබෙන සිවුරු භාණ්ඩාගාරයෙහි එකතු කර තබන්නේ, බෙද දීමට සෑහෙන තරමට රැස්වූ කල්හි, සඞ්ඝයාට බෙද දීමට ය. භාණ්ඩාගාරයෙහි සිවුරු බොහෝ වූ බව භික්ෂූහු තථාගතයන් වහන්සේට සැලකළහ. එකල්හි තථාගතයන් වහන්සේ **"අනුජානාමි භික්ඛවෙ! සම්මුඛීභූතෙන සඞ්ඝෙන භාජෙතුං"** යනුවෙන් උපචාරසීමාවට රැස්වූ සඞ්ඝයා විසින් බෙද ගන්නට අනුදැන වදළ සේක. ඒවා බෙදීමේදී ,අපගේ උපාධ්‍යායයන්ට දෙන්නය, ආචාර්‍ය්‍යයන්ට දෙන්නය, යනාදීන් බොහෝ ශබ්ද නගන්නට වූහ. ඒ බව භාග්‍යවතුන් වහන්සේට සැල කළ කල්හි, සිවුරු බෙදන්නට

Non-commercial distribution

පඤ්චාඞ්ගයෙන් යුක්ත භික්ෂුවක් සම්මත කර ගන්නට අනුදැන වදාළ සේක. චීවර භාජකයාගේ පඤ්චාඞ්ගය නම්:- ඡන්දයෙන් අගතියට නො යන බවය, ද්වේෂයෙන් අගතියට නො යන බවය, මෝහයෙන් අගතියට නොයන බවය, භයින් අගතියට නො යන බවය, බෙදූ නො බෙදූ දෑ දැන ගැනීමෙහි සමත් බවය යන මේ කරුණු පස ය.

සම්මත කරන කර්ම වාක්‍යය.

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං. සඞ්ඝො (තිස්සං) භික්ඛුං චීවරභාජකං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. සඞ්ඝො (තිස්සං) භික්ඛුං චීවරභාජකං සම්මන්නති. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො චීවරභාජකස්ස සම්මුති. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති. සො භාසෙය්‍ය.**

**සම්මතො සඞ්ඝෙන (තිස්සො) භික්ඛු චීවරභාජකො. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.**

චීවරභාජක භික්ෂූන්ට "සිවුරු බෙදිය යුත්තේ කෙසේ ද" යන අදහස ඇති විය. ඒ බව තථාගතයන් වහන්සේට සැල කළ කල්හි, **"අනුජානාමි භික්ඛවෙ! පඨමං උච්චිනිත්වා තුලයිත්වා වණ්ණාවණ්ණං කත්වා භික්ඛූ ගණෙත්වා වග්ගං බන්ධිත්වා චීවරපටිවිංසං ඨපෙතුං"** යනුවෙන් "මහණෙනි! පළමු කොට සිවුරු තෝරා වටිනාකම බලා, වටිනාකම අඩු ඒවාට තවත් දේ එක් කිරීමෙන් වටිනාකම සම කොට, භික්ෂූන් ගැන, වර්ග කොට, සිවුරු කොටස් තබන්නට අනු දනිමි' යි වදාළසේක. බොහෝ දෙනා විසින් වෙන වෙන ම ගෙනැවිත් පිදූ සිවුරු අතර හොඳ-නරක වටිනාකම අඩු-වැඩි ඒවා ඇත්තේ ය. එබැවින් සිවුරු පරීක්ෂා කර, වටිනාකම අඩු සිවුරුවලට තවත් සිවුරු එක් කොට සිවුරු කොටස් වෙන් කළ යුතු ය. සිවුරු බෙදීමට භික්ෂූන් වර්ග කළ යුත්තේ, වෙන වෙන ම බෙද දීමට අපහසු වන තරමට භික්ෂූන් වැඩි වුව හොත් ය. භික්ෂූන්

Non-commercial distribution

බොහෝ වෙත් නම්, දස නම බැගින් හෝ සතර නම පස් නම බැගින් හෝ භික්ෂූන් වර්ග කොට වර්ග ගණනට සිවුරු කොටස් වෙන් කොට කුසපාතනය කොට ඒවා බෙද දිය යුතු ය. ඒ ඒ වර්ගවල භික්ෂූන් විසින් නැවත ඒවා කුඩා කොටස් වලට බෙද කුසපාතනය කොට බෙද ගත යුතු ය. මේ සිවුරු බෙදගන්නා ක්‍රමය ය.

**මතකචීවරදාන කර්මය.**

භික්ෂුවක් කලුරිය කළහොත් ඒ භික්ෂුව අයත් සියල්ල සඞ්ඝසතු වෙයි. "කලුරිය කළ භික්ෂූන් අයත් වස්තු ගෝලයන්ට අයිති ය" යනු මෙකල ගිහියන්ගේ දේපල අයිති වීමේ ක්‍රමය අනුව සාදගෙන තිබෙන විනය විරෝධී නීතියකි.

"**භික්ඛුස්ස භික්ඛවෙ! කාලකතෙ සඞ්ඝො සාමී පත්තචීවරෙ. අපි ච ගිලානුපට්ඨාකා බහූපකාරා. අනුජානාමි භික්ඛවෙ! සඞ්ඝෙන තිචීවරඤ්ච පත්තඤ්ච ගිලානුපට්ඨාකානං දාතුං. යං තත්ථ ලහුභණ්ඩං ලහුපරික්ඛාරං තං සම්මුඛීභූතෙන සඞ්ඝෙන භාජෙතුං. යං තත්ථ ගරුභණ්ඩං ගරුපරික්ඛාරං තං ආගතානාගතස්ස චාතුද්දිසස්ස සඞ්ඝස්ස අවිස්සජ්ජිකං අවෙභඞ්ගිකං**" මේ මහාවග්ගපාළියේ චීවරක්ඛන්ධකයේ දැක්වෙන මෘත භික්ෂූන්ගේ පරිෂ්කාර පිළිබඳ විනය නීතිය ය.

උපස්ථායක භික්ෂුව විසින් කාලක්‍රියා කළ භික්ෂුවගේ පා-සිවුරු සඞ්ඝයා වෙත ගෙන ගොස්, "**ඉත්ථන්නාමො භන්තෙ! භික්ඛු කාලකතො. ඉදං තස්ස තිචීවරඤ්ච පත්තො ච**" යි සඞ්ඝයාට සැල කළ යුතු ය. ඒවා සඞ්ඝයාට අයත් වුව ද ගිලානෝපස්ථායක භික්ෂුවට සඞ්ඝයා විසින් දිය යුතු ය.

කර්ම වාක්‍යය.

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. (ඉත්ථන්නාමො) භික්ඛු කාලකතො. ඉදං තස්ස තිචීවරඤ්ච පත්තො ච. යදි සඞ්ඝස්ස පත්තකල්ලං. සඞ්ඝො ඉමං තිචීවරඤ්ච පත්තඤ්ච ගිලානුපට්ඨාකානං දදෙය්‍ය. එසා ඤත්ති.**

*Non-commercial distribution*

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. (ඉත්ථන්නාමො) භික්ඛු කාලකතො. ඉදං තස්ස තිචීවරඤ්ච පත්තො ච. සඞ්ඝො ඉමං තිචීවරඤ්ච පත්තඤ්ච ගිලානුපට්ඨාකානං දෙති. යස්සායස්මතො ඛමති ඉමස්ස තිචීවරස්ස ච පත්තස්ස ච ගිලානුපට්ඨාකානං දානං, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

දින්නං සඞ්ඝෙන තිචීවරඤ්ච පත්තො ච ගිලානුපට්ඨාකානං. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.

මෘත සාමණේර චීවර දන
කර්ම වාක්‍යය.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. (ඉත්ථන්නාමො) සාමණෙරො කාලකතො. ඉදං තස්ස චීවරඤ්ච පත්තො ච. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ඉමං චීවරඤ්ච පත්තඤ්ච ගිලානුපට්ඨාකානං දදෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. (ඉත්ථන්නාමො) සාමණෙරො කාලකතො. ඉදං තස්ස චීවරඤ්ච පත්තො ච. සඞ්ඝො ඉමං චීවරඤ්ච පත්තඤ්ච ගිලානුපට්ඨාකානං දෙති. යස්සායස්මතො ඛමති ඉමස්ස චීවරස්ස ච පත්තස්ස ච ගිලානුපට්ඨාකානං දානං, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

දින්නං ඉදං සඞ්ඝෙන චීවරඤ්ච පත්තො ච ගිලානුපට්ඨාකානං. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.

Non-commercial distribution

**තිචීවරාවිප්පවාස සම්මුතිය.**

කඨිනානිසංසය කෙළවර වීමෙන් පසු එක් රැයකුදු තුන් සිවුරෙන් වෙන් ව විසුවහොත් නිසඟි පචිති වේ. ඒ නිසා භික්ෂුව විසින් අධිෂ්ඨාන කර ගත් තුන් සිවුරු ඇත්තේ නම්, ඒවා යන යන තැනට ගෙන යා යුතු ය. යම් කිසි දුබල බවක් නිසා තුන් සිවුරු නො ගෙන යා හැකි භික්ෂුව විසින් 'තිචීවරෙන අවිප්පවාස සම්මුතිය' ලබා ගත යුතු යි. එය ලැබූ භික්ෂුවට තුන් සිවුරෙන් වෙන් ව විසීමෙන් ඇවැත් නො වේ.

ගිලන් භික්ෂුව විසින් සඞ්ඝයා වෙත එළඹ, සිවුරු ඒකාංස කොට පෙරවා වැඩි මහලු භික්ෂූන්ගේ පා වැඳ උක්කුටිකව හිඳ සඞ්ඝයාට වැඳ-ගෙන මේ වාක්‍යය කිය යුතු ය.

**අහං භන්තෙ! ගිලානො, න සක්කොමි තිචීවරං ආදාය පක්කමිතුං. සො'හං භන්තෙ සඞ්ඝං තිචීවරෙන අවිප්පවාසසම්මුතිං යාචාමි. දුතියම්පි -පෙ- තතියම්පි -පෙ-**

කර්ම වාක්‍යය.

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (තිස්සො) භික්ඛු ගිලානො, න සක්කොති තිචීවරං ආදාය පක්කමිතුං. සො සඞ්ඝං තිචීවරෙන අවිප්පවාසසම්මුතිං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො තිචීවරෙන අවිප්පවාසසම්මුතිං දදෙය්‍ය. එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (තිස්සො) භික්ඛු ගිලානො, න සක්කොති තිචීවරං ආදාය පක්කමිතුං. සො සඞ්ඝං තිචීවරෙන අවිප්පවාස-සම්මුතිං යාචති. සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො තිචීවරෙන අවිප්පවාසසම්මුතිං දෙති. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො තිචීවරෙන අවිප්පවා-**

Non-commercial distribution

**සසම්මුතියා දනං, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.**

**දින්නා සඞ්ඝෙන (තිස්සස්ස) භික්ඛුනො තිචීවරෙන අවිප්පවාසසම්මුති. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමි.**

**නවකම්ම සම්මුතිය.**

යම්කිසි සැදැහැවතකු විසින් විහාරයක් හෙවත් ආවාසයක් කරන-කරවන කල්හි දයකයාට පහසුවීම සඳහා භික්ෂූන් විසින් එයට උපදෙස් දිය යුතු ය. එයට උපදෙස් දීම සැමට ම නො කළ හැකි බැවින් සඞ්ඝයා විසින් ඒ ක්‍රියාවට සුදුසු භික්ෂුවක් තෝරා ඒ භික්ෂුවට 'නවකම්ම සම්මුතිය' දිය යුතු ය. සම්මුතිය ලත් භික්ෂුව විසින් විහාර කර්මාන්තය ඉක්මනින් අවසන් වන සැටියටත්, සුදුසු පරිදි එහි වැඩ කෙරෙන සැටියටත්, දයකයාටත්, කම්කරුවන්ටත් උපදෙස් දිය යුතු ය.

විශාඛා මහා උපාසිකාවන් පූර්වාරාම මහා විහාරය කරවීමේදී මුගලන් මහතෙරුන් වහන්සේ නව කර්ම සංවිධානය කළ සේක. එයින් අවුරුදු ගණනකින් මිස නිම කළ නොහෙන පූර්වාරාම විහාර කර්මාන්තය නව මසකින් නිමාවට පැමිණියේ ය. (මෙකල විනය නො දත් ඇතැම් අතිපණ්ඩිතයෝ විහාර සෑදීම් පන්සල් සෑදීම් භික්ෂූන්ට අයත් වැඩ නො වේ යයි බොරු බණ කියමින් මහජනයා මුලා කෙරෙති.)

**නව කර්ම සම්මුතිය දෙන කර්ම වාක්‍යය.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො (ඉත්ථන්නාමස්ස) ගහපතිනො විහාරං (ඉත්ථන්නාමස්ස) භික්ඛුනො නවකම්මං දදෙය්‍ය. එසා ඤත්ති.**

Non-commercial distribution

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. (ඉත්ථන්නාමස්ස) ගහපතිනො විහාරං (ඉත්ථන්නාමස්ස) භික්ඛුනො නවකම්මං දෙති. යස්සායස්මතො ඛමති (ඉත්ථ-න්නාමස්ස) ගහපතිනො විහාරං (ඉත්ථන්නාමස්ස) භික්ඛුනො නවකම්මස්ස දානං. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

දින්නො සඞ්ඝෙන (ඉත්ථන්නාමස්ස) ගහපතිනො විහාරො (ඉත්ථන්නාමස්ස) භික්ඛුනො නවකම්මං. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.

**සේනාසන ගාහාපක සම්මුතිය.**

බොහෝ භික්ෂූන් පැමිණෙන, බොහෝ භික්ෂූන් වෙසෙන සඟසතු විහාරවලට පැමිණෙන භික්ෂූන්ට සෙනසුන් ගැන්වීම හෙවත් සෙනසුන් නියම කර දීමට භික්ෂුවක් සඞ්ඝයා විසින් පත්කළ යුතු ය. ඒ භික්ෂුව විසින් භික්ෂූන් ගණන් කොට සෙනසුන් ගණන් කොට සුදුසු පරිදි ඒ ඒ සෙනසුන් වලට භික්ෂූන් පත් කළ යුතු ය.

සේනාසන ගාහාපක සම්මුතිය
දෙන කර්ම වාක්‍යය.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (තිස්සං) භික්ඛුං සෙනාසන-ගාහාපකං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. සඞ්ඝො (තිස්සං) භික්ඛුං සෙනාසනගාහාපකං සම්මන්නති. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො සෙනාසනගාහාපකස්ස සම්මුති. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය. සම්මතො සඞ්ඝෙන

Non-commercial distribution

**(තිස්සො) භික්ඛු සෙනාසනගාහාපකො. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.**

**සේනාසන පඤ්ඤාපක සම්මුතිය.**

නිතර බෙහෝ භික්ෂූන් පැමිණෙන සඞ්ඝාරාමවලට සෙනසුන් පැනවීම කරන භික්ෂුවක් ද සඞ්ඝයා විසින් පත් කළ යුතු ය. සම්මුතිය ලැබූ භික්ෂුව විසින් විහාරයට පැමිණෙන භික්ෂූන්ට සුදුසු පරිදි සෙනසුන් පනවා දිය යුතු ය.

සේනාසන පඤ්ඤාපක සම්මුතිය

කරන කර්ම වාක්‍යය.

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (තිස්සං) භික්ඛුං සෙනාසන-පඤ්ඤාපකං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, සඞ්ඝො (තිස්සං) භික්ඛුං සෙනාසනපඤ්ඤාපකං සම්මන්නති. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො සෙනාසනපඤ්ඤාපකස්ස සම්මුති, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.**

**සම්මතො සඞ්ඝෙන (තිස්සො) භික්ඛු සෙනා-සනපඤ්ඤාපකො, ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.**

මල්ලරාජ පුත්‍ර වූ දබ්බ රහතන් වහන්සේ සේනාසන පඤ්ඤාපක සම්මුතිය හා භත්තුද්දේසක සම්මුතිය ද ලැබ විසූහ.

**භත්තුද්දේසක සම්මුතිය.**

බොහෝ භික්ෂූන් වෙසෙන සඞ්ඝාරාමවලට පැමිණ, දන් දෙනු කැමැත්තෝ පස්නම-දසනම යනාදි වශයෙන් භික්ෂූන්ට

Non-commercial distribution

තම තමන්ගේ නිවෙස්වලට ආරාධනා කෙරෙති. සඞ්ඝයාහට කරන ආරාධනා පිළිගෙන ඒවාට භික්ෂූන් නියම කර යැවීමට භික්ෂුවක් සඞ්ඝයා විසින් සම්මත කර ගත යුතු ය. සම්මුතිය ලත් භික්ෂුව විසින් ආරාධනා පිළිගෙන, ඉරටුවල හෝ පතුරුවල පත්වල හෝ දනයට යා යුතු තැන් සටහන් කොට, ඒ සියල්ල කලවම් කොට, ඨිතිකාවේ පටන් හෝ ඨිතිකාවක් නැති කල්හි මහ තෙරුන් වහන්සේගේ පටන් පිළිවෙළින් සලාක දිය යුතු ය. සලාක ලැබූ භික්ෂූන් විසින් තම තමන් ලැබූ සලාකවල සඳහන් වී ඇති තැන්වලට යා යුතු ය. මේ බත් උදෙසීමේ ක්‍රමය ය.

සම්මුතිය කරන කර්ම වාක්‍යය.

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (තිස්සං) භික්ඛුං භත්තුද්දෙසකං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, සඞ්ඝො (තිස්සං) භික්ඛුං භත්තුද්දෙසකං සම්මන්නති. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො භත්තුද්දෙසකස්ස සම්මුති. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.**

**සම්මතො සඞ්ඝෙන (තිස්සො) භික්ඛු භත්තුද්දෙසකො, ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.**

යාගු භාජක සම්මුතිය කරන
කර්ම වාක්‍යය.

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (තිස්සං) භික්ඛුං යාගුභාජකං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.**

Non-commercial distribution

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. සඞ්ඝො (තිස්සං) භික්ඛුං යාගුභාජකං සම්මන්නති. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො යාගුභාජකස්ස සම්මුති. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති. සො භාසෙය්‍ය.

සම්මතො සඞ්ඝෙන (තිස්සො) භික්ඛු යාගු-භාජකො. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එව මෙතං ධාරයාමි.

එල භාජක සම්මුතිය දෙන
කර්ම වාක්‍යය.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං. සඞ්ඝො (තිස්සං) භික්ඛුං ඵලභාජකං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. සඞ්ඝො (තිස්සං) භික්ඛුං ඵලභාජකං සම්මන්නති. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො ඵලභාජකස්ස සම්මුති. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති. සො භාසෙය්‍ය.

සම්මතො සඞ්ඝෙන (තිස්සො) භික්ඛු ඵල-භාජකො. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.

ඛජ්ජභාජක සම්මුතිය දෙන
කර්ම වාක්‍යය.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං. සඞ්ඝො (තිස්සං) භික්ඛුං ඛජ්ජභාජකං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.

Non-commercial distribution

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, සඞ්ඝො (තිස්සං) භික්ඛුං ඛජ්ජභාජකං සම්මන්නති. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො ඛජ්ජභාජකස්ස සම්මුති, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.**

**සම්මතො සඞ්ඝෙන (තිස්සො) භික්ඛු ඛජ්ජ-භාජකො, ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.**

**අප්පමත්තක විස්සජ්ජක සම්මුතිය.**

සියලු භික්ෂූන්ට බෙදා දිය හැකි තරමට සඞ්ඝයාගේ භාණ්ඩාගාරයට ප්‍රත්‍යය නො ලැබෙන කාලවලදී, ඒ ඒ භික්ෂූන්ට වුවමනා සුළු සුළු දේවල් දීමට භික්ෂුවක්හට 'අප්පමත්තක විස්සජ්ජක සම්මුතිය' දීමට තථාගතයන් වහන්සේ අනුදැන වදළ සේක. සම්මුතිය ලත් භික්ෂුවට සඞ්ඝයාගෙන් නො විමසා භාණ්ඩාගාරයෙන් සුළු සුළු දේවල් දීමට බලය තිබේ. ඒ භික්ෂුව විසින් සිවුරු මසා ගැනීමට ඉඳිකටු ඉල්ලන භික්ෂුවකට ඉඳිකටුවක් දිය යුතු ය. පිහියක් ඉල්ලන්නකුට කුඩා පිහියක් දිය යුතු ය. දුර ගමනක් යන භික්ෂුවකට සෙරෙප්පු ජෝඩුවක් දිය යුතු ය. ඉණ බඳනා පටියක් ඉල්ලන භික්ෂුවකට එය දිය යුතු ය. අංසයෙහි එල්ලන පටියක් වුවමනා වූ භික්ෂුවකට එය දිය යුතු ය. පෙරහන වුවමනා භික්ෂුවකට එය දිය යුතුය. ඩබරාවක් වුවමනා භික්ෂුවකට එය දිය යුතු ය. දික් ගැබ පිණිස ද, සරස් ගැබ පිණිස ද, මඬුලු අඩමඬුලු පිණිස ද, නුවාව පිණිස ද රෙදි ඉල්ලන්නා වූ භික්ෂූන්ට එය දිය යුතු ය. ගිතෙල්-මී පැණි ආදිය එක් වරකට වැළඳීමට සෑහෙන පමණ දිය යුතු ය.

කර්ම වාක්‍යය.

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (තිස්සං) භික්ඛුං අප්පමත්තකවිස්සජ්ජකං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.**

*Non-commercial distribution*

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, සඞ්ඝො (තිස්සං) භික්ඛුං අප්පමත්තකවිස්සජ්ජකං සම්මන්නති. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො අප්පමත්තකවිස්සජ්ජකස්ස සම්මුති. සො තුණ්හස්ස, යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.**

**සම්මතො සඞ්ඝෙන (තිස්සො) භික්ඛු අප්පමත්තකවිස්සජ්ජකො, ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.**

**පත්තගාහාපක සම්මුතිය.**

පත්තගාහාපක සම්මුති දෙකකි. ඉන් එකක් සඞ්ඝයාට ලැබී ඇති පාත්‍ර බෙදා දීම සඳහා කරන සම්මුතියකි. එය **චූලවග්ගපාළියේ සේනාසනක්ඛන්ධකයෙහි** දැක්වේ. අනික "යො පන භික්ඛු ඌනපඤ්චබන්ධනෙන පත්තෙන අඤ්ඤං නවං පත්තං චෙතාපෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං' යන සිකපදයේ හැටියට පස් තැනක් පිළියම් නො කළ පාත්‍රයක් ඇතිව සිට අනුන්ගෙන් අලුත් පාත්‍රයක් ඉල්ලා ගැනීමෙන් ඇවැතට පැමිණි භික්ෂුව විසින් සඞ්ඝයා හට නිසදන ලද පාත්‍රය භික්ෂූන්ට ගැන්වීමට හෙවත් දීමට කරන සම්මුතියකි. එය **පාරාජිකා පාළියේ** වදරා තිබේ. දෙක්හිම කර්ම වාක්‍යවල වෙනසක් නැත්තේ ය.

කර්මවාක්‍ය මෙසේ ය:-

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (තිස්සං) භික්ඛුං පත්තගාහාපකං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, සඞ්ඝො (තිස්සං) භික්ඛුං පත්තගාහාපකං සම්මන්නති. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො පත්තගාහාපකස්ස**

Non-commercial distribution

**සම්මුති. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.**

**සම්මතො සඞ්ඝෙන (තිස්සො) භික්ඛු පත්තගාහාපකො, ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමි.**

පස් තැනක් පිළියම් නො කළ පාත්‍රයක් ඇතිව සිට අලුත් පාත්‍රය ඉල්ලා ගත් භික්ෂුව විසින් සඞ්ඝයා වෙත එළඹ, සිවුර ඒකාංස කොට පෙරවා, වැඩි මහලු භික්ෂූන්ගේ පා වැඳ, උක්කුටිකව හිඳ, ඇඳිලි බැඳ:

**"අයං මෙ භන්තෙ! පත්තො ඌන පඤ්චබන්ධනෙන පත්තෙන චෙතාපිතො නිස්සග්ගියො. ඉමා'හං සඞ්ඝස්ස නිස්සජාමි"** යි පාත්‍රය සඞ්ඝයාට නිස්සර්ජනය කොට ඇවැත දෙසා ගත යුතු ය. මේ කර්මයට සඞ්ඝයා රැස්විය යුත්තේ පාත්‍රය ද ඇතිව ය. නිස්සර්ජනය කළ පාත්‍රය භික්ෂූන්ට ගැන්වීමට ඉහත කී කර්ම වාක්‍යයෙන් භික්ෂුවක් සම්මත කළ යුතු ය. සම්මුතිය ලැබූ භික්ෂුව ඒ පාත්‍රය ගෙන එහි ඇති ගුණ කියා සඞ්ඝස්ථවිරයන් වහන්සේට එය පිළිගැන්විය යුතු ය. ඒ පාත්‍රය තමන්ගේ පාත්‍රයට වඩා හොඳ නම්, සඞ්ඝස්ථවිරයන් වහන්සේ ඒ පාත්‍රය පිළිගෙන උන්වහන්සේගේ පාත්‍රය සම්මුතිය ලත් භික්ෂුවට දිය යුතු ය. පාත්‍රයේ පළමු අයිතිකාර භික්ෂුව කෙරෙහි අනුකම්පාවෙන් එය නො පිළිගතහොත් සඞ්ඝස්ථවිරයන්ට දුකුළා ඇවැත් වේ. පාත්‍රය නරක නිසා නො පිළිගත්තාට ඇවැත් නො වේ. සඞ්ඝස්ථවිරයන් ඒ පාත්‍රය පිළිගතහොත් සඞ්ඝස්ථවිරයන්ගේ ඒ පාත්‍රය දෙවන තෙරුන් වහන්සේට පිළිගැන්විය යුතු ය. මෙසේ සියලු ම භික්ෂූන්ට පාත්‍රය දී අන්තිමට ඉතිරිවන සියල්ලටම ලාමක පාත්‍රය, පාත්‍ර විඥාපනය කළ භික්ෂුවට දියයුතු ය.

රූපියඡඩ්ඩක සම්මුතිය.

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (තිස්සං) භික්ඛුං රූපියඡඩ්ඩකං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.**

Non-commercial distribution

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. සඞ්ඝො (තිස්සං) භික්ඛුං රූපියඡඩ්ඩකං සම්මන්නති. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො රූපියඡඩ්ඩකස්ස සම්මුති, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

සම්මතො සඞ්ඝෙන (තිස්සො) භික්ඛු රූපියඡඩ්ඩකො. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.

සාටිය ගාහාපක සම්මුතිය.

සඞ්ඝයාට ලැබෙන වැසි සළු සුදුසු පරිදි බෙදා දීම ද කළ යුතු බැවින් තථාගතයන් වහන්සේ සාටිය ගාහාපක සම්මුතිය අනුදැන වදළ-සේක.

කර්ම වාක්‍යය මෙසේය:-

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (තිස්සං) භික්ඛුං සාටිය-ගාහාපකං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. සඞ්ඝො (තිස්සං) භික්ඛුං සාටියගාහාපකං සම්මන්නති. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො සාටියගාහාපකස්ස සම්මුති, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

සම්මතො සඞ්ඝෙන (තිස්සො) භික්ඛු සාටිය-ගාහාපකො. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.

Non-commercial distribution

**ආරාමික පේසක සම්මුතිය.**

ආරාමිකයෝ නම් භික්ෂූන්ට උපකාරය පිණිස සඞ්ඝාරාමයේ වෙසෙන ගිහියෝ ය. ඔවුන් ඒ ඒ කටයුතුවල යොදවන්නකු නැති කල්හි ඔවුහු කටයුතු නො කරති. කරන්නාහු සුදුසු පරිදි නො කරති. එබැවින් ආරාමික පේසකයකු සම්මත කිරීමට තථාගතයන් වහන්සේ අනුදැන වදාළ-සේක. ආරාමික පේසකයාය යනු ආරාමිකයන් ඒ ඒ වැඩවලට යොදවන තැනැත්තා ය. ආරාමික පේසක සම්මුතිය ලත් භික්ෂුව විසින් ආරාමිකයන් ඒ ඒ වැඩවල යෙදවිය යුතු ය.

කර්ම වාක්‍යය.

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (තිස්සං) භික්ඛුං ආරාමිකපෙසකං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, සඞ්ඝො (තිස්සං) භික්ඛුං ආරාමිකපෙසකං සම්මන්නති. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො ආරාමිකපෙසකස්ස සම්මුති. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.**

**සම්මතො සඞ්ඝෙන (තිස්සො) භික්ඛු ආරාමික-පෙසකො. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.**

**සාමණේර පේසක සම්මුතිය.**

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (තිස්සං) භික්ඛුං සාමණෙර-පෙසකං සම්මන්නෙය්‍ය, එසා ඤත්ති.**

Non-commercial distribution

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, සඞ්ඝො (තිස්සං) භික්ඛුං සාමණෙරපෙසකං සම්මන්නති. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො සාමණෙරපෙසකස්ස සම්මුති, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

සම්මතො සඞ්ඝෙන (තිස්සො) භික්ඛු සාමණෙරපෙසකො. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.

දණ්ඩ සම්මුතිය.

සැරයටියක් නො මැතිව ඇවිදින්නට නුපුළුවන් භික්ෂූන් විසින් සැරයටිය පාවිච්චි කිරීමට දණ්ඩ සම්මුතිය ලබා ගත යුතු ය. එය ලබනු කැමති භික්ෂුව විසින් සඞ්ඝයා වෙත එළඹ, සිවුර ඒකාංස කොට පෙරවා, වැඩි මහලු භික්ෂූන්ගේ පා වැඳ, උක්කුටිකයෙන් හිඳ, ඇඳිලි බැඳ:

**අහං භන්තෙ! ගිලානො, න සක්කොමි විනා දණ්ඩෙන ආහිණ්ඩිතුං. සො'හං භන්තෙ සඞ්ඝං දණ්ඩසම්මුතිං යාචාමි. දුතියම්පි -පෙ- තතියම්පි -පෙ-**

යන වාක්‍යය කියා සඞ්ඝයාගෙන් දණ්ඩ සම්මුතිය අයැදිය යුතු ය.

දණ්ඩ සම්මුතිය දෙන

කර්ම වාක්‍යය.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (තිස්සො) භික්ඛු ගිලානො න සක්කොති විනා දණ්ඩෙන ආහිණ්ඩිතුං, සො සඞ්ඝං දණ්ඩසම්මුතිං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො දණ්ඩසම්මුතිං දදෙය්‍ය. එසා ඤත්ති.

Non-commercial distribution

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (තිස්සො) භික්ඛු ගිලානො, න සක්කොති විනා දණ්ඩෙන ආහිණ්ඩිතුං, සො සඞ්ඝං දණ්ඩසම්මුතිං යාචති. සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො දණ්ඩසම්මුතිං දෙති. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො දණ්ඩ-සම්මුතියා දානං. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.**

**දින්නා සඞ්ඝෙන (තිස්සස්ස) භික්ඛුනො දණ්ඩ-සම්මුති. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.**

**සික්කා සම්මුතිය.**

සහල්ලක ලා එල්ලා ගෙන මිස පාත්‍රය ගෙන යාම අපහසු දුබල ගිලන් මහණුන්ට සික්කා සම්මුතිය දෙනු ලැබේ. එය ලබනු කැමති භික්ෂුව සඞ්ඝයා වෙත එළඹ, සිවුර ඒකාංස කොට පෙරවා වැඩිමහලු භික්ෂූන්ගේ පා වැඳ උක්කුටිකව හිඳ මේ වාක්‍යයෙන් සික්කා සම්මුතිය සඞ්ඝයාගෙන් ඉල්ලිය යුතු ය.

**අහං භන්තෙ ගිලානො, න සක්කොමි විනා සික්කාය පත්තං පරිහරිතුං, සො'හං භන්තෙ සඞ්ඝං සික්කා සම්මුතිං යාචාමි. දුතියම්පි -පෙ- තතියම්පි -පෙ-**

කර්ම වාක්‍යය.

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, අයං (තිස්සො) භික්ඛු ගිලානො, න සක්කොති විනා සික්කාය පත්තං පරිහරිතුං, සො සඞ්ඝං සික්කාසම්මුතිං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො සික්කාසම්මුතිං දදෙය්‍ය. එසා ඤත්ති.**

Non-commercial distribution

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. අයං (තිස්සො) භික්ඛු ගිලානො, න සක්කොති විනා සික්කාය පත්තං පරිහරිතුං, සො සඞ්ඝං සික්කාසම්මුතිං යාචති. සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො සික්කාසම්මුතිං දෙති. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො සික්කාසම්මුතියා දානං. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

දින්නා සඞ්ඝෙන (තිස්සස්ස) භික්ඛුනො සික්කාසම්මුති. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එව-මෙතං ධාරයාමි.

දණ්ඩසික්කා සම්මුතිය
ඉල්ලීමේ වාක්‍යය.

අහං භන්තෙ ගිලානො, න සක්කොමි විනා දණ්ඩෙන ආහිණ්ඩිතුං, න සක්කොමි විනා සික්කාය පත්තං පරිහරිතුං, සො'හං භන්තෙ සඞ්ඝං දණ්ඩසික්කාසම්මුතිං යාචාමි. දුතියම්පි -පෙ- තතියම්පි -පෙ-

කර්ම වාක්‍යය.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. අයං (තිස්සො) භික්ඛු ගිලානො, න සක්කොති විනා දණ්ඩෙන ආහිණ්ඩිතුං, න සක්කොති විනා සික්කාය පත්තං පරිහරිතුං, සො සඞ්ඝං දණ්ඩසික්කා සම්මුතිං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො දණ්ඩසික්කාසම්මුතිං දදෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. අයං (තිස්සො) භික්ඛු ගිලානො, න සක්කොති විනා දණ්ඩෙන

Non-commercial distribution

**ආහිණ්ඩිතුං, න සක්කොති විනා සික්කාය පත්තං පරිහරිතුං. සො සඞ්ඝං දණ්ඩසික්කාසම්මුතිං යාචති. සඞ්ඝො (තිස්සස්ස) භික්ඛුනො දණ්ඩසික්කාසම්මුතිං දෙති. යස්සායස්මතො ඛමති (තිස්සස්ස) භික්ඛුනො දණ්ඩසික්කාසම්මුතියා දානං, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.**

**දින්නා සඞ්ඝෙන (තිස්සස්ස) භික්ඛුනො දණ්ඩසික්කාසම්මුති. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.**

## උම්මත්තක සම්මුතිය.

සඞ්ඝ කර්මයක් කළ හැකි වීමට සීමාව තුළ වෙසෙන සියලු භික්ෂූන් එතැනට පැමිණිය යුතු ය. නො පැමිණිය හැකි භික්ෂූන්ගේ ඡන්දය ගත යුතු ය. බුද්ධකාලයෙහි උමතුව විසූ **ගග්ග** නම් භික්ෂුව සඞ්ඝ කර්මයට පැමිණෙන්නට සිතුනහොත් පැමිණෙයි. නො සිතුනහොත් නො පැමිණෙයි. එය සඞ්ඝයාට කරදරයක් විය. උමතු භික්ෂූන් නිසා සඞ්ඝයාට වන කරදරය නැති වීම පිණිස තථාගතයන් වහන්සේ උමතු භික්ෂූන්ට "උම්මත්තක සම්මුතිදානය" අනුදැන වදාළ සේක.

කර්ම වාක්‍යය.

**සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, (ගග්ගො) භික්ඛු උම්මත්තකො, සරති' පි උපොසථං න'පි සරති, සරති'පි සඞ්ඝකම්මං න'පි සරති ආගච්ඡති'පි උපොසථං න'පි ආගච්ඡති, ආගච්ඡති'පි සඞ්ඝ-කම්මං න'පි ආගච්ඡති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො (ගග්ගස්ස) භික්ඛුනො උම්මත්තකස්ස උම්මත්තකසම්මුතිං දදෙය්‍ය. සරෙය්‍ය වා (ගග්ගො)**

Non-commercial distribution

භික්ඛු උපොසථං න වා සරෙය්‍ය. සරෙය්‍ය වා සඞ්ඝකම්මං න වා සරෙය්‍ය, ආගච්ඡෙය්‍ය වා උපොසථං න වා ආගච්ඡෙය්‍ය, ආගච්ඡෙය්‍ය වා සඞ්ඝකම්මං න වා ආගච්ඡෙය්‍ය, සඞ්ඝො සහ වා (ගග්ගෙන) විනා වා (ගග්ගෙන) උපොසථං කරෙය්‍ය. සඞ්ඝකම්මං කරෙය්‍ය, එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, (ගග්ගො) භික්ඛු උම්මත්තකො සරති'පි උපොසථං න'පි සරති සරති'පි සඞ්ඝකම්මං න'පි සරති, ආගච්ඡති'පි උපොසථං න'පි ආගච්ඡති. ආගච්ඡති 'පි සඞ්ඝකම්මං න'පි ආගච්ඡති, සඞ්ඝො (ගග්ගස්ස) භික්ඛුනො උම්මත්තකස්ස උම්මත්තක සම්මුතිං දෙති, සරෙය්‍ය වා (ගග්ගො) භික්ඛු උපොසථං න වා සරෙය්‍ය, සරෙය්‍ය වා සඞ්ඝකම්මං න වා සරෙය්‍ය, ආගච්ඡෙය්‍ය වා උපොසථං න වා ආගච්ඡෙය්‍ය, ආගච්ඡෙය්‍ය වා සඞ්ඝකම්මං න වා ආගච්ඡෙය්‍ය, සඞ්ඝො සහ වා (ගග්ගෙන) විනා වා (ගග්ගෙන) උපොසථං කරිස්සති, සඞ්ඝකම්මං කරිස්සති, යස්සායස්මතො ඛමති (ගග්ගස්ස) භික්ඛුනො උම්මත්තකස්ස උම්මත්තකසම්මුතියා දානං. සරෙය්‍ය වා (ගග්ගො) භික්ඛු උපොසථං න වා සරෙය්‍ය, සරෙය්‍ය වා සඞ්ඝකම්මං න වා සරෙය්‍ය, ආගච්ඡෙය්‍ය වා උපොසථං න වා ආගච්ඡෙය්‍ය, ආගච්ඡෙය්‍ය වා සඞ්ඝකම්මං න වා ආගච්ඡෙය්‍ය, සඞ්ඝො සහ වා (ගග්ගෙන) විනා වා (ගග්ගෙන) උපොසථං කරිස්සති, සඞ්ඝකම්මං කරිස්සති, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

Non-commercial distribution

දින්නා සඞ්ඝෙන (ගග්ගස්ස) භික්ඛුනො උම්මත්තකස්ස උම්මත්තක සම්මුති. සරෙය්‍ය වා (ගග්ගො) භික්ඛු උපොසථං න වා සරෙය්‍ය, සරෙය්‍ය වා සඞ්ඝකම්මං න වා සරෙය්‍ය, ආගච්ඡෙය්‍ය වා උපොසථං න වා ආගච්ඡෙය්‍ය, ආගච්ඡෙය්‍ය වා සඞ්ඝකම්මං න වා ආගච්ඡෙය්‍ය, සඞ්ඝො සහ වා (ගග්ගෙන) විනා වා (ගග්ගෙන) උපොසථං කරිස්සති, සඞ්ඝකම්මං කරිස්සති, ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.

මෙසේ උම්මත්තක භික්ෂුවට උම්මත්තක සම්මුතිය දුන් පසු ඒ භික්ෂුව සහ මැද සිටියත් සඞ්ඝයාගෙන් බැහැර සීමාවේ සිටියත් එයින් කරන විනය කර්මයට හානියක් නො වේ.

Non-commercial distribution

# සීමා බන්ධන විනය කර්මය

සීමා බන්ධනය විනයානුකූලව නො කැරුනහොත් එහි කැරෙන විනයකර්ම එකකුදු නො හරියන බැවින් සීමා බන්ධනය ඉතා පරෙස්සමෙන්, ඉතා සැලකිල්ලෙන්, ඉතා පිරිසිදු ලෙස කළ යුතු විනය කර්මයෙකි. එය පිරිසිදු ලෙස කළ හැකි වීම පිණිස සීමා විපත්ති එකොළොස හා ත්‍රිවිධ සීමා සම්පත්තිය ද දත යුතු ය.

**"අති ඛුද්දකා, අති මහතී, ඛණ්ඩනිමිත්තා, ඡායානිමිත්තා, අනිමිත්තා, බහි සීමෙ ඨිතසම්මතා, නදියා සම්මතා, සමුද්දෙ සම්මතා, ජාතස්සරෙ සම්මතා, සීමාය සීමං සම්භින්දන්තෙන සම්මතා, සීමාය සීමං අජ්ඣොත්ථරන්තෙන සම්මතාති ඉමෙහි එකාදසහි ආකාරෙහි සීමතො කම්මානි විපජ්ජන්ති"**

මෙසේ වදරා ඇති බැවින් ඉතා කුඩා සීමාවය, ඉතා මහත් සීමාවය, කඩවූ නිමිති ඇති සීමාවය, ඡායානිමිත්තෙන් සම්මත සීමාවය, නිමිති නො කියා සම්මත සීමාව ය, සීමාවෙන් පිටත සිට සම්මත කළ සීමාවය, නදියෙහි සම්මත සීමාවය, සමුද්‍රයෙහි සම්මත සීමාව ය, විලෙහි සම්මත සීමාවය, පුරාණ සීමාවක් හා මිශ්‍රකොට සම්මත සීමාවය, පුරාණ සීමාවක් යට කොට සම්මත සීමාවය, යන සීමා එකොළොස විපත්ති සීමාවෝය. ඒ සීමාවන්හි කරන විනය කර්මයෝ සිද්ධියට නො පැමිණෙති.

(1) ඉතා කුඩා සීමාව නම්, භික්ෂූන් විසිඑක් නමකට හිඳ විනයකර්මයක් කිරීමට ඉඩ නැත්තා වූ සීමාව ය.

Non-commercial distribution

(2) ඉතා මහත් සීමාව නම්, දිගින් පුළුලින් තුන් යොදුනකට වඩා මදකුදු මහත් වන සීමාව ය.

(3) ඛණ්ඩනිමිත්ත සීමාව නම්, නිමිත්තෙන් නිමිත්ත ගටා නිමිත්ත කීර්තනය නො කොට සම්මත කළ සීමාවය. නිමිති නම් සීමාවක මායිම් සලකුණු ය. සීමාවක් සම්මත කරන කල්හි විනයධරයා විසින් එක් තැනකින් පටන් ගෙන "පුරත්ථිමාය දිසාය කිං නිමිත්තං?" යනාදීන් නිමිති විචාරමින් එයට පිළිතුරු ලද කල්හි "එසො පාසාණො නිමිත්තං" යනාදීන් පිළිවෙළින් නිමිති කිය යුතු ය. එසේ කීමේදී අවසාන නිමිත්ත කියා නැවත එය පළමු කී නිමිත්ත හා සම්බන්ධ වනු පිණිස පළමු කීර්තනය කළ නිමිත්ත නැවත ද කීර්තනය කළ යුතු ය. එසේ නො කොට අවසාන නිමිත්ත කීර්තනයෙන් නවත්වා සම්මත කළ සීමාව, කඩවූ නිමිති ඇති සීමාවක් වේ. එය අසීමාවෙකි. තවද නිමිත්තට නුසුදුසු දෙයක් නිමිත්ත වශයෙන් ගෙන සම්මත කළ සීමාව ද ඛණ්ඩ නිමිත්ත සීමා නම් වේ.

(4) ඡායානිමිත්ත සීමාවය යනු වෘක්ෂ පර්වතාදි යම් කිසිවක ඡායා නිමිති වශයෙන් ගෙන සම්මත කළ සීමාව ය.

(5) අනිමිත්ත සීමාවය යනු නිමිති තබන ලදුයේ වී නමුත් නිමිත්ත කීර්තනය නො කොට සම්මත කළ සීමාව ය.

(6) සීමාවෙන් පිටත සිට සම්මත කළ සීමාවය යනු නිමිත්ත කීර්තනය කොට නිමිතිවලින් පිට සිට ගෙන සම්මත කළ සීමාව ය.

(7.8.9) "**සබ්බා භික්ඛවෙ නදී අසීමා, සබ්බො සමුද්දෙ අසීමො, සබ්බො ජාතස්සරෝ අසීමො**' යි වදාරා ඇති බැවින් ගඞ්ගාවෙහි හෝ මුහුදෙහි හෝ විලෙහි හෝ සම්මත කරන සීමාවෝ සීමා නො වෙති.

(10) කලින් සම්මත කළ සීමාවකින් සුළු කොටසක් හසුකොට සම්මත කළ සීමාව ද අසීමාවෙකි.

(11) කලින් සම්මත කළ සීමාවක් සම්පූර්ණයෙන් හෝ සීමාවකින් සතර නමකට වාඩිවිය හැකි තරමේ කොටසක් හෝ

Non-commercial distribution

අනුකොට සම්මත කළ සීමාව පුරාණ සීමාවක් යට කොට සම්මත කළ සීමාව ය. එද අසීමාවෙකි.

**ත්‍රිවිධ සම්පත්තිය** යනු, '**නිමිත්ත සම්පත්තියය. පරිස සම්පත්තියය, කම්මවාචා සම්පත්තියය**' යන මේ තුනය.

නිමිත්ත යනු සම්මත කරන භූමියේ මායිම් සලකුණු ය. "**පඨමං නිමිත්තා කිත්තෙතබ්බා. පබ්බතනිමිත්තං. පාසාණනිමිත්තං වනනිමිත්තං රුක්ඛනිමිත්තං මග්ග නිමිත්තං වම්මිකනිමිත්තං නදීනිමිත්තං උදකනිමිත්තං**" යි වදාළ බැවින් සීමාවකට නිමිති වශයෙන් ගතයුතු වස්තු අටෙකි. එනම් පර්වතයය, ගලය, වනයය, වෘක්ෂයය, මාර්ගයය, තුඹසය, ගඟය, ජලයය යන මේ අටය.

**පබ්බත නිමිත්ත**

පස් කන්දය, ගල් කන්දය, පස් ගල් කලවම් කන්දය යි පර්වත තුන් වර්ගයෙකි. උස්ව පිහිටියේ ඇතකුගේ ප්‍රමාණයට කුඩා නම්, එය පර්වත සඞ්ඛ්‍යාවට නො ගැනේ. වැලි කඳු ද පර්වත සඞ්ඛ්‍යාවට නො ගැනේ. එබැවින් ඇතකු පමණට උස් නො වන කඳු හා වැලි කඳු සීමා නිමිති වශයෙන් නො ගනු ලැබේ. සතර පැත්තේ පර්වත සතරක් ඇති තැන ඒවා නිමිත්ත වශයෙන් කියා සීමා සම්මුතිය කළ හැකි ය. පර්වත තුනක් ඇති කල්හි නිමිති තුනෙන් ද සීමා බන්ධනය කළ හැකි ය. නිමිති එකකින් හෝ දෙකකින් සීමා බන්ධනය නො කළ හැකි ය. පර්වතයේ කොටසක් සීමා භූමියට ඇතුළු කොට බන්ධනය කරනහොත් පර්වතය සීමා නිමිත්ත වශයෙන් කීර්තනය නොකොට එහි පිහිටි ගසක් හෝ ගලක් හෝ තුඹසක් හෝ සීමා නිමිත්ත කර ගත යුතු ය. නිමිත්ත සෑම කල්හි ම සීමා භූමියෙන් පිටත තිබිය යුතු ය. ඒකාබද්ධ පර්වත දෙකක් එක් නිමිත්තක් වශයෙන් මිස නිමිති දෙකක් වශයෙන් නො ගත යුතු ය. වක්‍රපර්වතයක් සීමා භූමියෙන් දෙතුන් පැත්තක පිහිටියේ ද එය එක් දිසාවකට පමණක් නිමිත්ත වශයෙන් ගත යුතු ය. පර්වතය ඇතත් අනික් පැතිවලට අනික් දෙයක් නිමිත්ත කර ගත යුතු ය. සම්පූර්ණ පර්වතය සීමා භූමියට ඇතුළු කොට සීමා බන්ධනය කරනහොත් ඉන් පිටත පිහිටි ගස් ගල් ආදිය නිමිති කර ගත යුතු ය.

Non-commercial distribution

**පාෂාණ නිමිත්ත.**

කවර ජාතියකට වුවද අයත් ගලක් සීමා නිමිත්තට යෝග්‍යය. යබොර ද පාෂාණ සඞ්ඛ්‍යාවට යේ. එබැවින් එය සීමා නිමිත්තට යෝග්‍යය. ඇතකු පමණට හෝ එයට වඩා හෝ මහත් ගල පර්වත නිමිත්ත වශයෙන් මිස පාෂාණ නිමිත්ත වශයෙන් කීර්තනය නො කළ යුතු ය. පාෂාණ නිමිත්ත වශයෙන් කීර්තනය කළ යුත්තේ ඇතකුට කුඩා ගල් ය. කුඩා ගල් කැට රාශියක් හෝ ගඩොල් කැටයක් හෝ පාෂාණ නිමිත්ත වශයෙන් නො ගත යුතු ය. **"ඛත්තිංස පල ගුළපිණ්ඩ පරිමාණො වට්ටති. න තතො ඛුද්දකතරො"** යනුවෙන් දෙතිස් පලමක් බර සකුරු පිඩක් පමණ ඇති ගලට කුඩා ගලක් සීමා නිමිත්ත වශයෙන් නො ගත යුතු බව විනය අටුවාවේ දක්වා තිබේ.

මේ රටේ වෛද්‍යව්‍යවහාරයේ සැටියට මදටිය විස්සක් කලදෙකි. කලං දෙළොසක් පලමෙකි. ඒ මිම්මේ සැටියට පලම් දෙතිස රාත්තල් පසකුත් තුන් කාලක් පමණ වේ. මගධ දේශයේ භාවිත කරන මිම්ම ලෝකව්‍යවහාර මිම්මෙන් දෙගුණයක් ඇති බව ද දෙතිස් පලම මගධ මිම්මෙන් ගත යුතු බව ද කියති. නා නා මිනුම් ක්‍රම ඇති බැවින් අටුවාවෙහි දැක්වෙන පලම අවිනිශ්චිතය. එහෙත් එතරම් විශාල සකුරු පිඩු ඇතිවිය නො හෙන බැවින් අඩි දෙකතුන පමණ ඇති දැනට සීමා නිමිති වශයෙන් ගන්නා ගල් කණු සීමා නිමිත්තට ප්‍රමාණ නො වෙතැයි නො කිය හැකි ය.

බුරුමයේ විනය ගරුක තෙරුන් වහන්සේලා නිමිති වශයෙන් ගල් කණු සිටවා සීමා බන්ධනය නො කෙරෙති. වළවල් සාරා ජලය පුරවා උදක නිමිත්තයෙන් සීමා බන්ධනය කෙරෙති. තැන් දැන ගැනීම සඳහා ගල් කණු පසුව ඒ තැන්වල පිහිටවති. ගල්තලාව කොපමණ මහත් වුව ද පාෂාණ නිමිත්ත ලෙස ගත හැකි ය. ඉදින් මහ ගල්තලාවකින් කොටසක් සීමා භූමියට ඇතුළු කරනු කැමැත්තේ නම් ගල්තලාව සීමා නිමිත්තක් වශයෙන් නො ගෙන එය මතුයෙහි ඇති අනිකක් සීමා නිමිත්ත කර ගත යුතු ය. එකම ගල්තලාවක් සීමා භූමියෙන් දෙතුන් පැත්තක පිහිටියේ නම් එය එක් පැත්තක නිමිත්ත වශයෙන් පමණක් ගත යුතු ය. එකම ගල්තලාව නිමිති

Non-commercial distribution

දෙක තුනක් වශයෙන් කීර්තනය නො කළ යුතු ය. අතික් පැති වලට නිමිති වශයෙන් අතික් දෙයක් ගත යුතු ය.

**වන නිමිත්ත.**

ඇතුළත හරය නැති තල් පොල් කිතුල් ආදී ගස් වලින් සැදුණු වනය සීමා නිමිත්ත වශයෙන් ගැනීමට නුසුදුසු ය. සීමා නිමිත්ත වශයෙන් ගත යුත්තේ ඇතුළත හරය ඇති ගස් වලින්ම සැදුණා වූ හෝ ඇතුළත හරය ඇති ගසින් මිශ්‍ර වූ හෝ වනය ය. වනයක් වීමට යටත් පිරිසෙයින් ගස් සතරක් පහක්වත් තිබිය යුතු ය. ගස් දෙක තුනක්, වන නිමිත්තක් වශයෙන් නො ගත යුතු ය. නිමිත්ත වශයෙන් ගන්නා වනය කොතෙක් මහත් වුව ද මහත් වීමෙන් දෝෂයක් නැත්තේ ය. වන මැද සීමා බන්ධනයක් කරත හොත් වනය නිමිත්තක් වශයෙන් නො ගත යුතු ය. වනයෙන් කොටසක් ඇතුළු කොට සීමා බන්ධනය කිරීමේදී ද වනය නිමිත්තක් වශයෙන් නො සැලකිය යුතු ය. සීමා භූමිය තුළ වනයක් නැතිව ඒ භූමිය වටා වනය පිහිටා ඇති තැනක සීමා බන්ධනය කිරීමේදී වටා පිහිටි වනය එක් දිශාවකට නිමිත්ත වශයෙන් කීර්තනය කළ හැකි ය.

**රුක්ඛ නිමිත්ත.**

වෘක්ෂ නිමිත්ත වශයෙන් ගන්නා ගස ද ඇතුළත හරය ඇති ගස් වර්ගයකට අයත් ගසක් විය යුතු ය. හුණ-බට-පොල්-පුවක් ආදි හරය පිට පිහිටි ගස් සීමා නිමිත්ත වශයෙන් ගැනීමට සුදුසු නො වේ. ඇතුළත හරය ඇති ගස් වර්ගයකට අයත් නම්, උසින් අටඟුලක් පමණ වූ ද, මහතින් පන්හිඳක් පමණ වූ ද, ජීවමාන ගස සීමා නිමිත්තට සුදුසු ය. මහත් වූයේ ද මළ ගස නුසුදුසු ය. බිම පිහිටි ගස මිස භාජනයක පිහිටි ගස සීමා නිමිත්තට නුසුදුසු ය. භාජනයක රෝපිත ගසක් සීමා නිමිත්ත කරනු කැමැත්තේ නම්, එය බිම පිහිටවා ගත යුතු ය. එකෙණෙහි ම රෝපනය කළ ජීවත්වීම ගැන විශ්වාසය නොතැබිය හැකි ගස ද සීමා නිමිත්ත වශයෙන් නො ගත යුතු ය. අතුවලින් මුල් බැස විශාල ප්‍රදේශයක පැතිර පවත්නා නුග ගස් ඇත්තේ ය. එබඳු ගස එක් තැනකට මිස දෙතුන්

Non-commercial distribution

පලකට නිමිත්ත වශයෙන් කීර්තනය නො කළ යුතු ය. නොයෙක් තැන් වලට මුල් බැස ඇතත් ගස එකක් ම වන බැවිනි.

**මග්ග නිමිත්ත.**

වතු කුඹුරු වැව් පොකුණු ආදියට යන කෙටි පාරවල් සීමා නිමිත්තට නුසුදුසු ය. සීමා නිමිති වශයෙන් ගත යුත්තේ යටත් පිරිසෙයින් ගම් දෙක තුනක්වත් විනිවිද යන දීර්ඝ මාර්ගය ය. යම් කිසි පිය මඟක් රිය මගින් පටන් ගෙන නැවත ඒ රිය මඟට ම වැටී කෙළවර වේ නම්, ඒ මඟ ද සීමා නිමිත්තක් වශයෙන් නො ගත යුතු ය. දීර්ඝ මාර්ගයක් වුව ද මගීන් විසින් හැර දමන ලද්දක් වේ නම්, එද සීමා නිමිත්තකට නුසුදුසු ය. සීමා නිමිත්ත වශයෙන් කීර්තනයට සුදුසු වන්නේ මගීන්ගේ ගමන් කිරීම ද ඇති යටත් පිරිසෙයින් ගම් දෙක තුනක්වත් විනිවිද යන මාර්ගය ය. වෙන් වශයෙන් පටන් ගැනීම ඇති දෙමඟක් යම් කිසි තැනක දී එක් වී ඇති නම්, ඉන් එකක් මිස දෙක ම සිමා නිමිති නො කළ යුතු ය. සීමා නිමිති එකිනෙක වෙන්ව තිබිය යුතු ය.

**වම්මික නිමිත්ත.**

එදින ම බදිනා ලද අටඟුලක් උස ඇති ගව අඟක් පමණ මහත් වූ තුඹස ද සීමා නිමිත්ත වශයෙන් ගැනීම සුදුසු ය. එයට ද කුඩා තුඹසක් සීමා නිමිත්තක් වශයෙන් ගැනීමට සුදුසු නො වේ. කන්දක් පමණ මහත් වූයේ ද තුඹස සීමා නිමිත්තට සුදුසු වේ. සීමා භූමිය වටා ඒකාබද්ධව පිහිටි තුඹසක් වේ නම්, එය එක් දිශාවකට නිමිත්ත වශයෙන් ම කීර්තනය කළ යුතු ය.

**නදී නිමිත්ත.**

වස්සාන ඍතුවෙහි දස දිනකට පසළොස් දිනකට වර බැගින් වර්ෂාව පවත්නා කල්හි, යමක වර්ෂාව නැවතුණු කෙණෙහි ම වතුර ගලා යාමද නවතින්නේ නම්, එය නදී සඞ්ඛ්‍යාවට නො පැමිණේ. යමක කියන ලද පරිදි වර්ෂාව පවත්නා කාලයේ වස්සාන ඍතුවෙහි නො නැවතී ජලය ගලා යාම සිදු වේ නම්, විනයෙහි නියමිත පරිදි තුන් මඬුලු වසා හැදි භික්ෂුණිය තොටින් හෝ නො තොටින් හෝ ගඟට බැස එතර වන කල්හි ඇගේ අඳනය තෙමෙන පමණට ජලය

Non-commercial distribution

ඇත්තේ නම්, ඒ නදිය සීමා නිමිත්තට හා අතිකුත් විනය කර්මවලට ද සුදුසු නදිය වේ. නියං කාලවලදී වතුර ගලා යාම නැවතී ඇත්තේ ද නදිය අනදියක් නො වේ. එකල්හි ද එය නදී නිමිත්ත වශයෙන් ගැනීමට සුදුසු ය.

මිනිසුන් විසින් අමුණු බැඳීමෙන් කුඩා නදියක වතුර ගලායාම නැවතී ගියේ නම්, ඉන් පසු එය නදී නිමිත්ත වශයෙන් ගැනුමට සුදුසු නො වේ. ආවරණය ඉක්මවා වතුර ගලා යේ නම් නදී නිමිත්තට සුදුසු ය. නදී නිමිත්ත වශයෙන් කීර්තනයට සුදුසු වන්නේ ගලා යන ජලය ය. නැවතී ඇති ජලය සීමා නිමිත්ත වශයෙන් කීර්තනය කරතහොත් කළ යුත්තේ උදක නිමිත්ත වශයෙනි. සීමාභූමිය වටා ගලායන ගඟ එක් දිශාවකට මිස දිශා දෙක තුනකට නිමිත්ත වශයෙන් නො ගත යුතුය. සීමා භූමිය වටා පිහිටි එකිනෙකට සම්බන්ධයක් නැති ගඞ්ගා ඇත්තේ නම් ඒවා ඒ ඒ දිශාවේ නිමිති වශයෙන් ගත හැකි ය. මහා ගඞ්ගාවකින් වතුර ගැනීම පිණිස කැපූ ඇල නිතර වතුර ගලා යන්නක් වුව ද සීමා නිමිත්තට සුදුසු නො වේ. මිනිසුන් කැණූ ඒ ජලමගෙහි පසුව බොහෝ ගඟදිය ගලා යාමෙන් මහත් වී ඔරුපාරු යන කිඹුලුන් වෙසෙන ගඟක් වී නම්, එකල්හි එය ද නදීනිමිත්ත වශයෙන් ගැනීමට සුදුසු වේ. නිමිත්ත වශයෙන් ගැනීමට සුදුසු නදියේ දිග පුළුල ප්‍රමාණයක් දක්වා නැත.

**උදක නිමිත්ත.**

පොළොවෙහි කොතැනක හෝ රැස්ව ඇති ගලා නො යන ජලය උදක නිමිත්තට සුදුසු ය. එහි ප්‍රමාණ නියමයක් නැත. ඌරන් බල්ලන් කැණූ වළක හෝ ක්‍රීඩා පිණිස ළමයින් කැණූ වලක හෝ රැස්වී ඇති ජලය උදක නිමිත්ත වශයෙන් ගැනීමට සුදුසු වේ. එකෙණෙහි ම වළ කැණ පුරවන ලද ජලය වුවද කම් වාක්‍යය කියා අවසන් වන තුරු පවත්නේ නම් එයද සීමා නිමිත්ත වශයෙන් ගැනුමට සුදුසු ය. එබඳු සුළු ජලයක් නිමිත්ත කොට සීමා බන්ධනය කළ කල්හි පසු කාලයේදී සීමා භූමිය හැඳින ගත හැකිවීමට නිමිත්ත කරගත් ජලය පිහිටි තැන්වල ගල්-ටැම් පිහිටවිය යුතු ය. අන්‍ය ස්ථිර සලකුණක් හෝ පිහිට විය යුතු ය.

Non-commercial distribution

සීමා සම්මුතිය සඞ්ඝ කර්ම කිරීම සඳහා ය. ඉඩම්වල අයිතිය පිළිබඳ කරුණක් නො වන බැවින් ඒ තැන්වල ගල් කණු පිහිටවීමෙන් භික්ෂූන්ට ද වරදක් නො වේ. සීමා සම්මුතියේදී ඉඩම් අයිතිය පිළිබඳ ප්‍රශ්නයක් නැත. කවුරුන් අයත් බිමක වුව ද සීමා බන්ධනය කළ හැකි ය. සීමා බන්ධනය නිසා ඒ භූමිය සඟසතු වන්නේ නොවේ.

සීමාබන්ධන විනයකර්මය කළ හැකි වීමට සතර නමකට නො අඩු භික්ෂු පිරිසක් එක්රැස් විය යුතු ය. සීමා බන්ධනය කරන්නේ ද ග්‍රාම සීමාව තුළය. එබැවින් සීමා බන්ධනයක් කරන කල්හි ඒ ගම තුළ බද්ධසීමාවලට නො පිවිස ඉන්නා සියලු භික්ෂූන් ඒ ස්ථානයට පමුණුවා ගත යුතු ය. පමුණුවා ගත නොහෙන භික්ෂූන්ගේ ඡන්දය ගත යුතු ය. එසේ කිරීමෙන් සීමාබන්ධනය පරිස සම්පත්තියෙන් යුක්ත වේ. සීමා බන්ධනය කරන ගම තුළ ඡන්දය නො දී, එතැනට නො පැමිණ, එක භික්ෂුවකුදු වූයේ නම්, පරිසවිපත්තිය නිසා සීමාබන්ධනය සිදු නො වේ.

සමහර ගම්වල විනයෙහි අවිසාරදයන් විසින් නුසුදුසු පරිදි බන්ධනය කළ විපත්ති සීමා ද තිබිය හැකි ය. එබඳු සීමා අසීමා බැවින් සීමා බන්ධනය කරන ගම තුළ එබඳු අසීමාවක ඡන්දය නුදුන් භික්ෂුවක් වී නම් එයින් නව සීමාව ද අසීමාවක් වේ. කලින් තිබෙන සීමා වල තත්ත්වය නො දත හැකි බැවින් යම් කිසි ගමක සීමාවක් බදින කල්හි එගම වෙසෙන සියලුම භික්ෂූන් එතැනට පමුණුවාගෙන සැක සහිත භික්ෂූන් ගමින් බැහැර කර, සීමා බන්ධනය කිරීම වඩා හොඳ නිසැක ක්‍රමය ය. බුදුන් වහන්සේ විසින් සීමා බන්ධනය සඳහා වදාළ කර්මවාක්‍යය නො වරදවා කියා බන්ධනය කිරීමෙන් සීමා බන්ධන කර්මය, කර්මවාක්‍ය සම්පත්තියෙන් යුක්ත වේ.

### නව සීමා බන්ධනය

සීමා බන්ධනය විනාඩි ගණනකදී සිදු කළ හැකි කර්මයකි. එයට ඇති දුෂ්කර දෙය සීමා භූමිය ශුද්ධ කර ගැනීම ය. සඞ්ඝයා විසින් ත්‍රිවිධ සම්පත්තියෙන් යුක්ත කොට සීමාවක් සම්මත කළ කල්හි, එහි මායිම් සලකුණු සියල්ල නැති වී ගියේ ද, සීමාව

Non-commercial distribution

දන්නා භික්ෂූන් නැති වී ගියේ ද, සඞ්ඝයා විසින් කර්මවාක්‍යයෙන් සමූහනනය නො කරන ලදුයේ නම්, සියලු විනය කර්ම කිරීමට සුදුසු සීමාවක් වශයෙන් එය ශාසනාන්තර්ධානය දක්වා ම පවත්නේ ය. පොළොවේ පස ඉවත් කර සීමා භූමියක් ජලාසයක් කෙළේ ද ඒ බිම සීමාව ම ය. වරක් සම්මත කළ සීමාවක් නැවත අසීමාවක් වීමට සඞ්ඝයා විසින් කර්ම වාක්‍යයෙන් සමූහනනය කළ යුතු ය. සමූහනනයෙන් පසු ගල් කණු ආදී නිමිති ඇත ද ඒ බිම අසීමාවෙකි.

මේ දිවයිනෙහි බුදුසසුන පිහිටා දැනට වර්ෂ දෙදහසකට අධික කාලයක් ඉක්ම ඇත්තේ ය. ඒ දීර්ඝකාලය තුළ රටේ තැනින් තැන ඇති වී ලකුණකුදු ඉතිරි නොවී අභාවයට ගිය විහාරස්ථාන බොහෝ ය. ඒවායේ විනය කර්ම කිරීමට සීමා බැඳ තුබුණු බවට ද සැකයක් නැත. ඒවායේ සලකුණු ද අද දක්නට නැත. සලකුණු නැත ද අදත් ඒ බිම් විනය කර්ම කිරීමට සුදුසු සීමා ය. මේ රටේ ඒ නො දත හැකි පුරාණ සීමා අසවල් තැන නැතය කියා නො කිය හැකි ය. සීමා බන්ධනයකට බිමක් මේ රටෙන් තෝරා ගත් කල්හි එය සමහර විට එයට වඩා මහත් වූ පුරාණ සීමාවක් ඇතුළේ ම විය හැකි ය. සමහර විට පුරාණ කුඩා සීමාවක් සම්පූර්ණයෙන්ම එයට අසු වී තිබිය හැකි ය. සමහර විට පුරාණ සීමාවකින් කොටසක් එයට අසු වී තිබිය හැකි ය. සමහර විට ඒ බිම පුරාණ සීමාවක් හා ගැටී තිබිය හැකි ය.

ඉදින් සීමා සම්මුතියට තෝරාගත් බිම පුරාණ සීමාවක් ඇතුළේ ම වූවක් නම්, සීමාවක් තුළ තවත් සීමාවක් සම්මත කළ නො හෙන බැවින් එය පුරාණ සීමාව ම මිස නව සීමාවක් නො වේ. එසේ සම්මත කර ගත් සීමාව තුළ කර්ම කරන අවස්ථාවේ දී පුරාණ සීමාවට අයත් ප්‍රදේශයෙහි අන් භික්ෂුවක් වී නම් ඒ කර්‍ම, වර්ග කර්‍ම වීමෙන් සිද්ධියට නො පැමිණේ. ඉදින් එහි විනය කර්‍මයක් කරන අවස්ථාවෙහි පුරාණ සීමා භූමිය තුළ අන් භික්ෂුවක් නො වී නම්, ඒ කර්‍මය සිද්ධියට පැමිණේ.

''න භික්ඛවෙ! සීමාය සීමා අජ්ඣොත්ථරිතබ්බා. යො අජ්ඣොත්ථරෙය්‍ය ආපත්ති දුක්කටස්ස'' යි විනයෙහි වදරා ඇති

Non-commercial distribution

බැවින් සම්පූර්ණ පුරාණ සීමාවක් හෝ පුරාණ සීමාවකින් කොටසක් හෝ හසු කොට නව සීමාවක් සම්මත නො කළ යුතු ය. එසේ කළහොත් "**යෙසං භික්ඛවෙ! සීමා පචජා සම්මතා, තෙසං තං කම්මං අධම්මිකං කුප්පං අට්ඨානාරහං**" යන බුද්ධාඥාව පරිදි ඒ සීමාව සීමාවක් නො වේ.

"**න භික්ඛවෙ! සීමාය සීමා සම්භින්දිතබ්බො, යො සම්භින්දෙය්‍ය ආපත්ති දුක්කටස්ස**" යනු වදළ බැවින් පුරාණ සීමා භූමියක් හා මිශ්‍ර කොට පුරාණ සීමා භූමියක් හා ගටා නව සීමාවක් සම්මත නො කළ යුතු ය. එසේ සම්මත කළහොත් එයද අසීමාවෙකි.

පුරාණ සීමා භූමි අසුවීමෙන් අලුතෙන් බඳනා සීමා අසීමා විය හැකි බැවින් නව සීමා බන්ධනය කිරීමේදී විනයධරයෝ පළමු කොට භූමිය ශුද්ධ කෙරෙති. භූමි ශුද්ධිය කළ යුත්තේ කර්ම වාක්‍යයෙන් සීමා සමූහනනය කිරීමෙනි. මායිම් සලකුණු ඇති, මායිම් දන්නා සීමාවක් සමූහනනය කිරීම අපහසු කාර්‍ය්‍යයක් නො වේ. සතර නමකට නො අඩු භික්ෂු පිරිසක් ඒ සීමා භූමියට පිවිස සමූහනන කර්ම වාක්‍යය කී කල්හි සීමා සමූහනනය සිදු වේ. මේ කාලයේ නව - සීමාවක් බන්ධනය කිරීමේදී කරන්නට සිදුවන්නේ මායිම් ලකුණු නැති, නො දන්නා සීමාවන් සමූහනනය කිරීමකි. එය පහසු කාර්‍ය්‍යයක් නොවේ. එබැවින් නව සීමා බන්ධනයක් සඳහා නිසැක ලෙස බිමක් සුද්ධ කර ගැනීමට කාලය බොහෝ ගත වේ.

දිග පුළුලින් තුන් යොදුන දක්වා මහත් වූ සීමා ද ඇත්තේ ය. කුඩා සීමා ද ඇත්තේ ය. ගම් බොහෝ ගණනක් අසු වී ඇති මායිම් නො දන්නා මහා සීමාවක් සමූහනනය අති දුෂ්කරය. එක් තැනක භික්ෂූන් රැස්ව සීමා සමූහනනය කරන කල්හි ඒ මහා සීමාව තුළ අන් තැන්වල භික්ෂූන් සිටිය හැකි බැවිනි. සීමාවක් සමූහනනය කරන කල්හි අත් පසට නො පැමිණ ඒ සීමාව තුළ කොතැනක හෝ භික්ෂුවක් වුවහොත් ඒ සමූහනන කර්මය වර්ග කර්මයක් වීමෙන් සීමා සමූහනනය සිදු නො වේ. එබැවින් දැනට සීමා බන්ධනය කරන තැන්වලට පුරාණ මහා සීමා අසුවුවහොත් ඒ සීමා

Non-commercial distribution

සියල්ලම අසීමා වේ. මෙයට සැනසිල්ලට ඇත්තාවූ එකම කාරණය නම්, මහා සීමා සුලභ නො වීම ය. බොහෝ සෙයින් රටේ දක්නා ලැබෙන සීමා දිග පුළුලින් රියන් සියයටත් අඩු ඒවා ය.

අනුරාධපුරයේ මහා සීමාව හැර මේ රටේ අන් තැනක මහා සීමාවක් බඳනා ලද බව අසන්නට ද නැත. භික්ෂූන් විසින් බොහෝ සෙයින් අතීතයේ බැඳ තිබෙන්නේ ද මෙකල බඳින්නේ ද කුඩා සීමා ය. ඒ නිසා රටේ ඒ ඒ තැන්වල තිබිය යුත්තේ ද කුඩා කුඩා සීමා භූමි ය. බඹ විස්සක තිහක මානයේ ඉන්නා භික්ෂූන් එක් වී සමූහනනය කළ කල්හි ඒ සීමා සමූහනනය සිදු විය හැකි ය. මේ පොළොවෙහි පුරාණ සීමා භූමිවලට අසුවන තැන්වලට වඩා ඇත්තේ සීමාවලට නො හසු වන තැන් ය. එබැවින් නව සීමාවක් බන්ධනය කරන භූමියක් පුරාණ සීමා භූමියකට හසුවීම සිදුවන්නේ ද කලාතුරකිනි. එබැවින් විශාල ප්‍රදේශයක් භික්ෂූන්ගෙන් සිස් නො කොට සමූහනන කර්‍මය කොට, බිම ශුද්ධ කරගෙන දැනට බන්ධනය කරන සීමා ගැන, සැක කළ යුත්තක් ද නැත.

**සීමා භූමි ශුද්ධිය.**

නව සීමාවක් බන්ධනය කරන කල්හි භූමිය ශුද්ධ කරන්නේ මෙසේ යඃ- සීමා බන්ධනයට ගන්නා භූමි භාගය හා එයට පිටින් සතර දිශාවෙන් ම බඹ දෙකක් පමණ භූමියක් සම කොට පිරිසිදු කොට මඤ්චප්‍රමාණ කොටුවලට වෙන් කළ යුතු ය. එය කරන කල්හි කුඤ්ඤ ගසා ලණු ඇද ඉරි ඇඳීමෙන් හෝ හුණු ආදී ද්‍රව්‍යයකින් ඉරි ගැසීමෙන් හෝ සියලුම කොටුවල සතර කොණට කුඤ්ඤ ගසා තැබීමෙන් හෝ පිරිසිදු ලෙස කළ යුතු ය. ඉක්බිති සතර නමක් වූ හෝ පස් නමක් ස-නමක් වූ හෝ භික්ෂු පිරිසක් විසින් සියලුම කොටුවල සිට පිළිවෙළින් සීමා සමූහනන කර්‍මය කළ යුතු ය. එය කරන කල්හි ඒ කර්‍මයට සහභාගි නො වන සියලුම භික්ෂූන් ගමෙන් ම බැහැර කොට ග්‍රාම ශුද්ධියත් කර ගෙන ම කරතහොත් වඩා හොඳ ය. ගම ශුද්ධ කළ නො හෙතහොත් ඒ සමීපයෙහි බඹ විස්සක් විසිපහක් තරම ප්‍රමාණයෙන් අන්‍ය භික්ෂූන් බැහැර කර සමූහනන කර්‍මය කළ යුතු ය.

Non-commercial distribution

කර්මයට සහභාගි වන භික්ෂූන්ගේ කර්මයට යෝග්‍යායෝග්‍ය භාවය තේරුම් ගැනීම ද දුෂ්කර බැවින් වෙනස් වෙනස් වූ භික්ෂු සමූහ ලවා සමූහනන කර්මය දෙතුන් වරක් කරවීම ශුද්ධිය පිණිසත් සීමාව පිළිබඳ සැක දුරුවීමටත් හොඳ ය. මේ කර්මය කරන කල්හි විනය නො දත් ඇතැම් භික්ෂූන්ට කර්මය කරනු බලා සිටින්නට ඒ සමීපයට එන්නට සිත් වනු ඇත. භික්ෂූන් සමීපයට එතොත් වැළැක්විය යුතු ය. මඤ්චප්‍රමාණය යනු දිගින් පස් රියනක් හා පුළුලින් දෙරියන් හමාරක්වූ ප්‍රමාණය ය. යම් කිසි භූමියක එසේ වෙන් කළ ගැබ් සියල්ලෙහිම සඞ්ඝයා සිට සමූහනන කර්මය කළ කල්හි පුරාණ සීමාවකින් කෙබඳු කොටසක් හෝ ඒ භූමියට හසු වී තිබුණා නම්, ඒ සීමා සමූහනනය වී භූමිය ශුද්ධ වන්නේ ය.

නව සීමා භූමියක් ශුද්ධ කර ගැනීමට මෙසේ සමූහනනය කරන්නේ කොතැනක ඇත ද යන බව නො දන්නා සීමාවෙකි. සීමා සමූහනනයක් සිදු වන්නේ ද ඒ කර්මය කරන භික්ෂූන් සමූහනනය කරන සීමාව තුළ ම සිට සමූහනනය කළහොත් ය. සමූහනන කර්මය කරන භික්ෂූන් සතර නමගෙන් එක නමක්වත් සීමා භූමියෙන් පිටත සිටියේ නම් සමූහනනය සිදු නො වේ. ගැබ් වෙන් කොට සැම තැනම සිට සීමා සමූහනනය කළ යුත්තේ කොතැනක සීමාවක් තුබුණත් සමූහනනය වීම පිණිස ය.

නව සීමාව බන්ධනය කරන භූමි භාගයට සමහර විට භික්ෂූන් සතර නමකට ඉන්නට ප්‍රමාණ නො වන තරමේ කුඩා කොටසක් පුරාණ සීමාවකින් හසු වී තිබිය හැකි ය. නව සීමාව බන්ධනය කරන භූමි භාගයෙහි පමණක් සමූහනන කර්මය කිරීමෙන් ඒ කුඩා කොටස හසු වී ඇති සීමාව සමූහනනය නො වේ. එය තුළ සඞ්ඝයා සිට සමූහනනය නො කැරුණ බැවිනි. යටත් පිරිසෙයින් බඹ දෙකක මානයේවත් නව සීමාවෙන් පිටත භූමියෙහි සමූහනන කර්මය කළ යුත්තේ එහෙයිනි. සමූහනන කර්මය කරන සමීපයට තවත් භික්ෂූන්ට පැමිණෙන්නට නො දිය යුත්තේ සමූහනනය කරන පුරාණ සීමාවට, ඒ කර්මය කරද්දී තවත් භික්ෂූන් ඇතුළු වී සිටියහොත් සමූහනනය සිදු නො වන බැවිනි.

Non-commercial distribution

**"සීමා භික්ඛවෙ! සමූහනන්තෙන පඨමං තිචීවරෙන අවිප්පවාසො සමූහන්තබ්බො. පචඡා සමාන සංවාසා සීමා සමූහත් තබ්බා"** යන විනය නීතිය පරිදි සීමා සමූහනනය කරන කල්හි පළමු කොට අවිප්‍රවාස සීමා සමූහනන කර්ම වාක්‍යයෙන් අවිප්‍රවාස සීමා සමූහනනය කළ යුතු ය. ඉක්බිති සමාන සංවාස සීමා සමූහනන කර්ම වාක්‍යයෙන් සමානසංවාස සීමා සමූහනනය කළ යුතු ය. සමානසංවාස සීමා හා අවිප්පවාස සීමා එකම භූමියෙහි ම ඇති බැවින් දෙයාකාරයෙන්ම සමූහනනය නො කළහොත් භූමි ශුද්ධිය නො වේ.

කියන ලද පරිදි ක්‍රමානුකූලව සමූහනන කර්මය කළ පසු ඒ භූමි භාගයට හසු වූ පුරාණ සීමා වී නම්, ඒ සියල්ල ම නැති වී ඒ බිම ශුද්ධ ග්‍රාම සීමාව වන්නේ ය. ග්‍රාම සීමාවෙහි ද සියලු විනය කර්ම කළ හැකි ය. සීමා බන්ධනය කරන්නේ ද ග්‍රාම සීමාව තුළම ය. ගම ම සියලු විනය කර්මවලට සුදුසු සීමාව වී තිබියදී එහි තවත් සීමා බන්ධනය කරන්නේ විනය කර්ම කිරීම පහසු වීමටය. ග්‍රාම සීමාවෙහි විනය කර්මයක් කරතහොත් ගම තුළ ඉන්නා සියලු භික්ෂූන් එතැනට රැස් කර ගත යුතු ය. නො පැමිණිය හැකි භික්ෂූන්ගේ ඡන්දය ගෙන්වා ගත යුතු ය. එසේ කොට විනය කර්මයක් කරන කල්හි හදිසියෙන් ඒ ගමේ කොතැනකට හෝ භික්ෂුවක් පැමිණියේ නම්, එයින් කර්ම විපත්තිය වේ. කරුණු මෙසේ හෙයින් ග්‍රාම සීමාවල නිතර විනය කර්ම කිරීම පහසු නැත. කුඩා සීමාවක් බැඳ ගත් කල්හි විනය කර්මයකට එක් රැස් කර ගත යුත්තේ ඒ සීමාව තුළ ඉන්නා භික්ෂූන් පමණ ය. සීමාවෙන් පිටත පෙනී පෙනී වුවද කොතෙක් භික්ෂූන් සිටියේ ද එයින් සීමාව තුළ කරන කර්මවලට හානියක් නැත. කුඩා සීමා බන්ධනය කරන්නේ ඒ ප්‍රයෝජනය සඳහා ය.

ක්‍රමානුකූලව සීමා සමූහනනය කොට භූමිය ශුධකර ගත් පසු පාෂාණනිමිත්තයෙන් සීමා බන්ධනය කරන්නේ නම්, සතර දිශාවෙහි හෝ අට දිශාවෙහි හෝ ප්‍රමාණවත් ගල්ටැම් පිහිටවිය යුතු ය. උදක නිමිත්තයෙන් සීමා බන්ධනය කරන්නේ නම් සතර දිශාවෙහි හෝ අට දිශාවෙහි ම හෝ වළවල් සාරවා ජලය පිරවිය යුතු ය. භූමි ශුද්ධිය කරන්නට කලින්

Non-commercial distribution

ගල්කණු සිටවා තැබීම ද වරද නැත. පිළියෙල කළ නිමිති ඇතුළත සීමා බන්ධනය කරන කාලයෙහි ඒ ඒ ගමෙහි වෙසෙන සභාග භික්ෂූන් සැමදෙනා ම ඒ සීමා භූමියට පමුණුවා ගත යුතු ය. එතැනට නො පැමිණ ඒ ගම තුළ වෙසෙන තවත් භික්ෂූහු වෙත් නම්, ඒ භික්ෂූන්ගෙන් ඡන්දය ගෙන්වා ගත යුතු ය. කර්මය කරන වෙලාවට එතනට නො පැමිණෙන භික්ෂූන්ට ඒ ගමෙන් පිටතට. වී ඉන්නට හෝ සැලැස්සිය යුතු ය.

හදිස්සියෙන් ගමට ඇතුළුවන ආගන්තුක භික්ෂූන් නැවැත්වීම පිණිස මාර්ගවල ආරක්ෂකයන් තැබිය යුතු ය. සීමා බන්ධන කර්මය කරන අතර ගමින් වැටී ඇති මාර්ගයක රථයක වුව ද භික්ෂුවක් ගමන් කළේ නම්, සීමා බන්ධනය ව්‍යර්ථ වේ. ගම ආරක්ෂා කොට සිමා බන්ධන ස්ථානයට සඞ්ඝයා රැස්වූ පසු ප්‍රථමයෙන් බන්ධනය කරන සීමාවේ නිමිති සඞ්ඝයාට ඇසෙන සේ කිය යුතු ය. එය කළ යුත්තේ කර්ම වාක්‍යය කියන භික්ෂූන් වහන්සේ විසිනි. කර්ම වාක්‍යය කියන භික්ෂුව නැගිට සීමා භූමියේ නැගෙනහිර දිග සිට **"පුරත්ථිමාය දිසාය කිං නිමිත්තං?"** යි නැගෙනහිර දිශාවේ නිමිත්ත කුමක් දැ.යි විචාළ යුතු ය. නිමිත්ත ගල්කණුවක් නම්, අනිකකු විසින් **"පාසාණො භන්තෙ"** යි එයට පිළිතුරු දිය යුතු ය. පිළිතුරු දී ම අනුපසම්පන්නයකු විසින් කළ ද වරද නැත. ඉක්බිති විනයධරයා විසින් සඞ්ඝයාට ඇසෙන සේ **"එසො පාසාණො නිමිත්තං"** යි නිමිත්ත කිය යුතු ය.

ඉක්බිති ගිනිකොණට ගොස් **"පුරත්ථිමාය අනුදිසාය කිං නිමිත්තං?"** යි විචාළ යුතු ය. එහි නිමිත්ත ගල්ටැඹක් නම් **"පාසාණො භන්තෙ"** යි පිළිතුරු දිය යුතු ය. ඉක්බිති විනයධරයා විසින් **"එසො පාසාණො නිමිත්තං"** යි නිමිත්ත කිය යුතු ය. මෙසේ පිළිවෙළින් අට දිගම නිමිති විචාරා කියා අවසන් කළ පසු නිමිත්තයෙන් නිමිත්ත සම්බන්ධවනු පිණිස නැවත ද නැගෙනහිරට ගොස් පළමු කී පරිදි ම නිමිත්ත විචාරා කිය යුතු ය. මෙසේ එක් වරක් නිමිත්ත කීර්තනය ද ප්‍රමාණ වේ. එහෙත් තුන් වරක් ම එසේ

Non-commercial distribution

කළහොත් වඩා හොඳ ය.

නිමිත්ත කීර්තනය කරන කල්හි එක් දිශාවක නිමිති බොහෝ ගණනක් ඇති නම්, "පුරත්ථිමාය දිසාය කිං නිමිත්තං?"යි පළමුවන නිමිත්ත විචාරා එතැන් පටන් ඇති නිමිති "පුරත්ථිමාය දිසාය අපරං කිං නිමිත්තං" යි නිමිති ඇතිතාක් විචාරමින් කීර්තනය කළ යුතු ය. ඉතිරි දිශාවලදී ද එසේ ම පිළිපැදිය යුතු ය. නිමිත්ත කීර්තනයෙන් පසු " **සීමං භික්ඛවෙ සම්මන්නන්තෙන පඨමං සමානසංවාසා සීමා සම්මන්නිතබ්බා පච්ඡා තිචීවරෙන අවිප්පවාසො සම්මන්නිතබ්බො"** යි වදාළ පරිදි සීමා සම්මුතිය කිරීමේදී ප්‍රථමයෙන් සමානසංවාස සීමා සම්මුතිය කළ යුතු ය. පසුව සුදුසු පරිදි ඒ බිම ම තිචීවරෙන අවිප්පවාස සම්මුතිය කළ යුතු ය. බුද්ධාඥාව පරිදි නො වරදවා **"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො"** යනාදි සීමා බන්ධන කර්ම වාක්‍යය කියා අවසන් කරනු සමග ම කීර්තනය කළ නිමිති ඇතුළත වූ භූමි භාගය, පෘථිවි සන්ධාරක ජලය තෙක් ම සඞ්ඝයාගේ විනය කර්මයන්ට සුදුසු සීමා භූමිය වන්නේ ය.

මෙසේ වරක් සීමා බන්ධනය කළ භූමි භාගය සඞ්ඝයා විසින් නැවත සමූහනනය නො කළහොත් සර්වඥශාසනය පවත්නාතාක් සීමාවක් වශයෙන් ම පවත්නේය. නැවත ඒ බිම අසීමාවක් කළ හැක්කේ සඞ්ඝයා විසින් පමණෙකි. පසු කලෙක පස් පුරවා සීමා භූමිය උස් කළේ ද ඒ බිම සීමාවම ය. සීමා භූමිය යට කොට ගඟක් ගලා ගියේ ද එහි කණු සිටවා මැසි බැඳ විනය කර්මය කළ හැකි ය.

මහා සීමා ඛණ්ඩ සීමා වශයෙන් සීමා දෙකක් බන්ධනය කරනහොත් ඒ සීමා දෙකට අතර හිස් භූමියක් ඉතිරි කළ යුතු ය. ඛණ්ඩ සීමාවේ නිමිතිවලට පිටින් සීමාන්තරිකය වෙන්ව පෙනෙන පරිදි ගල් කණු ද පිහිට විය යුතු ය. මෙකල මහා සීමා බන්ධනයක් නො කෙරෙන බැවින් ඛණ්ඩසීමා මහාසීමා වශයෙන් සීමා බන්ධනය කිරීමේ ක්‍රමය මේ පොතට ඇතුළු නො කරන ලදී.

Non-commercial distribution

# සීමා සමූහනන සීමා සම්මුති පිළිබඳ කම් වාක්‍යය.

තිචීවරේන අවිප්පවාස සීමා සමූහනනය.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. යො සො සඞ්ඝෙන තිචීවරෙන අවිප්පවාසො සම්මතො, යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො තං තිචීවරෙන අවිප්පවාසං සමූහනෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, යො සො සඞ්ඝෙන තිචීවරෙන අවිප්පවාසො සම්මතො. සඞ්ඝො තං තිචීවරෙන අවිප්පවාසං සමූහනති. යස්සා-යස්මතො ඛමති එතස්ස තිචීවරෙන අවිප්පවාසස්ස සමුග්ඝාතො, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

සමූහතො සො සඞ්ඝෙන තිචීවරෙන අවි-ප්පවාසො, ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.

Non-commercial distribution

සමාන සංවාස සීමා සමූහනනය.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. යා සා සඞ්ඝෙන සීමා සම්මතා සමානසංවාසා එකූපොසථා. යදි සඞ්ඝස්ස පත්තකල්ලං. සඞ්ඝො තං සීමං සමූහනෙය්‍ය සමානසංවාසං එකූපොසථං. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො. යා සා සඞ්ඝෙන සීමා සම්මතා සමාන සංවාසා එකූපොසථා. සඞ්ඝො තං සීමං සමූහනති සමානසංවාසං එකූපොසථං. යස්සායස්මතො ඛමති, එතිස්සා සීමාය සමානසංවාසාය එකූපොසථාය සමුග්ඝාතො. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති. සො භාසෙය්‍ය.

සමූහතා සා සීමා සඞ්ඝෙන සමාන සංවාසා එකූපොසථා, ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.

සීමා සම්මුතියේදී නිමිත්ත කීර්තනය

පුරත්ථිමාය දිසාය කිං නිමිත්තං?

පාසාණො භන්තෙ.

එසො පාසාණො නිමිත්තං.

පුරත්ථිමාය අනුදිසාය කිං නිමිත්තං?

පාසාණො භන්තෙ.

එසො පාසාණො නිමිත්තං.

දක්ඛිණාය දිසාය කිං නිමිත්තං?

පාසාණො භන්තෙ.

එසො පාසාණො නිමිත්තං.

Non-commercial distribution

දක්ඛිණාය අනුදිසාය කිං නිමිත්තං?

පාසාණො භන්තෙ.

එසො පාසාණො නිමිත්තං.

පච්ඡිමාය දිසාය කිං නිමිත්තං?

පාසාණො භන්තෙ.

එසො පාසාණො නිමිත්තං.

පච්ඡිමාය අනුදිසාය කිං නිමිත්තං?

පාසාණො භන්තෙ.

එසො පාසාණො නිමිත්තං.

උත්තරාය දිසාය කිං නිමිත්තං?

පාසාණො භන්තෙ.

එසො පාසාණො නිමිත්තං.

උත්තරාය අනුදිසාය කිං නිමිත්තං?

පාසාණො භන්තෙ.

එසො පාසාණො නිමිත්තං.

පුරත්ථිමාය දිසාය කිං නිමිත්තං?

පාසාණො භන්තෙ.

එසො පාසාණො නිමිත්තං.

**සමාන සංවාස සීමා සම්මුතිය**

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො යාවතා සමන්තා නිමිත්තා කිත්තිතා, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො එතෙහි නිමිත්තෙහි සීමං සම්මන්නෙය්‍ය, සමානසංවාසං එකූපොසථං. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, යාවතා සමන්තා නිමිත්තා කිත්තිතා, සඞ්ඝො එතෙහි නිමිත්තෙහි

Non-commercial distribution

සීමං සම්මන්නති සමානසංවාසං එකුපොසථං. යස්සායස්මතො ඛමති එතෙහි නිමිත්තෙහි සීමාය සම්මුති සමානසංවාසාය එකුපොසථාය, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

සම්මතා සා සීමා සඞ්ඝෙන එතෙහි නිමිත්තෙහි සමානසංවාසා එකුපොසථා, ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.

අවිප්පවාස සීමා සම්මුතිය.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, යා සා සඞ්ඝෙන සීමා සම්මතා සමානසංවාසා එකුපොසථා, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො තං සීමං තිචීවරෙන අවිප්පවාසං සම්මන්නෙය්‍ය ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ! සඞ්ඝො, යා සා සඞ්ඝෙන සීමා සම්මතා සමානසංවාසා එකුපොසථා, සඞ්ඝො තං සීමං තිචීවරෙන අවිප්පවාසං සම්මන්නති ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච. යස්සායස්මතො ඛමති එතිස්සා සීමාය තිචීවරෙන අවිප්පවාසාය සම්මුති ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

සම්මතා සා සීමා සඞ්ඝෙන තිචීවරෙන අවිප්පවාසා ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමි.

Non-commercial distribution

# කම් කාරක සඞ්ඝයෝ

**චතුවග්ගො පඤ්චවග්ගො - දස වීසති වග්ගිකො**
**අතිරෙක වීසති වග්ගො - පඤ්ච සඞ්ඝා විභාවිතා.**

යනුවෙන් දැක්වෙන පරිදි චතුර්වර්ග සඞ්ඝයා ය, පඤ්ච වර්ග සඞ්ඝයාය, දශවර්ග සඞ්ඝයාය, විංශති වර්ග සඞ්ඝයාය, අතිරේක විංශතිවර්ග සඞ්ඝයායයි සඟහු පස්වැදෑරුම් වෙති.

අබ්භාන කර්මයය, උපසම්පද කර්මයය, සඞ්ඝ පවාරණ කර්මයය යන මේ කර්ම හැර ඉතිරි කර්ම සියල්ල චතුර්වර්ග සඞ්ඝයා විසින් කළ හැකි ය. අබ්භාන කර්මයත් මධ්‍ය දේශයේ උපසම්පද කර්මයත් හැර ඉතිරි කම් සියල්ල පඤ්චවර්ග සඞ්ඝයාට කළ හැකි ය. අබ්භාන කර්මය හැර සියලු විනය කර්ම දශවර්ග සඞ්ඝයාට කළ හැකි ය. විංශති වර්ග සඞ්ඝයාට හා අතිරේක විංශතිවර්ග සඞ්ඝයාට සියලු ම විනය කර්ම කළ හැකි ය.

**කර්ම සතර.**

අපලෝකන කර්මයය, ඥප්ති කර්මයය, ඥප්ති ද්විතීය කර්මයය, ඥප්ති චතුර්ථ කර්මයය යි විනය කර්ම සතර වර්ගයෙකි.

සීමසථ සඞ්ඝයා රැස් කොට, නො පැමිණිය හැකියවුන්ගේ ඡන්දය ගෙන කාරණය සඞ්ඝයාට තුන්වරක් දැන්වීම් වශයෙන් සිදු කරන කර්මය **'අපලෝකන කර්ම'** නම් වේ. කියන ලද පරිදි සඞ්ඝයාගේ අනුමතියෙන් "සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අජ්ජුපොසථො පණ්ණරසො යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො උපොසථං

Non-commercial distribution

කරෙයා" යනාදීන් ඥප්තියෙන් පමණක් සිදු කරන කර්මය **'ඥප්තිකර්ම'** නම් වේ. සඞ්ඝයාගේ අනුමතියෙන් ඥප්තිය සහිත එක් අනුශ්‍රාවණයකින් සිදු කරන කර්මය **'ඥප්තිද්විතීය කර්ම'** නමි. එක් ඥප්තියකින් හා අනුශ්‍රාවණ තුනකින් සිදු කරන කර්මය **'ඥප්ති චතුර්ථ කර්ම'** නම් වේ.

කම් වාක්‍යවල 'සුණාතු මෙ භන්තෙ සඞ්ඝො' යන්නෙහි පටන් 'එසා ඤත්ති' යන්න දක්වා ඇති පූර්ව කොට්ඨාසය ඥප්තිය ය. ඉන් මතුයෙහි ඇති "සුණාතු මෙ භන්තෙ සඞ්ඝො" යනාදි වගන්ති කොටස් අනුශ්‍රාවණය ය.

මේ කර්මයන් අතුරෙන් අපලෝකන කම් වශයෙන් කළ යුත්ත අපලෝකනයෙන් ම මිස ඥප්ති කර්මාදි වශයෙන් නො කළ යුතු ය. ඥප්ති කම්ය ද ඤත්තිය තබා ම කළ යුතු ය. අපලෝකන කම්ාදි වශයෙන් නො කළ යුතු ය. ඥප්තිද්විතීය කම්යන් කෙරෙහි අපලෝකනයෙන් කළ යුතු ඒවා ද නො කළ යුතු ඒවා ද ඇත්තේ ය. සීමා සම්මුති-සීමා සමූහනන-කඨින දන-කඨිනුද්ධාර- කුටි වත්ථු දේශනා-විහාර වත්ථු දේශනා යන කර්ම සය ගරුකර්ම බැවින් ඥප්ති ද්විතීය කම් වාක්‍යය කියාම කළ යුතු ය. අපලෝකනයෙන් නො කළ යුතු ය. ඉතිරි තෙළෙස් සම්මුතිය හා සේනාසන ගාහක-මතක චීවර දන සම්මුතිය ද යන මේවා ලඝු කර්ම බැවින් අපලෝකනයෙන් කිරීමෙන් ද වරද නැත. ඥප්ති කර්මය ඥප්ති චතුත්ථ කම් වශයෙන් නො කළ යුතුම ය. කම් වාක්‍ය කීමේදී අක්ෂර පද දෝෂයක් වී නම් ශුද්ධිය පිණිස නැවත නැවත කීම වටනේ ය. එසේ කිරීම අසිද්ධ කම්යේ සිද්ධිය පිණිස ද, සිද්ධ කම්යේ දළ්හිකම්ය පිණිස ද වේ. ඥප්ති චතුර්ථ කම්ය ඥප්ති තබා තුන්වර අනුශ්‍රාවණය කොට ම කළ යුතු ය. අපලෝකන කම්ාදි වශයෙන් නො කළ යුතු ය.

**කම් විපත්ති.**

කම් විපත්තිය යනු කම්යේ වරද ය. වරදවා කළ කම්ය කෙළේ ද කම්යක් නො වේ. එබැවින් විනය කර්ම කරන කල්හි කොතැනක-වත් වරදක් ඇති නො වන පරිදි ඉතා ශුද්ධ ලෙස කළ යුතු ය.

Non-commercial distribution

**"ඉමානි චත්තාරි කම්මානි කතිහාකාරෙහි විපජ්ජන්ති? පඤ්චහාකාරෙහි විපජ්ජන්ති. වත්ථුතො වා ඤත්තිතො වා අනුසාවනතො වා සීමතො වා පරිසතො වා"** යි.

**පරිවාරයෙහි** දැක්වෙන පරිදි ඉහත කී සතර වැදෑරුම් කර්‍මයෝ වස්තුවය, ඥප්තියය, අනුශ්‍රාවණයය, සීමාව ය, පිරිසය යන මොවුන්ගේ වශයෙන් විපත්ති කර්‍මයෝ වෙති. අධර්‍ම කර්‍මයෝ වෙති.

**"සම්මුඛා කරණීයං කම්මං අසම්මුඛා කරොති. වත්ථුවිපන්නං අධම්මකම්මං"** යනාදීන් පරිවාරයෙහි දැක්වෙන පරිදි සම්මුඛයෙහි කළ යුතු කර්‍මයක් අසම්මුඛයෙහි කෙරේ නම්, පිළිවිස කළ යුතු කර්‍මයක් නො විචාරා කෙරේ නම්, ප්‍රතිඥාවෙන් කළ යුතු කර්මයක් ප්‍රතිඥාවක් නැතිව කෙරේ නම්, සති විනය දිය යුත්තහුට අමූළ්හ විනය දේ නම්, අමූළ්හ විනය දිය යුත්තහුට තස්සපාපියාසිකා කර්‍මය කෙරේ නම්, තස්සපාපියාසිකා කර්‍මය කළ යුත්තහුට තර්ජනීය කර්‍මය කෙරේ නම්, තර්ජනීය කර්මය කළ යුත්තහුට නියස්ස කර්‍මය කෙරේ නම්, නියස්ස කර්‍මය කළ යුත්තහුට පබ්බාජනීය කර්‍මය කෙරේ නම්, පබ්බාජනීය කර්‍මය කළ යුත්තහුට පටිසාරණීය කර්‍මය කෙරේ නම්, පටිසාරණීය කර්මය කළ යුත්තහුට උක්ෂේපනීය කර්‍මය කෙරේ නම්, උක්ෂේපනීය කර්‍මය කළ යුත්තහුට පිරිවෙස දේ නම්, පිරිවෙස දිය යුත්තාට මූලාය පටිකස්සනය කෙරේ නම්, මූලාය පටිකස්සනය කළ යුත්තහුට මානත දේ නම්, මානත දිය යුත්තහුට අබ්භාන කර්‍මය කෙරේ නම්, අබ්භානය කළ යුත්තහුට උපසම්පද කර්‍මය කෙරේ නම්, නො පෝයෙහි පොහෝ කෙරේ නම්, අපවාරණයෙහි පවාරණය කෙරේ නම්, පණ්ඩකයකු, උපසම්පද කෙරේ නම්, තිත්ථිය පක්කන්-තකයකු, තිරිසනකු, මාතෘඝාතකයකු, පීතෘඝාතකයකු, අරහන්ත ඝාතකයකු, භික්ෂුණීදූෂකයකු, සඞ්ඝභේදකයකු, ලෝහිතුප්පාදකයකු, උභතෝබ්‍යඤ්ජනයකු, විසි වසට අඩු වයස් ඇතියකු උපසම්පද කෙරේ නම්, වස්තු විපන්න අධර්‍ම කර්‍මයෝ ය.

අන්තරායයන් ඇති කල්හි දූතිකාවක මගින් කරන භික්ෂුණී උපසම්පදවය, පත්තනික්කුජ්ජනයය උම්මත්තක සම්මුතියය, සේඛසම්මුතියය, බ්‍රහ්මදණ්ඩයය, ප්‍රකාශනීය කර්‍මයය, අවන්දිය කර්‍මයය යන කර්‍ම අට අසම්මුඛයෙහි ද කිරීමට සුදුසු කර්‍මයෝ ය.

Non-commercial distribution

ඉතිරි කම් සියල්ල ම කළ යුත්තේ කර්මාර්හ පුද්ගලයාගේ සම්මුඛයෙහි ය. පුද්ගලයාගේ අසම්මුඛයෙහි කරන ලද්දහු ඒ කර්මයෝ වස්තු විපන්න අධර්ම කර්මයෝ වෙති. අවිනය කර්මයෝ වෙති. පිළිවිස කළ යුතු කර්මයෙහි පුද්ගලයාගෙන් පිළිවිසීම ම වස්තුව ය. නො පිළිවිස කළ කල්හි ඒ කර්මය වස්තුවිපන්නතාවෙන් අධර්ම කර්මයක් වේ. උපසම්පදාදි කර්මයන්ට නුසුදුසු පුද්ගලයන්ට උපසම්පදාදි කර්ම කිරීමේදී ඒ පුද්ගලයන්ගේ නුසුදුසු බව ම වස්තු විපන්න භාවය ය.

**"පඤ්චහාකාරෙහි ඤත්තිතො කම්මානි විපජ්ජන්ති. වත්ථුං න පරාමසති. සඞ්ඝං න පරාමසති. පුග්ගලං න පරාසමති. ඤත්තිං න පරාමසති පච්ඡා වා ඤත්තිං ඨපෙති. ඉමෙහි පඤ්චහාකාරෙහි ඤත්තිතො කම්මානි විපජ්ජන්ති"** යි පරිවාරයෙහි දැක්වෙන පරිදි වස්තුව පරාමර්ශනය නො කිරීමය, සඞ්ඝයා පරාමර්ශනය නො කිරීමය, පුද්ගලයා පරාමර්ශනය නො කිරීමය, ඥප්තිය පරාමර්ශනය නො කිරීමය, පසුව හෝ ඥප්තිය තැබීමය යන කරුණු පසින් ඥප්තියෙන් කර්මයෝ විපත්තියට පැමිණෙති.

එහි "වස්තුව පරාමර්ශනය නො කිරීම ය" යනු උපසම්පදාදි කර්ම කරන කල්හි කර්මාර්හයාගේ නාමය නො යොදා ඥප්තිය කීම ය. "සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අයං නාගො ආයස්මතො තිස්සස්ස උපසම්පදාපෙක්ඛො" යි කියයුතු තැන උපසම්පදා-පේක්ෂකයාගේ නම හැර "සුණාතු මෙ භන්තෙ සඞ්ඝො ආයස්මතො තිස්සස්ස උපසම්පදාපෙක්ඛො" යි කර්ම වාක්‍යය කීම වස්තු පරාමර්ශනය නො කිරීමය.

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අයං නාගො ආයස්මතො තිස්සස්ස උපසම්පදාපෙක්ඛො" යි කියයුතු තැන "සඞ්ඝො" යනු නො කියා "සුණාතු මෙ භන්තෙ අයං නාගො ආයස්මතො තිස්සස්ස උපසම්පදාපෙක්ඛො" යි කීම සඞ්ඝයා පරමාර්ශනය නො කිරීම ය.

පුද්ගලයා පරාමර්ශනය නො කිරීමය යනු උපසම්පදා-පේක්ෂකයාගේ උපාධ්‍යායයාගේ නම නො කියා හැරීම ය. "සුණාතු

Non-commercial distribution

මෙ භන්තෙ සඞ්ඝො අයං නාගො ආයස්මතො තිස්සස්ස උප-සම්පදාපෙක්ඛො' යි කිය යුතු තැන 'සුණාතු මෙ භන්තේ සඞ්ඝො අයං නාගො උපසම්පදාපෙක්ඛො" යි කීම පුද්ගලයා පරාමර්ශනය නො කිරීම ය.

ඤත්තිය පරාමර්ශනය නො කිරීම ය යනු සම්පූර්ණයෙන් ඥත්තිය නො කියා අනුශ්‍රාවණය පමණක් කීම ය. පසුව ඤත්තිය තැබීමය යනු පළමුව අනුශ්‍රාවණය කියා පසුව"එසා ඤත්ති" යි කියා 'ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී එවමෙතං ධාරයාමි" යි කීම ය.

**"පඤ්චහාකාරෙහි අනුසාවණතො කම්මානි විපජ්ජන්ති. වත්ථුං න පරාමසති. සඞ්ඝං න පරාමසති. පුග්ගලං න පරාමසති. සාවණං හාපෙති. අකාලෙ සාවෙති ඉමෙහි පඤ්චහාකාරෙහි අනුසාවණතො කම්මානි විපජ්ජන්ති"** යි පරිවාරයෙහි දැක්වෙන පරිදි වස්තුව පරාමර්ශනය නො කිරීමය, සඞ්ඝයා පරාමර්ශනය නො කිරීමය, පුද්ගලයා පරාමර්ශනය නො කිරීමය, අනුශ්‍රාවණය පිරිහෙවීමය, අකාලයෙහි අනුශ්‍රාවණය කිරීමය යන කරුණු පසින් අනුශ්‍රාවණයෙන් කර්මයෝ විපතට පැමිණෙති.

මෙහි ද වස්තු පරාමර්ශනය නො කිරීම් ආදිය ඤත්තිය ගැන කී පරිදි දත යුතු ය. අනුශ්‍රාවණය පිරිහෙවීම යනු ඤත්තිය පමණක් කියා අනුශ්‍රාවණය නො කියා හැරීම ය, අකුරු හා වචන වරදවා කීමය යන කරුණු දෙක ය. අනුශ්‍රාවණය පමණක් නොව ඤත්තිය ද නො වරදවා කිය යුතු ය. කර්ම වාක්‍යය කියන භික්ෂූන් විසින්-

**"සිථිලං ධනිතඤ්ච දීඝරස්සං**
**ගරුකං ලහුකඤ්ච නිග්ගහීතං,**
**සම්බන්ධං වවත්ථිතං විමුත්තං**
**දසධා ව්‍යඤ්ජනබුද්ධියාප්පභෙදෙ."**

යන ගයෙන් දැක්වෙන කරුණු දශය සලකා ගෙන එය කළ යුතු ය. සිථිලය යනු අල්පප්‍රාණ අක්ෂරය ය. ධනිතය යනු මහාප්‍රාණ අක්ෂරය ය. නිග්ගහීතය යනු කරණය තද කරගෙන

Non-commercial distribution

විවෘත ද නො වූ සංවෘතකාරයෙන් ද නො වැසූ මුඛයෙන් නාසයෙන් සුළං යවමින් උච්චාරණය කළ යුතු වූ බින්දුව ය. විමුත්තය යනු කරණයන් තද කර නොගෙන මුඛය විවෘත කොට හුස්ම මුඛයෙන් පිට කරමින් කිය යුතු අක්ෂරය ය. මේ කරුණු සතර කර්ම වාක්‍යය කීමේදී විශේෂයෙන් සැලකිය යුතු ය. සිථිලය ධනිතය කොට ද, ධනිතය සිථිලය කොට ද, නිග්ගහීතය විමුත්තය කොට ද, විමුත්තය නිග්ගහීතය කොට ද කර්ම වාක්‍යය කීමෙන් කර්ම කෝපය වන බවත්, ඉතිරි කරුණු සය වැරද වීමෙන් කර්ම කෝපය නො වන බවත්, විනය අටුවාවෙහි දක්වා තිබේ. එහෙත් විනය කර්ම කිරීමේදී කියන ලද කරුණු දශය ම පිළිබඳව ශුද්ධිය ඇති වන පරිදි කර්ම වාක්‍යය කිය යුතු ය. අකාලයෙහි අනුශ්‍රාවණය කිරීමය යනු ඥත්තියට පළමුවෙන් අනුශ්‍රාවණය කිරීම ය.

එකොළොස් වැදෑරුම් විපත්ති සීමාවන්හි කරන කර්මයෝ සීමා විපත්තියෙන් විපතට පැමිණෙති. විපත්ති සීමා එකොළොස ඉහත සීමා බන්ධන විනය කර්ම විස්තරයේ කියා ඇත.

**"ද්වාදසහි ආකාරයෙහි පරිසතො කම්මානි විපජ්ජන්ති'** යනාදීන් දෙළොස් ආකාරයකින් පිරිස නිසා කර්ම විපත්තිය වන බව පරිවාරයෙහි වදරා තිබේ. කරන විනය කර්මයට සෑහෙන පමණට සුදුසු භික්ෂූන් සීමාවට නො පැමිණීම ය, ඡන්දය ගත යුතු භික්ෂූන්ගෙන් ඡන්දය නො ගැනීම ය, පැමිණි ඇතැම් භික්ෂූන් විසින් විරුද්ධත්වය ප්‍රකාශ කිරීමෙන් කර්මය වැළැක්වීම ය යන කරුණු තුනෙන් පිරිස නිසා කර්ම විපත්තිය වේ. මේ තුන් ආකාරය චතුර්වර්ග කරණීයාදි කර්ම කොට්ඨාස සතර හා යෙදීමෙන් පිරිස නිසා වන කර්ම විපත්තිය දෙළොස් ආකාර වේ.

## අධර්ම කර්ම ගැන පිළිපැදිය යුතු අයුරු

ෂඩ් වර්ගික භික්ෂූන් සඟ මැද අධර්ම කර්ම කරන්නට වූහ. ඒ බව භික්ෂූහු බුදුන් වහන්සේට සැල කළහ. එකල්හි තථාගතයන් වහන්සේ **"න භික්ඛවෙ අධම්මකම්මං කාතබ්බං, යො කරෙය්‍ය ආපත්ති දුක්කටස්ස"** යි අධර්ම කර්ම කරන භික්ෂූන්ට දුකුළා ඇවැතක් පණවා වදළ-සේක. එයින් ද නො නැවතී ඒ භික්ෂූහු

Non-commercial distribution

අධර්ම කර්‍ම කරනන්ට වූහ. භික්ෂූහු බුදුරාජාණන් වහන්සේට ඒ බව සැල කළෝ ය. එකල්හි තථාගතයන් වහන්සේ "**අනුජානාමි භික්ඛවෙ අධම්මකම්මෙ කයිරමානෙ පටික්කොසිතුං**" යනුවෙන් අධර්ම කර්මය කරන කල්හි එතැනට රැස්වූ භික්ෂූන් විසින් විරුද්ධත්වය ප්‍රකාශ කොට වළක්වන්නට අනු දැන වදළ-සේක. එසේ කරන කල්හි ෂට්වර්ගික භික්ෂූහු කෝපව ඒ භික්ෂූන්ට තර්ජනය කළෝ ය. ඒ බව බුදුරජාණන් වහන්සේට සැල කළ කල්හි "**අනුජානාමි භික්ඛවෙ දිට්ඨිම්පි ආවිකාතුං**" යනුවෙන් 'මෙය අධර්ම කර්මයෙක, මෙය අපට නුරුස්නේය' යි තමන්ගේ ලබ්ධිය ප්‍රකාශ කරන්නට අනුදැන වදළ-සේක.

ෂට්වර්ගික භික්ෂූන් අධර්ම කර්ම කරන කල්හි භික්ෂූහු එය තමන්ට නුරුස්නා බව ෂට්වර්ගික භික්ෂූන්ට ම කීවෝ ය. එයින් ද කෝප වී ෂට්වර්ගික භික්ෂූහු ඒ භික්ෂූන්ට තර්ජනය කළෝ ය. ඒ බව බුදුරජාණන් වහන්සේට සැල කළ කල්හි **අනුජානාමි භික්ඛවෙ චතුහි පඤ්චහි පටික්කොසිතුං, ද්වීහි තීහි දිට්ඨිං ආවිකාතුං, එකෙන අධිට්ඨාතුං** යනුවෙන් භික්ෂූන් සතර පස් දෙනකුන් විසින් වැළැක්වීම කරන්නටත්, දෙතුන් දෙනකුන් විසින් ලබ්ධිය ප්‍රකාශ කරන්නටත්, එක් භික්ෂුවක් විසින් අධිෂ්ඨානය කරන්නටත් අනුදැන වදළ - සේක.

කර්ම වාක්‍යය කියන භික්ෂුව විසින් "යස්ස නක්ඛමති සො භාසෙය්‍ය" යි කී කල්හි එය අධර්ම කර්මයක් නම්, "අධම්මකම්මං එතං, න මෙ තං ඛමති" යි එය නුරුස්නා භික්ෂූන් විසින් තමන්ගේ ලබ්ධිය ප්‍රකාශ කළ යුතු ය. සැමෙ ම ඇසෙන සේ ප්‍රකාශ කිරීමට බිය නම්, තමා සමීපයේ වෙසෙන භික්ෂුවකට එය ප්‍රකාශ කළ යුතු ය. එසේ ද නො හැකි කල්හි "න මෙ තං ඛමති" යි ඉටාගත යුතු ය.

කර්මයට සහභාගි වීම පිණිස සීමාවට පැමිණ සිටින භික්ෂුවක් විසින් පටික්කෝසනය කළ යටත් පිරිසෙයින් තමා සමීපයේ සිටින භික්ෂුවකට වුව ද තමාගේ අරුචිය ප්‍රකාශ කළ කර්මය, කර්මයක් නො වේ. සීමාවෙහිදී ම මිස පසුව අන්

Non-commercial distribution

තැනකදී විරුද්ධත්වය ප්‍රකාශ කිරීමෙන් කර්‍ම විපත්තියක් නො වේ. අනුපසම්පන්නයන්ගේ හා නා නා සංවාසකයන්ගේ ද, උපසම්පන්න උම්මත්තකයන්ගේ ද, සිහිසන් නැතිවන තරමේ බලවත් වේදනාවෙන් පෙළෙන භික්ෂුවගේ ද, සීමාවෙන් බැහැර සිටින භික්ෂුවගේ ද පටික්කෝසනයෙන් කර්‍මය අකර්‍මයක් නො වේ.

**අචාර්‍ය්‍ය**

# රේරුකානේ චන්දවිමල

**මහාස්ථවිර පාදයන් වහන්සේ**

විසින් සම්පාදිත

# විනය කර්ම පොත

නිමි.

*Non-commercial distribution*